මුනි ගීතය



වනරතන ඛේමක හිමි

මුනි ගීතය

(සුත්තනිපාතයේ සරල සිංහල පරිවර්තනයකි)

පළමුවන ප්‍රකාශනය (අන්තර්ජාල) - 2023 පෙබරවාරි

හැඳින්වීම

මෙය පාලි සුත්ත නිපාතයට කළ සරල සිංහල නිදහස් පරිවර්තනයකි. එසේම මෙහි දී ව්‍යඤ්ජනයට වඩා අර්ථයට ප්‍රමුඛතාව දෙන ලදී. 'සුත්ත නිපාතය' යන්නෙහි තේරුම 'සූත්‍ර එකතුව' යන්නයි. සූත්‍ර එකතුව වූ සූත්‍ර පිටකය තුල තවත් සූත්‍ර එකතුවක් අන්තර්ගත වූයේ කෙසේ ද? ඊට හේතුව නම් මෙහි එන බොහෝ සූත්‍ර ('මා විසින් මෙසේ අසන ලදී' යන ආරම්භය නොමැති සූත්‍ර) භාග්‍යවතුන් වහන්සේ ජීවත් වන කාලයේදී ම සූත්‍ර එකතුවක් ලෙස සංගෘහිත වී තිබීමයි. එම සූත්‍ර වලට සංගායනා වලදී අනෙක් සූත්‍ර ද එකතුකර වර්තමාන සුත්ත නිපාතය සකස් වී ඇත. එබැවින් මෙහි එන එම මුල් සූත්‍ර ඉතා පැරණිය. නිකාය වල වෙනත් සූත්‍ර වලද මේවා ගැන සඳහන් වීමෙන් මේ කරුණ ස්ඵුට වේ. විශේෂයෙන් අට්ඨක වර්ගය හා පාරායන වර්ගය විශේෂිතය.

මේ පරිවර්තනය සිදු කිරීමේ දී බුද්ධ ජයන්ති සිංහල පරිවර්තනයත් කේ.එන්. ජයවික්‍රම මහතාගේ ඉංග්‍රීසි පරිවර්තනයත්, පූජ්‍ය ඩෙන්මාර්ක් ඤාණදීප හිමියන්ගේ ආංශික ඉංග්‍රීසි පරිවර්තයත් *(The Silent Sages of Old)*, කේ.ආර්. නෝමන් (K.R. Norman) මහතාගේ මුල් පරිවර්තනය (*The Rhinoceros Horn*) හා එහි පුනර්පරිවර්තනයත් (*The sutta nipata)* භාවිතා කරන ලදී.

කෙසේ නමුත් මෙම පරිවර්තනයේ දී සූත්‍ර කිහිපයක් සහ සූත්‍ර කිහිපයක ඇතැම් කොටස් ද පරිවර්තනය නොකළේ පරිවර්තක විසින් එම සූත්‍ර හා කොටස් එතරම් ප්‍රයෝජනයක් නැතැයි සිතූ හෙයිනි. අන්තර්ගතය අනුව 2.7 බ්‍රාහ්මණ ධම්මික සූත්‍රය පසු කාලීනව එකතු වූවක් බව සිතිය හැකිය. මෙහි එන බොහෝ සූත්‍ර පැවිද්දන් වෙනුවෙන්ම දේශිත වුවද ගිහි පිංවතුන්ට අදාළ වන සූත්‍ර ගණනාවක් ද සුත්තනිපාතයේ ඇත.

ධර්මය අවබෝධ නොකළ කෙනෙකු විසින් පරිවර්තනය කරන ලද බැවින් මෙහි වැරදි තිබිය යුතුය. එලෙසින් ම පරිවර්තනයක දී මුල් කෘතියට සියයට සියයක සාධාරණයක් කිසි විටෙකත් සිදු කළ නොහැක. සූත්‍ර පිටකයේ 'ක්‍රීම්' එක බඳු වූ සුත්ත නිපාතයේ සැබෑ රසය විඳීමට එය පාලියෙන් ම කියවිය යුතුය.

අද බොහෝ බෞද්ධයන් මෙන් ම අන්‍යාගමිකයන් ද බුදු දහම ලෙස දකින්නේ 'ලවුඩ් ස්පීකර් බුද්ධාගම'ත්, නොයෙක් පුද පූජා පිංකම් හා වන්දනා මානය. නමුත් සැබෑ බුදු දහම යනු ඊට වඩා බොහෝ ගැඹුරු බුද්ධිගෝචර වූ සනාතන දහමකි. ඉතා සරලව කළ මේ පරිවර්තනයෙන් ධර්මයේ මේ ගැඹුර ගැන වැටහීමක් පාඨකයාට ලැබේ නම් පරිවර්තකගේ උත්සහය සඵල වී ඇත.

පරිවර්තක
2020-09-22

පටුන

පිළිගැන්වීම

මහවනයේ ගස්යට, ඇළ දොළ අයිනේ හිඳ

මා හට කරුණාවෙන් දහම් කරුණු පහදා දුන්

අපවත් වී වදාල

අති පූජ්‍ය ඩෙන්මාර්ක් ඤාණදීප ස්වාමීන් වහන්සේගේ

ශ්‍රී නාමයට ඉමහත් ගෞරවයෙනි.

සබ්බදිට්ඨිපහානාය - යං සද්ධම්මං අදේසයි
අනුකම්පං උපාදාය - තං නමස්සාමි ගෝතමං[1]

සියළු දෘෂ්ඨි ප්‍රහීණ කිරීමට
සත්ත්වයා කෙරෙහි අනුකම්පාවෙන්
යම් සද්ධර්මයක් දේශනා කළේද
ඒ දේශනා කළ ගෞතමයන්ට මාගේ නමස්කාරය වේවා.!

---

[1] මූලමධ්‍යමකාරිකාවේ අවසන් ශ්ලෝකයේ පාලි පර්වර්තනය

1 . සර්ප පරිච්ඡේදය

1.1 සර්ප සූත්‍රය

1. යමෙක් හටගත් ක්‍රෝධය දුරුකරන්නේ ද
ඖෂධයකින් පැතිරුණ සර්පවිෂක් දුරුකරන්නා සේ
එම භික්ෂුව එගොඩත් මෙගොඩත්[1] අතහරී
සර්පයෙක් දිරුණු පරණ හැව අතහරින්නා සේ (1)

2. යමෙක් රාගය (ඇලීම) ඉතුරු නොකර උදුරා දමයි ද
මල් නෙලන්නේක් (විලට) බැස නෙළුම් මලක් සේ
එම භික්ෂුව එගොඩත් මෙගොඩත් අතහරී
සර්පයෙක් දිරුණු පරණ හැව අතහරින්නා සේ (2)

3. යමෙක් ආශාව (තණ්හා) ඉතුරු නොකර සිඳ දමයි ද
වේගයෙන් ගලන දොළක් වියළවන්නා සේ
එම භික්ෂුව එගොඩත් මෙගොඩත් අතහරී
සර්පයෙක් දිරුණු පරණ හැව අතහරින්නා සේ (3)

4. යමෙක් මානය ඉතුරු නොකර නසාලයි ද
මහා ජලපහරක් ඉතා දුර්වල බට පාලමක් නසන සේ
එම භික්ෂුව එගොඩත් මෙගොඩත් අතහරී
සර්පයෙක් දිරුණු පරණ හැව අතහරින්නා සේ (4)

---

[1] එගොඩට ගිය පසු එගොඩක් මෙගොඩක් නැත. (මෙගොඩ = සසර, එගොඩ = නිවන)

5. යමෙක් පැවැත්මේ (හවේ) සාරයක් නොලබන්නේ ද,
මල් නෙලන්නෙක් ඇහැටු ගහකින් මල් නොලබන්නා සේ
එම භික්ෂුව එගොඩත් මෙගොඩත් අතහරී
සර්පයෙක් දිරුණු පරණ හැව අතහරින්නා සේ (5)

6. යමෙකුගෙ ඇතුලත කෝපය නැති ද
නොයෙක් නොයෙක් වීම්[1] ද ඉක්මවයිද
එම භික්ෂුව එගොඩත් මෙගොඩත් අතහරී
සර්පයෙක් දිරුණු පරණ හැව අතහරින්නා සේ (6)

7. යමෙකගේ ඇතුලත මැනවින් සකස් කළ
විතර්කයන් ඉතුරු නැතිව පිඹ හැර ඇති ද
එම භික්ෂුව එගොඩත් මෙගොඩත් අතහරී
සර්පයෙක් දිරුණු පරණ හැව අතහරින්නා සේ (7)

8. යමෙක් ඉක්මවා නොයයි ද පසුපසට නොඑයි ද
මේ සියළු ප්‍රපඤ්චයන්[2] ඉක්මවා ද
එම භික්ෂුව එගොඩත් මෙගොඩත් අතහරී
සර්පයෙක් දිරුණු පරණ හැව අතහරින්නා සේ (8)

9. යමෙක් ඉක්මවා නොයයි ද පසුපසට නොඑයි ද
ලෝකයේ සියල්ල මේ ඇති සැටියෙන් වෙනස් යැයි දැන
එම භික්ෂුව එගොඩත් මෙගොඩත් අතහරී
සර්පයෙක් දිරුණු පරණ හැව අතහරින්නා සේ (9)

10. යමෙක් ඉක්මවා නොයයි ද පසුපසට නොඑයි ද
සියල්ල මේ ඇති සැටියෙන් වෙනස් යැයි ආශාව දුරු කළේ
එම භික්ෂුව එගොඩත් මෙගොඩත් අතහරී
සර්පයෙක් දිරුණු පරණ හැව අතහරින්නා සේ (10)

---

[1] විවිධ වූ ස්වභාවයන් ඉක්මවයිද

[2] ප්‍රපංච : පාලනයකින් තොරව ලියැලන සිතුවිලි වැල් (පූර්ණ විස්තරයක් සඳහා කටුකුරුන්දේ ඤාණානන්ද හිමියන්ගේ 'මුල් බුදුසමයේ සංකල්පය සහ යථාර්ථය' බලන්න.)

11. යමෙක් ඉක්මවා නොයයි ද පසුපසට නොඑයි ද
සියල්ල මේ ඇති සැටියෙන් වෙනස් යැයි ඇලීම දුරු කළේ
එම භික්‍ෂුව එගොඩත් මෙගොඩත් අතහරී
සර්පයෙක් දිරුණු පරණ හැව අතහරින්නා සේ (11)

12. යමෙක් ඉක්මවා නොයයි ද පසුපසට නොඑයි ද
සියල්ල මේ ඇති සැටියෙන් වෙනස් යැයි ද්වේශය දුරු කළේ
එම භික්‍ෂුව එගොඩත් මෙගොඩත් අතහරී
සර්පයෙක් දිරුණු පරණ හැව අතහරින්නා සේ (12)

13 යමෙක් ඉක්මවා නොයයි ද පසුපසට නොඑයි ද
සියල්ල මේ ඇති සැටියෙන් වෙනස්යැයි මුලාව(මෝහය) දුරු කළේ
එම භික්‍ෂුව එගොඩත් මෙගොඩත් අතහරී
සර්පයෙක් දිරුණු පරණ හැව අතහරින්නා සේ (13)

14. යමෙකුට කවර හෝ අනුසයක් නොමැති ද
අකුසලයන්ගේ මුල් සහමුලින් නැසුවේ ද
එම භික්‍ෂුව එගොඩත් මෙගොඩත් අතහරී
සර්පයෙක් දිරුණු පරණ හැව අතහරින්නා සේ (14)

15. යමෙකුට මෙගොඩට ඒමට හේතුවන්නා වූ
දරථයෙන් උපන් දෑ (කෙලෙස්) කිසිවක් නැති ද
එම භික්‍ෂුව එගොඩත් මෙගොඩත් අතහරී
සර්පයෙක් දිරුණු පරණ හැව අතහරින්නා සේ (15)

16. යමෙකුට පැවැත්මේ (භවයේ) බැඳතැබීමට නිසි හේතුවන
වනයෙන් (රාගයෙන්) උපන් දෑ (කෙලෙස්) කිසිවක් නැති ද
එම භික්‍ෂුව එගොඩත් මෙගොඩත් අතහරී
සර්පයෙක් දිරුණු පරණ හැව අතහරින්නා සේ (16)

17. යමෙක් පඤ්ච නීවරණ ප්‍රහීණ කර
නිදුක් වූයේ, සැක ඉක්ම වූයේ, (ඇනී තිබූ) උල් ගලවන ලද්දේද,
එම භික්‍ෂුව එගොඩත් මෙගොඩත් අතහරී
සර්පයෙක් දිරුණු පරණ හැව අතහරින්නා සේ (17)

1.2 ධනිය සූත්‍රය

1. (ධනිය ගොපලු)
   බත් පිස ඇත්තෙමි. කිරි දොවා ඇත්තෙමි.
   මහී නදී ඉවුරේ (නිත්‍ය) වාස ඇත්තෙමි.
   කුටිය(ගෙය) සෙවිලි කරන ලදි. (ලිප්) ගිනි දල්වන ලදී.
   ඉදින් කැමැත්තේ නම් වැස්ස වසින්න. (18)

2. (භාග්‍යවතුන් වහන්සේ)
   ක්‍රෝධ නැත්තෙමි. (ද්වේශ) උල ගලවන ලද්දෙමි.
   මහී නදීඉවුරේ එක් රැයක වාසය ඇත්තෙමි.
   කුටියේ සෙවිලි ඉවත් කරන ලදී. ගිනි නිවන ලදී.
   ඉදින් කැමැත්තේ නම් වැස්ස වසින්න. (19)

3. (ධනිය)
   ඇට මැස්සන් හා මදුරුවන් ඇත්තේ නැත.
   මඩේ වැඩුණු තණ පිටියේ ගවයෝ හැසිරෙති.
   පැමිණි වර්ෂාවද (ඔවුහු) ඉවසත්.
   ඉදින් කැමැත්තේ නම් වැස්ස වසින්න. (20)

4. (භාග්‍යවතුන් වහන්සේ)
   පහුර මැනවින් සකස් කොට බඳින ලදී.
   එතෙර වුයේ, එගොඩට ගියේ සැඩ පහර දුරු කරන ලදී.
   පහුරෙන් ප්‍රයෝජනයක් (දැන්) ඇත්තේ නැත.
   ඉදින් කැමැත්තේ නම් වැස්ස වසින්න. (21)

5. (ධනිය)
   මාගේ ගොපලිය කීකරුය, සෙල්ලක්කාර නැත.
   දිගු කලක් එක්ව වසන්නීය. (මට) ප්‍රිය ය.
   ඇගේ කිසි වරදක් නොඅසමි.
   ඉදින් කැමැත්තේ නම් වැස්ස වසින්න. (22)

6. (භාග්‍යවතුන් වහන්සේ)
සිත මගේ කීකරු ය. මිදුනේ ය.
දිගු කලක් වඩන ලදී. මැනවින් දමුනි ය.
මා කෙරෙහි වරදක් ඇත්තේ නැත.
ඉදින් කැමැත්තේ නම් වැස්ස වසින්න. (21)

7. (ධනිය)
මම මටම සේවය කර ගනිමි (කාගෙවත් බැලයෙක් නොවෙමි.)
දරුවන් ද මා සමඟ වෙසේ. (ඔවුන්) නිරෝගීය.
ඔවුන්ගේ කසි වරදක් නොඅසමි.
ඉදින් කැමැත්තේ නම් වැස්ස වසින්න. (24)

8. (භාග්‍යවතුන් වහන්සේ)
මම කිසිකෙනෙකුගේ සේවකයෙක් නොවෙමි (මගේවත්).
මිදී ගිය වහල් බවින් මුළු ලෝකයේම හැසිරෙමි.
වේතනයෙන් ප්‍රයෝජනයක් ඇත්තේ නැත.
ඉදින් කැමැත්තේ නම් වැස්ස වසින්න. (25)

9. (ධනිය)
නහඹු වස්සෝ ද ඇත. කිරි බොන වස්සෝ ද ඇත.
ගැබිනි දෙන්නුද, ගැබිනි වීමට නිසි දෙන්නු ද ඇත.
වෘෂභ වූ නායක ගවයෙකු ද ඇත.
ඉදින් කැමැත්තේ නම් වැස්ස වසින්න. (26)

10. (භාග්‍යවතුන් වහන්සේ)
නහඹු වස්සෝ ද නැත. කිරි බොන වස්සෝ ද නැත.
ගැබිනි දෙන්නු ද, ගැබිනි වීමට නිසි දෙන්නු ද නැත.
වෘෂභ වූ නායක ගවයෙකු ද නැත.
ඉදින් කැමැත්තේ නම් වැස්ස වසින්න. (27)

11. (ධනිය)
කණු මැනවින් සිටුවා ඇත. නොසැලෙන්නාහ.
මුදුතණ බැඳුම් අලුත්ය. මැනවින් බැඳ ඇත.
කිරිබොන වැස්සන්ටත් සිඳලිය නොහැක.
ඉදින් කැමැත්තේ නම් වැස්ස වසින්න. (28)

12. (භාග්‍යවතුන් වහන්සේ)
වෘෂභයෙකු මෙන් බැඳුම් සිඳ,
හස්තියෙක් කුණු වූ වැලක් (කඩන්නා) සේ කඩා දමා,
මම නැවත ගර්භාෂයක හොවින්නට නොපැමිණෙමි.
ඉදින් කැමැත්තේ නම් වැස්ස වසින්න. (29)

13. නිම්න හා උස්තැන් යට කරමින්
මහා වර්ෂාවක් එවෙලේ ඇද වැටුණි.
වැස්ස වසිනවා අසා[1]
මේ අර්ථය ධනිය පැවසුවේය. (30)

14. (ධනිය)
අපට භාග්‍යවතුන් වහන්සේ දැක ගන්නට ලැබුණි ද,
එය අපට අනල්ප වූ ලාභයකි.
ඇස් ඇත්තානෙනි, ඔබේ සරණ ලැබීමට පැමිණෙන්නෙමු.
මහා මුනිවරයාණෙනි, ඔබ අපගේ ශාස්තෘ වන්නෙහිය. (31)

15. ගොපලියත් මමත් කීකරුව
සුගතයන් වහන්සේ වෙත බඹසර හැසිරෙන්නෙමු.
ඉපදීම මරණය කෙළවර කොට
දුක කෙළවර කරන ලද්දෝ වන්නෙමු. (32)

16. (මාරයා)
දරුවන් ඇත්තා දරුවන් නිසා සතුටුවෙයි.
එලෙසින්ම ගවයන් ඇත්තා ගවයන් නිසා සතුටුවෙයි.
වත්කම් (උපධි) මිනිසුන්ගේ සතුටයි.
යමෙකුට වත්කම් නැති ද ඔහුට සතුටක් නැත. (33)

17. (භාග්‍යවතුන් වහන්සේ)
දරුවන් ඇත්තා දරුවන් නිසා ශෝක වෙයි.
එලෙසින්ම ගවයන් ඇත්තා ගවයන් නිසා ශෝක වෙයි.
වත්කම් මිනිසුන්ගේ ශෝකයයි.
යමෙකුට වත්කම් නැති ද ඔහුට ශෝකයක් නැත. (34)

---

[1] එම වර්ෂාවෙන් ධනියගේ හරක් පට්ටිය වැනසින.

1.3 'කඟවේන අඟ' සූත්‍රය

1. සියළු සත්ත්වයන් කෙරෙහි මුගුරු බහා තබා
ඔවුන් අතරින් කිසිවෙකුටත් හිංසාවක් නොකර
දරුවන් නොපතන්නේ කෙසේ යහළුවෙක් පතන්නද?
කඟවේන අඟක් මෙන් තනිව හැසිරෙන්න.[1] (35)

2. සබඳතා ඇත්තාට සෙනෙහස උපදියි.
සෙනෙහස අනුවම මේ දුක් හටගනී.
සෙනෙහසින් උපදින අදීනව දකිමින්
කඟවේන අඟක් මෙන් තනිව හැසිරෙන්න. (36)

3. සහෘද මිතුරන් කෙරෙහි අනුකම්පා කරන්නා
(ඔවුන් කෙරෙහි) බැඳුනු සිතැත්තේ (තමුන්ගේ) යහපත නැතිකරගනී.
සබඳතා පැවැත්වීමේ එම භය දකිමින්
කඟවේන අඟක් මෙන් තනිව හැසිරෙන්න. (37)

4. අඹුදරුවන් කෙරෙහි යම් අපේක්ෂාවක් ඇත් ද,
එය (පඳුරේ) පැටළුණු විශාල උණ ගසක් වැනි ය.
නොපැටළුණු උණ මොරෙයයක් සේ නොබැඳෙමින්
කඟවේන අඟක් මෙන් තනිව හැසිරෙන්න. (38)

5. කැලය කෙරෙහි (ආශාවෙන්) නොබැඳුනු මුවා
කෑම සොයමින් කැමති තැනක යන්නා සේ
ස්වෛරී භව පතන නුවණැති මිනිසා
කඟවේන අඟක් මෙන් තනිව හැසිරෙන්න. (39)

6. වසන තැන, සිටින තැන, ගමන් කිරීමේදී හා චාරිකාවේදී
මිතුරන් මැද ආමන්ත්‍රනා ඇත.
නොබැඳුනු බවත්, ස්වෛරී බවත් පතන්නේ
කඟවේන අඟක් මෙන් තනිව හැසිරෙන්න. (40)

---

[1] අං ඇති හැම සතාටම අං දෙක බැගින් ඇත. ඉන්දියානු කඟවේනට ඇත්තේ එක් අඟකි.

7. මිතුරන් මැද කෙලිලොල් බවත් ඇලීමත් ඇත.
දරුවන් කෙරෙහිද විපුල ප්‍රේමයක් වේ.
ප්‍රියයන්ගෙන් වෙන්වීම (නම් දුක) පිළිකුල් කරමින්
කඟවේන අඟක් මෙන් තනිව හැසිරෙන්න. (41)

8. සතර දිසාවන්හිම ගැටීමක් නැතිව
ලද දෙයින් සතුටුවන්නේ
(පැමිණෙන) උවදුරු බිය නැතිව ඉවසමින්
කඟවේන අඟක් මෙන් තනිව හැසිරෙන්න. (42)

9. ඇතැම් පැවිද්දන් සතුටු කිරීම අපහසුය.
එලෙසින්ම ගෘහස්ථ ගිහියොත්.
පරපුත්‍රයින් (අන් අයගේ දරුවන් වූ ඔවුන්) කෙරෙහි උනන්දු නොවී
කඟවේන අඟක් මෙන් තනිව හැසිරෙන්න. (43)

10. කොළ හැලුණු කොබෝලීල ගසක් මෙන්,
ගිහි සලකුණු බහා තබා
වීරයා ගිහි බන්ධන සිඳ දමා
කඟවේන අඟක් මෙන් තනිව හැසිරෙන්න. (44)

11. ඉදින් එක්ව හැසිරීමට හා විසීමට මනා වූ
බුද්ධිමත් නුවණැති මිතුරෙකු (කල්‍යාණ මිත්‍රයකු) ලබානම්
සියළු උවදුරු මැඩපවත්වා,
සතුටු සිතින්, සිහි ඇතිව ඔහු සමඟ හැසිරෙන්න. (45)

12. ඉදින් එක්ව හැසිරීමට හා විසීමට මනා වූ
බුද්ධිමත් නුවණැති මිතුරෙකු නොලබා නම්,
(තම) රට විජිතය හැර යන රජෙකු සේ
කඟවේන අඟක් මෙන් තනිව හැසිරෙන්න. (46)

13. මිතුරු සම්පත්තිය අනිවාර්යයෙන්ම අගයමු.
තමාට වඩා ශ්‍රේෂ්ඨ හෝ සමාන මිතුරන් ඇසුරු කළ යුතුය.
ඔවුන් නොලද්දේ නම්, වරද නැතිව ආහාර ගන්නේ
කඟවේන අඟක් මෙන් තනිව හැසිරෙන්න. (47)

14. රන්කරුවකු විසින් මැනවින් සෑදූ
ප්‍රභාශ්වර වූ රන් භාණ්ඩ (වළලු) දෙකක්
අතේ එකිනෙක ගැටෙමින් පවතින සැටි දැක
කඟවේන අඟක් මෙන් තනිව හැසිරෙන්න. (48)

15. එලෙසින්ම මා හට දෙවැන්නෙකු (සිටීම) නිසා
කථා කිරීමත්, (ඔහු කෙරෙහි) ඇල්මත් වන්නේය.
අනාගතයේ ඇතිවිය හැකි එම භය දකිමින්
කඟවේන අඟක් මෙන් තනිව හැසිරෙන්න. (49)

16. විචිත්‍ර වූ, මියුරු වූ, සිත් අලවන කාමයෝ
විවිධ ස්වරූපයෙන් සිත කළඹත්,
කාමගුණයන්ගේ (එම) ආදීනවය දැක
කඟවේන අඟක් මෙන් තනිව හැසිරෙන්න. (50)

17. එය (කාමයන්) විපතක්ද, ගඩුවක්ද, උපද්‍රවයක්ද
රෝගයක්ද, උලක්ද, භයක්ද වන්නේය.
කාම ගුණ කෙරෙහි ඇති එම භය දැක
කඟවේන අඟක් මෙන් තනිව හැසිරෙන්න. (51)

18. සීතල ද, උෂ්ණය ද, බඩගින්න පිපාසය ද,
සුළං ද, අව්වද, මැසි මදුරු සර්පයන් ද
ඒ සියළු උවදුරු මැඩපවත්වා
කඟවේන අඟක් මෙන් තනිව හැසිරෙන්න. (52)

19. විශාලව වැඩුණු කයක් ඇති පද්මකුල, උළාර
හස්තියකු රංචුව හැරදමා
කැමති සේ කැළයේ වාසය කරන්නා සේ
කඟවේන අඟක් මෙන් තනිව හැසිරෙන්න. (53)

20. යම් සාමයික විමුක්තියක් ඇද් ද,
එය ස්පර්ශ කිරීමට පිරිසෙහි ඇළුනහුට නොහැකිය.
හිරු නෑයගේ[1] (එම) වචනය අසා
කඟවේන අඟක් මෙන් තනිව හැසිරෙන්න. (54)

---

[1] ශාක්‍යයන් සූර්‍ය වංශිකයන් බැවින් බුදුරදුන්ට මෙසේ කියනු ලැබේ.

21. වැරදි දෘෂ්ඨි ඉක්මවන ලද්දේ
නියත මාවතට පැමිණියේ (ආර්ය) මාර්ගය ලබන ලද්දේ
'උපදවන ලද ඥාණය ඇත්තෙමි',
අනෙකුගේ මඟ පෙන්වීමක් අවශ්‍ය නැත්තේ
කඟවේන අඟක් මෙන් තනිව හැසිරෙන්න. (55)

22. ලොල් නොවූයේ, කුහක නැත්තේ, (ආශා) පිපාස නැත්තේ
ගුණ නොමකන්නේ, මෝහ කහට ගසා දමන ලද්දේ
සියළු ලෝකයේ සිත ලගින තැනක් (ඇළුනු දෙයක්) නැත්තෙකු වී
කඟවේන අඟක් මෙන් තනිව හැසිරෙන්න. (56)

23. අයහපත් දේම දක්නා, නරක දෙයෙහි ඇළුණු
නරක මිතුරන් වර්ජනය කරන්න.
තෙමේ ප්‍රමාදයෙහි යෙදෙන්නා ඇසුරු නොකරන්නේ
කඟවේන අඟක් මෙන් තනිව හැසිරෙන්න. (57)

24. බහුශ්‍රැත වූ, ධර්මධර වූ, උදාර වූ
දහම් දෙසන මිත්‍රයා ඇසුරු කරන්න.
(දහම්) අර්ථයන් දැන සැක දුරු කරගන්න
කඟවේන අඟක් මෙන් තනිව හැසිරෙන්න. (58)

25. කෙළි සෙල්ලම්ද, ඇලීමද, ලොවේ ඇති කාම සැපය ද
අගය නොකර, අපේක්ෂා නොකරන්නේ
හැඩවැඩ වීමෙන් වැළකුණේ, සත්‍ය කතා කරන්නේ
කඟවේන අඟක් මෙන් තනිව හැසිරෙන්න. (59)

26. දරුවන් ද, බිරිඳ ද, මව ද, පියා ද,
ධනය ද, ධාන්‍යය ද, නෑයන් ද
නානාප්‍රකාර වූ ඒ කාමයන් අතහැර
කඟවේන අඟක් මෙන් තනිව හැසිරෙන්න. (60)

27. එය (කාමයන්) උගුලකි. එහි ඇත්තේ සීමිත සැපයකි.
ආශ්වාදය අඩුය. එහි දුකම වැඩිය.
එය ඇමකැයි නුවණැත්තා දැන
කඟවේන අඟක් මෙන් තනිව හැසිරෙන්න. (61)

28. දැල බිඳ යන මසෙකු සේ,
බැඳීම් පලා දමා
දැවුණු තැනට ගින්න ආපසු නොඑන්නා සේ
කඟවේන අඟක් මෙන් තනිව හැසිරෙන්න. (62)

29. පහතට හෙලූ ඇස් ඇත්තේ, ඇවිදිමින් කාලය නොගෙවන්නේ
රකින ලද ඉන්ද්‍රිය ඇත්තේ, රකින ලද මනසක් ඇත්තේ
(රාගයෙන්) තෙත් නොවූයේ, (රාග ගින්නෙන්) නොදැවුනේ
කඟවේන අඟක් මෙන් තනිව හැසිරෙන්න (63)

30. ගිහි සළකුණු හැරපියා
පත්‍රවලින් ගැවසුන පරසතු රැක මෙන්
කහවත් ඇතිව අභිනික්මන් කොට
කඟවේන අඟක් මෙන් තනිව හැසිරෙන්න. (64)

31. රසයෙහි ගිජුබවක් නැත්තේ, ලොල් නොවූයේ
අනෙකෙක් පෝෂණය නොකර, ගෙපිළිවෙළින් පිඬුසිගා වඩින්නේ,
ඒ ඒ පවුල් කෙරෙහි නොබැඳුනු සිත් ඇත්තේ
කඟවේන අඟක් මෙන් තනිව හැසිරෙන්න. (65)

32. පඤ්චනීවරණ[1] සිතින් දුරුකොට, සියළු උපක්ලේශ ද දුරුකොට
(කිසිවක්) ඇසුරු නොකරන්නේ,
දොස් සහිත සෙනෙහස සිඳ
කඟවේන අඟක් මෙන් තනිව හැසිරෙන්න. (66)

33. සැප හා දුක පිටුදැක
මුලින්ම සොම්නසද දොම්නසද (පිටු දැක)
සන්සිඳීම (සමථං), විශුද්ධිය, උපේක්ෂාව ලැබ
කඟවේන අඟක් මෙන් තනිව හැසිරෙන්න. (67)

34. පරමාර්ථයට (නිවනට) පැමිණීමට වීර්යය අරඹන ලද්දේ
නොහැකිළුණු සිතැත්තේ, කුසීත නොවූ පිලිවෙත් ඇත්තේ
දැඩිව (ආර්ය මාර්ගයේ) හික්මුනේ, දැඩි වීර්යයට පැමිණියේ
කඟවේන අඟක් මෙන් තනිව හැසිරෙන්න. (68)

---

[1] කාමයන්ට ඇති කැමැත්ත, ද්වේශය, නිදිමත හා මැලිබව, සිතේ විසිරීම හා කුකුස් කිරීම, ධර්ම මාර්ගය ගැන සැකය.

35. පිළිසලන (කාය විවේකය) ද භාවනාව ද අත් නොහරිමින්
නිරතුරුව (බාහිර) ධර්මතාවන් කෙරෙහි ධර්මානුකූලව හැසිරෙමින්
භව පැවැත්ම වල[1] ආදීනව නුවණින් සළකා
කඟවේන අඟක් මෙන් තනිව හැසිරෙන්න. (69)

36. අප්‍රමාදී වූයේ, තණ්හාව ක්‍ෂය කිරීම (නිවන) පතමින්
බුද්ධි හීනයෙකු නොවූයේ, ධර්මය දත්, සතිමත් වූයේ,
ධර්මය නුවණින් දැන, (ධර්මාවබෝධය) නියත වූයේ, ප්‍රධන් වීර්යය
ඇත්තේ
කඟවේන අඟක් මෙන් තනිව හැසිරෙන්න. (70)

37. සිංහයකු සේ ශබ්ද වලට බිය නොවෙමින්,
සුළඟ දැලක නොපැටලෙන්නා සේ කිසිවක නොපැටලෙමින්,
නෙළුමක ජලය නොතැවරෙන්නා සේ කිසිවක නොතැවරෙමින්,
කඟවේන අඟක් මෙන් තනිව හැසිරෙන්න. (71)

38. සතුන්ගේ රජ වූ, (අන් සතුන්) යටපත් කරමින් හැසිරෙන්නා වූ
(තම) දළ බල කොට(අන් සතුන්) පිරිහෙලන්නා වූ සිංහයෙකු මෙන්
ප්‍රත්‍යන්ත සේනාසන ඇසුරු කරන්න.
කඟවේන අඟක් මෙන් තනිව හැසිරෙන්න. (72)

39. සුදුසු කාලයේ මෛත්‍රී, උපේක්‍ෂා, කරුණා, මුදිතා
විමුක්තීන් ඇසුරු කරමින්
සියළු ලෝකයා සමඟ අවිරුද්ධ වෙමින්
කඟවේන අඟක් මෙන් තනිව හැසිරෙන්න. (73)

40. ඇලීම ද (රාග), ද්වේශය ද, මුළාව ද (මොහ) දුරුකොට
බැඳීම් පලා දමා
මරණයෙහි බිය නොවී
කඟවේන අඟක් මෙන් තනිව හැසිරෙන්න. (74)

41.(තමාගේ) වාසිය පිණිසම භජනය කිරීම ද, ඇසුරු කිරීම ද කරත්
කාරණයක් නැතිව ඇසුරු කරන මිතුරන් අද දුර්ලභ ය.
ආත්මාර්ථයෙහි ප්‍රඥා ඇති මිනිසුන් අපවිත්‍ර ය (අපවිත්‍ර සිතැත්තෝය).
කඟවේන අඟක් මෙන් තනිව හැසිරෙන්න. (75)

---

[1] කාම රූප අරූප ත්‍රිවිධ භව.

1.4 කසීභාරද්වාජ සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී. එක් සමයක භාග්‍යවතුන් වහන්සේ මගධයෙහි දකුණු කඳුකරයේ (දක්ෂිණගිරි) ඒකනාළා බමුණු ගම වැඩ වෙසෙති. එකල්හි කසීභාරද්වාජ (ගොවි භාරද්වාජ) බමුණු විසින් සීසාන කාලයේ නගුල් පන්සියයක් පමණ යොදවන ලද්දේ වෙයි.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පෙරවරුයෙහි හැඳ පාත්‍ර සිවුරු ගෙන කසීභාරද්වාජගේ කර්මාන්තයට වැඩියහ. එකල්හි කසීභාරද්වාජ බමුණාගේ කර්මාන්තයේ ආහාර ගැනීමේ අවස්ථාව විය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මිනිසුන් ආහාර ගන්නා ස්ථානයට පැමිණ එකත්පසෙක සිටි සේක. කසීභාරද්වාජ බමුණු උන්වහන්සේ පිඬු පිණිස සිටුනු දැක, උන්වහන්සේට මෙලෙස කීය. ''ශ්‍රමණය, මම සීසාමි, වපුරමි. සීසා වපුරා කමි. ශ්‍රමණය නුඹත් සීසාන්න, වපුරන්න. සීසා වපුරා කන්න.'' ''බමුණ, මම ද සීසාමි වපුරමි. සීසා වපුරා කන්නෙමි.''

"අපි ගෞතමයන්ගේ වියගස හෝ නගුල හෝ හී වැල හෝ කෙවිට හෝ හරකුන් හෝ නොදකිමු. නමුත් භවත් ගෞතමයන් මෙසේ කීය, 'බමුණ මම ද සීසාමි වපුරමි. සීසා වපුරා කන්නෙමි'යි.'' ඉක්බිති කසීභාරද්වාජ බමුණු භාග්‍යවතුන් වහන්සේට ගාථාවෙන් මෙය කීයඃ

1. ගොවියෙකි යි පිළින කෙරෙහි
   නමුත් ඔබගේ ගොවිතැනක් නොදකිමු.
   යම් පරිද්දකින් ඔබගේ ගොවිතැන දැනගන්නේමු ද
   විමසන ලදුව ඒ ගොවිතැන අපට කියන්න.
   (76)

2. (භාග්‍යවතුන් වහන්සේ)
   ශ්‍රද්ධාව බීජයයි, තපස වැස්සයි.
   ප්‍රඥාව මගේ විය හා නගුලයි.
   පවට ලැජ්ජාව නගුලිසයි, මනස වියරුහැනයි.
   සතිය මගේ හීවැල හා කෙවිටයි. (77)

3. කායක්‍රියා රැක්කේ, වචනය රැක්කේ
   ආහාරයෙත් උදරයෙහිත් සංයත වෙමි.
   සත්‍යය අස්වැන්න ලෙස නෙලමි.
   මෘදු බව මාගේ විය ලිහා දැමීමයි. (78)

4. බන්ධන වලින් මිදීමට (නිවනට) යන වාහනය වූ
වීර්යය මාගේ බර උසුලන්නා ය (ගවයා ය).
යම් තැනකට ගොස් ශෝක නොකෙරේ ද,
(එතැනට ඌ) ආපසු නොහැරී යන්නේ ය. (79)

5. මෙලෙස එම ගොවිතැන කරන ලදි.
ඒ ගොවිතැනහි අමෘත ඵල ඇත.
එම ගොවිතැන කොට
සියළු දුකින් මිදෙන්නේය. (80)

ඉක්බිති කසීභාරද්වාජ බමුණා විශාල රන් තලියක කිරිබත් වඩා භාග්‍යවතුන් වහන්සේට පිරිනැමුවේය. ''භවත් ගෞතමයන් කිරිපිඬු වළඳත්වා. භවත් ගෞතමයන් යම් අමෘත ඵල දෙන ගොවිතැනක් කරන්නෙහි ද එම නිසා භවත්හු ගොවියෙකි.''

6. ගාථා කියා ලද්ද මට වැළඳීමට නොනිසිය.
බමුණ, (නිවැරදි දිවි පැවැත්ම) දකින්නාට එය (චාරිත්‍ර) ධර්මයක් නොවේ.
ගාථා කියා ලද්ද බුදුවරු පිළිකෙව් කෙරෙත්
බමුණ (එබඳු චාරිත්‍ර) ධර්ම ඇති මේ ජීවන ක්‍රමයයි. (81)

7. පරිපූර්ණ වූ මහා ඍෂි වූ
ආශ්‍රව ක්‍ෂය කළ, කුකුස් සන්සිඳුන ඔහුට
අන් ආහාර පාන වලින් උවටැන් කරන්න.
ඔහු පින් කැමැත්තාට පින්කෙතක් වන්නේය. (82)

"ඉදින් භවත් ගෞතමයනි, කවරකුට මෙම කිරිබත දෙන්නෙම් ද?" "බමුණ, දෙවියන් සහිත ලෝකයේ මරුන් බ්‍රහ්මයන් ශ්‍රමණ බ්‍රාහ්මණයන් දෙව් මිනිසුන් සහිත ප්‍රජාවෙහි තථාගතයන් හෝ තථාගත ශ්‍රාවකයෙක් හැර මේ කිරිබත වළඳා මැනවින් දිරවිය හැකි යමෙකු නොදකිමි. එම නිසා බමුණ නුඹ මෙම කිරිබත තණ නැති තැනක හෝ දමන්න, සතුන් නැති ජලයේ හෝ පා කර හරින්න." ඉක්බිති කසීභාරද්වාජ බමුණා ඒ කිරිබත සතුන් නැති දියෙහි දැමුවේය. එවිට එම කිරිබත චිටි චිටි හඬින් දුම් දමන්නට විය. බෙහෙවින් දුම් දමන්නට විය. යම්සේ දවසක් තිස්සේ ගිනියම් කළ නඟුල් තලයක් ජලයේ දැමූ විට චිටි චිටි හඬින් දුම් දමයි ද,

බෙහෙවින් දුම් දමයි ද, එලෙසින්ම එම කිරිබත ජලයේ දැමූයේ චිටි චිටි හඬින් දුම් දමන්නට විය. බෙහෙවින් දුම් දමන්නට විය.

එවිට භාරද්වාජ බමුණු බිය වූයේ, ලොමුදැහැ ගැන්වූයේ භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ පාමුල හිසින් වැඳ මෙය කීය; "ඉතා මනහරය භවත් ගෞතමයාණෙනි, ඉතා මනහර ය. යම් සේ යටිකුරු කරන ලද්දක් උඩුකුරු කරන්නේ ද, වැසුණු දෙයක් විවර කරන්නේ ද, මුළා වූවකුට මාර්ගය කියන්නේ ද, 'ඇස් ඇත්තෝ රූප දකින්නෝයැ'යි අඳුරේ තෙල් පහනක් දරන්නේ ද, එලෙසින්ම භවත් ගෞතමයන් විසින් නන් අයුරින් ධර්මය දෙසන ලදී. මම භවත් ගෞතමයන් ද ධර්මය ද භික්ෂු සංඝයා ද සරණ කොට යමි. මා හට භවත් ගෞතමයන් ලඟ පැවිද්ද ලැබේවා! උපසම්පදාව ලැබේවා!"

කසී භාරද්වාජ බමුණාට භාග්‍යවතුන් වහන්සේ ලඟ පැවිද්ද හා උපසම්පදාව ලැබුණි. ආයුෂ්මත් භාරද්වාජ තෙමේ උපසම්පදාව ලැබ නොබෝ කලකින් එකලා වූයේ, වෙන් වූයේ, අප්‍රමාදීව වීර්යයෙන් යුක්තව වසන්නේ යම් කාරණයක් සඳහා කුල පුත්‍රයෝ මනාකොට ගිහිගෙයින් නික්ම පැවිදිවෙත් ද, නොබෝ කලකින්ම ඊට හේතු වූ ඒ උත්තරීතර බඹසර කෙළවර මේ දිවියේදීම තමා විසින්ම මැනවින් දැන පසක් කොට එළඹ විසීය. 'ඉපදීම ක්‍ෂය විය. බඹසර වැස නිමවිය, කළ යුත්ත කරන ලදී. මේ භවයෙන් එහාට යැමක් නැතැ'යි දැන ගත්තේය. ආයුෂ්මත් භාරද්වාජ තෙමේ රහතුන් අතුරෙන් එක් අයෙක් විය.

1.5 චුන්ද සූත්‍රය

1. (චුන්ද රන්කරු)
 බුද්ධ වූ, ධර්මස්වාමී වූ, තණ්හාව දුරු කළ
 දෙපා ඇත්තවුන් අතර උත්තරීතර වූ,
 (මිනිසුන්) දමනය කරන්නන් අතර උතුම් වූ
 විපුල ප්‍රඥා ඇති මුනි වරයා විමසමි.
 ලෝකයේ ශ්‍රමණයින් කීදෙනෙක් ද? ඔවුන් ප්‍රකාශ කරන්න. (83)

2. (භාග්‍යවතුන් වහන්සේ)
 ශ්‍රමණයින් සතර දෙනෙකි. පහක් නැත.
 සාක්ෂි කොට විමසන ලද්දේ ඔවුන් ඔබට ප්‍රකාශ කරමි.
 මාර්ගය දිනපු කෙනා ද, මාර්ගය දෙසන කෙනා ද,
 මාර්ගයේ ජීවත් වන්නාද, මාර්ගය දූෂණය කරන්නා ද යනුවෙනි. (84)

3. (චුන්ද රන්කරු)
 බුදුවරු මාර්ගය දිනන ලද්දා යැයි කියන්නේ කාටද?
 මාර්ග දේශකයා (ඉන්) වෙනස් වන්නේ කෙසේද?
 මාර්ගයේ ජීවත් වන්නා මා විසින් අසන ලද්දේ කියනු මැන.
 ඉක්බිතිව මට මාර්ගය දූෂණය කරන්නා කියනු මැන. (85)

4. (භාග්‍යවතුන් වහන්සේ)
 යමෙක් සැකය ඉක්මවී ද, (කෙලෙස්) උල් ගලවන ලදද
 නිවනෙහි ඇළුනේ, කිසිවකට ගිජු නොවූයේ
 දෙවියන් සහිත ලෝකයට නායක වූයේ
 කිසිවකින් (සිත) වෙනස් නොවන ඔහු 'මාර්ගය දිනන ලද්දා' යැයි
 බුදුවරු පවසත්. (86)

5. මෙහි යමෙක් උත්තරීතරම දේ (නිවන) උත්තරීතරම දේ යැයි දැන
 මෙහිම ධර්මය දේශනා කරයි ද, විස්තර කරයි ද
 ඒ සැකය පසාරු කළ, නොසැලෙන මුනිවරයා වූ
 ඒ දෙවන මහණ 'මාර්ග දේශකයා' යැයි කියත්. (87)

6. යමෙක් මැනවින් දේශිත ධර්ම මාර්ගයේ
සංයමයෙන් සතිමත්ව (එම) මාර්ගයේ ජීවත් වෙයි ද
නිවැරදි තත්වයන් ඇසුරු කරන
තෙවැනි භික්ෂුව 'මාර්ගයේ ජීවත්වන්නා' යැයි කියත්. (88)

7. මනා සිල් ව්‍රත ඇත්තන්ගේ වැස්ම (සිවුරු) ගෙන
කඩා පනින, පවුල් වල (මිනිසුන්ගේ) ශ්‍රද්ධාව නැති කරන,
නොගැලපෙන හැසිරීම් ඇති,
කළ වැරදි සඟවා ගන්නා, සංයමයක් නැති, බොල් වූ (හිස්),
(භික්ෂු) ප්‍රතිරූපයෙන් (පමණක්) හැසිරෙන ඔහු මාර්ග දූෂකයාය. (89)

8. ධර්මය දත්, ආර්‍යයන්ගේ ශ්‍රාවක වූ, නුවණැති
යම් ගිහියෙක් ඔවුන්ව අවබෝධ කරගෙන
ඔවුන් සියළුදෙනා ඒ ඒ ආකාර යැයි දැන
මෙසේ දැක තමුන්ගේ ශ්‍රද්ධාව නැති කර නොගනී.
කෙලෙසද දුෂ්ඨයා අදුෂ්ඨ පුද්ගලයා සමඟත්
ශුද්ධ පුද්ගලයා අශුද්ධයා සමඟත් සම කරන්නේ? (90)

1.6 'පිරිහීම' සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී. එක් සමයක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවනයෙහි අනේපිඩු සිටුවරයාගේ ආරාමයේ වැඩ වෙසෙති. එකල එක්තරා දේවතාවියක් රැ බොහෝ ඉක්ම ගිය කල්හි, සුන්දර රුවක් ඇත්තී, මුළු ජේතවනයම බබලවා භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණියාය. පැමිණ (ගෞරවයෙන්) වැඳ එක් පසෙක සිටියාය. එකත්පස්ව සිටි ඒ දේවතාවිය භාග්‍යවතුන් වහන්සේට ගාථාවෙන් මෙය පැවසුවාය.

1. පිරිහෙන පුද්ගලයා (කවුදැයි)
   අපි ගෞතමයන්ගෙන් විමසමු.
   (එය) භාග්‍යවතුන්ගෙන් විමසීමට පැමිණියෙමු.
   පිරිහෙන්නාගේ දොරටුව කුමක්ද? (91)

2. (භාග්‍යවතුන් වහන්සේ)
   දියුණු වන්නා හඳුනා ගැනීම පහසු ය.
   පිරිහෙන්නා ද හඳුනා ගැනීම පහසු ය.
   ධර්මයට කැමැත්තා දියුණු වෙයි.
   ධර්මයට ද්වේශ කරන්නා පිරිහෙයි. (92)

3. (දේවතාවිය)
   මෙලෙස ඒ ඔහු පළමුවැනි පිරිහෙන්නා යැයි දැන ගතිමු.
   භාග්‍යවතුනි, පිරිහෙන්නාගේ දෙවැනි දොරටුව කුමක්දැයි කියනු මැන. (93)

4. (භාග්‍යවතුන් වහන්සේ)
   ඔහුට අසත්පුරුෂයන් ප්‍රිය වෙයි. සත්පුරුෂයන් ප්‍රිය නොකරයි.
   අසත්පුරුෂ ධර්මයට කැමැති වෙයි. එය පිරිහෙන්නාගේ දොරටුවකි. (94)

5. (දේවතාවිය)
   මෙලෙස ඒ ඔහු දෙවැනි පිරිහෙන්නා යැයි දැන ගතිමු.
   භාග්‍යවතුනි, පිරිහෙන්නාගේ තෙවැනි දොරටුව කුමක්දැයි කියනු මැන. (95)

6. (භාග්‍යවතුන් වහන්සේ)
   යම් මිනිසෙක් නිදන සුලු ද,පිරිස ප්‍රිය කරයි ද, උත්සහයක් නැති ද,
   අලස, ක්‍රෝධ ලක්ෂණ ඇති ද, එය පිරිහෙන්නාගේ දොරටුවකි. (96)

7. (දේවතාවිය)
මෙලෙස ඒ ඔහු තෙවැනි පිරිහෙන්නා යැයි දැන ගතිමු.
භාග්‍යවතුනි, පිරිහෙන්නාගේ සතරවැනි දොරටුව කුමක්දැයි කියනු මැන. (97)

8. (භාග්‍යවතුන් වහන්සේ)
යමෙක් තරුණ විය පසුකොට මහළු වූ මවට හෝ පියාට
බොහෝ (ධනය) ඇත්තේ නමුදු නොසළකා ද, එය පිරිහෙන්නගේ
දොරටුවකි. (98)

9. (දේවතාවිය)
මෙලෙස ඒ ඔහු සිව්වැනි පිරිහෙන්නා යැයි දැන ගතිමු.
භාග්‍යවතුනි, පිරිහෙන්නාගේ පස්වැනි දොරටුව කුමක්දැයි කියනු මැන. (99)

10. (භාග්‍යවතුන් වහන්සේ)
යමෙක් බමුණෙකු හෝ ශ්‍රමණයෙකු හෝ වෙනත් දුගියෙකු
බොරු කියා වංචා කෙරේද, එය පිරිහෙන්නගේ දොරටුවකි. (100)

11. (දේවතාවිය)
මෙලෙස ඒ ඔහු පස්වැනි පිරිහෙන්නා යැයි දැන ගතිමු.
භාග්‍යවතුනි, පිරිහෙන්නාගේ සයවැනි දොරටුව කුමක්දැයි කියනු මැන. (101)

12. (භාග්‍යවතුන් වහන්සේ)
රන් හා භෝජන ඇති බොහෝ ධනය ඇති පුරුෂයා
රසැති බොජුන් තනිවම වළඳාද, එය පිරිහෙන්නාගේ දොරටුවකි. (102)

13. (දේවතාවිය)
මෙලෙස ඒ ඔහු සවැනි පිරිහෙන්නා යැයි දැන ගතිමු.
භාග්‍යවතුනි, පිරිහෙන්නාගේ සත්වැනි දොරටුව කුමක්දැයි කියනු මැන. (103)

14. (භාග්‍යවතුන් වහන්සේ)
යම් මිනිසෙක් කුල මානයෙන්, ධන මානයෙන්,
ජාති මානයෙන් යුක්තද,
තමාගේ ඥාතීන් පහත් කොට සළකාද,
එය පිරිහෙන්නගේ දොරටුවකි. (104)

15. (දේවතාවිය)
මෙලෙස ඒ ඔහු සත්වැනි පිරිහෙන්නා යැයි දැන ගතිමු.
භාග්‍යවතුනි, පිරිහෙන්නාගේ අටවැනි දොරටුව කුමක්දැයි කියනු මැන.
(105)

16. (භාග්‍යවතුන් වහන්සේ)
ස්ත්‍රී ලොල් වූ, මත්පැනට ලොල් වූ, සූදුවට ලොල් වූ, යම් මිනිසෙක්
ලද දෙය විනාශ කර ගනී ද, එය පිරිහෙන්නාගේ දොරටුවකි.
(106)

17. (දේවතාවිය)
මෙලෙස ඒ ඔහු අටවැනි පිරිහෙන්නා යැයි දැන ගතිමු.
භාග්‍යවතුනි, පිරිහෙන්නාගේ නමවැනි දොරටුව කුමක්දැයි කියනු මැන.
(107)

18. (භාග්‍යවතුන් වහන්සේ)
සිය බිරිඳගෙන් නොසතුටු වූයේ ගණිකාවන් වෙත යයි ද,
අන් අයගේ අඹුවන් කරා යා ද, එය පිරිහෙන්නාගේ දොරටුවකි.
(108)

19. (දේවතාවිය)
මෙලෙස ඒ ඔහු නවවැනි පිරිහෙන්නා යැයි දැන ගතිමු.
භාග්‍යවතුනි, පිරිහෙන්නාගේ දසවැනි දොරටුව කුමක්දැයි කියනු මැන.
109)

20. (භාග්‍යවතුන් වහන්සේ)
තරුණ විය ඉක්ම වූ (වයසට ගිය) පුරුෂයෙක්
යොවුන් තරුණියක් විවාහ කර ගනී ද,
ඇයට ඊර්ෂ්‍යාවෙන් (වෙන කෙනෙකු හා සම්බන්ධ වෙති යි)
නින්දක් නොලබා ද, එය පිරිහෙන්නාගේ දොරටුවකි. (110)

21. (දේවතාවිය)
මෙලෙස ඒ ඔහු දසවැනි පිරිහෙන්නා යැයි දැන ගතිමු.
භාග්‍යවතුනි, පිරිහෙන්නාගේ එකලොස් වැනි දොරටුව කුමක්දැයි
කියනු මැන (111)

22. (භාග්‍යවතුන් වහන්සේ)
(ස්ත්‍රී/පුරුෂ, සුරා, සූදු ආදියට) ඉතා ලොල් වූ, ඒ වෙනුවෙන් ධනය විසුරුවන ස්ත්‍රියක් හෝ එවැනි පුරුෂයෙක් නායක කමේ තබා ද, එය පිරිහෙන්නාගේ දොරටුවකි. (112)

23. (දේවතාවිය)
මෙලෙස ඒ එකලොස්වැනි පිරිහෙන්නා යැයි දැන ගතිමු. භාග්‍යවතුනි, පිරිහෙන්නාගේ දොළොස් වැනි දොරටුව කුමක්දැයි කියනු මැන. (113)

24. (භාග්‍යවතුන් වහන්සේ)
ක්ෂත්‍රීය පවුලක උපන්, අල්ප ධනය ඇති, මහා ආශා ඇති ඔහු, රජකම පතා ද, එය පිරිහෙන්නාගේ දොරටුවකි. (114)

25. ලෝකයේ එම පිරිහෙන්නන් නුවණැත්තා නුවණින් බලා, ආර්ය වූ දර්ශන සම්පත්තිය ඇති ඔහු, සුගතියට පැමිණේ. (115)

1.7 වසල සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී. එක් සමයක භාග්‍යවතුන් වහන්සේ සැවත් නුවර ජේතවනේ අනේපිඬු සිටුහුගේ ආරාමයේ වැඩ වෙසෙති. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පෙරවරුවේ හැඳ පාත්‍ර සිවුරුගෙන පිඬු පිණිස සැවැතට පිවිසියහ. එකල්හි අග්ගික භාරද්වාජ බමුණාගේ නිවසේ හෝම පූජා පිළියෙල කොට ගිනි දල්වන ලද්දේ වෙයි. භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ගෙපිළිවෙලින් පිඬුසිඟා වඩිමින් අග්ගික භාරද්වාජගේ නිවෙසට වැඩි සේක. අග්ගික භාරද්වාජ බමුණා වඩිනා භාග්‍යවතුන් වහන්සේ දුරදීම දැක මෙසේ කීය; ''මුඩුමහණ, ඔතැනම සිටු, ශ්‍රමණය, ඔතැනම සිටු, වසලයා ඔතැනම සිටු.'' මෙසේ කියූ කල්හි භාග්‍යවතුන් වහන්සේ අග්ගික භාරද්වාජ බමුණුට මෙසේ කීය; ''බමුණ, නුඹ වසලයකු හෝ වසලයකු කරවන ධර්ම හෝ දන්නෙහි ද?'' ''භවත් ගෞතමයනි වසලයකු හෝ වසලයකු කරවන ධර්ම හෝ මම නොදනිමි. යම් පරිද්දෙකින් මම වසලයකු හෝ වසලයකු කරවන ධර්ම හෝ දැන ගන්නේ නම් එපරිදි භවත් ගෞතමයන් මට දහම් දෙසන්නේ නම් මැනවි.'' ''එසේ නම් බමුණ අසන්න මැනවින් සිත යොමු කරන්න දේශනා කරමි.'' ''භවත්නි එසේය.''යි අග්ගික භාරද්වාජ බමුණා භාග්‍යවතුන් වහන්සේට පිළිතුරු දුන්නේය. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළහ;

1. යම් මිනිසෙක් කිපෙන සුලු ද, වෛරී ද,
   පාපී වූයේ අනුනගේ ගුණ මකන්නේ ද,
   විපරිත දෘෂ්ඨි ඇති ද, තම වැරදි සඟවන්නේ ද
   ඉන් දැන ගන්න ඔහු වසලයකු බව. (116)

2. යමෙක් මෙහි එක් වරකින් උපන් හෝ
   දෙවරකින් උපන්[1] සත්ත්වයන්ට හිංසා කෙරේ ද
   යමෙකුට ප්‍රාණීන් කෙරෙහි දයාවක් නැති ද
   ඉන් දැන ගන්න ඔහු වසලයකු බව. (117)

3. යමෙක් මරයි ද, ගම් නියංගම් වටලා පැහැර ගනී ද,
   නිග්‍රහ නිසා කුප්‍රසිද්ධ වේද, ඉන් දැන ගන්න ඔහු වසලයකු බව.
   (118)

4. ගමේදී හෝ කැලේදී යමෙකුට අයිති වූ දෙයක්
   නොදුන්නේ, සොරකම් කරයි ද, ඉන් දැන ගන්න ඔහු වසලයකු බව.
   (119)

---

[1] බිත්තර වලින් පහල වන සතුන් ආදිය. ඔවුන්ට උපත් 2කි.

5. යමෙක් නිසැකවම ණයක් ගෙන (හිමිකරු) ඉල්ලනවිට පලායයි ද, ''ඔබට ණයක් නැතැ''යි කියා, ඉන් දැන ගන්න ඔහු වසලයකු බව. (120)

6. යමෙක් ඉතින් යමක් ලබාගැනීමේ ආශාවෙන් මඟ යන ජනයා නසා යමක් ගනී ද, ඉන් දැන ගන්න ඔහු වසලයකු බව. (121)

7. යම් මිනිසෙක් තමා නිසා හෝ අනෙකෙක් නිසා හෝ ධනය නිසා හෝ සාක්ෂි විමසූ කළ බොරු කියා ද, ඉන් දැන ගන්න ඔහු වසලයකු බව. (122)

8. යමෙක් (තමාගේ) ඥාතීන්ගේ හෝ මිතුරන්ගේ අඹුවන් සමඟ බලහත්කාරයෙන් හෝ දෙදෙනාගේ කැමැත්තෙන් හෝ හැසිරේ ද, ඉන් දැන ගන්න ඔහු වසලයකු බව. (123)

9. යමෙක් තරුණ විය පසුකොට මහළු වූ මවට හෝ පියාට බොහෝ (ධනය) ඇත්තේ නමුදු නොසළකා ද, ඉන් දැන ගන්න ඔහු වසලයකු බව. (124)

10. යමෙක් මව හෝ පියා හෝ සොයුරු හෝ සොයුරිය හෝ නැන්දනිය වචනයෙන් පෙළා ද, බණී ද, ඉන් දැන ගන්න ඔහු වසලයකු බව. (125)

11. යමෙක් යහපත (හොඳ දේ) විමසූ කළ අයහපතින් අනුශාසනා කෙරේද රහසින් කතාබස් කෙරේ ද, ඉන් දැන ගන්න ඔහු වසලයකු බව. (126)

12. යමෙක් පාපී ක්‍රියා කොට, එය අන් අය නොදනීවායි පතා ද ඔහු සැඟවුනු (රහස්) කටයුතු ඇත්තෙක් ද, ඉන් දැන ගන්න ඔහු වසලයකු බව. (127)

13. යමෙක් ඉතින් අන් පවුලක් වෙත ගොස් මිහිරි ආහාර වළඳා ඔවුන් (තම නිවසට) ආ විට නොසළකානම්, ඉන් දැන ගන්න ඔහු වසලයකු බව. (128)

14. යමෙක් බමුණෙකු හෝ ශ්‍රමණයකු හෝ වෙනත් දුගියකු බෙරුකියා වංචා කෙරේ ද, ඉන් දැන ගන්න ඔහු වසලයකු බව. (129)

15. යමෙක් කෑම වෙලාවේ පිඬු සිඟා සිටි බමුණෙකුට හෝ ශ්‍රමණයෙකුට
බැණ වදීද, කිසිවක් නොදෙයි ද, ඉන් දැන ගන්න ඔහු වසලයකු බව.
(130)

16. මුළාවෙන් වෙළුනේ යම් කිසිවක් ලබාගනු කැමැත්තේ
බොරු බස් කියා ද, ඉන් දැන ගන්න ඔහු වසලයකු බව. (131)

17. යමෙක් තමුන් උසස් කොට සළකා ද, අනුන් පහත් කොට සළකා ද,
ස්වකීය මානයෙන් ඉතා හීන වූයේ ද, ඉන් දැන ගන්න ඔහු වසලයකු
බව. (132)

18. බණින්නේද, තද ලෝභය, පාපී ආශාවන් මසුරුකම් ඇත්තේද, කපටිද,
පවට බිය ලැජ්ජා[1] නැති ද, ඉන් දැන ගන්න ඔහු වසලයකු බව. (133)

19. යමෙක් බුදුන් වහන්සේට හෝ උන්වහන්සේගේ ශ්‍රාවකයකුට පරිභව
කෙරේ ද,
(එම ශ්‍රාවකයා) පැවිද්දෙක් හෝ ගිහියෙක් වේවා, ඉන් දැන ගන්න ඔහු
වසලයකු බව. (134)

20. යමෙක් නිසැකවම රහත් නොවීම 'රහත්' යැයි ප්‍රකාශ කෙරේ ද,
බඹුන් සහිත ලොව එම සොරා අධම වූ වසලයාය
යමෙක්හු මා විසින් ඔබට ප්‍රකාශ කරන ලද ද, ඔවුනට වසලයන්
යැයි කියන ලදී. (135)

21. උපතින් වසලයකු වන්නේ නැත. උපතින් බ්‍රාහ්මණයකු වන්නේ ද
නැත.
ක්‍රියාවෙන් වසලයකු වෙයි. ක්‍රියාවෙන් බ්‍රාහ්මණයකු වෙයි. (136)

22.යම් මාගේ මේ නිදසුනක් වේ ද, එයින් ද එය දැනගන්න.
බලු මස් උයන සැඬොල් පුතෙක් 'මාතංග' යැයි ප්‍රසිද්ධ වීද (137)

23. ඒ මාතංග ලැබීමට ඉතා දුර්ලභ වූ කීර්තියෙන් කෙළවරට පැමිණියේ
ඔහුට උපස්ථාන කිරීමට බොහෝ බමුණෝ හා ක්ෂත්‍රියෝ පැමිණයහ
(138)

---

[1] කුසල් වන්නේ 'බිය ලැජ්ජා' නොව 'පවට බිය හා ලැජ්ජා'වයි.

24. ඔහු (කෙලෙස්) දූවිලි නැති ශ්‍රේෂ්ඨ මාර්ගය වූ දේවමාර්ගයට නැග, කාමරාගය ගෙවා දමා බ්‍රහ්මලෝකයට පැමිණියේ ය.
කුලය ඔහු බ්‍රහ්ම ලෝකයට යෑම වැළකුවේ නැත. (139)

25. (වේද) ඉගෙනගන්නා පවුලක උපන්, මන්ත්‍ර නෑ වූ බමුණෝ වූ ඔවුහු පාප ක්‍රියා වල නිතර යෙදෙනු පෙනේ. (140)

26. මෙලොවදීම (ඔවුහු) ගැරහිය යුත්තාහ. මරණින් මතු දුගතියේ උපදිත් කුලය ඔවුන් ගැරහීමෙන් හෝ දුගතියට යෑමෙන් වැළකුයේ නැත. (141)

27. උපතින් වසලයෙකු වන්නේ නැත. උපතින් බ්‍රාහ්මණයෙකු වන්නේ නැත.
ක්‍රියාවෙන් වසලයෙකු වෙයි. ක්‍රියාවෙන් බ්‍රාහ්මණයෙකු වෙයි. (142)

මෙසේ කී කල අග්ගික භාරද්වාජ බමුණා භාග්‍යවතුන් වහන්සේට මෙය කීය; ''ඉතා මනහරය. භවත් ගෞතමයනි ඉතා මනහරය. යම් සේ යටිකුරු කරන ලද්දක් උඩුකුරු කරන්නේ ද, වැසුණු දෙයක් විවර කරන්නේ ද, මුළා වූවකුට මාර්ගය කියන්නේ ද, 'ඇස් අත්තෝ රූප දකින්නෝයැ'යි අඳුරේ තෙල් පහනක් දරන්නේ ද, එලෙසින්ම භවත් ගෞතමයන් විසින් නන් අයුරින් ධර්මය දෙසන ලදී. ඒ මම භවත් ගෞතමයන් ද ධර්මය ද භික්ෂු සංඝයා ද සරණ කොට යමි. භවත් ගෞතමයන් මා අද පටන් දිවිහිමියෙන් සරණ ගිය උපාසකයකු ලෙස දරණ සේක්වා.''

1.8 මෛත්‍රී සූත්‍රය

1. තමන්ගේ යහපත (උදාකර ගැනීම) සඳහා දක්ෂයා විසින්
යම් වූ ඒ ශාන්ත තත්වයට (නිවනට) එළඹීමට
කළ යුතු දෑ නම්ඃ සමර්ථයෙකු වීම ද, ඍජු වීම ද, මොනවට ඍජු වීම ද,
කීකරු වීම ද, මෘදු වීම ද, මානාධික නොවීම ද (143)

2. ලද දෙයින් සතුටු වීම ද, දායකයන්ට බරක් නොවීම ද,
අල්ප කටයුතු ඇති බවද, සැහැල්ලු පැවැතුම් ඇති බවද,
සන්සුන් ඉඳුරන් ඇති බවද, නුවණැති ද,
නොගැලපෙන පැවැතුම් නැති ද, දායකයන් කෙරෙහි ගිජු නොවීම ද
යන මේවායි (144)

3. යමක් නිසා නුවණැති අන්‍යයෝ දොස් නගයි ද,
එවැනි කුඩා වූ දෙයක හෝ නොයෙදෙන්නේ ය.
සියලු සත්ත්වයෝ සැපයට පත් වූවෝ වෙත්වා !
සුවපත් වූවෝ, උපද්‍රව නැත්තෝ වෙත්වා! (145)

4. යම් තාක් පණැති සත්ත්වයන් වෙත්ද
ඒ සියළු දෙනා බිය වූ හෝ බිය නැති හෝ
දික් වූ හෝ විශාල වූ හෝ
මධ්‍යම වූත් කුඩා වූත් ඉතා සියුම් හා මහත් වූත් (146)

5. දක්නා ලද්දා වූ හෝ යම් නොදක්නා ලද්දා වූත්,
දුර වසන්නා වූත්, ළඟ වසන්නා වූත්,
ඉපදුනු ද, උපතකට යන්නා වූ ද,
සියළු සත්ත්වයෝ සැපයට පත් වූවෝ වෙත්වා! (147)

6. කිසිවෙක් කිසිවෙකු නොරවටත්වා!
කිසිවෙක් කිසිතැනක කවරෙකුවත් පහත් කර නෙසිතත්වා!
ද්වේශයෙන් ගැටෙනසුළු හැඟීමෙන්
එකිනෙකාට දුකක් කැමති නොවෙත්වා! (148)

7. යම් සේ මවක් තම දරුවා
(තම) එකම දරුවා දිවිපුදා රකීයි ද
එලෙසම සියළු සත්ත්වයන් කෙරෙහි
අප්‍රමාණ වූ (මෛත්‍රී) සිතක් වඩන්නේය (149)

8. උඩ යට සරස බාධා (සීමා) විරහිතව අවෛරී, සතුරන් නැති
අප්‍රමාණ වූ මෛත්‍රී චිත්තය සියළු ලෝකය කෙරෙහි වඩන්නේය.
(150)

9. සිටින්නේ හෝ ඇවිදුනේ හෝ හිඳින්නේ හෝ
හොවින්නේ හෝ යම් තාක් නිදිමතක් නැති ද
(ඒ තාක්) ඒ (මෛත්‍රී) සතිය අධිෂ්ඨාන කරන්නේ ය.
එය මෙලොව බ්‍රහ්ම විහරණය යැයි කියනු ලැබේ. (151)

10. දෘෂ්ඨියකට නොපැමිණ සිල්වත් වූයේ,
(විදර්ශනා) දැක්මෙන් යුක්ත වූයේ,
කාමයන් කෙරෙහි ගිජු බව දුරු කරන්නේ,
නියත ලෙස ගර්භාෂයක හොවින්නට නැවත නොඑන්නේ ය.
(152)

1.9 හේමවත සූත්‍රය

1. (සාතාගිරි යක්ෂ)
අද පසළොස්වක පොහෝ දිනයයි.
දිව්‍යමය රාත්‍රියක් එළඹ සිටියි.
උත්තම නම් වූ ශාස්තෘවර
ගෞතමයන් ඉතින් දකුම්හ. (153)

2. (හේමවත යක්ෂ)
කිම සිත මැනවින් යොදන ලද්දේ ද?
සියලු සතුන් කෙරෙහි සමසිත් ඇති ද?
කිම ඉටු අනිටු දෙයෙහි
සංකල්පනා පාලනය කරන ලද ද? (154)

3. (සාතාගිරි යක්ෂ)
ඔහුගේ සිත මැනවින් යොදවා ඇත. සියළු සතුන් කෙරෙහි සමසිත් ඇත.
තව ද ඉටු අනිටු දෙයෙහි ඔහුගේ සංකල්පනා පාලනය කර ඇත. (155)

4. (හේමවත යක්ෂ)
කිම නොදුන් දේ නොගනී ද? කිම සතුන්ට හිංසා නොකෙරේ ද?
කිම ප්‍රමාදය දුරුකරන ලද ද? කිම භාවනාව අතහැර නැති ද? (156)

5. (සාතාගිරි යක්ෂ)
ඔහු නොදුන් දේ නොගනී. තව ද සතුන්ට හිංසා නොකෙරේ.
තව ද ප්‍රමාදය දුරු කර ඇත. බුදුන් වහන්සේ භාවනාව අත් නොහරී. (157)

6. (හේමවත යක්ෂ)
කිම බොරු නොකියයි ද? කිම රළු බස් නැති ද?
කිම කේලාම් නොකියයි ද? කිම හිස් බස් නොකියයි ද? (158)

7. (සාතාගිරි යක්ෂ)
හෙතෙම බොරු නොකියයි. තව ද රළු බස් නොකියයි.
තව ද කේලාම් කීමක් ද නැත. හෙතෙම නුවණින් සලකා යහපත් දේ කියයි. (159)

8. (හේමවත යක්ෂ)
කිම කාමයන්හි නොඇලේ ද? කිම සිත නොකැළඹුණි ද?
කිම මුළාව ඉක්මවී ද? කිම ධර්මයෙහි නුවණැස් ඇත්තේ ද? (160)

9. (සාතාගිරි යක්ෂ)
ඔහු කාමයන්හි නොඇලේ. තව ද සිත නිසලය.
සියළු මෝහය ඉක්මවා ඇත. බුදුන් වහන්සේ ධර්මයෙහි නුවණැස් ඇත්තේ ය. (161)

10. (හේමවත යක්ෂ)
කිම විද්‍යාවෙන්[1] යුක්ත ද? කිම පිරිසිදු ක්‍රියා පිලිවෙතින්[2] යුක්ත ද?
කිම ඔහුගේ ආශ්‍රව[3] ක්‍ෂීණ ද? කිම පුනර්භවයක් නැති ද? (162)

11. (සාතාගිරි යක්ෂ)
විද්‍යාවෙන් ද යුක්තය. තව ද පිරිසිදු ක්‍රියා පිළිවෙතින් යුක්ත ය.
ඔහුගේ සියළු ආශ්‍රව ක්‍ෂය වී ඇත. ඔහුට පුනර්භවයක් නැත. (163)

12. මුනිවරයාගේ සිත පිරිසිදු කාය-වචී කර්මයෙන් යුක්ත ය.
විද්‍යාචරණ සම්පන්න හෙතෙම ධාර්මිකව පසසන්න. (164)

13. මුනිවරයාගේ සිත පිරිසිදු කාය, වචී කර්මයෙන් යුක්ත ය.
විද්‍යාචරණ සම්පන්න හෙතෙම අනූව ධාර්මිකව සතුටු වන්න. (165)

14. මුනිවරයාගේ සිත පිරිසිදු කාය, වචී කර්මයෙන් යුක්ත ය.
ඉතින් විද්‍යා-චරණ සම්පන්න ගෞතමයන් දකින්නට යම්හ. (166)

15. වැලි මුවකුගෙ බඳු කෙණ්ඩා ඇති, කෘශ, වීර, අල්පාහාර ඇති, ලොල් නැති
කැලයෙහි බවුන් වඩන ගෞතම මුනිවරයා දකින්න යන්න එන්න. (167)

16. තනිව හැසිරෙන සිංහයකු, හස්තියකු බඳු කාමයන් කෙරෙහි අපේක්‍ෂා නැත්තා වෙත එළඹ මාර උගුලෙන් මිදෙන අයුරු විමසමු. (168)

---

[1] ත්‍රිවිද්‍යා - පෙර ජීවිත සිහි කිරීමේ නුවණ, දිවැස, ආශ්‍රව ක්‍ෂය කළ නුවණ
[2] චරණ - ධ්‍යාන ආදිය
[3] ආශ්‍රව 3 - කාම, පැවැත්ම, අවිද්‍යාව

17. (දහම්) දෙසන, පවසන, සියළු ධර්මයන්ගේ පරතෙරට පත්,
බුද්ධ වූ, වෛර බිය ඉක්මවූ, ගෞතමයන් අපි විමසමු. (169)

18. (හේමවත යක්ෂ)
කුමක ලොව උපදී ද? කුමක්හි සබඳතා පවත්වයි ද?
ලෝකයා කුමක් අල්ලගෙන, කුමක ලෝකයා වෙහෙසෙයි ද? (170)

19. (භාග්‍යවතුන් වහන්සේ)
හයෙහි[1] ලොව උපන්නේ, හයහිය සබඳතා පවත්වන්නේ
ලෝකයා හයම අල්ලාගෙන, හයහි වෙහෙසට පත්වෙයි. (171)

20. (හේමවත යක්ෂ)
යම් තැනක ලෝකයා වෙහෙසන ඒ අල්ලා ගැනීම කුමක් ද?
යා යුතු මඟ අසන ලද්දේ කියනු මැන, දුකින් මිදෙන්නේ කෙලෙසද?
(172)

21. (භාග්‍යවතුන් වහන්සේ)
ලෝකයේ පඤ්ච කාමගුණයන් හා හයවනුව මනසත් කියන ලදි.
ඒවා කෙරෙහි කැමැත්ත දුරලා මෙසේ දුකින් මිදෙන්නේ ය.
(173)

22. ලෝකයා යා යුතු ඒ මඟත් නුඹලාට තත් වූ පරිදි කියන ලදි.
'මෙලෙසින් දුකින් මිදෙයි' යන්න ද නුඹලට මම පවසමි. (174)

23. (හේමවත යක්ෂ)
මෙලොව කවරෙක් සැඩපහර තරණය කරයි ද?
මෙහි කවරෙක් සයුරෙන් එගොඩ වෙයි ද?
(යමක) ප්‍රතිශ්ඨාවක් නැතිව, (යමක) එල්ලෙන්නේ නැතිව
කවරෙක් ගැඹුරු දියේ නොගිලෙයි ද? (175)

24. (භාග්‍යවතුන් වහන්ස)
සැමදා සිල්වත් වූයේ, නුවණැති, සමාහිත සිතක් ඇති
ඇතුලට යොමු වුනු සිත් ඇති, සතිමත් කෙනා තරණය කිරීමට
දුෂ්කර සැඩපහර තරණය කරයි. (176)

---

[1] ඇස, කන, නහය, දිව, කය, මනස

25. කාම සඤ්ඤාවෙන් වෙන් වූයේ, සියළු බන්ධන ඉක්මවූයේ
(කාමයන්ගෙන්) සතුටු වීමත්, පැවැත්මත් සම්පූර්ණයෙන් ක්ෂය කළ
ඔහු ගැඹුරු දියේ නොගිලෙයි. (177)

26. (හේමවත යක්ෂ)
ගැඹුරු ප්‍රඥාවක් ඇති, අරුත් දැක්වීමෙහි දක්ෂ
කිසිවක් (අයිති) නැති, කාමභවයේ නොඇළුණු
සියළු තැනින් විමුක්ත වූ
දිව්‍යමය මාර්ගයෙහි යන ඒ මහා සෘෂීන් බලව (178)

27. උත්තම නම් වූ, අරුත් දැක්වීමෙහි දක්ෂ,
ප්‍රඥාව දෙන, කාම නිවසෙහි නො ලැගුණ,
සියල්ල දත්, ඉතා නුවණැති, උතුම් මාර්ගයේ යන
ඒ මහා සෘෂීන් බලව (179)

28. සැඩපහර තරණය කළ,
ආශ්‍රව රහිත යම් සම්බුදුවරයෙකු අද දුටිමු ද
එය අපට මනා වූ දර්ශනයකි.
සොඳුරු උදෑසනකි. ශෝබන පිබිදීමකි. (180)

29. සෘද්ධිමත්, කීර්තිමත් මේ දහසක් වූ සියළු යක්ෂයො
ඔබ සරණ කොට යෙති. ඔබ අපගේ උත්තරීතර ශාසතෘන් ය.
(181)

30. සම්බුදුන් වහන්සේටත්, ධර්මයේ විශිෂ්ඨ භාවයටත් නමදිමින්
ඒ අපි ගමින් ගමටත්, කන්දෙන් කන්දටත් යම්හ.
(182)

1.10 ආලවක සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී. එක් සමයක භාග්‍යවතුන් වහන්සේ ආලවිහි ආලවක යකුගේ භවනෙ වැඩ වෙසෙති. ඉක්බිති ආලවක යකු භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ මෙසේ කීයඃ ''මහණ, නික්ම යව.'' ''හොඳයි ඇවැත්නි''යි භාග්‍යවතුන් වහන්සේ නික්මුණු සේක. ''මහණ ඇතුල් වෙව.'' ''හොඳයි ඇවැත්නි''යි භාග්‍යවතුන් වහන්සේ පිවිසි සේක. දෙවනුවද ආලවක යකු මෙසේ කීයඃ ''මහණ නික්ම යව.'' ''හොඳයි ඇවැත්නි''යි භාග්‍යවතුන් වහන්සේ නික්මුණු සේක. ''මහණ ඇතුල් වෙව.'' ''හොඳයි ඇවැත්නි''යි භාග්‍යවතුන් වහන්ස පිවිසි සේක. තෙවනුව ද ආලවක යකු මෙසේ කීයඃ ''මහණ නික්ම යව.'' ''හොඳයි ඇවැත්නි''යි භාග්‍යවතුන් වහන්සේ නික්මුණු සේක. ''මහණ ඇතුල් වෙව.'' ''හොඳයි ඇවැත්නි''යි භාග්‍යවතුන් වහන්සේ පිවිසි සේක. සතරවනුව ද ආලවක යකු මෙසේ කීයඃ ''මහණ නික්ම යව.'' ''ඒ කී පමණින් මම නොයමි. ඔබට පුළුවන් දෙයක් ඇත්නම් එය කරව.'' ''මහණ, නුඹෙන් ප්‍රශ්නයක් අසමි. ඉදින් මට උත්තර නොදෙන්නේ නම් නුඹේ සිත වික්ෂිප්ත කරමි. නුඹේ හදවත හෝ පලා දමමි, පාද වලින් ගෙන ගංගා නදියෙන් එතෙරට හෝ විසි කරමි.'' ''ඇවැත්නි දෙවියන් සහිත ලෝකයෙහි මරුන් සහිත බඹුන් සහිත ශ්‍රමණ බ්‍රාහ්මණයින් සහිත දෙව් මිනිසුන් සහිත ප්‍රජාවෙහි යමෙක් මාගේ සිත වික්ෂිප්ත කරයි ද, හදවත හෝ පලයි ද, පා වලින් ගෙන ගංගා නදියෙන් එතෙරට විසි කරයි ද, එවැන්නකු නොදකිමි. නමුත් ඇවැත්නි නුඹට යම් සැකයක් ඇත්නම් විමසන්න.'' ඉක්බිති ආලවක යකු භාග්‍යවතුන් වහන්සේට ගාථාවෙන් මෙය කීයඃ

1. පුරුෂයෙකුට මෙලොව ඇති ශ්‍රේෂ්ඨම ධනය කුමක්ද?
   කුමක් පුරුදු කළ කල්හි සැප ගෙන දේද?
   රසයන් අතර මිහිරිම රසය කුමක්ද?
   කෙසේ ජීවත් වන්නාගේ ජීවිතය ශ්‍රේෂ්ඨ යැයි කියනු ලැබේද?
   (183)

2. (භාග්‍යවතුන් වහන්සේ)
   පුරුෂයෙකුට මෙලොව ඇති ශ්‍රේෂ්ඨම ධනය ශ්‍රද්ධාවයි.
   ධර්මය පුරුදු කළ කල්හි සැප ගෙන දේ.
   රසයන් අතර මිහිරිම රසය සත්‍යයයි.
   ප්‍රඥාවෙන් ජීවත් වන්නාගේ ජීවිතය ශ්‍රේෂ්ඨ යැයි කියති. (184)

3. (ආලවක යකු)
සැඩ පහර කෙසේ තරණය කරන්නද?
සයුර කෙසේ තරණය කරන්නද?
දුක ඉක්මවා යන්නේ කෙසේද?
පාරිශුද්ධිය කෙසේ ලැබේද? (185)

4. (භාග්‍යවතුන් වහන්සේ)
ශ්‍රද්ධාවෙන් සැඩ පහර තරණය කෙරේ, අප්‍රමාදයෙන් සයුර ද.
වීර්යයෙන් දුක ඉක්මවා යේ. ප්‍රඥාවෙන් පාරිශුද්ධිය ලැබේ. (186)

5. (ආලවක යකු)
ප්‍රඥාව කෙසේ ලබා ද? ධනය කෙසේ ලැබේ ද?
කීර්තිය කෙසේ පැමිණෙන්නේ ද? මිත්‍රයන් බැඳගන්නේ කෙසේ ද?
මෙලොවින් පරලොව ගොස් මරණින් මතු කෙසේ ශෝක නොකෙරේ ද ? (187)

6. (භාග්‍යවතුන් වහන්සේ)
රහතුන් විශ්වාස කරගෙන, අප්‍රමාදීව, විචක්ෂණශීලීව
නිවනට පත්වීමට දහම් අසන්නාට ප්‍රඥාව ලැබේ. (188)

7. ගැලපෙන ලෙස වෙහෙස යොදවා ක්‍රියාකරන උත්සාහවන්තයට ධනය ලැබේ
සත්‍ය කතාකිරීමෙන් කීර්තිය පැමිණේ, මිත්‍රයන් බැඳ තබන්නේ දීමයි. (189)

8. එම ධර්ම සතර ශ්‍රද්ධාවන්ත ගිහිගෙයි වසන යමෙකුට ඇත්නම් සත්‍යය ධර්මය උත්සහය ත්‍යාගය, හේ ඒකාන්තයෙන් පරලොව ශෝක නොකරයි (190)

9. ඉදින් සත්‍යය, ධර්මය[1] ත්‍යාගය ඉවසීම (වීර්යය) ට වැඩි දෙයක් ඇත්දැයි කැමතිනම් අන්‍ය බොහෝ ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගෙන් විමසා බලව. (191)

---

[1] 'ධමා'ලෙස ගතිමි

10. (ආලවක යකු)
දැන් ඉතින් කුමට බොහෝ ශ්‍රමණ බ්‍රාහ්මණයන්ගෙන් විමසන්න ද?
පරලොව යහපතක් ගෙන දෙන දෙයක් ඇත්නම්, අද මම එය
දැනගතිමි. (192)

11. මට යහපත පිණිසමයි බුදුහු අලවු පුර වාසයට පැමිණියේ.
කවරකුට දුන් දෙය මහත්ඵල වන්නේදැයි අද මම දැනගතිමි. (193)

12. සම්බුදුන් වහන්සේටත් ධර්මයේ විශිෂ්ඨභාවයටත් නමදිමින්
ඒ මම ගමින් ගමට, නගරයෙන් නගරයට යන්නෙමි. (194)

මෙසේ කී කල ආලවක යක්ෂයා භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීයඃ ''ඉතා මනහරය භවත් ගෞතමයනි, ඉතා මනහර ය. යම් සේ යටිකුරු කරන ලද්දක් උඩුකුරු කරන්නේ ද, වැසුණු දෙයක් විවර කරන්නේ ද, මුළා වූවකුට මාර්ගය කියන්නේ ද, 'ඇස් අත්තෝ රූප දකින්නෝ යැ'යි අඳුරේ තෙල් පහනක් දරන්නේ ද, එලෙසින්ම භවත් ගෞතමයන් විසින් නන් අයුරින් ධර්මය දෙසන ලදී. ඒ මම භවත් ගෞතමයන් ද ධර්මය ද භික්ෂු සංඝයා ද සරණ කොට යෙමි. භවත් ගෞතමයන් මා අද පටන් දිවිහිමියෙන් සරණ ගිය උපාසකයකු ලෙස දරණ සේක්වා.''

1.11 විජය සූත්‍රය

1. යන්නේ හෝ සිටින්නේ හෝ හිඳින්නේ හෝ හොවින්නේ හෝ
   දිගහරියි ද හකුළුවයි ද එය කයේ සෙලවීමක් පමණයි. (195)

2. නහරින් බැඳුනු ඇටවල, මස් හා සම අලවා ඇත.
   (ඒ) කය සිවියෙන් වසා ඇත. (මේ නිසා) ඇති සැටියෙන් නොපෙනේ.
   (196)

3. බඩ වැලින් පිරුණු, වමනයෙන පිරුණු, අක්මාවෙන් ද, මුත්‍රාශයෙන් ද,
   හෘදය පෙනහළු වකුගඩු බඩ දිවෙන් ද (197)

4. සොටු කෙළ දහදිය මේදය ද
   ලෙයින් ද සඳමිඳුලෙන් ද පිතෙන් ද තෙලින් ද යුක්ත ය. (198)

5. යලිත් නව දොරින් සැමදා අසූචි ගලයි.
   ඇසින් කබත්, කනින් කලාඳුරු ද ගලයි. (199)

6. නහයෙන් සොටු ද ඇතැම් දින කටින් වමනයත් ගලයි.
   පිතත් සෙමත් වමනය කරයි. කයින් දහදියත් වැගිරෙයි. (200)

7. යලිත් සිදුරු සහිත හිස මොලයෙන් පිරී ඇත.
   අවිද්‍යාව පෙරටු කර ගත් මෝඩයා එය ශුභ යැයි හඟී. (201)

8. යම් කලෙක ඔහු මියගොස් ඉදිමී නිල්වී නිදයි ද,
   අමු සොහොනක බැහැර කරන ලද්දේ ඥාතීහු අපේක්ෂා රහිත වෙත්.
   (202)

9. එය බල්ලන් ද හිවලුන් ද වෘකයන් ද කා දමති.
   කපුටන් ද, ගිජුලිහිණියන් ද යම් වෙනත් ප්‍රාණීන් ඇත්ද ඔහු ද ඒ කති.
   (203)

10. මෙහි නුවණැති භික්ෂුවක් බුද්ධ වචනය අසා
    ඔහු එය මැනවින් දැනගනී, ඇති සැටියෙන් දකී. (204)

11. මෙය යම් සේද එය ද එසේය. එය යම් සේද මෙයත් එසේය.
    අභ්‍යන්තර වූත් බාහිර වූත් කය කෙරෙහි කැමැත්ත දුරුලයි. (205)

12. මෙහි ඒ නුවණැති භික්ෂුව ඡන්ද-රාග දුරු කළේ
අමෘත ශාන්තිය වූ චුතියක් නැති නිවනට පැමිණෙයි. (206)

13. (නව දොරින්) ඒ ඒ තැන විසුරුවන, නොයෙක් කුණපයෙන්
පිරුණු, දුගඳ හමන අසූචි (කය) දෙපා ඇත්තා පරිහරණය කරයි.
(207)

14. එවැනි කයකින් යුක්තව යමෙක් තමා උසස් කොට සිතයි ද
අනෙක් අය පහත් කොට සිතයි ද, ඒ නොදන්නා කම මිස වෙන
කුමක්ද? (208)

1.12 මුනි සූත්‍රය

1. සබඳතා පැවැත්වීමෙන් බිය උපදී.
ගෘහයෙන් (කෙලෙස්) දූවිලි හටගණී.
ගෙයක් නොමැති සබඳතා නැති
ඒ තත්වය මුනිවරයන්ගේ දර්ශනයයි. (209)

2. යමෙක් හටගත් දෙය මුලින් උදුරා දමයි ද, නැවත රෝපනය
නොකෙරේ ද,
උපදින දේටත් (ඉපදීමට) ඉඩ නොදෙයි ද,
ඔහුට තනිව හැසිරෙන මුනිවරයා යැයි කියන්නේ ය.
ඒ මහා ඍෂි තෙමේ ශාන්ත තත්වය දක්නා ලදී. (210)

3. (පැලවෙන) බිම් නුවණින් දැන බීජය නසා
ඊට තෙතමනය නොදෙයි ද[1]
නියතව ඉපදීම සම්පූර්ණයෙන් ක්‍ෂය කළ ඒ මුණිවරයා
තර්කය දුරලා ගිණීමකට නොඑයි. (211)

4. සියළුම නිවෙස් දැන[2]
ඒ අතරින් එකකුදු නොකැමැත්තේ
ගිජුකම දුරලා ගිජු නොවූයේ, සැබැවින්ම මුනි වූ ඔහු
පරතෙරට ගොස් ඇත. එබැවින් වෙර නොයොදයි. (212)

5. සියල්ල යටපත් කළ, සියල්ල දත්, නුවණැති
සියළු ධර්මතාවන්හි නොඇලුනු
සියල්ල අත්හල , ආශාව ක්‍ෂය කිරීමෙන් විමුක්ත වූ
ඔහු ද මුනිවරයෙකැයි නුවණැත්තෝ ප්‍රකාශ කරති. (213)

6. ප්‍රඥා බලය ඇති, (ප්‍රාතිමෝක්‍ෂය නම්) ශීල ව්‍රතයට පැමිණි
සමාහිතව භාවනාවේ ඇළුන, සතිමත්
බැඳීම් වලින් මිදුනු, (කෙලෙස්) උල් නැති, ආශ්‍රව නැති
ඔහු ද මුනිවරයෙකැයි නුවණැත්තෝ ප්‍රකාශ කරති. (214)

---

[1] බිම් - උපදින ලෝක (කාම රූප අරූප), බීජය - විඥ්ඥාණය, තෙතමනය - තණ්හාව

[2] උපදින ස්ථාන

7. අප්‍රමාදී වූ තනිව හැසිරෙන මුනිවරයා
නින්දා ප්‍රශංසා වලින් නොසැලෙන්නේ
සිංහයකු සේ ශබ්ද වලින් බිය නොවෙමින්
සුළඟක් දැලෙහි නොපැටලෙන්නා සේ (කිසිවක) නොපැටලෙමින්
නෙළුමක් දියෙන් නොතැවරෙන්නා සේ (කිසිවක) නොතැවරෙමින්
අන් අය (නිවනට) පමුණුවන, වෙන අය විසින් (ඔහුව නිවනට)
පැමිණවීමක් නැත්තේ
ඔහු ද මුනිවරයෙකැයි නුවණැත්තෝ ප්‍රකාශ කරති. (215)

8. යමෙක් නානතොට කණුවක් සේ ස්ථිරව සිටී ද
අන් අය යමෙක් කෙරෙහි භාෂාව කෙළවරට පැමිණියේ යැයි කියත්ද[1]
ඒ රාගය දුරු කළ, මැනවින් සන්සුන් ඉඳුරන් ඇති
ඔහුද මුනිවරයෙකැයි නුවණැත්තෝ ප්‍රකාශ කරති. (216)

9. යමෙක් (ඔහුගේ සිත) සැබැවින්ම ස්ථිරව නැවතුනි ද,
(පිළිවියන) තරස් දණ්ඩක් සේ ඍජු වී ද
පාප කර්ම පිළිකුල් කෙරේ ද
සම (හොඳ) හා විසම (නරක) විමසන්නේ ද
ඔහු ද මුනිවරයෙකැයි නුවණැත්තෝ ප්‍රකාශ කරති. (217)

10. තරුණ හෝ මැඳුම් වියේ හෝ වූ සැබැවින්ම මුනිවරයෙකු වූ ඔහු
සංයත වූයේ ද, පව්කම් නොකරයි ද
කුපිත නොවන්නේ, ඔහු වෙන කෙනෙකු ද කුපිත නොකරන්නේ
ඔහු ද මුනිවරයෙකැයි නුවණැත්තෝ ප්‍රකාශ කරති. (218)

11. යම් අග්‍ර දෙයක් හෝ සාමාන්‍ය හෝ ඉතුරු වූ දෙයක් හෝ
අනුන් දුන් දෙයින් යැපෙන ඔහුට පිඬු ලෙස ලැබේ ද
(එය) පැසසීමට හෝ හෙලා දැකීමට නොයන්නේ
ඔහු ද මුනිවරයෙකැයි නුවණැත්තෝ ප්‍රකාශ කරති. (219)

---

[1] ඔහුගේ තත්වය කීමට වචන නැත. වචන පථය ඉක්මවා ඇත.

12. මුනිවරයා මෛථුනයෙන් වැලකී හැසිරෙන්නේ,
යමෙක් තරුණ වුව ද කිසිවක නොබැඳේ ද
ගැලී සිටීමෙන් හා ප්‍රමාදයෙන් වෙන්වූයේ, මැනවින් විමුක්ත ද
ඔහු ද මුනිවරයෙකැයි නුවණැත්තෝ ප්‍රකාශ කරති. (220)

13. ලෝකය දැන, පරම යහපත (නිවන) දකින්නේ,
සැඩ පහර හා සයුර තරණය කළ, නොවෙනස් වන,
බන්ධන සිඳලූ, (කිසිවක්) ඇසුරු නොකළ, ආශ්‍රව නැති
ඔහු ද මුනිවරයෙකැයි නුවණැත්තෝ ප්‍රකාශ කරති. (221)

14. අසමාන වූ දෙදෙනාගෙන්[1] ඈත්ව වාසය කිරීම හා හැසිරීම ඇද්ද
ගිහියන් අඹුව පෝෂණය කරයි. මගේ යැයි කිසිවක් නැත්තා
(පැවිද්දා) හට මනා සිල් ව්‍රත ඇත්තේ ය.
ගිහියන් පරපණ නැසීමෙහි ආසංයත වෙයි.
සංයත වූ මුනිවරයා නිතරම ප්‍රාණීන් රකියි. (222)

15. යම් සේ නිල් ගෙලක් ඇති පක්ෂියකු වූ මොණරා
කිසි කලෙක හංසයාගේ වේගයට නොපැමිණේ ද
එලෙසම (කාය, චිත්ත) විවේකීව කැලයේ භාවනා කරන මුනි වූ
භික්ෂුව (කිසි කලෙකත්) ගිහියනට අනුකරණය කළ නොහැක.
(223)

[1] එනම් ගිහි හා පැවිදි.

2 . කුඩා පරිච්ඡේදය

2.1 රතන (මැණික්) සූත්‍රය

1. භූමියෙහි හෝ වේවා අහසෙහි හෝ වේවා
මෙහි රැස් වූ යම් තාක් සත්ත්වයන් ඇද්ද
ඒ සියලු සත්ත්වයෝ සතුටු සිත් ඇත්තෝ වෙත්වා!
තවද මේ කියන දේට සැළකිල්ලෙන් සවන් දෙන්න. (224)

2. එසේ හෙයින් සියළු සත්ත්වයෝ ඇහුම් කන් දෙත්වා!
මනුෂ්‍ය ප්‍රජාවට මෛත්‍රී කරන්න.
දිවා ද රාත්‍රී ද යමෙක්හු (නුඹලාට) පුද පූජා කෙරේද
එමනිසා ඔවුන්ව අප්‍රමාදීව රකින්න. (225)

3. මෙලොව හෝ අන්ලොවක හෝ යම් වටිනා ධනයක් ඇද්ද
ස්වර්ගයෙහි හෝ යම් වටිනා මැණිකක් ඇද්ද
තථාගතයන් හා සම වූ දෙයක් නම් නැත.
මෙයද බුදුරදුන් කෙරෙහි ඇති ඉතා වටිනා රුවනකි.
එම සත්‍යයේ බලයෙන් සුවපත් වේවා! (226)

4. (කෙලෙස්) ක්‍ෂය කිරීමක්, නොඇලීමක්, අමෘත වූ, ප්‍රණීත වූ යමක්
සමාහිත ශාක්‍ය මුනිවරයා සාක්‍ෂාත් කළේද
එම (නිවන්) ධර්මය හා සම වූ කිසිවක් නැත.
මෙයද ධර්මයෙහි ඇති ඉතා වටිනා රුවනකි.
එම සත්‍යයේ බලයෙන් සුවපත් වේවා! (227)

5. බුද්ධ ශ්‍රේෂ්ඨයන් පිරිසිදු යැයි යමක් බොහෝ වර්ණනා කළේ ද
(එයට) ආනන්තරික සමාධිය යැයි කියන ලදද
එම සමාධියට සම වූ වෙනත් දෙයක් නම් නැත.
මෙයද ධර්මයෙහි ඇති ඉතා වටිනා රුවනකි.
එම සත්‍යයේ බලයෙන් සුවපත් වේවා! (228)

6. සත්පුරුෂයන් විසින් පසසන ලද යම් පුද්ගලයෝ අට දෙනෙක් වෙත්ද
යුගල වශයෙන් එහි සතරක් වෙත්.
සුගතයන් වහන්සේගේ ඒ ශ්‍රාවකයෝ පුදපූජා ලැබීමට සුදුසුය.
ඔවුනට දුන් දේ මහත්ඵල වන්නාහ.
මෙයද සංඝයා කෙරෙහි ඇති ඉතා වටිනා රුවනකි.
එම සත්‍යයේ බලයෙන් සුවපත් වේවා! (229)

7. යමෙක්, මැනවින් යෙදුනෝ, දැඩි වූ සිතින්
ගෞතම ශාසනයෙහි නික්ම ගියාහුද
ඔවුහු (ලද යුතු) සමාපත්තියට පැමිණ, අමෘතයට බැසගෙන
නොමිලේම ලද සැනසිල්ල රස විඳිති.
මෙයද සංඝයා කෙරෙහි ඇති ඉතා වටිනා රුවනකි.
එම සත්‍යයේ බලයෙන් සුවපත් වේවා! (230)

8. යම් සේ පොළොවෙහි සිටවූ ඉන්ද්‍රඛීලයක්
සතර දිගින් එන සුළඟට සෙලවිය නොහැකිද
යමෙක් ආර්ය සත්‍යය අවබෝධයෙන් දකීද
එම සත්පුරුෂයාද එවැනි උපමා ඇතැයි කියමි.
මෙයද සංඝයා කෙරෙහි ඇති ඉතා වටිනා රුවනකි.
එම සත්‍යයේ බලයෙන් සුවපත් වේවා! (231)

9. ගැඹුරු ප්‍රඥාවක් ඇත්තා විසින් මැනවින් දේශිත
ආර්ය සත්‍යය යමෙක් මැනවින් අවබෝධ කෙරේද
ඔවුහු බොහෝ ප්‍රමාදයට පත්වූයේ නමුදු
ඔවුහු අට වැනි භවයකට නම් නොයති.
මෙයද සංඝයා කෙරෙහි ඇති ඉතා වටිනා රුවනකි.
එම සත්‍යයේ බලයෙන් සුවපත් වේවා! (232)

10. ඔහුට දර්ශන සම්පත්තිය[1] ලැබෙනවාත් සමඟ
සක්කාය දෘෂ්ඨියද, (ධර්ම මාර්ගයේ) සැකයද (විචිකිච්ඡා),
සීල ව්‍රෘත දැඩිව ගැනීමදැයි යම් කිසිවක් ඇතිද
ඒ ධර්ම තුන බැහැර කරන ලද්දේ වෙයි.
සතර අපායෙන්ද මැනවින් මිදුනේ
තැන් සයක්[2] කිරීමට නොපුළුවන් වූයේ වෙයි[3].
මෙයද සංඝයා කෙරෙහි ඇති ඉතා වටිනා රුවනකි.
එම සත්‍යයේ බලයෙන් සුවපත් වේවා! (233)

11. කයින් වචනයෙන් හෝ සිතින්
ඔහු විසින් පාප කර්මයන් කරන ලද්දේ නමුදු
ඔහුට එය සඟවා තබා ගැනීමට නොහැකිය.
ඒ නොහැකි බව සම්මා දිට්ඨිය ඇත්තා[4] කෙරෙහි කියන ලදී.
මෙයද සංඝයා කෙරෙහි ඇති ඉතා වටිනා රුවනකි.
එම සත්‍යයේ බලයෙන් සුවපත් වේවා! (234)

12. ගිම්හාන ඍතුවේ පළමු වැනි ගිම්හාන මාසේ
මල් අග පිපුන වන ගොමුවක් වැනි
එවැනි උපමා ඇති පරම හිතසුව පිණිස වූ
නිර්වාණගාමී උතුම් ධර්මයක් දේශනා කළහ.
මෙයද බුදුරදුන් කෙරෙහි ඇති ඉතා වටිනා රුවනකි[5].
එම සත්‍යයේ බලයෙන් සුවපත් වේවා! (235)

---

[1] එනම් සෝවාන් ඵලය

[2] ආනන්තරිය කර්ම 5 සහ වෙන ශාසතෘවරයකු සරණ යාම

[3] මෙම පේලි 2 'මහාවස්තු' වල එන රතන සූත්‍රයේ දක්නට නැත. සූත්‍ර වල එන්නේ අපාය තුනක් පමණි. එය සතරක් වූයේ පසු කාලීනවය.

[4] එනම් සෝවාන් වූ පුද්ගලයා

[5] ගිම්හාන ඍතුවේ පළමුවැනි ගිම්හාන මාසයේ, අග පිපුනු මල් ඇති මල් ගොමුවක් සුළඟින් සෙලවී සුවඳ හමාද, එලෙසින්ම බවුන් වඩන බුද්ධ පුත්‍රයන් වහන්සේලා ශීලයට එළඹ, සිල් සුවඳ හමයි. මෙයද සංඝයා කෙරෙහි ඇති වටිනා රත්නයකි - මහාවස්තු

13. උතුම් වූ, උතුම් දේ දන්නා වූ, උතුම් දේ දෙන, උතුම් දේ ගෙන එන,
උත්තරීතර වූවා විසින් උතුම් ධර්මය දේශනා කරන ලදි.
මෙයද බුදුරදුන් කෙරෙහි ඇති ඉතා වටිනා රුවනකි[1].
එම සත්‍යයේ බලයෙන් සුවපත් වේවා! (236)

14. පැරණි දේ ක්‍ෂය විය, අළුතින් හටගැනීමක් නැත.
අනාගත භවයක පහ වූ ආශා ඇත්තේ
වැනසුනු බීජ ඇති ඔවුහු (නැවත) වැඩීමට ආශාවක් නැත්තේ
පහනක් නිවී යන්නා සේ ඒ නුවණැත්තෝ නිවී යති.
මෙයද සංඝයා කෙරෙහි ඇති ඉතා වටිනා රුවනකි.
එම සත්‍යයේ බලයෙන් සුවපත් වේවා! (237)

15. භූමියෙහි හෝ වේවා අහසෙහි හෝ වේවා
මෙහි රැස් වූ යම් තාක් සත්ත්වයන් ඇද්ද
දෙව් මිනිසුන් විසින් පූජිත තථාගත
බුදුරදුන් නමදිමු. සුවපත් වේවා! (238)

16. භූමියෙහි හෝ වේවා අහසෙහි හෝ වේවා
මෙහි රැස් වූ යම් තාක් සත්ත්වයන් ඇද්ද
දෙව් මිනිසුන් විසින් පූජිත තථාගත
ධර්මය නමදිමු. සුවපත් වේවා! (239)

17. භූමියෙහි හෝ වේවා අහසෙහි හෝ වේවා
මෙහි රැස් වූ යම් තාක් සත්ත්වයන් ඇද්ද
දෙව් මිනිසුන් විසින් පූජිත තථාගත
සංඝයා නමදිමු. සුවපත් වේවා! (240)

[1] දැල්වෙන ගින්නක් ඉන්ධන ඉවර වීමෙන් සෙලවී නිවී යන්නේ යම්සේද, එලෙසින්ම බවුන් වඩන බුද්ධ පුත්‍රයන් වහන්සේලා ප්‍රඥාවෙන් රාග අනුශය ගෙවා දමා, මාර රජුගේ ආදර්ශනයට යති. මෙයද සංඝයා කෙරෙහි ඇති වටිනා රත්නයකි - මහාවස්තු

2.2 'පිළිගඳ' සූත්‍රය

1. (තිස්ස බ්‍රාහ්මණ)
බොඩහොමුය, කර හමුය, චීනමුංය
පළා කොළය, අල වර්ගය, රුක් පලතුරුය
ධාර්මිකව ලද්දේ, (එම ආහාර) පමණක් වළඳමින්
(රස) කාමයට ආසාවක් නැත්තේ, (ඔවුහු) බොරු නොකියති (241)

2. අන් අය විසින් දෙන ලද, පිරිසිදු, ප්‍රණීත වූ
මැනවින් පිළියෙල කළ, මැනවින් සාදන ලද්ද යමෙක් රස විඳින්නේ
හැල් සහලේ බත් වළඳන
ඔහු, කාශ්‍යප, පිළිගඳ වළඳයි. (242)

3. මැනවින් පිළියෙල කළ කුරුළු මස් සමග
හැල් සහලේ බත් වළඳන ඔබ
'මට පිළිගඳ කැප නැතැ'යි යන්න
බ්‍රහ්ම-ඥාති වූ ඔබ පවසන්නෙහිය.
කාශ්‍යපය, ඔබගෙන් මේ කරුණ විමසමි,
ඔබගේ පිළිගඳ කවර ආකාරද? (243)

4. (කාශ්‍යප බුදුරදුන්)
ප්‍රාණ ඝාතය, වධදීම, (අත් පා) සිඳීම, සිරකිරීම,
සොරකම, බොරුව, රැවටිලි, වංචා,
හිතකර නොවන දෑ ඉගෙනීම, අන් අයගේ අඹුවන් වෙත යෑම,
පිළිගඳ එයයි. මස් ව්‍යංජනය නොවේ (244)

5. මෙහි යම් ජනයෙක් කාමයන් ඇසුරු කිරීමේ දී සංයමයක් නැතිද
රසයෙහි ගිජු වූ, අපවිත්‍ර (කටයුතු ආදිය) හා මුසු වූ,
නාස්තික දෘෂ්ඨිය, විෂම (පාප) ක්‍රියා ඇති, කරුණු පෙන්වා දිය
නොහැක්කේ ද
පිළිගඳ එයයි. මස් ව්‍යාංජනය නොවේ (245)

6. යමෙක් ගෙරෝසු, දරුණු, පිටමස් කන[1]
මිත්‍ර ද්‍රෝහී, කරුණාවක් නැති, අධික මාන්නයක් ඇති,
මසුරු වූවෝ කාටවත් යමක් නොදෙත් ද
පිළිගඳ එයයි. මස් ව්‍යාංජනය නොවේ (246)

---

[1] සිටින තැන ගුණ කියා නැති තැන දොස් කීම

7. ක්‍රෝධයද, (යමක) ගැලී සිටීමද, දැඩි බවද, විරුද්ධව නැඟී සිටීමද,
ඊවටිල්ල, ඉරිසියාව, තමා උසස් කොට කතා කිරීමද,
අධික මානයද, අසත්පුරුෂ ඇසුරද
පිළිගඳ එයයි. මස් ව්‍යාංජනය නොවේ. (247)

8. යමෙක් පාප ක්‍රියා වල නියැලේ ද, ණය ගෙන නොදේ ද,
කූට වෙළඳාම් ඇතිද, මෙහි වැරදි ක්‍රියා ඇතිව හොඳ කෙනෙකු සේ පෙනී සිටී ද,
අධම මිනිසෙකුව මෙලොව දුෂ්ඨ ක්‍රියා කෙරේ ද,
පිළිගඳ එයයි. මස් ව්‍යාංජනය නොවේ. (248)

9. යම් ජනයෙක් මෙහි සත්ත්වයන් කෙරෙහි සංයමයක් නැතිද (මරයිද)
අනුන්ගේ දේ පැහැරගෙන කරදර කිරීමේ උත්සහවත් වේද
දුස්සීල, කුරිරු වූ, සැඩපරුෂ, මෛත්‍රියක් නැතිද
පිළීගඳ එයයි. මස් ව්‍යාංජනය නොවේ. (249)

10. ඔවුන් (ප්‍රිය වූවන්) කෙරෙහි ගිජු වූ, විරුද්ධවාදීන් නසන
(එසේ කිරීමට) නිතර උත්සහවත් වූ ඒ යමෙක් මරණින් මතු අඳුරට යත් ද,
ඒ සත්ත්වයෝ හිස යටිකුරුව නිරයේ වැටෙත්.
පිළීගඳ එයයි. මස් ව්‍යාංජනය නොවේ. (250)

11. මස්මාළු නොවේ, ආහාර උපවාසයද නොවේ
නිරුවත නොවේ, තට්ටය ජටාදැරීම දූවිලි ඇඟ තවරා සිටීමද නොවේ
හම් පෙරවීම හෝ ගිනි පිදීමේ යෙදීමද නොවේ
ලෝකයේ වෙනත් යම් බොහෝ ආකාර තපස් වේද
වේදමන්ත්‍ර, හෝම යාඥා, කලින් කල කරන වෘත වලින්ද නොවේ
සැකය නොඉක්මවූ මිනිසා පිරිසිදු කරනුයේ (251)

12. (සය) ඉන්ද්‍රියයන් අවබෝධ කරගෙන, ඊකගත් දිය පහරවල් (ඉන්ද්‍රිය) ඇතිව හැසිරෙන
ධර්මයේ පිහිටියේ, ඍජු බවෙහි හා මෘදු බවෙහි ඇළුණු
බන්ධන ඉක්ම වූ, සියළු දුක ප්‍රහීණ කළ
ඒ නුවණැත්තෝ ඇසූ දුටු දෙයෙහි නොගැලෙයි. (252)

13. මෙසේ භාග්‍යවතුන් වහන්සේ මේ අර්ථය නැවත නැවතත් කීහ.
වේද මන්ත්‍ර පරතෙරට පත්වූවහු (බමුණා) එය දැන ගත්තේය.
පිළිගඳ විරහිත, (කිසිදෙයක්) ඇසුරු නොකළ, දැන ගැනීමට
දුෂ්කර වූ දෙය
මුනිවරයා විසින් විචිත්‍ර ගාථා වලින් පවසන ලදී. (253)

14. බුදුරදුන්ගේ පිළිගඳ නොමැති, සියළු දුක් දුරලන
සුභාෂිත වචන අසා (බමුණු තෙම)
නිහතමානීව තථාගතයන්ට වැඳ වැටුනේය.
එතැනදීම පැවිද්දට කැමැත්තත් ප්‍රකාශ කළේය. (254)

2.3 පවට ලැජ්ජා සූත්‍රය

1. (පවට ඇති) ලැජ්ජාව ඉක්මවා යමින් එය (එම ලැජ්ජාව) පිළිකුල් කරමින්
‘මම යහළුවෙක් වෙමි’යි පවසමින්
කළ හැකි කටයුතු (උදව්) නොකරන්නා
‘‘ඔහු මගේ (යහළුවෙකු) නොවේ’’යැයි මෙසේ ඔහුව දැන ගත යුතුය.
(255)

2. යමෙක් මිතුරන්ට ප්‍රිය වූ (නමුත්) නොකරන කතා කියයිද
(ඔහු) නොකරන දේ කියන්නෙක් බව නුවණැත්තෝ දැනගනිති.
(256)

3. යමෙක් හැමවිටම අප්‍රමාදීව (මිතුරන්) භේද කෙරේද
(මිතුරා) සැක කරන්නේද, වැරදිම සොයයිද, ඔහු මිතුරෙකු නොවේ
යමෙක් මිතුරෙකු කෙරෙහි ළය හෙව් දරුවකු සේ
අන් අය විසින් භේද කල නොහැකි වේද, ඔහු සැබෑ මිතුරාය.
(257)

4. පුරුෂ බරක් උසුලන්නා (වීර්යවන්තයා)
ප්‍රතිඵල ආනිසංස කොට ඇත්තේ (බලාපොරොත්තු වන්නේ)
පැසසුම් ගෙන දෙන (විවේක/සමාධි) සැපය වඩයිද (එය)
සිත ප්‍රමෝදයට පත් කරවන කරුණකි. (258)

5. (කාය හා චිත්ත) විවේක යුෂ බී
සමාධි මිහිරි යුෂද බී
ධර්ම ප්‍රීති මිහිරි යුෂ බොමින්
(ඔහු) කාය චිත්ත සන්තාප නැති, පාපී නොවන්නෙක් වන්නේය.
(259)

2.4 මංගල සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී. එක් සමයක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර ජේතවනයෙහි අනේපිඬු සිටුවරයාගේ ආරාමයේ වැඩ වෙසෙති. එකල එක්තරා දේවතාවියක් රෑ බොහෝ ඉක්ම ගිය කල්හි, සුන්දර රුවක් ඇත්තී, මුළු ජේතවනයම බබලවා භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණියාය. පැමිණ (ගෞරවයෙන්) වැඳ එක් පසෙක සිටියාය. එකත් පස්ව සිටි ඒ දේවතාවිය භාග්‍යවතුන් වහන්සේට ගාථාවෙන් මෙය පැවසුවාය.

1. යහපත පතන්නා වූ බොහෝ දෙවියන්ද මිනිසුන්ද
   මංගල කරුණු (මොනවාදැයි) සිතූහ. උත්තම වූ මංගල කරුණු
   දෙසනු මැන. (260)

2. (භාග්‍යවතුන් වහන්සේ)
   අඥානයින් ඇසුරු නොකිරීමද, නුවණැත්තන් ඇසුරු කිරීමද
   පිදිය යුත්තන් පිදීමද යන එය උතුම් මංගල කරුණකි. (261)

3. ගැලපෙන ප්‍රදේශයක විසීමද, පෙර පින් කර ඇති බවද
   යහපත් අරමුණු ඇති බවද යන එය උතුම් මංගල කරුණකි. (262)

4. බහුශ්‍රැත භාවයද, ශිල්ප දැනීමද, විනයක් ඇති බවද, මැනවින් හික්මුනු බවද
   සුභාෂිත බසද යන එය උතුම් මංගල කරුණකි. (263)

5. මව්පියන්ට උපස්ථාන කිරීමද, අඹුදරුවන්ට සංග්‍රහ කිරීමද
   නිරවුල් කර්මාන්තයද (රැකියාවද) යන එය උතුම් මංගල කරුණකි.
   (264)

6. දානයද, ධර්මයෙහි හැසිරීමද, නෑයන්ට සැළකීමද
   නිවැරදි ක්‍රියාද යන එය උතුම් මංගල කරුණකි. (265)

7. පාපයන්ගෙන් වැළකීමද,(ඒවායෙහි)නොඇල්මද, මත්පැනින් වැළකීමද
   ධර්මයෙහි අප්‍රමාදී වීමද යන එය උතුම් මංගල කරුණකි. (266)

8. (අන් අයට) ගරු කිරීමද, නිහතමානී බවද, ලද දෙයින් සතුටු වීමද, කළ ගුණ සැලකීමද
   සුදුසු කාලයේ ධර්මය ඇසීමද, යන එය උතුම් මංගල කරුණකි.
   (267)

9. ඉවසීමද, සුවච බවද (ඇහුම් කන් දීමද), මහණුන් දැක්මට යාමද
සුදුසු කාලයේ ධර්ම සාකච්ඡාවද යන එය උතුම් මංගල කරුණකි.
(268)

10. තපස ද, බ්‍රහ්මචර්යාව ද, ආර්ය සත්‍යය දැකීමද
නිවන සාක්ෂාත් කිරීමද යන එය උතුම් මංගල කරුණකි. (269)

11. ලෝකධර්මයන්[1] ස්පර්ෂ කළ විට යමෙකුගේ සිත කම්පා නොවේද
ශෝකයක් නැතිද, (කෙලෙස්) දූවිලි නැතිද, බියක් නැතිද යන එය
උතුම් මංගල කරුණකි. (270)

12. එවැනි දේ සිදුකර සැම තැනකම අපරාජිත වූවෝ
හැමතැන සුවසේ යත්ද, එය ඒ කරුණු අතරින් උතුම් මංගල කරුණය.
(271)

[1] ලෝක ධර්ම අටඃ ලාභ-අලාභ, නින්දා-ප්‍රශංසා, කීර්තිය-අපකීර්තිය, සැප-දුක

2.5 සුචිලෝම සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී. එක් සමයක භාග්‍යවතුන් වහන්සේ ගයාවෙහි ටංකිතමංචයෙහි සුචිලෝම (ඉඳිකටු වැනි ලොම් ඇති) යකුගේ භවනෙ වැඩ වෙසෙති. එකල්හි ඛර (කර්කශ) යකුද සුචිලෝම යකුද භාග්‍යවතුන් වහන්සේ අසලින් ගමන් කරති. ඛර යකු සුචිලෝම යක්ෂයාට මෙසේ කීයඃ ''ඒ මහණෙකි''. "ඒ මහණෙකු නොවේ, බොරු මහණෙකි. හෙතෙම මහණෙකුද නැතිනම් බොරු මහණෙකුදැයි දැනගන්නා තෙක් නැවතුව.''

ඉක්බිති සුචිලෝම යකු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ භාග්‍යවතුන් වහන්සේ වෙත කය ලං කළේය. භාග්‍යවතුන් වහන්සේ කය ඉවතට නැමූ සේක. සුචිලෝම යක්ෂයා මෙසේ ඇසීයඃ ''මහණ, මට බයද?'' ''ඇවැත, මම නුඹට භය නැත්තෙමි. නමුත් නුඹේ ස්පර්ශය කටුකය.''

''මහණ නුඹෙන් ප්‍රශ්නයක් විමසමි. ඉතින් මට පිළිතුරු නොදේ නම් නුඹගේ සිත හෝ වික්ෂිප්ත කරන්නෙමි, නුඹේ හදවත හෝ පලාදමමි, පාද වලින් ගෙන ගංගා නදියෙන් එතෙරට හෝ විසිකරමි.'' ''ඇවැත්නි දෙවියන් සිටින ලෝකයෙහි මරුන් සහිත බඹුන් සහිත ශ්‍රමණ බ්‍රාහ්මණයින් සහිත දෙව් මිනිසුන් සහිත ප්‍රජායෙහි යමෙක් මාගේ සිත වික්ෂිප්ත කරයිද, හදවත හෝ පලයිද, පා වලින් ගෙන ගංගා නදියෙන් එතෙරට විසිකරයිද, එවැන්නෙකු නොදකිමි. නමුත් ඇවැත්නි නුඹට යම් සැකයක් ඇත්නම් විමසන්න.'' ඉක්බිති සුචිලෝම යකු භාග්‍යවතුන් වහන්සේට ගාථාවෙන් මෙය කීය.

1. රාගය ද ද්වේශය ද කුමක් මුල් කොට ඇත්තාහුද?
   (බඹසර) නොඇල්මත්, (කාම සැපයේ) ඇල්මත්, ලොමු දැහැගැන්මත්
   කොයින් උපදිත්ද?
   මනෝ විතර්කයෝ කොයින් හටගෙන
   දරුවන් කපුටකු මුදාහරින්නා සේ (මෙම කෙලෙස්) මුදාහරිත්ද?
   (272)

2. (භාග්‍යවතුන් වහන්සේ)
රාගයද ද්වේශයද මෙය නිදාන කොට ඇත.
නොඇල්මත්, ඇල්මත්, ලොමු දැහැගැන්මත් මෙයින් උපන.
මෙයින් හටගත් මනෝ විතර්කයෝ
දරුවන් කපුටකු මුදාහරින්නා සේ (මෙම කෙලෙස්) මුදාහරිත්.
(273)

3. සෙනෙහසින් උපන්, නුග ගසෙහි කඳින් උපන්
අරළු මුල් මෙන් තමාගෙන් හටගත් (ආශාව නිසා)
වනයේ පැටළුනු පුස්වැලක් සේ
බොහෝ දෙනා කාමයන්හි පැටලී සිටිත්. (274)

4. යමෙක් ඒවා කුමක් නිදාන කොට ඇත්දැයි දනිත් ද
යක්ෂය අසන්න, ඔවුහු එය දුරුකරති.
ඔවුහු නැවත නොඉපදීම පිණිස මින් පෙර තරණය නොකළ
එතෙර වීමට දුෂ්කර මෙම සැඩපහර තරණය කරති. (275)

2.6 ධර්මයෙහි හැසිරීම සූත්‍රය

1. ධර්මයෙහි හැසිරීම ද, බඹසර ද උත්තරීතර ධනය යැයි කිහ.
   ගිහිගෙය අතහැර, ගෙයක් නොමැතිව පැවිද්දෙක් වූ නමුදු (276)

2. හෙතෙම කටමැත දොඩවන කෙනෙකු නම්
   අනුනට හිංසා කිරීමේ ඇලුනු මෘගයෙක් වන්නේ නම්
   ඔහුගේ ජීවිතය පාපීය,
   තමාගේ (කෙලෙස්) දූවිලි වඩයි. (277)

3. කලහ කිරීමේ ඇලුනේ, මෝහධර්මයෙන් වෙළුනේ
   බුදුරදුන් දෙසූ දහම කියන ලදුයේ නමුත් තේරුම් නොගනී. (278)

4. වෙහෙසීම (හිංසාව) තමා විසින් පුරුදු කරන ලද්දේ
   අවිද්‍යාව පෙරටු කර ගත්තේ
   නිරයගාමී මාර්ගය වූ
   (කෙලෙස් වලින්) කිලුටු වීම නොදනී. (279)

5. දුගතියට සපැමිණි, ගර්භාෂයෙන් ගර්භාෂයට, අඳුරෙන් අඳුරට යන
   එවැනි වූ භික්ෂුව නියත ලෙස මරණින් මතු දුකට පැමිණේ. (280)

6. වසර ගණනක් පැරණි, පිරුණු වැසිකිළි වලක් පිරිසිදු කිරීම දුෂ්කර සේ
   යමෙක් එවැනි ආකාරද, කෙලෙස් සහිත ඔහු පිරිසිදු කිරීමද දුෂ්කරය. (281)

7. පාපී ආශාවන් ඇති, පාපී සිතුවිලි ඇති, පාපී ඇවතුම් පැවැතුම් ඇති
   ගිහි සිතක් ඇසුරු කළ එවැන්නෙක් මහණෙනි (නුඹලා) දනිව් නම් (282)

8. සියළු දෙනා සමඟිව ඔහුව බැහැර කරන්න.
   (ඒ) කසල ගසා දමන්න, කුණු ඉවතට අතුගා දමන්න. (283)

9. එයින් මහණකමක් නොමැතිව මහණකු මෙන් සිටින (ඒ)
   බොල් පොලා දමන්න.
   පාපී ආශාවන් ඇති, පාපී ඇවතුම් පැවැතුම් ඇති
   ඔවුන් ගසා ඉවත දමා (284)

10. සතිමත්ව, ශුද්ධ වූවෝ ශුද්ධ වූවන් සමගම සමාන සංවාස (ඇසුරු) කරන්න.
    එයින් සමඟිව බුද්ධිමත්ව දුක කෙළවර කරන්න. (285)

2.7 බ්‍රාහ්මණ ධම්මික සූත්‍රය

පරිවර්තනය නොකරන ලදී. (අන්තර්ගතය : පුරාණ බ්‍රාහ්මණයින්ට වඩා වර්තමාන බ්‍රාහ්මණයින් බොහෝ පිරිහී ගොස් ඇති බව හා ගවයන් මැරීම විවේචනය කරීම)

2.8 ඔරුව සූත්‍රය

1. යම් පුරුෂයෙක් ධර්මය දන්නේද, එමනිසා
ඉන්ද්‍රයාට මෙන් දෙවිවරු ඔහුව පුදන්නාහ.
(මෙසේ) ඔහු පූජිත වූයේ, ඉන් ප්‍රසන්න සිත් ඇත්තේ
බහුශ්‍රැතව ධර්මය දේශනා කරන්නේය. (318)

2. යමෙක් අප්‍රමාදීව එවැනි කෙනෙකු ඇසුරු කරයිද
නුවණැති වන්නේ, ඒ ධර්මය අවධානයෙන් අසා
ධර්මානු ධර්ම පිලිවෙතේ යෙදීමෙන්
උගත්, ධර්මය අවබෝධ කරගත්, දක්ෂයෙක් වන්නේය. (319)

3. ධර්මයෙහි අර්ථයට (නිවනට) නොපැමිණි, ඉරිසියා සහගත
(ප්‍රඥාවෙන් හා ප්‍රතිපදාවෙන්) කුඩා, අනුවණ කෙනෙක් (ඇදුරෙක්)
ඇසුරු කරන්නා
මෙලොවදී ධර්මය අවබෝධ කර නොගෙන
සැක දුරුකරගත නොහැකිව මරණයට පත්වේ. (320)

4. යම් සේ මහත් වූ සැඩ දිය පහර ඇති
නදියකට මිනිසෙකු බැස
හෙතෙම දිය පහරට හසුව ගසාගෙන යන කල්හි
කෙලෙසද ඔහුට අන් අයව (ගඟෙන්) එතෙර කළ හැකිවන්නේ?
(321)

5. එලෙසින්ම (තෙමේ) ධර්මය අවබෝධ කර නොගෙන
බහුශ්‍රැතයන්ගෙන් (ධර්ම කරුණුවල) අර්ථය නොඅසා
තෙමේ නොදැන, සැක දුරුකර නොගෙන
කෙලෙසද ඔහුට අන් අයට ධර්මය අවබෝධ කළ හැකි වන්නේ?
(322)

6. යම් සේ හබලකින් හෝ රිටකින් සමන්විත
ශක්තිමත් ඔරුවකට ගොඩ වී
(නාවික) උපාය දන්නා, දක්ෂ, නුවණැති ඔහු
එයින් අන් බොහෝ දෙනාද එතෙර කරන්නේය. (323)

7. එලෙසින්ම යමෙක් ධර්මයෙන් කෙළවරට ගියේ, වැඩූ සිතක් ඇතිද
බහුශ්‍රැත වේද, නොසැලෙන ස්වභාව ඇත්තේද
හෙතෙම සවන් යොමු කරන, ධර්මය අවබෝධ කිරීමට හැකියව ඇති
අන් ජනයාට ධර්මය අවබෝධ කරවන්නේය. (324)

8. එබැවින් නුවණැති වූත්, බහුශ්‍රැත වූත්
සත්පුරුෂයකු අනිවාර්යයෙන් ඇසුරු කරන්න
(ධර්මයෙහි) අර්ථය දැනගෙන (එය) පිළිපදින්නේ
ධර්මය දැනගත් ඔහු සැප ලබන්නේය. (325)

2.9 'සීලය කුමක්ද?' සූත්‍රය

1. (ප්‍රශ්නය)
   කවර සීලයක්, කවර හැසිරීමක්, කවර ක්‍රියා වැඩීමෙන්
   කෙසේ (සසුනෙහි) මැනවින් පිහිටි පුද්ගලයා උත්තරීතර යහපතට
   පැමිණේ ද? (326)

2. (භාග්‍යවතුන් වහන්සේ)
   වැඩිහිටියන්ට ගරුකරන්නේ, (ඔවුන්ගේ ලාභාදියෙහි) ඊර්ෂ්‍යා නැත්තේද
   ගුරුන් දක්නට සුදුසු කල් දන්නේ
   ක්ෂණ සම්පත්තිය දන්නා ඔහු ධර්මය දෙසන කල
   ඒ සුභාෂිත සැළකිල්ලෙන් අසන්නේය. (327)

3. දෑඩිබව (අදහස් දෑඩිව ගැනීම) පසෙකලා යටහත් පැවැතුම් ඇත්තේ
   සුදුසු කාලයේ ගුරුන් සමීපයට යන්නේය.
   (ඒ දෙසූ) අර්ථයද, ධර්මයද, සංයමය ද (සීලයද), බඹසරද,
   සිහිකරන්නේද, පුරුදු කරන්නේද වෙයි. (328)

4. ධර්මයෙහි වසන්නේ, ධර්මයෙහි ඇලුනේ
   ධර්මයෙහි පිහිටියේ, ධර්ම විනිශ්චය දන්නේ
   ධර්මය විකෘති කරන කථා නොකියන්නේ
   සත්‍යය වූ සුභාෂිත ප්‍රකාශ කරන්න. (329)

5. සිනහව, දෑඩිව පැතීම, වැලපීම, දුෂ්ඨ කමද
   රැවටිල්ල , කුහකකම, ගිජුබව, මාන්නයද
   ප්‍රචණ්ඩතාව, කර්කශ බවද, (කෙලෙස්) කහටද, මුසපත් වීමද
   (යන දේවල්) හැරදමා ගැලී සිටීම (මත් වීම) දුරුකොට
   ස්ථිරව පිහිටා, (නොසැලී) හැසිරෙන්න. (330)

6. සුභාෂිත ද, එහි සාරයද දන්නේය.
   දැනුම ද, සමාධි සාරය ද දන්නේය.
   යම් මිනිසෙක් සැහැසි වෙයිද, ප්‍රමාදයෙන් යුක්තද
   ඔහුට ප්‍රඥාව ද, දැනුම ද නොවැඩේ. (331)

7. යමෙක් ආර්යයන් දෙසන ලද ධර්මයෙහි ඇලුනිද
   ඔවුහු වචනයෙන් ද, මනසින් ද, ක්‍රියාවෙන් ද උත්තරීතර වෙති.
   ශාන්ත භාවයේ ද, මොළොක් බවෙහි ද, සමාධියෙහි ද පිහිටියාහු,
   ඔවුහු දැනුමෙහි ද, ප්‍රඥාවෙහි ද සාරය (නිවන) වෙත පැමිණියහ.
   (332)

2.10 නැඟිටීම සූත්‍රය

1. නැඟිටින්න, හිඳගන්න, නිදා ගැනීමෙන් නුඹලාට කවර ප්‍රයෝජනයක්ද?
   හුලකින් විදින ලදුව පෙලෙන ලෙඩුන්ට කවර නින්දක්ද? (323)

2. නැඟිටින්න, හිඳගන්න,
   ශාන්තිය (නිවන) පිණිස දැඩිව හික්මෙන්න.
   මාර රජු නුඹලාගේ ප්‍රමාද බව දැන
   (නුඹලාව) මුළා නොකෙරේවා! වසඟයට නොගනීවා! (324)

3. දෙවිවරු ද මිනිසුන් ද යහපත් යැයි
   යමක් ග්‍රහනය කොට සිටිත් ද,
   ඒ පැටලෙන දෙය (කාමය) තරණය කරව්.
   මේ අවස්ථාව (ක්‍ෂණ සම්පත්තිය) නුඹලා පසුකර නොයේවා!
   අවස්ථාව ඉක්ම ගියාහු
   නිරයට ගියාහු, ශෝක කෙරෙත්මය. (325)

4. ප්‍රමාදය කිළුටකි. ප්‍රමාදයෙන් ප්‍රමාදයට අනුව වැටීමද කිළුටකි.
   අප්‍රමාදී බවින් හා විද්‍යාවෙන් තමන්ගේ හුල උදුරා දමන්න.
   (326)

2.11 රාහුල සූත්‍රය

1. (ප්‍රශ්නය)
කිම නිතර එක්ව විසීම හේතුකොට
නුවණැත්තාට අවමන් කෙරෙහිද?
කිම මිනිස් වර්ගයාට (නැණ) සිල දරන්නා
නුඹ විසින් නිතර පුදන ලදුයේද? (337)

2. (රාහුල)
නිතර එකට විසීම හේතුකොට නුවණැත්තාට අවමන් නොකරමි.
මිනිස් වර්ගයාට (නැණ) සිල දරන්නා මවිසින් නිතර පුදන ලද්දේය.
(338)

ඒ නිදාන කතාවයි

3. ප්‍රිය ස්වරූප ඇති, මනරම් පංචකාමගුණ හැරපියා
ශ්‍රද්ධාවෙන් ගිහිගෙයින් නික්ම දුක කෙළවර කරන්නෙක් වන්න.
(339)

4. කලණමිතුරන්ද, ජනයාගෙන් වෙන් වූ අල්ප ශබ්ද ඇති
ප්‍රත්‍යන්ත සෙනසුන්ද ඇසුරු කරන්න. පමණ දැන ආහාර ගන්න.
(340)

5. සිවුරු පිණ්ඩපාත බෙහෙත් සේනාසන යන මේවා කෙරෙහි
ආශාවක් ඇති කර නොගන්න. මේ ලෝකයට නැවත එන්න එපා.
(341)

6. ප්‍රාතිමෝක්ෂ ශීලයෙහිද
පංච ඉන්‍ද්‍රියයන්හිද සංවර වන්න.
ඔබ තුල කායගතාසතිය ඇති වේවා!
කළකිරීම (නිබ්බිදාව) බහුලව ඇතියෙක් වන්න (342)

7. රාග සහගත ආකර්ශණීය නිමිත්ත පිළිකෙව් කරන්න.
ඒකාග්‍ර වූ, මැනවින් තැන්පත් වූ සිතින් අශුභය වඩන්න. (343)

8. නිමිති රහිත (අනිමිත්ත) භාවනාව වඩන්න,
මාන්නය අනුශය සමඟ දුරලන්න.
එයින් මාන්නය (යථාපරිදි) අවබෝධ කොට
උපශාන්තව හැසිරෙන්න. (344)

මෙසේ මෙම ගාථා වලින් භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් රාහුලයන්ට නිතර අවවාද කරන සේක.

2.12 නිග්‍රෝධකප්ප සූත්‍රය

පරිවර්තනය නොකරන ලදී (අන්තර්ගතය වංගීස තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේගේ ගුණ වර්ණනා කරමින් නිග්‍රෝධකප්ප තෙරුන් වහන්සේගේ නිවන් අවබෝධය විමසති)

2.13 'නිවැරදි හැසිරීම' සූත්‍රය

1. (ප්‍රශ්ණකරු)
එතෙර වූ, එගොඩට ගිය, සම්පූර්ණයෙන් නිවීගිය, (සිත) ස්ථිරව පිහිටි
පුළුල් ප්‍රඥාවක් ඇති මුනිවරයාගෙන් විමසමි.
ගිහිගෙයින් නික්ම, කාමයන් දුරුකොට
කෙලෙස ඒ භික්ෂුව ලෝකයෙහි නිවැරදිව හැසිරෙයිද? (361)

2. (භාග්‍යවතුන් වහන්සේ)
උල්කාපාත, සිහින හා (නැකත් ආදී) වෙනත් ලකුණුද
යන මංගල කරුණු (ශුභ- අශුභ) යමෙකුට විනාශ වීද
ඒ භික්ෂුව මංගල්‍ය - දෝෂ (ශුභ - අශුභ) ප්‍රහීණ කළේ
ඔහු ලෝකයේ නිවැරදිව හැසිරෙයි. (362)

3. භික්ෂුව මානුෂික වූද දිව්‍යමය වූද
කාමයන් කෙරෙහි ඇල්ම දුරලන්නේද
පැවැත්ම (භවය) ඉක්මවා, ධර්මය අවබෝධ කර
ඔහු ලෝකයේ නිවැරදිව හැසිරෙයි. (363)

4. භික්ෂුව කේලමට පිටුපා
ක්‍රෝධය මසුරුකම හැරදමා
එකඟවීමත් විරුද්ධ වීමත් ප්‍රහීණ කොට
ඔහු ලෝකයේ නිවැරදිව හැසිරෙයි. (364)

5. ප්‍රිය හා අප්‍රිය දේ අතහැර
(කිසිවක්) අල්ලා නොගෙන, කිසිවක් ඇසුරු නොකළේ
බන්ධන වලින් මොනවට මිදුනේද
ඔහු ලෝකයේ නිවැරදිව හැසිරෙයි. (365)

6. හෙතෙම මගේ යැයි ගත් දෙයෙහි සාරයක් නොදකින්නේ
අයිති දෙයෙහි කැමැත්ත හා ඇලීම (ඡන්දරාග) දුරුකොට
හෙතෙම කිසිවක් ඇසුරු නොකළේ, වෙන අය විසින් (නිවනට)
පැමිණවීමක් නැත්තේ
ඔහු ලෝකයේ නිවැරදිව හැසිරෙයි. (366)

7. වචනයෙන්ද මනසින්ද ක්‍රියාවෙන්ද
අවිරුද්ධ වූයේ මැනවින් ධර්මය දැන
නිවීම දැඩිව පතමින්
ඔහු ලෝකයේ නිවැරදිව හැසිරෙයි. (367)

8. යම් භික්ෂුවක් ''මට වඳී'' යැයි සතුටක් ඇති කර නොගනීද
පරිභව කරන ලද නමුදු වෛරයක් නොබඳීද
අනුන් දුන් අහරෙහි මත් නොවෙයිද
ඔහු ලෝකයේ නිවැරදිව හැසිරෙයි. (368)

9. ආශාවත් පැවැත්මත් වෙසෙසින් ප්‍රහීණ කොට
(අත් පා ආදිය) සිඳ දැමීමෙන් හා වදබන්ධන වලින් වැළකුණේ
සැකය තරණය කළ හෙතෙම, හුල උදුරා දැමුයේද
ඔහු ලෝකයේ නිවැරදිව හැසිරෙයි. (369)

10. තමන්ට ගැලපෙන දෙය දැනගෙන
භික්ෂුව ලෝකයේ කිසිවෙකුට හිංසාවක් නොකරන්නේද
තත් වූ පරිදි ධර්මය දැනගත්තේ
ඔහු ලෝකයේ නිවැරදිව හැසිරෙයි. (370)

11. යමෙකුට (කෙලෙස්) අනුශය[1] කිසිවක් නැතිද
අකුශල මූලය සහමුලින් උදුරා දැමූයේ
ආශාවක් නැති ඔහු, කිසිවක් නොපතන්නේ
ඔහු ලෝකයේ නිවැරදිව හැසිරෙයි. (371)

12. ආශ්‍රව[2] ක්ෂය කළේ, මාන්නය ප්‍රහීණ කළේ
සියළුම රාගය (ඇලීම) උපදවන මාර්ග ඉක්මවා ගියේ
දැමුනේ, පරිපූර්ණව නිවී ගියේ, ස්ථිරව පිහිටියේ ද
ඔහු ලෝකයේ නිවැරදිව හැසිරෙයි. (372)

---

[1] අනුශය 7කි - කාමරාග අනුශය, ගැටීමේ අනුශය, දෘෂ්ටි අනුශය, සැක අනුශය, මාන අනුශය, පැවැත්මට ඇල්ම අනුශය, අවිද්‍යා අනුශය

[2] රා ආදී මත් කරවන ද්‍රව්‍ය පැසවන මණ්ඩි වලට නමකි. මෙහි කෙලෙස් ආශ්‍රව 3කි - කාම, භව (පැවැත්ම), අවිද්‍යාව

13. ශ්‍රද්ධාව ඇති, (ධර්ම) දැනුමැති, (නිවනට) නියත වූ මාවත දකින්නේ
භේද වූ ජනයා අතර පැත්තක් නොගන්නා නුවණැත්තා
ආශාවද ද්වේශයද ගැටීමද දුරු කරන්නේ
ඔහු ලෝකයේ නිවැරදිව හැසිරෙයි. (373)

14. සුපිරිසිදු ජයග්‍රාහකයා වී වැස්ම විවර කළේ ද (සැඟවූ දෙයක් නැතිද)
සිතේ උපදින දේ (සිතුවිලි) වසඟ කළ, එතෙරට ගිය, නොසැලෙන
සංස්කාර (පංචුපාදානස්කන්ධ) නිරුද්ධ කිරීමේ ඥානයේ දක්ෂ වූයේද
ඔහු ලෝකයේ නිවැරදිව හැසිරෙයි. (374)

15. අතීතයෙහි වූ දෙයෙහි හෝ අනාගතයේ වන දෙයෙහි හෝ
(සිතින් කරන) සකස් කිරීම් ඉක්මවූයේ,
පිරිසිදු ප්‍රඥාවෙන් ඉක්මවා ගියේ
සියළු ආයතනයන්ගෙන්[1] මැනවින් මිදුනේද
ඔහු ලෝකයේ නිවැරදිව හැසිරෙයි. (375)

16. මාර්ගය දැන, ධර්මය අවබෝධ කර
(වැස්ම) විවර කරන ලද්දේ, ආශ්‍රවයන්ගේ ප්‍රහීණ වීම දැක
'මගේ' යැයි අල්ලාගත් සියළු දේ සම්පූර්ණයෙන් ක්ෂය කරන්නේද
ඔහු ලෝකයේ නිවැරදිව හැසිරෙයි. (376)

17. (ප්‍රශ්න කරු)
භාග්‍යවතුනි, සැබැවින්ම එය එසේමයි.
යම්කිසි භික්ෂුවක් දැමුනේ (දමනය වූයේ) මෙලෙස වෙසේද
සියළුම බන්ධනද ඉක්මවා ගියේ
ඔහු ලෝකයේ නිවැරදිව හැසිරෙයි. (377)

---

[1] ආයතන 12කි - ඇස - රූප, කන - ශබ්ද, නාසය - ගඳ සුවඳ, දිව - රස, කය - ස්පර්ශය, මනස - ධර්ම

1.14 ධම්මික සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී. එක් සමයක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවනයෙහි අනේපිඬු සිටුහුගේ ආරාමයේ වැඩ වෙසෙති. ඉක්බිති ධම්මික උපාසක තෙමේ පන්සියයක් පමණ වූ උපාසකවරු සමඟ භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණියේය. පැමිණ (ගෞරවයෙන්) වැඳ එක් පසෙක හිඳ ගත්තේය. එකත්පස්ව හිඳගත් ධම්මික උපාසක භාග්‍යවතුන් වහන්සෙට මෙය ගාථාවෙන් කිය.

1. පුළුල් ප්‍රඥාවක් ඇති ගෞතමයන් වහන්සේගෙන් මෙය විමසමි.
   යම් ගිහිගෙය අතහැර අනගාරික වූවෙක් (පැවිදි වූවෙක්) හෝ
   ගිහිගෙයි වසන උපාසකයෝ වෙත්වා
   කවර ආකාරයෙන් කටයුතු කරන ශ්‍රාවකයා යහපත් වේද? (378)

(භාග්‍යවතුන් වහන්සේ වර්ණනා කරමින් ප්‍රකාශ කරන ඊළඟ ගාථා 8 පරිවර්තනය නොකරන ලදී)

10. (භාග්‍යවතුන් වහන්සේ)
    මහණෙනි මට සවන් දෙන්න, කෙලෙස් ගසාදමන
    ධර්මය නුඹලාට දෙසමි, සියළුදෙන එය දරාගන්න
    තමුන්ගේ යහපත දක්නා නුවණැත්තන් වී
    පැවිද්දන්ට ගැලපෙන ඒ හැසිරීම් රටාව පුරුදු කරන්න. (387)

11. භික්ෂුව විකාලයේ (සවස් වරුවේ) ගමෙහි නොහැසිරෙන්නේය.
    සුදුසු කාලයේ (පෙරවරුවේ) පිඬු පිණිස ගමට පිවිසෙන්නේය.
    ඇලීම් (බැඳීම්) නොකල්හී සැරිසන්නා වැළඳ ගනියි.
    එම නිසා ධර්මය අවබෝධ කළාහු විකාලයේ නොහැසිරෙන්නාහ.
    (388)

12. රූප ද, ශබ්ද ද, රස ද, සුවඳ ද, ස්පර්ශය ද,
    යන යමක් සත්ත්වයන් මදයට පමුණුවත් ද (මත් කරත් ද),
    එම (පංච) ධර්මයන් කෙරෙහි කැමැත්ත දුරු කරන්නේය.
    සුදුසු කාලයේ ඔහු උදෑසන අහර සොයා (ගමට) පිවිසෙන්නේය.
    (389)

13. භික්ෂුව සුදුසු කාලයේ පිඬු ලබා තනිව පෙරලා අවුත්
    විවේක ස්ථානයක (භාවනාවට) හිඳ ගන්නේ
    බැහැරට නොව ඇතුලට යොමුකල සිතක් ඇත්තේ
    එක්තැන් කල සිතක් ඇත්තේ, මනස බැහැර දෙයකට නොයවන්නේය.
    (390)

14. ඉදින් ඔහු තම ශිෂ්‍යයෙකු සමඟ හෝ
වෙනත් කිසියම් භික්ෂුවක් සමඟ කතාබහ කරන්නේ නම්
ප්‍රණීත වූ ධර්මයම කථා කරන්නේය.
කේලාම් කීම් හෝ අන් අයගේ වැරදි හෝ කතා නොකරන්නේය.
(391)

15. කිසිවෙක් විරුද්ධ වාද ඇතිව වාද කරත්ද
ස්වල්ප ප්‍රඥාවක් ඇති ඔවුන් ප්‍රශංසා නොකරමු.
එයින් එයින් බැඳීම් ඔවුන්ව වැළඳගනිත්.
එමෙන්ම ඔවුහු සිතත් (සිතුවිලි ඔස්සේ) බොහෝ දුර යවත්. (392)

16. උතුම් ප්‍රඥා ඇත්තාගේ (බුදුරදුන්ගේ) ශ්‍රාවකයා
සුගතයන් වහන්සේ දෙසූ ධර්මය අසා
ආහාරද සෙනසුන්ද ඇඳ පුටුද පැන්ද
සඟල සිවුරද පාවහන්ද[1] නුවණින් සළකා පරිභෝග කරන්නේය.
(393)

17. එමනිසා නෙළුමක දිය බින්දුවක් නොඇලෙන්නා සේ
භික්ෂුව ආහාරයේද ඇඳ පුටුවලද
පැන්ද සඟල සිවුරද පාවහන්ද
යන දේවල් වල නොඇලෙන්නේය. (394)

18. යම් ආකාරයකින් ක්‍රියා කිරීමෙන් (ගිහි) ශ්‍රාවකයා යහපත් වේ නම්
ඒ ගිහිවත නුඹලාට කියමි.
පරිපූර්ණ වූ භික්ෂු ශීලය ස්පර්ශ කිරීමට (ලැබීමට)
(අඹුදරු, කෙත්වතු ආදී) වත්කම් බරින් යුතු ගිහියනට නොහැක.
(395)

19. බියෙන් ජීවත් වන හෝ නොවන යම්තාක් සත්ත්වයෝ ලොව ඇතිද
ඒ සියළු සත්ත්වයන් කෙරෙහි මුගුරු ඉවතලා
(තමුන්) සතුන් නොනසන්නේ, (වෙන අයකු ලවාද) නොනස්වන්නේ
අන්අය සතුන් මරනවිට එය අනුමත නොකරන්නේය. (396)

20. ඉක්බිති ශ්‍රාවකයා කොතැනක හෝ ඇති කිසියම් වූ දෙයක්
තමුන්ට අයත් නොවන්නේ යැයි දැන එය ගැනීමෙන් වළකින්නේය.
වෙන අයෙකු ලවාද සොරකම් නොකරවන්නේ, වෙන අය කරයි නම් එය අනුමත නොකරයි.

---

[1] රජ්ජුපවාහනං - රජස් ගෙනයෑම/ සෝදා හැරීම. නමුත් මෙය රජ්ජුපාහනං විය යුතු යැයි සිතමු. සාමාන්‍යයෙන් ගන්නා 'සිවුරු සෝදන ජලය' යන්නහි අර්ථයක් නැත.

සියළු ආකාරයේ සොරකම් කිරීම් වලින් වළකින්නේය. (397)

21. ගිනිගෙන දිලිසෙන අඟුරු වලක් මඟහරින්නා සේ
(ඔහු) අබ්‍රහ්මචර්‍යාවයෙන් (මෛථුනයෙන්) වළකින්නේය.
බඹසර රැකිය නොහැකිනම්
අන් අයගේ අඹුවන් කරා නොයන්නේය. (398)

22. සභාවකට ගියේ හෝ පිරිසක් මැදට ගියේ හෝ
තනිවම තව කෙනෙකුට හෝ බොරු නොකියන්නේය.
වෙන කෙනෙකු ලවාද නොකියවන්නේය, (වෙන අයෙකුගේ) බොරු
කීමද අනුමත නොකරන්නේය.
සියළුම බොරුකීම් වලින් වළකින්නේය. (399)

23. මෙය උන්මාදය ඇතිකරවන්නකැයි දැන
මත්පැන් පානය නොකරන්නේය.
යම් ගිහියෙක් මෙම ධර්මයට (නොබීමට) කැමති නම්,
වෙන අයෙකුටද පානය කිරීමට නොදෙන්නේ, (වෙන අයකුගේ)
බීමද අනුමත නොකරන්නේය.
(400)

24. මත් වීමෙන් පසු මෝඩයෝ පව්වැඩ කරත්.
අන් ජනයාද ප්‍රමාදයට පත් කෙරෙත්.
උන්මාදය, මුලාව ඇතිකරවන, මෝඩයන්ට ප්‍රිය වූ,
එම පව්කාර ක්‍රියාව දුරලන්නේය. (401)

(මෙයින් පංච ශීලය කියා නිම කරන ලදී)

25. සතුන් නොමරන්නේය. සොරකම් නොකරන්නේය.
බොරු නෙකියන්නේය. මත්පැන් පානය නොකරන්නේය.
අබ්‍රහ්මචර්යාව වූ මෛථුනයෙන් වෙන් වන්නේය.
විකාල භෝජනය වූ රාත්‍රී ආහාරයෙන් වළකින්නේය. (402)

26. මල් දම් නොදරයි, සුවඳ විලවුන් නොගල්වයි,
බිම ඇඳ කරගෙන ඇතිරිල්ලක් (පැදුරක්) එලා නිදන්නේය.
දුක කෙළවර කළ බුදුවරයා විසින් එය
අංග අටක් ඇති පොහොය (සීලය) යැයි කියනු ලැබේ. (403)

(මෙයින් අටසිල් කියන ලදී)

27. තවද පක්ෂයෙහි එන මාසෙපෝය, පුන්පෝය
අටවක, පාටිහාරිය පක්ෂ යන පෝය දිනවල (එනම් සතර පෝය)
ප්‍රසන්න මනසින් යුක්තව අංග අටකින් යුක්ත

පෙහෙවස් පිරිපුන් කොට රකින්නේය. (404)

28. ඉක්බිති පෙහෙවස් රැක පසුදින උදේ
ප්‍රසන්න සිතින්, සතුටු වෙමින් නුවණැත්තා
ආහාරපාන වලින් භික්ෂු සංඝයා
සුදුසු පරිදි වළඳවන්නේය. (405)

29. ධාර්මිකව ලත් දෙයින් මව් පියන්ට සළකන්නේය.
ඔහු ධාර්මික වෙළඳාමක නිරත වන්නේය.
මේ ගිහිවතෙහි අප්‍රමාදීව යෙදෙන්නා
(මරණින් මතු) ස්වයං ප්‍රභාෂ්වර නම් දෙව්වරු වෙත එළඹේ.
(406)

03 . විශාල පරිච්ඡේදය

3.1 පැවිද්ද සූත්‍රය

1. යම් පරිදි ඇස් ඇත්තා පැවිදි වීද, ඒ පැවිද්ද වර්ණනා කරමි.
   යම් පරිදි පිරික්සා[1] ඔහු පැවිද්ද ප්‍රකාශ කළේද (එය කියමි). (407)

2. ''යම් ගිහිගෙයි විසීමක් ඇද්ද එය අවහිරයකි.
   (කෙලෙස්) දූවිලි වලට තෝතැන්නකි.
   පැවිද්ද නිදහස් අහස මෙනි''
   මෙසේ දැක පැවිදි විය. (408)

3. කයෙන් පැවිදිව පව් කම් දුරලීය.
   වාග්-දුෂ්චරිතය දුරලා දිවි පැවැත්ම පිරිසිදු කළේය. (409)

4. මගධ ජනයාගේ පර්වත වලින් වටවූ රජගහ නුවරට බුදුරදුන් වැඩියහ.
   උතුම් ලකුණු වලින් ගැවසීගත් සේක් පිඬු පිණිස හැසුරුණහ. (410)

5. ලක්ෂණ සම්පන්න උන්වහන්සේ, ප්‍රාසාදයෙහි සිටි
   බිම්බිසාර දැක මේ අර්ථය කීය. (411)

6. ''භවත්නි අසව්, මොහු ලස්සනය, අරෝහපරිණාහය, ප්‍රසන්නය
   මනා හැසිරීමෙන්ද යුක්තය, වියගහ දුරක් පමණ ඉදිරිය බලයි. (412)

7. යට හෙළූ ඇස් ඇතිය, සතිමත්ය, පහත් පෙළේ පවුලකින් ආවෙකු
   මෙන් නොවේ.
   භික්ෂුව කොහි යනනේදැයි රාජදූතයනි දුව ගොස් බලව.'' (413)

---

[1] ගිහි දිවිය හා පැවිදි දිවිය අතර වෙනස පිරික්සා බලා

8. ඒ යවන ලද රාජදූතයෝ පිටුපසින් ලුහුබැන්දහ.
''භික්ෂුව කොහේ යන්නේද? විසීම කොහි වන්නේද?'' (414)

9. ඉන්ද්‍රිය සංවරයෙන් යුක්තව, ඉතා සංවරව, සිහි නුවණින් යුක්තව
ගෙපිළිවෙලින් හැසිරෙන්නේ, වහා පාත්‍රය පිරිණි. (415)

10. මුනි වරයා පිඬු පිණිස හැසිර, නගරයෙන් පිටවී
''මෙහි වාසය කරන්නේමැ''යි පාණ්ඩව පර්වතයට වැඩියහ. (416)

11. වාසය කරන තැන දැක, රාජ දූතයෝ ඒ අසල හිඳගත්හ.
එක් දූතයෙක් පැමිණ රජුට (මෙය) දැන්වීය. (417)

12. ''මහරජාණනි, ඒ භික්ෂුව පාණ්ඩවයට පෙරදැරිව
ගිරිගුහාවක සිංහයකු මෙන් ව්‍යාඝ්‍රයෙකු, වෘෂභරාජයකු මෙන් සිටී''
(418)

13. දූතයාගේ වචනය අසා රජුතෙම සුන්දර යානාවක නැඟී
පාණ්ඩව පර්වතය කරා ඉක්මනින් නික්ම ගියේය. (419)

14. යානයෙන් යා හැකි දුර යානයෙන් ගොස් රජු රථයෙන් බැස
පයින් (තවුසා) වෙත පැමිණ, ඔහු ළඟින් හිඳගත්තේය. (420)

15. හිඳගත් රජු පිළිසඳර කතා කොට
ඉක්බිතිව මේ අර්ථය පැවසීය. (421)

16. ''යොවුන්ය, තරුණය, උපතින් පළමු තුරුණු වියේ පසුවන්නේය.
මනා රූපයෙන් හා ආරෝහපරිණාහයෙන් යුක්තය. උසස් උපතක්
ඇති ක්ෂත්‍රියයකු වැනිය. (422)

17. බල සෙනඟට අග්‍ර වී ඇත් සෙනඟ පරිවරණ ලදුව හොබනේය.
මම වස්තුව දෙමි. පරිභෝග කරව, අසන ලදුව කුලය කියන්න.''
(423)

18. "රජතුමනි, උතුරු රට හිමාලය අසල
කොසොල් රාජ්‍යයේ පිහිටි ධනයෙන් හා වීර්යයෙන් යුත් රටක් වෙයි.
(424)

19. එහි සූර්‍ය වංශයට අයත් ශාක්‍යයනම් ජාතියක් වෙයි.
එම පවුලෙන් පැමිණ පැවිදි වීමි, රජතුමනි කාමය නොපතමි. (425)

20. කාමයන්හි ආදීනව දැක නෛෂ්කර්මය ක්ෂෙමය ලෙස දැක
ප්‍රධන් වීර්යය වැඩීමට යන්නෙමි. මගේ සිත එහි රැඳුනිය." (426)

3.2 ප්‍රධන් වීර්යය සූත්‍රය

1. ඒ මම බන්ධන වලින් නිදහස් බව ලැබීමට නෙරංජනා නදී තෙර
   ප්‍රධන් වීර්යයෙන් යුක්තව දැඩි පරාක්‍රමයකින් බවුන් වඩද්දී, (427)

2. නමුචි (මාරයා) තෙම කාරුණික වදන් පවසමින් ළගට පැමිණියේය.
   ''නුඹ කෙට්ටුය දුර්වර්ණය, නුඹේ මරණය අත ලගමය. (428)

3. මරණය හා ජීවිතය අතර අනුපාතය දහසට එකකි.
   භවත, ජීවත් වන්න, ජීවත් වීම ශ්‍රේෂ්ඨය, ජීවත් වී පිංකම් කරන්න.
   (429)

4. බ්‍රහ්මචර්යාවේ හැසිරෙමින් ගිනිපුදන්න, දන් දෙන්න.
   ඔබට බොහෝ පින් රැස්වන්නේය. ප්‍රධන් වීර්යයෙන් ඇති ඵලය
   කුමක්ද? (430)

5. ප්‍රධන් මාර්ගය දුර්ගයකි, දුෂ්කරය, ප්‍රතිඵල ලැබීම දුෂ්කරය.''
   බුදුරදුන් හමුවෙහි සිට මාරයා මේ ගාථා කීය. (431)

6. එසේ පවසන ඒ මරුට භාග්‍යවතුන් වහන්සේ මෙය කීහ.
   ''යම් කිසි හේතුවකින් මෙහි පැමිණියා වූ, ප්‍රමාදයට නෑ වූ පාපිය,
   (432)

7. පිනෙන් මට අංශුමාත්‍රයකුදු ප්‍රයෝජනයක් ඇත්තේ නැත.
   යමෙකුට පිනෙන් ප්‍රයෝජනයක් වේද, මාරය, ඔවුනට කීම නිසිය.
   (433)

8. ශ්‍රද්ධාව ඇත, එලෙසම වීර්යයත්, ප්‍රඥාවත් මා කෙරේ ඇත.
   මෙලෙස මා දැඩිව වීර්යය වඩද්දී ජීවිතය ගැන විමසන්නේ ඇයි?
   (434)

9. මෙම වාතය (සුළඟ) ගංගා ආදී දිය දහරාත් වියලවා දමයි.
   (එය) දැඩිව වීර්යය වඩන මාගේ ලෙය වියලවන්නේ නැත්තේ ඇයි?
   (435)

10. ලෙය වියැලෙන කල්හි පිත හා සෙමත් වියැලෙයි.
    මස ක්ෂය වී යද්දී සිත බෙහෙවින් පහන් වේ.
    සති සමාධි හා ප්‍රඥාවද බෙහෙවන් මා කෙරෙහි පිහිටයි. (436)

11. ඒ මම මෙලෙස වෙසෙද්දීත්, දැඩි වේදනාවට පත්ව සිටිද්දීත්
    සිත කාමයන් නොපතයි. සත්ත්වයාගේ පාරිශුද්ධිය බලන්න. (437)

12. කාමයන් තොපගේ පළමු සේනාවයි, දෙවැන්න (බඹසර) කනස්සල්ල (අරතිය) යැයි කියනු ලැබේ.
තාගේ තෙවැන්න සාපිපාසාවයි, සතර ආශාව යැයි කියනු ලැබේ. (438)

13. තාගේ පස්වැන්න නිදිමත හා මැලි බවයි, භය බිය යැයි කියැවේ.
තාගේ හත්වැන්න සැකයයි, ගුණමැකීම හා සිතේ තදබව ඔබේ අටවැන්නයි. (439)

14. ලාභ ප්‍රශංසා සත්කාර හා වැරදි ලෙස ලැබූ කීර්තියද
යමෙක් තමන් උසස් කොට දක්වමින් අනුන් හෙලාදකීද (එයද) (440)

15. නමුචිය[1], ඒ තාගේ සේනාවයි,
කලුවාගේ[2] පහරදෙන හමුදාවයි.
දුර්වලයාට එය (එම සේනාව) දිනිය නොහැක,
දිනාම සැපයට පැමිණිය යුතුය. (441)

16. ඒ මුදුතණ පරිහරණය කරමි.[3] මෙහි ජීවිතයට නින්‍දා වේවා.
යම් පැරදී ජීවත් වීමකට වඩා සටනේදී මියයාම මට ශ්‍රේෂ්ඨය. (442)

17. ඇතැම් ශ්‍රමණ බ්‍රාහ්මණයින්
එහි (ඒ කෙලෙස්වල) ගිලුනාහු අප්‍රකට වෙත්
මනා වෘත ඇත්තවුන් යම් මඟකින් යාද,
ඒ මාර්ගයද (ඔවුහු) නොදනිත්. (443)

18. වාහනය මත නැගුණු මාරයා සහිත සේනාව
යුධ පිණිස හාත්පසින් සිටිනු දැක
යුධ පිණිස ඉදිරියට යෙමි.
(මගේ) ස්ථානයෙන් (පර්යංකයෙන්) මා බැහැර නොකෙරේවා ! (444)

19. දෙවියන් සහිත ලෝකයාට මැඩලිය නොහැකි ඒ සේනාව
අමු මැටි පාත්‍රයක් ගලකින් වනසන්නා සේ ප්‍රඥාවෙන් වනසමි. (445)

20. සිතුවිලි පාලනය කොට සතිය මැනවින් පිහිටුවා
බොහෝ ශ්‍රාවකයන් හික්මවමින් රටින් රට ඇවිදිමි. (446)

---

[1] මාරයාට පර්යාය පදයකි

[2] මාරයාට පර්යාය පදයකි

[3] බවුන් වැඩීම සඳහා ආසනය ලෙස අතුරන්නේ මුදුතණ වැනි තණය

21. ඔවුහු අප්‍රමාදීව වීර්යය වඩන්නාහු, මගේ උපදෙස් පිළිපදින්නාහු ඔබගේ අකැමැත්ත පිටම, යම් තැනකට ගොස් ශෝක නොකෙරේද, එතැනට යති.'' (447)

22. (මාරයා)
''භාග්‍යවතුන් සත් අවුරුද්දක් පියවරෙන් පියවර ලුහුබැන්දෙමි.
සතිමත් සම්බුදුන්ගේ බැස ගැනීමට තැනක් (සිදුරක්) නොලදිමි.
(448)

23. යම් සේ කපුටෙක් මේදවර්ණ පාෂාණයක් වටා යන්නේ
''මෙහි මෘදු බවක් විඳින්නේ නම් මැනවි,
ආශ්වාදයක් විඳින්නේ නම් මැනවි''යි සිතාද (449)

24. එහි ආශ්වාදයක් නොලබා කපුටා එයින් ඉවත්ව ගියේය.
ඒ ගලෙහි ගැටුනු කපුටා සේ ගෞතමයන් කෙරෙහි කළකිරී ඉවත්ව යන්නෙමු'' (450)

25. ඒ ශෝකයෙන් පීඩිතයාගේ කිහිල්ලෙන් වීණාව වැටුණි.
එයින් ඒ ශෝකී සිතැති යක්ෂයා එතැනම අතුරුදහන් විය. (451)

3.3 සුභාෂිත සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී. එක් සමයක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවනයෙහි අනේපිඬු සිටාණන්ගේ ආරාමයේ වැඩවෙසෙති. එහිදී භාග්‍යවතුන් වහන්සේ ''මහණෙනි'' කියා භික්ෂූන් ඇමතූහ. ''ස්වාමිනී'' යැයි භික්ෂූහු පිළිතුරු දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළහ. ''මහණෙනි, අංග හතරකින් යුත් වචනය සුභාෂිත වෙයි. දුර්භාෂිත නොවෙයි, නිවැරැදි වෙයි, නුවණැත්තන්ගේ ගැරහීමට ලක් නොවේ. කුමන සතරකින්ද? මහණෙනි, මෙහි භික්ෂුව

1. සුභාෂිතයක්ම කියයි. දුර්භාෂිතයක් නොකියයි.
2. ධර්මයම කියයි. අධර්මය නොකියයි.
3. ප්‍රිය වචනය කියයි. අප්‍රිය වචනය නොකියයි.
4. සත්‍යයම කියයි. බොරුවක් නොකියයි.

මහණෙනි, මෙම අංග හතරින් යුත් වචනය සුභාෂිත වෙයි, දුර්භාෂිත නොවෙයි. නිවැරදිද වෙයි. නුවණැත්තන්ගේ ගැරහීමට ලක් නොවේ''. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක. මෙය වදාරා සුගතයන් වහන්සේ ඉක්බිති මෙය කීහ:

1. සත්පුරුෂයා සුභාෂිතය උතුම් යැයි කීය.
ධර්මය කියයි. අධර්මය නොවේ. එය දෙවැන්නයි.
ප්‍රිය තෙපුල් කියයි. අප්‍රිය දේ නොවේ. එය තෙවැන්නයි.
සත්‍යය කියයි. බොරුවක් නොවේ. එය සතර වැන්නයි. (452)

ඉක්බිති ආයුෂ්මත් වංගීස තෙරුන් අස්නෙන් නැගිට සිවුර ඒකාංශ කොට භාග්‍යවතුන් වහන්සේට ඇඳිලි බැඳ මෙය කීය. ''භාග්‍යවතුන් වහන්ස, මට කියන්නට අවසරයි''. ''වංගීස එය කියන්න''යි බුදුරදුන් කීහ. ඉක්බිති ආයුෂ්මත් වංගීස තෙරුන් භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි සුදුසු ගාථාවලින් පැසසූහ.

2. යම් බසෙකින් තමා තැවුලට පත් නොවේද, අන්අය නොපෙළන්නේද,
එවැනි බස්ම කියන්නේය, එකැතින්ම එම වචනය සුභාෂිතයකි.[1]
(453)

---

[1] කරුණු 4න් පළමු කරුණ මෙහි විස්තර කෙරේ.

3. යම් වචනයක් සතුටින් පිළිගනීද, ඒ ප්‍රිය වචනම කියන්නේය.
යම් පාපී වචනයක් නොගෙන, අන්අයට ප්‍රිය බසක් කියන්නේය.
(454)

4. ''සැබැවින්ම සත්‍යය අමෘත වචනයයි, එය සදාකාලික ධර්මතාවයකි''යි
සත්පුරුෂයෝ සත්‍යයේ, යහපතේ, ධර්මයේ පිහිටා කීහ. (455)

5. ක්‍ෂෙම වූ නිවනට පැමිණීමට, දුක් කෙළවර කිරීමට
බුදුරදුන් යම් වචනයක් දෙසයිද, එය වචන අතරින් උත්තම වේ.
(456)

3.4 සුන්දරික භාරද්වාජ සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ කොසොල් රට සුන්දරිකා නදී තීරයේ වසන සේක. එකල්හි සුන්දරික භාරද්වාජ බමුණා සුන්දරිකා ගං ඉවුරේ ගිනි පුදයි. අග්නි හෝමය පවත්වයි. ඉක්බිති සුන්දරික භාරද්වාජ බමුණු ගිනි පුදා, අග්නිහෝම පවත්වා නැගිට ''කවරෙක් නම් මේ හව්‍යශේෂය (ගිනි පුදා ඉතුරු වූ ආහාර) බුදින්නේද''යි හාත්පස සිව්දිග බැලීය. ඔහු නුදුරෙහි එක් ගසක් මුල හිස වසා පොරවා සිටින භාග්‍යවතුන් වහන්සේ දුටුවේය. දැක වම් අතින් හව්‍යශේෂය ගෙන දකුණතින් කෙංඩිය ගෙන භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණියේය. භාග්‍යවතුන් වහන්සේ ඔහුගේ පා හඬට හිස විවර කළහ. ඉක්බිති සුන්දරික භාරද්වාජ බමුණු ''මේ භවත තට්ටයෙකි, මේ භවත තට්ටයෙකි''යි එතැනින්ම ආපසු හැරෙනු කැමති විය. ඉක්බිති ඔහුට මෙසේ සිතින ''ඇතැම් බමුණෝද තට්ට හිස් ඇත්තෝ වෙති. මම ඔහු වෙත ගොස් කුලය විමසන්නෙම් නම් මැනවි''යි. ඉක්බිති ඔහු භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ මෙසේ ඇසීය ''භවත්නි, කුමන කුලයට අයත්ද?'' ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඔහුට ගාථාවන්ගෙන් ඇමතූහ:

1. බ්‍රාහ්මණයෙක් නොවෙමි, රාජපුත්‍රයෙක්ද නොවෙමි.
   වෛශ්‍යද නොවෙමි, වෙන කිසිවෙකුද නොවෙමි.
   පුහුදුන් ජනයාගේ ගෝත්‍ර පිරිසිඳ දැන
   කිසිවක් (අයිති) නැතිව ප්‍රඥාවෙන් ලොව හැසිරෙමි. (457)

2. කඩකැප්පූ සිවුර දරමින් ගෙයක් නොමැතිව
   කෙස් බා, මැනවින් නිවුනේ
   මෙලොව මිනිසුන් හා නොඇලෙමින් හැසිරෙමි.
   බමුණ මගෙන් නොඇසිය යුතු ගෝත්‍ර ප්‍රශ්නයක් ඇසුවෙහිය. (458)

3. (බමුණා)
   භවත්නි, බමුණෝ බමුණන් සමඟ ඒකාන්තයෙන්
   (ඔබ) බ්‍රාහ්මණයෙක්ද නැතිනම් නොවේදැයි විමසත්.

   (භාග්‍යවතුන් වහන්සේ) :
   ඉදින් ඔබ බ්‍රාහ්මණයෙක් යැයිද මම අබ්‍රාහ්මණයෙක් යැයිද කියානම්
   අකුරු විසි හතරක් ඇති පද තුනක් ඇති 'සාවිත්තිය' විමසමි.
   (459)

4. (බමුණා)
කුමක් හේතුවෙන් ඍෂිවරු මිනිස්සු රජදරුවන් බමුණන්
මෙලොවදී දෙවිවරුන්ට බොහෝ යාග කෙරෙත්ද?

(භාග්‍යවතුන් වහන්සෙ)
යමෙක් (සසර) කෙළවරට ගියේද, නුවණින් පරතෙරට ගියේද
යාග කාලයේ (ඔහුට) යමෙකුගේ දානය දේද,
ඔහුගේ ඒ යාගකර්මය සමෘද්ධ වේ යැයි කියමි.[1] (460)

5. (බමුණා)
සැබැවින්ම ඔහුගේ යාගය සමෘද්ධ වේ
එවැනි වූ වේදයෙන් (දැනුමෙන්) පරතෙරට ගිය කෙනෙකු දකිමි.
ඔබ වැන්නන් නොදැකීම නිසා
අන්‍ය ජනයා පූජා (සඳහා භාවිතා කරන) කැවිලි වළඳත්. (461)

6. (භාග්‍යවතුන් වහන්සේ)
එම නිසා බ්‍රාහ්මණය, ඔබට යහපතින් ප්‍රයෝජන ඇති නිසා
ශාන්ත වූ, (කෙලෙස්) දුම රහිත, සිත් කරදර නැති, ආශා රහිත
(කෙනෙකු) වෙත එළඹ විමසන්න
මෙහි ඉතා නුවණැත්තෙක් (ඔබට) ලැබෙන්නේ නම් මැනවි. (462)

7. (බමුණා)
භවත් ගෞතමයනි, මම යාගයෙහි ඇලුනෙමි
යාගයක් යදිනු කැමැත්තෙමි.
භවත්නි, මට අනුශාසනා කරන්න, කොතැනට දුන් යාගය
සමෘද්ධ වන්නේදැයි මම නොදනිමි, මේ කරුණ මට කියා දෙන්න
(463)

(භාග්‍යවතුන් වහන්සේ)
එසේනම් බමුණ නුඹ සවන් යොමු කරන්න. නුඹට ධර්මය දෙසමි.

8. කුලය අසනු එපා, හැසිරීම් රටාවම විමසන්න.
(ඕනෑම) දරකඩකින් නියත ලෙස ගිනි උපදී.
පහත් කුලයේ නමුදු නුවණැති මුනිවරයා
පවට ලැජ්ජාවෙන් පව වළකන්නේ, ශ්‍රේෂ්ඨ වන්නේය. (464)

9. සත්‍යයෙන් දමනය වූ, (ඉන්ද්‍රිය) සංවරයට පැමිණි
වේදයෙන් (දැනුමින්) කෙළවරට ගියේ, බඹසර වැස නිමවූ (ඔහුට)
යම් බමුණෙක් පිං අපේක්ෂාවෙන් යාග කෙරේ නම්,
ඔහුට සුදුසු කාලයේ යාග ද්‍රව්‍ය (දානය) පුදන්න. (465)

---

[1] මෙම ගාථා යුගලය අවුල් වී ගොස් ඇති සෙයක් පෙනේ

10. යමෙක්, කාමයන් හැරපියා, නිවෙසක් නොමැතිව හැසිරෙත්ද
මැනවින් සංවර වූ බැවින් (පිළිවියන) තරස් දණ්ඩක් සේ ඍජු වෙත්ද
යම් බමුණෙක් පිං අපේක්ෂාවෙන් යාග කෙරේනම්
ඔවුනට සුදුසු කාලයේ දානය පුදන්න. (466)

11. යමෙක් රාගය දුරු කරන ලද්දෝද, මැනවින් සන්සුන් ඉඳුරන් ඇත්තෝද
චන්ද්‍රග්‍රහණයෙන් මිදුණු සඳ මෙන් වන්නෝද (පරිපූර්ණ වෙත්ද)
යම් බමුණෙක් පිං අපේක්ෂාවෙන් යාග කෙරේනම්
ඔවුනට සුදුසු කාලයේ දානය පුදන්න. (467)

12. හැමවිටම සතිමත්ව, 'මගේ' යැයි ගැනීම හැරදා
ලෝකයෙහි නොඇලෙමින් හැසිරෙත්ද
යම් බමුණෙක් පිං අපේක්ෂාවෙන් යාග කෙරේනම්
ඔවුනට සුදුසු කාලයේ දානය පුදන්න. (468)

13. යමෙක් කාමයන් හැරපියා, (කාමයන්) මඬිමින් හැසිරේද
යමෙක් උපතේ හා මරණයේ කෙළවර නුවණින් දැනගත්තේද
සීත පොකුණක් සේ මැනවින් නිවී ගියේද
(ඒ) තථාගතයන් පූජා (සඳහා භාවිතා කරන) කැවිලි ලැබීමට සුදුසුය. (469)

14. හොඳ පුද්ගලයන් හා සමඟ හැසිරෙන්නේ, විෂම අයගෙන් දුර වූයේ
තථාගතයන් අනන්ත ප්‍රඥාවෙන් යුතු වන්නේ
මෙලොව හෝ පරලොව හෝ නොඇලුනු
(ඒ) තථාගතයන් පූජා කැවිලි ලැබීමට සුදුසුය. (470)

15. යමෙක් කෙරෙහි රැවටිල්ල හෝ මාන්නය නොවේද
යමෙක් තණ්හාව පහ කළේ, 'මගේ' යැයි දෙයක් නැත්තේ, ආශාව නැත්තේ
ක්‍රෝධය දුරු කළේ, මැනවින් නිවී ගියේ
යම් බ්‍රාහ්මණයෙක් ශෝක කිලුට ප්‍රහීණ කළේද
(ඒ) තථාගතයන් පූජා කැවිලි ලැබීමට සුදුසුය. (471)

16. යමෙක් මනසේ නිවාස (සිත රැඳෙන තැන්) දුරලී ද
යමෙකුට කවර වූ හෝ අල්ලාගත් දෙයක් නැතිද
මෙලොව හෝ පරලොව කිසිවක් අල්ලා නොගත්තේ
(ඒ) තථාගතයන් පූජා කැවිලි ලැබීමට සුදුසුය. (472)

17. තැන්පත් සිතක් ඇත්තේ, යමෙක් සැඩපහර තරණය කළේද
පරම වූ දැක්මෙන් ධර්මය අවබෝධ කළේද
ආශ්‍රව ක්‍ෂය කළේ, අන්තිම ශරීරය දරණ
(ඒ) තථාගතයන් පූජා කැවිලි ලැබීමට සුදුසුය. (473)

18. යමෙකුගේ භව තණ්හාව ද, රළු වචන ද,
පිඹ හරින ලද්දේ ද, අස්ථයට ගියේ, ඇත්තේ නැතිද
ඒ වේදයෙන් (දැනුමෙන්) පරතෙරට ගිය, හැම අතින්ම විමුක්ත වූ
(ඒ) තථාගතයන් පූජා කැවිලි ලැබීමට සුදුසුය. (474)

19. (කාම) උගුල් ඉක්මවූයේ, යමෙකුට උගුල් කිසිවක් නැතිද
(මාන්නයෙන්) මනින සත්වයන් අතර ඔහු නොමනින කෙනෙකු වූයේ
(වැඩෙන) ක්‍ෂෙත්‍රය හා භූමිය සමඟ දුක පිරිසිඳ දැන ගත්තේ
(ඒ) තථාගතයන් පූජා කැවිලි ලැබීමට සුදුසුය. (475)

20. (සිත) ලගින තැනක් ඇසුරු නොකොට, (කාමයන්ගෙන්) විවේකය දකින්නේ
අන් අය දැනගත් දෘෂ්ඨි ඉක්මවා ගියේ
යමෙකුට අරමුණු (ආධාරක) කිසිවක් නැතිද
(ඒ) තථාගතයන් පූජා කැවිලි ලැබීමට සුදුසුය. (476)

21. විවිධාකාර වූ සියළු ධර්මතා යමෙකු දැනගෙන
පිඹ හරින ලද්දේද, අස්තයට ගියේ, ඇත්තේ නැතිද
ශාන්ත වූයේ, උපාදාන (අල්ලා ගැනීම) ක්‍ෂය කිරීමෙන් විමුක්ත වූයේ
(ඒ) තථාගතයන් පූජා කැවිලි ලැබීමට සුදුසුය. (477)

22. බැඳීම් වල හා උපතේ සම්පූර්ණ වැනසීම දැක
රාග මාර්ගය නිරවශේෂ ලෙස දුරු කළේ
පාරිශුද්ධ වූයේ, දොස් රහිත, (කෙලෙස්) කිළිටු නැති, නිර්මල
(ඒ) තථාගතයන් පූජා කැවිලි ලැබීමට සුදුසුය. (478)

23. යමෙක් තෙමේ ම (තමා තුල) ආත්මයක් නොදකී ද
තැන්පත් සිතක් ඇත්තේ, ඍජු වූයේ, ස්ථිරව පිහිටියේ
සැබැවින්ම ඔහු නොසැලෙන්නේ, ඇණුන හුල් නැත්තේ, සැක නැත්තේ
(ඒ) තථාගතයන් පූජා කැවිලි ලැබීමට සුදුසුය. (479)

24. යමෙකු තුල කිසිදු වූ මුළාවක් නැතිද
සියළු ධර්මයන්හි ඥාන දර්ශනය ඇත්තේ,
අන්තිම ශරීරයක් දරයිද
නිර්භය වූ අනුත්තර සම්බෝධියට පැමිණියේද
එතෙකින් යක්‍ෂයාගේ (සත්ත්වයාගේ) ශුද්ධිය වේ.
(ඒ) තථාගතයන් පූජා කැවිලි ලැබීමට සුදුසුය. (480)

25. (බමුණා)
මාගේ යාගය නුඹ වැනි වේදයෙන් (දැනුමෙන්) පරතෙරට ගිය
කෙනෙකු ලැබීමෙන් සත්‍ය යාගයක් වේවා! භාග්‍යවතුනි,
(ඔබ) විද්‍යාමාන බ්‍රහ්මයාය, මාගේ යාගය පිළිගන්නා සේක්වා!
භාග්‍යවතුන් මාගේ පූජා කැවිලි වළඳන සේක්වා! (481)

26. (භාග්‍යවතුන් වහන්සේ)
ගාථා කියා ලද්ද මට වැළඳීමට නොනිසිය.
බමුණ, (නිවැරදි දිවි පැවැත්ම) දකින්නාට එය (චාරිත්‍ර) ධර්මයක්
නොවේ.
ගාථා කියා ලද්ද බුදුවරු පිළිකෙව් කෙරෙත්.
(චාරිත්‍ර) ධර්ම ඇති කළ බමුණ, මේ ජීවන ක්‍රමයයි. (482)

27. පරිපූර්ණ වූ, මහාඍෂි වූ,
ආශ්‍රව ක්ෂය කළ, කුකුස් සන්සිඳුන ඔහුට
අන් ආහාරපාන වලින් උවටැන් කරන්න.
ඔහු පිං කැමැත්තාට පින් කෙතක් වන්නේය. (483)

28. (බමුණා)
භාග්‍යවතුනි, ඉතා මැනවි, යමෙක් මාගේ දක්ෂිණාව වැළඳීමට සුදුසුද
ඔහු ඒ ආකාරයෙන් දැන ගතිමි.
යාග කාලයේ දානය ලැබීමට සුදුස්සෙක් සොයමින් යන්නේ
ඔබගේ ශාසනයට පැමිණියෙමි. (484)

29. යමෙකු ප්‍රචණ්ඩත්වයෙන් තොරවේද, යමෙකුගේ සිත නොකැළඹුණිද
කාමයන්ගෙන් මැනවින් මිදුනේද, යමෙකු මැලි බව දුරු කළේ ද
(485)

30. සීමා මායිම් දුරු කළේ
උපත, මරණය ගැන දක්ෂ වූයේ (දැන ගත්තේ)
මුනිවරයෙකුගේ ගුණ වලින් යුත්
එවැනි වූ මුනිවරයෙක් යාගයට පැමිණියේය. (486)

31. බැම හැකිලීම් දුරලා ඇඳිලි බැඳ වඳින්න.
ආහාරපාන පූජා කරන්න, එලෙස දක්ෂිනාව සමෘද්ධ වන්නේය.
(487)

32. අනුත්තර පින් කෙත වූ
බුදුරදුන් පූජා කැවිලි ලැබීමට සුදුසුය.
මුළු ලෝකයාටම දන් දීමට සුදුස්සාය,
භවත්හුට, දුන්දේ මහත්ඵල වන්නේය. (488)

ඉක්බිති සුන්දරික භාරද්වාජ බමුණු භාග්‍යවතුන් වහන්සේට මෙය කීය. ''ඉතා මනහරය භවත් ගෞතමයාණෙනි, ඉතා මනහරය. යම් සේ යටිකුරු කරන ලද්දක් උඩුකුරු කරන්නේද, වැසුණු දෙයක් විවර කරන්නේද, මුළා වූවකුට මාර්ගය කියන්නේද, 'ඇස් ඇත්තෝ රූප දකින්නෝයැ'යි අඳුරේ තෙල් පහනක් දරන්නේද, එලෙසින්ම භවත් ගෞතමයන් විසින් නන් අයුරින් ධර්මය දෙසන ලදී. මම භවත් ගෞතමයන්ද ධර්මයද භික්ෂු සංඝයාද සරණ කොට යමි. මා හට භවත් ගෞතමයන් ලඟ පැවිද්ද ලැබේවා, උපසම්පදාව ලැබේවා.''

සුන්දරික භාරද්වාජ බමුණාට භාග්‍යවතුන් වහන්සේ ලඟ පැවිද්ද හා උපසම්පදාව ලැබුණි. ආයුෂ්මත් සුන්දරික භාරද්වාජ තෙමේ උපසම්පදාව ලැබ නොබෝ කලකින් එකලා වූයේ වෙන් වූයේ අප්‍රමාදීව වීර්යයෙන් යුක්තව වසන්නේ යම් කාරණයක් සඳහා කුල පුත්‍රයෝ ගිහිගෙයින් නික්ම මනාකොට පැවිදිවෙත්ද, නොබෝ කලකින්ම ඊට හේතු වූ ඒ උත්තරීතර බඹසර කෙළවර මේ දිවියේදීම තමා විසින්ම මැනවින් දැන පසක් කොට එළඹ විසීය 'ඉපදීම ක්ෂය විය. බඹසර වැස නිමවිය, කළ යුත්ත කරන ලදී. මේ භවයෙන් එහාට යෑමක් නැතැ'යි දැන ගත්තේය. ආයුෂ්මත් සුන්දරික භාරද්වාජ තෙමේ රහතුන් අතුරෙන් එක් අයෙක් විය.

3.5 මාඝ සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී. එක් සමයක භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර ගිජ්ඣකූට පර්වතයේ වාසය කරති. ඉක්බිති මාඝ තරුණයා භග්‍යවතුන් වහන්සේ කරා එළඹ පිළිසඳර කතා කොට එක් පසෙක හිඳ ගත්තේය. එක් පසෙක හිඳගත් මාඝ තරුණයා භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය.

''භවත් ගෞතමයනි, මම වනාහි දානපති දායකයෙක් වෙමි. යදියන්ගේ බස් දන්නේ, දීමෙහි යෙදුනෙම්, ධාර්මිකව වස්තුව සොයමි. ධාර්මිකව ධනය සොයා, ධාර්මිකව ලත්, ධාර්මිකව ලබාගත් ධනයෙන් එක් අයෙකුටද දෙමි, දෙදෙනෙකුටද දෙමි, තිදෙනෙකුටද දෙමි, දස දෙනෙකුටද දෙමි, විසි දෙනෙකුටද දෙමි, පනහකටද දෙමි, සියයකටද දෙමි, ඊට වැඩියෙනුත් දෙමි. භවත් ගෞතමයනි, මෙලෙස දෙන්නේ, මෙලෙස යාග කරන්නේ කිම මම බොහෝ පිං රැස් කරන්නෙම්ද?''

''තරුණය, ඒකාන්තයෙන් නුඹ එලෙස දෙන්නේ, එලෙස යාග කරන්නේ බොහෝ පිං රැස් කරන්නෙහිය. තරුණය, යමෙක් දානපති දායකයෙක් වූයේ, යදියන්ගේ බස් දන්නේ, දීමෙහි යෙදුනේ, ධාර්මිකව වස්තුව සොයන්නේ, ධාර්මික ධනය සොයා, ධාර්මිකව ලත්, ධාර්මිකව ලබාගත් ධනයෙන් එක් අයෙකුටද, දෙදෙනෙකුටද, තිදෙනෙකුටද, දස දෙනෙකුටද, විසි දෙනෙකුටද, පනහකටද, සියයකටද දෙයි නම්, ඊට වැඩියෙනුත් දෙයි නම් බොහෝ පිං රැස් කරන්නේය''

ඉක්බිති මාඝ තරුණයා භාග්‍යවතුන් වහන්සේට ගාථාවෙන් මෙය කීය.

1. වදන් වල අරුත් දන්නා කසට සිවුරක් දරන
 ගෙයක් නැතිව හැසිරෙන භවත් ගෞතමයන් මම විමසමි.
 යම් දීමෙහි යෙදුන දානපති ගිහියෙක්
 පිනෙන් ප්‍රයෝජන ඇත්තේ, පිං අපේක්ෂාවෙන් යාග කෙරේද
 මෙහිදී (මෙලොවදී) අන් අයට කෑම බීම දේද
 කවරකුට දෙන කල්හි ඔහුගේ එම යාගය පිරිසිදු වේද? (489)

2. (භාග්‍යවතුන් වහන්සේ)
 යම් දීමෙහි යෙදුනු දානපති ගිහියෙක්
 පිනෙන් ප්‍රයෝජන ඇත්තේ, පිං අපේක්ෂාවෙන් යාග කෙරේද
 මෙහිදී අන් අයට කෑම බීම දේද
 (ඒ යාගය) ස්ථිරසාර වූ 'දක්ෂිණාවට සුදුස්සන්' කෙරෙහි සඵල
 වන්නේය. (490)

3. (මාඝ)
යම් දීමෙහි යෙදුනු දානපති ගිහියෙක්
පිනෙන් ප්‍රයෝජන ඇත්තේ, පිං අපේක්ෂාවෙන් යාග කෙරේද
මෙහි දී අන් අයට කෑම බීම දේද
භාග්‍යවතුනි, මට 'දක්ෂිණාවට සුදුස්සන්' ප්‍රකාශ කරන්න. (491)

4. (භාග්‍යවතුන් වහන්සේ)
ඉදින් යමෙක් ලෝකයෙහි නොඇලී හැසිරේත්ද
කිසිවක් (අයිති) නැත්තෝ, පූර්පූර්ණ වූවෝ, සංසිඳුනු සිත් ඇත්තෝද
යම් බමුණෙක් පිං අපේක්ෂාවෙන් යාග කෙරේ නම්
ඔවුනට සුදුසු කාලයේ යාග ද්‍රව්‍ය (දානය) පුදන්න. (492)

5. යමෙක් සියළු බැඳීම් බන්ධන සිඳලුවෝද
දැමුනාහු, විමුක්ත වූවෝ, සිත් තැවුල් නැත්තෝ, ආශා නැත්තෝද,
යම් බමුණෙක් පිං අපේක්ෂාවෙන් යාග කෙරේ නම්
ඔවුනට සුදුසු කාලයේ දානය පුදන්න. (493)

6. යමෙක් සියළු බැඳීම් වලින් මොනවට මිදුනෝද
දමුනාහු, විමුක්ත වූවෝ, සිත් තැවුල් නැත්තෝ, ආශා නැත්තෝද
යම් බමුණෙක් පිං අපේක්ෂාවෙන් යාග කෙරේ නම්
ඔවුනට සුදුසු කාලයේ දානය පුදන්න. (494)

7. රාගයත් ද්වේශයත් මුළාවත් හැරපියා
ආශ්‍රව ක්‍ෂය කළෝ, බඹසර වැස නිම කළෝද
යම් බමුණෙක් පිං අපේක්ෂාවෙන් යාග කෙරේ නම්
ඔවුනට සුදුසු කාලයේ දානය පුදන්න. (495)

8. යමෙක් කෙරෙහි රැවටිල්ල හෝ මාන්නය නොවේද
යමෙක් තණ්හාව පහ කළෝද, 'මගේ' යැයි දෙයක් නැත්තෝ, ආශා නැත්තෝද
යම් බමුණෙක් පිං අපේක්ෂාවෙන් යාග කෙරේ නම්
ඔවුනට සුදුසු කාලයේ දානය පුදන්න. (496)

9. යමෙක් නිසැකවම තණ්හාවෙහි නොවැටුනෝද
සැඩපහර තරණය කොට, 'මගේ' යැයි දෙයක් නැතිව හැසිරෙන්නෝද
යම් බමුණෙක් පිං අපේක්ෂාවෙන් යාග කෙරේ නම්
ඔවුනට සුදුසු කාලයේ දානය පුදන්න. (497)

10. මෙලොව හෝ පරලොව විවිධ දේ කෙරෙහි
යමෙකුහට ලෝකයෙහි කිසිදු වූ ආශාවක් නැතිද
යම් බමුණෙක් පිං අපේක්ෂාවෙන් යාග කෙරේ නම්
ඔවුනට සුදුසු කාලයේ දානය පුදන්න. (498)

11. යමෙක් කාමයන් හැරපියා නිවෙසක් නොමැතිව හැසිරෙන්නෝද
මැනවින් සංවර වූ බැවින්, (පිළිවියන) තරස් දණ්ඩක් සේ ඍජු වේද
යම් බමුණෙක් පිං අපේක්ෂාවෙන් යාග කෙරේ නම්
ඔවුනට සුදුසු කාලයේ දානය පුදන්න. (499)

12. යමෙක් රාගය දුරු කරන ලද්දෝ, මැනවින් සන්සුන් ඉඳුරන් ඇත්තෝ
චන්ද්‍රග්‍රහනයෙන් මිඳුනු සඳ මෙන් වන්නෝද (පරිපූර්ණ වෙත්ද)
යම් බමුණෙක් පිං අපේක්ෂාවෙන් යාග කෙරේ නම්
ඔවුනට සුදුසු කාලයේ දානය පුදන්න. (500)

13. සංසිඳුනෝ, රාගය දුරු කළෝ, කෝප රහිතද
යමෙකුහට මේ භවය හැරපියා වෙන භවයකට යෑමක් නැතිද,
යම් බමුණෙක් පිං අපේක්ෂාවෙන් යාග කෙරේ නම්
ඔවුනට සුදුසු කාලයේ දා3නය පුදන්න. (501)

14. ඉතිරි නැතිව උපත හා මරණය හැරපියා
සියළු සැක ඉක්මවා ගියෝද
යම් බමුණෙක් පිං අපේක්ෂාවෙන් යාග කෙරේ නම්
ඔවුනට සුදුසු කාලයේ දානය පුදන්න. (502)

15. යමෙක් තමන් තමුන්ටම දූපතක් කරගෙන ලෝකයේ හැසිරෙත්ද,
කිසිවක් (අයිති) නැත්තා වූ, හැම දෙයින්ම නිදහස් වූවෝද
යම් බමුණෙක් පිං අපේක්ෂාවෙන් යාග කෙරේ නම්
ඔවුනට සුදුසු කාලයේ දානය පුදන්න. (503)

16. මේ අවසාන (උපත) යැයි, නැවත ඉපදීමක් නැතැයි
යමෙක් එතැන මෙය තත් වූ පරිදි දනිත්ද
යම් බමුණෙක් පිං අපේක්ෂාවෙන් යාග කෙරේ නම්
ඔවුනට සුදුසු කාලයේ දානය පුදන්න. (504)

17. යමෙක් දැනුමෙන් පරතෙරට ගියෝ, භාවනාවෙහි ඇළුනෝ සතිමත්ද
සම්බෝධියට පැමිණියෝ, බොහෝ දෙනෙකුට පිළිසරණක් වූවෝද
යම් බමුණෙක් පිං අපේක්ෂාවෙන් යාග කෙරේ නම්
ඔවුනට සුදුසු කාලයේ දානය පුදන්න. (505)

18. (මාඝ)
සැබැවින්ම මාගේ විමසීම නොසිස් විය.
භාග්‍යවතුන් මට 'දක්ෂිණාවට සුදුස්සන්' දේශනා කළහ.
නුඹ වහන්සේ එතැන මෙය තත් වූ පරිදි දන්නාහ.
ඔබ වහන්සේ විසින් ඇති සැටියෙන්ම එම ධර්මය දන ගන්නා ලදී.
(506)

19. යම් දීමෙහි යෙදුනු දානපති ගිහියෙක්
පිනෙන් ප්‍රයෝජන ඇත්තේ පිං අපේක්ෂාවෙන් යාග කෙරේද
මෙහිදී අන් අයට කෑම බීම දේද
භාග්‍යවතුනි, මට දාන සම්පත්තිය වදාළ මැනව. (507)

20. (භාග්‍යවතුන් වහන්සේ)
දන් දෙන්නේ (ඒ ගැන පමණක් සිතමින්) දන් දෙන්න
(ලබන) සියළු දෙනා කෙරෙහි චිත්ත ප්‍රසාදය ඇති කර ගන්න [1]
දන් දෙන්නාගේ අරමුණ දන්දීමයි.
ඒ තැන (සිත) පිහිටුවා ද්වේශය දුරලයි [2] (508)

21. ඔහු (දෙන ද්‍රව්‍ය ගැන) ඇලීම දුරලූයේ [3] ද්වේෂයත් මැඩලයි
දිවා රෑ නිතරම අප්‍රමාදී වී
අප්‍රමාණ වූ මෛත්‍රී සිත වඩයි
(ඒ) අප්‍රමාණ දැහැන සියළු දිශාවල පතුරවන්නේය. (509)

22. (මාඝ)
කවරෙක් පිරිසිදු වේද? මිදේද? බැඳේද?
තමන් කෙසේ බ්‍රහ්මලෝකයට යන්නේද?
මුනිවරයානෙනි, නොදන්නා මම විමසන ලද්දේ කියනු මැන
භාග්‍යවතුන් වනාහි මා අද දුටු විද්‍යාමාන බ්‍රහ්මයාය
ඔබ අපට බ්‍රහ්මයා සම යැයි කීම සත්‍යයකි.
ආලෝකය දෙන්නානෙනි, කෙලෙස බඹලොවට පැමිණේද? (510)

23. (භාග්‍යවතුන් වහන්සේ)
යමෙක් ත්‍රිවිධ දානසම්පත්තියෙන් යුක්තව
ස්ථිරසාර වූ 'දක්ෂිණාවට සුදුස්සන්' කෙරෙහි දන්දේද
දීමෙහි යෙදෙන්නා මෙලෙස මැනවින් දන් දී
බ්‍රහ්මලෝකයට එළඹෙන්නේ යැයි කියමි. (511)

මෙලෙස කී කල්හි මාඝ තරුණයා භාග්‍යවතුන් වහන්සේට මෙය කීය. ''ඉතා මනහරය. භවත් ගෞතමයනි, ඉතා මනහරය. යම් සේ යටිකුරු කරන ලද්දක් උඩුකුරු කරන්නේද, වැසුණු දෙයක් විවර කරන්නේද, මුළා වූවකුට මාර්ගය කියන්නේද, 'ඇස් ඇත්තෝ රූප දකින්නෝයැ'යි අඳුරේ තෙල් පහනක් දරන්නේද, එලෙසින්ම භවත් ගෞතමයන් විසින් නන් අයුරින් ධර්මය දෙසන ලදී. ඒ මම භවත් ගෞතමයන්ද ධර්මයද භික්ෂු සංඝයාද සරණ කොට යෙමි. භවත් ගෞතමයන් මා අද පටන් දිවිහිමියෙන් සරණ ගිය උපාසකයකු ලෙස දරණ සේක්වා.''

3.6 සභිය සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර උණුවනයෙහි ලෙහෙණුන්ගේ අභයභූමියේ වැඩවසති. එකල්හි සභිය පරිබ්‍රාජකයාගේ පැරණි ලේ නෑ දේවතාවියක් විසින් ප්‍රශ්න (කිහිපයක්) කියා දෙන ලදි. ''සභිය, යම් මහණෙක් හෝ බමුණෙක් මේ ප්‍රශ්න ඇසුව කල්හි නුඹට විසඳා දේද, ඔහු වෙත බඹසර හැසිරෙන්න''යි කියා.

ඉක්බිති සභිය පිරිවැජී ඒ දේවතාවිය හමුවේ එම ප්‍රශ්න උගෙන පිරිස් ඇති ශිෂ්‍යයන් ඇති ශිෂ්‍යයන්ට ගුරු වූ ප්‍රසිද්ධ කීර්තිමත් ශිෂ්‍යයන්ට තොටුපලක් බඳුවූ බොහෝ ජනයා විසින් හොඳ යැයි සම්මත යම් මහණ බමුණෝ ඇත්ද, එනම් පූරණ කස්සප, මක්ඛලිගෝසාල, අජිත කේසකම්බල, පකුධ කච්චායන, සංජය බේල්ලට්ඨිපුත්‍ර, නිගණ්ඨ නාතපුත්‍ර වෙත පැමිණ එම ප්‍රශ්න ඇසීය. ඔවුහු සභිය පිරිවැජී ප්‍රශ්න අසන ලද්දේ පිළිතුරු නොදෙත්. පිළිතුරු නොදෙන්නේ කෝපයත් ද්වේශයත් නොසතුටත් පහළ කරත්. සභියගෙන්ම නැවත පැන විමසත්. ඉක්බිති සභිය පරිබ්‍රාජකයාට මෙසේ සිතිනඃ ''යම් ඒ පිරිස් ඇති, ශිෂ්‍යයන් ඇති ශිෂ්‍යයන්ට ගුරු වූ ප්‍රසිද්ධ කීර්තිමත් ශිෂ්‍යයන්ට තොටුපලක් බඳුවූ බොහෝ ජනයා විසින් හොඳ යැයි සම්මත යම් මහණ බමුණෝ ඇත්ද, එනම් පූරණ කස්සප, මක්ඛලිගෝසාල, අජිත කෙසකම්බල, පකුධ කච්චායන, සංජය බේල්ලට්ඨිපුත්‍ර, නිගණ්ඨ නාතපුත්‍ර ද, ඔවුහු මා විසින් ප්‍රශ්න අසල ලද්දේ පිළිතුරු නොදෙත්. පිළිතුරු නොදෙන්නේ කෝපයෙන් ද්වේශයත් නොසතුටත් පහල කරති. මගෙන්ම නැවතත් ප්‍රශ්න අසති. මම හීන භාවයට (ගිහි බවට) ගොස් කම්සුව විඳින්නේ නම් මැනවි''යි කියාය.

ඉක්බිති සභිය පිරිවැජීට මෙසේ සිතින. ''මේ ශ්‍රමණ ගෞතමයනුත් පිරිස් ඇත්තෙකි. ශිෂ්‍යයන් ඇත්තෙකි. ශිෂ්‍යයන්ට ගුරු වූ ප්‍රසිද්ධ කීර්තිමත් ශිෂ්‍යයන්ට තොටුපලක් බඳුවූ බොහෝ ජනයා විසින් හොඳ යැයි සම්මතය. ශ්‍රමණ ගෞතමයන් වෙත එළඹ මෙම ප්‍රශ්න අසන්නේ නම් මැනවි''යි. යලිත් ඔහුට මෙසේ සිතින. ''යම් ඒ දිරුණු, වැඩිහිටි, මහළු , බොහෝ කල් ජීවත් වූ, පැසුළු වියට පැමිණි, තෙර, චිර රාත්‍රඥ, පැවිද්දෙන් බොහෝ කල් ගිය, පිරිස් ඇති, ශිෂ්‍යයන් ඇති, ශිෂ්‍යයන්ට ගුරු වූ, ප්‍රසිද්ධ, කීර්තිමත්, ශිෂ්‍යයන්ට තොටුපලක් බඳුවූ, බොහෝ ජනයා විසින් හොඳ යැයි සම්මත යම් මහණ බමුණෝ ඇත්ද, එනම් පූරණ කස්සප, මක්ඛලිගෝසාල, අජිත කෙසකම්බල, පකුධ කච්චායන, සංජය බෙල්ලට්ඨිපුත්‍ර, නිගණ්ඨ නාතපුත්‍ර ද, ඔවුහු මා විසින් ප්‍රශ්න අසල ලද්දේ පිළිතුරු නොදෙත්. පිළිතුරු නොදෙන්නේ කෝපයත්,

ද්වේශයත් නොසතුටත් පහල කරති. මගෙන්ම නැවතත් ප්‍රශ්න අසති. ශ්‍රමණ ගෞතමයන් කෙසේ මේ ප්‍රශ්න වලට පිලිතුරු දෙන්නද? ඔහු උපතින් තරුණය, පැවිද්දත් අළුත්ය.''

සභිය පිරිවැජිට නැවතත් මෙසේ සිතින. ''ශ්‍රමණයා තරුණ යැයි අපහාස නොකළ යුතුයි. ශ්‍රමණ ගෞතමයන් තරුණ වූවද මහා ඍද්ධි මෙන්ම මහා ආනුභාව ඇත්තෙකි. ශ්‍රමණ ගෞතමයන් වෙත එළඹ මේ ප්‍රශ්න අසන්නේ නම් මැනවි.'' ඉක්බිති සභිය පිරිවැජි රජගහනුවර වෙත චාරිකාවේ නික්මුණ. අනුපිළිවෙලින් රජගහනුවර වෙත පැමිණ උණ වනයෙහි ලෙහෙනුන්ගේ අභයභූමියේ සිටින භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹියේය. එළැඹ පිළිසඳර කතා නිමවා එක් පසෙක හිඳ ගත්තේය. හිඳ භාග්‍යවතුන් වහන්සේට ගාථාවෙන් මෙය කීය.

1. සැක ඇත්තෙමි, සංශය ඇත්තෙමි
   ප්‍රශ්න ඇසීමට කැමැත්තෙන් පැමිණියෙමි
   මා විසින් ප්‍රශ්න අසන ලදුයේ ඒවා කෙළවර කරන්නෙකු වන්න
   අනුපිළිවෙලින් ධර්මානුකූලව මට විසඳා දෙන්න. (512)

2. (භාග්‍යවතුන් වහන්සේ)
   සභිය, (නුඹ) දුර සිට
   ප්‍රශ්න ඇසීමට කැමැත්තෙන් පැමිණියෙහිය
   අසන ලදුව ඒවා කෙළවර කරන්නෙකු වන්නෙමි.
   අනුපිළිවෙලින් ධර්මානුකූලව නුඹට විසඳා දෙන්නෙමි. (513)

3. (ඔබ) සිත කැමති යම් කිසි ප්‍රශ්නයක් ඇත්නම්, සභිය මගෙන් අසන්න
   ඒ ඒ ප්‍රශ්නය මම නුඹට අවසන් කර දෙමි. (514)

එවිට සභිය පිරිවැජිට මෙසේ සිතින. ''භවත්නි, ආශ්චර්යයකි. අද්භූතය. අන් මහණ බමුණන් වෙතින් (ප්‍රශ්න ඇසීමට) යම් අවසර මාත්‍රයකුදු නොලදිමිද ඒ අවසරය මේ ශ්‍රමණ ගෞතමයන් මට දෙන ලදි''යි සතුටු වූයේ, ප්‍රමුදිත වූයේ, ඔද වැඩුනේ, ප්‍රීති සොම්නස් වූයේ භාග්‍යවතුන් වහන්සේගෙන් ප්‍රශ්නයක් ඇසීය.

4. කුමන තත්වයකට පැමිණීමෙන් 'භික්ෂුවක්' යැයි කියාද?
   'මෘදු' වූයේ කෙසේද? කෙලෙස 'දැමුනේ' යැයි කියාද?
   කෙලෙස 'බුද්ධ' (අවදි වූයේ) යැයි කියාද?
   මා විසින් භාග්‍යවතුන්ගෙන් අසන ලදුයේ විසඳනු මැන (515)

5. (භාග්‍යවතුන් වහන්සේ)
තමුන්ම මාර්‍ගයේ ගමන් කළේ
මැනවින් නිවීමට ගියේ, සැකයෙන් එතෙර වූයේ
පැවැත්ම හා නොපැවැත්ම හැරපියා
(බඹසර) වැස නිම වූ, නැවත ඉපදීම ක්‍ෂය කළ ඔහු 'භික්ෂුවයි' (516)

6. හැමතැනකම උපේක්ෂා සහගත වූයේ, සතිමත් වූයේ
මුළු ලොව කිසිවෙකුටත් ඔහු හිංසා නොකරන්නේ
එතෙර වූයේ, ශ්‍රමණ වූයේ, නොකැළඹුනේ
යමෙකුට උස්වීමක් (මාන්නයක්) නැතිද, ඔහු 'මෘදු වූවෙකි' (517)

7. අභ්‍යන්තර හා බාහිර සියළු ලෝකයෙහි (ඇති දේ කෙරෙහි)
යමෙකුගේ ඉන්‍ද්‍රියයන් වඩන ලදද (සංවරද)
මෙලොවත් පරලොවත් විනිවිද දැන (සිත) වඩන ලද්දේ,
(මරණයට) කාලය බලාපොරොත්තුවෙන් සිටින ඔහු 'දැමුනු
කෙනෙකි' (518)

8. සංසාරයත්, චුත උත්පත්ති දෙකත්
සියළුම (පංති වලට) වර්ග කිරීම්ද නුවණින් දැනගෙන
(කෙලෙස්) දූවිලි හා කිළිටු දුරු කොට සුපිරිසිදු වූයේ
උපත ක්‍ෂය කළ බවට පැමිණි ඔහුට 'අවදි වූයේ' යැයි කියනු ලැබේ.
(519)

ඉක්බිති සභිය පිරිවැජි භාග්‍යවතුන් වහන්සේගේ වචනය සතුටින් පිළිගෙන, අනුමෝදන් වී, තුටු වූයේ, ප්‍රමුදිත වූයේ, ඔද වැඩුනේ, ප්‍රීති සොම්නස් වූයේ භාග්‍යවතුන් වහන්සේගෙන් තවත් ප්‍රශ්නයක් ඇසීය.

9. කුමන තත්වයට පැමිණීමෙන් 'බ්‍රාහ්මණයා' යැයි කියාද?
'ශ්‍රමණයා' කෙසේද? කෙලෙසින් 'ස්නානය කළ කෙනා' වේද?
කෙලෙසින් 'හස්තියා' යැයි කියාද?
මා විසින් භාග්‍යවතුන්ගෙන් අසන ලදුයේ විසඳනු මැන (520)

10. (භාග්‍යවතුන් වහන්සේ)
සියළු පාපයන් බැහැර ලා
කිලුටු නැති, හොඳ, තැන්පත් සිතක් ඇති, ස්ථිරසාර
හෙතෙම සසර ඉක්මවූයේ, පරිපූර්ණ වූයේ
(කිසිවක) නොලැගුන එහෙවු වූ ඔහුට 'බ්‍රහ්මයා'යැයි පැවසේ. (521)

11. පිං හා පව් බැහැර කළ, සන්සුන් වූ
(කෙලෙස්) දූවිලි නැති, මෙලොව හා පරලොව දැනගත්
උපත - මරණය ඉක්මවා ගිය
එහෙව් වූ ඔහුට ඒ අයුරුම බැවින් 'ශ්‍රමණයා' යැයි කියනු ලැබේ.
(522)

12. අභ්‍යන්තර හා බාහිර මුළු ලෝකයෙහි
සියළු පව් සෝදාහල
දෙව් මිනිසුන් අතර (පංති වලට) වර්ගීකරණයන්හි
ගිණීමකට නොඑයිද, ඔහුට 'ස්නානය කළ කෙනා' යැයි කියනු ලැබේ
. (523)

13. ලෝකයේ කිසිදු අපරාධයක් නොකරයිද
සියළු බැඳීම් බන්ධන ලිහාදමා
කිසි තැනක (හෝ දෙයක) නො ඇලෙන, විමුක්ත වූ
එහෙව් වූ ඔහු ඒ ඇයුරුම බැවින් 'හස්තියා' යැයි කියනු ලැබේ.
(524)

ඉක්බිති සභිය පිරිවැජි භාග්‍යවතුන් වහන්සේගේ වචනය සතුටින් පිළිගෙන, අනුමෝදන් වී, තුටු වූයේ, ප්‍රමුදිත වූයේ, ඔද වැඩුනේ, ප්‍රීති සොම්නස් වූයේ භාග්‍යවතුන් වහන්සේගෙන් තවත් ප්‍රශ්නයක් ඇසීය.

14. කවරකුට 'කෙත දිනන ලද්‌'යි බුදුවරු පවසත්ද?
කෙලෙස 'දක්ෂයා (කුශල)' වේද? කෙලෙසින් 'නුවණැත්තා' ද?
කෙලෙස 'මුනි' යැයි කියාද?
මා විසින් භාග්‍යවතුන්ගෙන් අසන ලදුයේ විසඳනු මැන (525)

15. (භාග්‍යවතුන් වහන්සේ)
දිව්‍ය වූද මනුෂ්‍ය වූද බ්‍රහ්ම කෙතද
මේ සියළුම කෙත් (උපදින තැන්) නුවණින් දන
සියළු කෙත් වල මූල බන්ධන වලින් මිඳුනේද
එහෙව් වූ ඔහුට ඒ අයුරුම බැවින් 'කෙත දිනූ කෙනා' යැයි කියනු ලැබේ. (526)

16. දිව්‍ය වූද මනුෂ්‍ය වූද බ්‍රහ්ම කෝෂයද
මේ සියළු කෝෂ (උපදින තැන්) නුවණින් දන
සියළු කෝෂ වල මූල බන්ධන වලින් මිදුනේද
එහෙව් වූ ඔහුට ඒ අයුරුම බැවින් 'දක්ෂයා' යැයි කියනු ලැබේ.
(527)

17. අභ්‍යන්තර හා බාහිර සුදු පාටවල් දෙකම (එනම් කළු-සුදු)
නුවණින් දන, පිරිසිදු ප්‍රඥාවක් ඇත්තේ
කළු-සුදු[1] ඉක්මවා ගියේද
එහෙව් වූ ඔහුට ඒ අයුරුම බැවින් 'නුවණැත්තා' යැයි කියනු ලැබේ.
(528)

---

[1] හොඳ-නරක, පිං-පව් ආදිය ගත හැක.

18. අභ්‍යන්තර හා බාහිර මුළු ලෝකයෙහි
සත්පුරුෂ හා අසත් පුරුෂ ධර්මය දන
දෙව් මිනිසුන් විසින් පූජිත වූයේ
උගුල හා දැල ඉක්මවා ගියේද, ඔහු 'මුනිවරය'යි. (529)

ඉක්බිති සභිය පිරිවැජි භාග්‍යවතුන් වහන්සේගේ වචනය සතුටින් පිළිගෙන, අනුමෝදන් වී, තුටු වූයේ, ප්‍රමුදිත වූයේ, ඔද වැඩුනේ, ප්‍රීති සොම්නස් වූයේ භාග්‍යවතුන් වහන්සේගෙන් තවත් ප්‍රශ්නයක් ඇසීය.

19. කුමන තත්වයට පැමිණීමෙන්
'දැනුමෙන් (වේදයෙන්) පරතරට ගියේ' යැයි කියාද?
කෙතෙකින් 'දැනගත් කෙනා' ද? කෙලෙසින් 'වීරියවන්තයා' ද?
කෙලෙසින් 'උසස් කුල' (අජානීය) නම් වේද?
මා විසින් භාග්‍යවතුන්ගෙන් අසන ලදුයේ විසඳනු මැන (530)

20. (භාග්‍යවතුන් වහන්සේ)
මෙහි ශ්‍රමණයන්ගේ හෝ බ්‍රාහ්මණයන්ගේ ඇතිතාක්
සියළු ඉගැන්වීම් (වේද) නුවණින් දැන
සියළු විඳීම් කෙරෙහි ඇල්ම දුරලුවේද
සියළු ඉගැන්වීම් ඉක්මවාලූ ඔහු 'දැනුමෙන් පරතෙරට ගියේ' වෙයි.
(531)

21. අභ්‍යන්තර හා බාහිර රෝගයන්ට මූලය වූ
ප්‍රපංච[1] නාම-රූපය නුවණින් දැන
සියළු රෝගයන්ගේ මූල බන්ධනයෙන් මිදුනේද
එහෙව් වූ ඔහුට ඒ අයුරුම බැවින් 'දැනගත් කෙනා' යැයි කියනු
ලැබේ. (532)

22. මෙලොව සියළු පාපයන්ගෙන් වෙන්වූයේ
නිරය දුක ඉක්මවා ගියේද, ඔහු වීර්‍යවන්තයෙකි
වීර්යය ඇත්තේ, ප්‍රධන් වීර්යය ඇත්තේ
එහෙවු වූ ඔහුට ඒ අයුරුම බැවින් 'වීරයා' යැයි කියනු ලැබේ.
(533)

23. අභ්‍යන්තර හා බාහිර උගුල්වල මූලය වූ
බන්ධන යමෙකු විසින් සිඳ දමන ලද ද
සියළු උගුල් වල මූල බන්ධනයෙන් මිදුනේද
එහෙව් වූ ඔහුට ඒ අයුරුම බැවින් 'උසස් කුල' (අජානීය) යැයි කියනු
ලැබේ. (534)

---

[1] 10 පිටුවේ ඇති පාද සටහන බලන්න

ඉක්බිති සභිය පිරිවැජි භාග්‍යවතුන් වහන්සේගේ වචනය සතුටින් පිළිගෙන, අනුමෝදන් වී, තුටු වූයේ, ප්‍රමුදිත වූයේ, ඔද වැඩුනේ, ප්‍රීති සොම්නස් වූයේ භාග්‍යවතුන් වහන්සේගෙන් තවත් ප්‍රශ්නයක් ඇසීය.

24. කුමන තත්වයට පැමිණීමෙන් 'සෞඛ්‍යමත්' (සොත්ථියං) ද?
කෙලෙසින් 'උසස් කෙනෙක්' (අරිය) ද ?
කෙලෙසින් 'මනා පැවැත්මෙන්' යුක්තද?
කෙලෙසින් 'ඇවිදින ශ්‍රමණයෙක්' (පිරිවැජියෙක්) නම් වේද?
මා විසින් භාග්‍යවතුන්ගෙන් අසන ලදුයේ විසඳනු මැන. (535)

25. (භාග්‍යවතුන් වහන්සේ)
වැරදි-නිවැරදි යැයි ලෝකයේ යම් කිසිවක් ඇද්ද
ඒ සියළු ධර්මයන් උගෙන, පිරිසිඳ දැන
(ඒවා) මැඩපවත්වන්නේ, සැක නැත්තේ, විමුක්ත වූයේ
කිසි දෙයක් කෙරෙහි සිත් තැවුල් නැති ඔහුට 'සෞඛ්‍යමත්' යැයි කියනු ලැබේ. (536)

26. ආශ්‍රව හා ඇලුම් කිරීම් සිඳ දමා
මැනවින් දන්නා ඔහු ගර්භාෂයක හොවීමට නොඑයිද
ත්‍රිවිධ සංඥාවද[1], (කාම) මඩ වගුර ද හැරපියා
වර්ග කිරිමකට නොඑන ඔහුට 'උසස් කෙනා' යැයි කියනු ලැබේ. (537)

27. යමෙක් මෙහි මනා පැවැත්මෙහි පූර්ණත්වයට පත් වූයේ
හැමවිටම දක්ෂද, ධර්මය දන්නේද
කිසිදු දෙයක නොබැඳේද විමුක්තද
යමෙකුට ගැටීමක් ඇත්තේ නැද්ද, ඔහු 'මනා පැවැත්මෙන්' යුත් කෙනාය (538)

28. උඩ යට හෝ මැද තිරස (ලෝකවල)
දුක් විපාක දෙන යම් කර්මයක් ඇතිද (එයද)
වංචාව මාන්නය එලෙසින්ම ආශාව හා ක්‍රෝධයත්
මඟහැර (ඒවායින් පිට වී), පිරිසිඳ දැන හැසිරේද
නාම-රූපය අවසන් කළේද
ඔහු 'පිරිවැජි' බවේ පූර්ණත්වයට පත්වූයේ යැයි කියනු ලැබේ. (539)

ඉක්බිති සභිය පිරිවැජි භාග්‍යවතුන් වහන්සේගේ වචනය සතුටින් පිළිගෙන, අනුමෝදන් වී, සතුටු වූයේ, ප්‍රමුදිත වූයේ, ඔද වැඩුනේ, ප්‍රීති සොම්නස් වූයේ, අසුනෙන් නැඟිට උතුරු සිවුර ඒකාංශ

---

[1] උසස්, පහත්, සම යන මාන

කර භාග්‍යවතුන් වහන්සේ වෙත ඇඳිලි බැඳ භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි සුදුසු ගාථා වලින් පැසසූවේය.

29. මහා ප්‍රාඥයානනි, ඔබ යම් හැට තුනක් වූ
    ව්‍යවහාර සම්මුති සංඥා ඇසුරු කළ
    ශ්‍රමණයින්ගේ ඇලෙනසුළු ප්‍රවාද
    මුළුල්ල දුරලා සැඩපහරේ (අනෙක්) කෙළවරට ගියේය. (540)

30. දුකෙහි කෙළවරට ගිය, එතෙරට ගිය
    දිදුලන ප්‍රඥාවක්, පුළුල් ප්‍රඥාවක් ඇත්තා වූ ඔබ
    අර්හත්ය, සම්මා සම්බුද්ධය, ආශ්‍රව ක්‍ෂය කළේ යැයි සිතමි
    දුක් කෙළවර කරවන ඔබ මා එගොඩ කළේය. (541)

31. මාගේ වූ යම් සැකයක් දැනගෙන
    තිබූ සැකයෙන් මාව එතෙර කළේය, ඔබට නමස්කාර වේවා!
    මුනි මාර්ගය පරිපූර්ණ කළ මුනිවරයානෙනි
    තද බවක් නැති, හිරු නෑ වූ ඔබ මෘදුය. (542)

32. මට යම් සැකයක් පෙර වීද ඇස් ඇත්තා එය මට විසඳා දෙන ලදී.
    සැබැවින්ම ඔබ මුනිවරයෙකි. සම්බුද්ධය, ඔබට නීවරණ[1] නැත.
    (543)

33. ඔබ සියලු සිත් තැවුල් බිඳ දමා, විනාශ කර දමා ඇත.
    සිසිල් වූයේ, පූර්ණ ලෙස දැමුනේ, ධෛර්යවන්ත , සත්‍යමත පිහිටි
    වීර්යය ඇත්තෙකි. (544)

34. හස්තියානෙනි, ඒ මහාවීර වූ හස්තියාගේ වචන කෙරෙහි
    නාරද කඳු දෙකෙහිම සියළු දෙවිවරු සතුටු වෙති. (545)

35. අජානීය පුරුෂයානෙනි, ඔබට නමස්කාර වේවා!
    උත්තම පුරුෂයානෙනි, ඔබට නමස්කාර වේවා!
    දෙවියන් සහිත ලෝකයෙහි
    ඔබට සමානයෙක් නම් නැත. (546)

36. ඔබ බුද්ධය, ඔබ ශාස්තෘය, ඔබ මාරයා මැඬලූ මුනිවරයාය
    ඔබ අනුශය සිඳ දමා එතෙර වූයේ, මේ ප්‍රජාවද එතෙර කරන්නෙහිය.
    (547)

---

[1] නීවරණ / ආවරණ පහකි (19 පිටුවේ පාද සටහන් බලන්න.)

37. ඔබ විසින් වත්කම් ඉක්මවන ලදී, ආශ්‍රව ඔබ බිඳ දමන ලදී
කිසිවක් අල්ලා නොගත්තේ, සිංහයෙක් වූයේ, බිය වෙව්ලීම් ප්‍රහීණ
කරන ලදී. (548)

38. යම් සේ මනරම් සුදු නෙළුමක් දියෙහි නොතැවරේද
එලෙසින්ම ඔබ පිං හා පව් යන දෙකෙහිම නොතැවරේ
වීරයානෙනි, පා දිගු කළ මැනව, සභිය තම ගුරුවරයා නමදියි.
(549)

ඉක්බිති සභිය පිරිවැජි භාග්‍යවතුන් වහන්සේගේ පාමුල හිසින් වැඳ මෙය කීය. "ඉතා මනහරය. භවත් ගෞතමයාණෙනි, ඉතා මනහර ය. යම් සේ යටිකුරු කරන ලද්දක් උඩුකුරු කරන්නේ ද, වැසුණු දෙයක් විවර කරන්නේ ද, මුළා වූවකුට මාර්ගය කියන්නේ ද, 'ඇස් ඇත්තෝ රූප දකින්නෝයැ'යි අඳුරේ තෙල් පහනක් දරන්නේ ද, එලෙසින්ම භවත් ගෞතමයන් විසින් නන් අයුරින් ධර්මය දෙසන ලදී. මම භවත් ගෞතමයන් ද ධර්මය ද භික්ෂු සංඝයා ද සරණ කොට යමි. මා හට භවත් ගෞතමයන් ලඟ පැවිද්ද ලැබේවා! උපසම්පදා ලැබේවා!" "සභිය, පෙර අන්‍යාගමික පැවිද්දෙක් වූ යමෙක් මෙම ධර්ම විනයෙහි පැවිද්ද කැමැත්තේ නම්, උපසම්පදාව කැමැත්තේ නම්, ඔහු මාස හතරක් පිරිවෙස් විසිය යුතුය. මාස හතරක් ඇවෑමෙන් සතුටු සිත් ඇති භික්ෂූහු ඔහුව භික්ෂුභාවය පිණිස පැවිදි කරත්, උපසම්පදා කරත්. නමුත් මෙහිදී මා විසින් පුද්ගලයන් අතර වෙනසද දැනගන්නා ලදී." "ස්වාමීනි, ඉදින් පෙර අන්‍යාගමික පැවිද්දන් මෙම ධර්ම විනයෙහි පැවිද්ද කැමැත්තේ නම්, උපසම්පදාව කැමත්තේ නම්, ඔවුන් මාස හතරක් පිරිවෙස් විසිය යුතු නම්, මාස හතරක ඇවෑමෙන් සතුටු සිත් ඇති භික්ෂූහු ඔවුන් භික්ෂුභාවය පිණිස පැවිදි කරත් නම්, උපසම්පදා කරත් නම්, මම වසර හතරක් පිරිවෙස් වසමි. වසර හතරක ඇවෑමෙන් සතුටු සිත් ඇති භික්ෂූහු මා භික්ෂුභාවය පිණිස පැවිදි කරත්වා! උපසම්පදා කරත්වා!"

සභිය පිරිවැජිට භාග්‍යවතුන් වහන්සේ ලඟ පැවිද්ද හා උපසම්පදාව ලැබුණි. ආයුෂ්මත් සභිය තෙමේ උපසම්පදාව ලැබ නොබෝ කලකින් එකලා වූයේ, වෙන් වූයේ, අප්‍රමාදීව වීර්යයෙන් යුක්තව වසන්නේ යම් කාරණයක් සඳහා කුල පුත්‍රයෝ මනාකොට ගිහිගෙයින් නික්ම පැවිදිවෙත් ද, නොබෝ කලකින්ම ඊට හේතු වූ ඒ උත්තරීතර බඹසර කෙළවර මේ දිවියේදීම තමා විසින්ම මැනවින් දැන පසක් කොට එළඹ විසීය. 'ඉපදීම ක්ෂය විය. බඹසර වැස නිමවිය, කළ යුත්ත කරන ලදී. මේ භවයෙන් එහාට යෑමක් නැතැ'යි දැන ගත්තේය. ආයුෂ්මත් සභිය තෙමේ රහතුන් අතරෙන් එක් අයෙක් විය.

3.7 සේල සූත්‍රය

පරිවර්තනය නොකරන ලදී. (අන්තර්ගතය - සේල බ්‍රාහ්මණයාගේ පැවිද්ද හා අර්හත්වය)

3.8 උල සූත්‍රය

1. මෙලොව මිනිස් ජීවිතය ඉදිරිය දත නොහැකි ඊට නිමිති නොමැත්තකි. කරදර සහිතය, ස්වල්ප වූවකි, එයද දුක හා බැඳී ඇත. (576)

2. උපන් අයට නොමැරී ඉන්න යම්කිසි ක්‍රමයක් නම් ඇත්තේ නැත මහළු වී හෝ මරණයට පත්වෙති. සත්ත්වයන් එවැනි ධර්මතාවයකින් යුක්තය. (577)

3. යම් සේ ඉදුනු ගෙඩි වලට උදෑසන බිමට වැටීමේ බියක් ඇතිද එලෙසින්ම උපන් මිනිසුන්ට නිතරම මරණ බිය පවතී. (578)

4. යම් සේ කුඹල්කරු සෑදූ සියළු මැටි භාජන බිඳීම අවසන් කොට ඇද්ද, මිනිසුන්ගේ ජීවිතයද එවැනිය. (579)

5. බාල වේවා, මහළු වේවා, මෝඩ වේවා, නුවණැති වේවා සියළු දෙනා මරු වසඟයට යති, සියලු දෙනා මරණය කෙළවර කොට ඇත්තාහ. (580)

6. මරු විසින් මඩනා ලදුව ඔවුහු මෙලොවින් පරලොව යද්දී පියා දරුවා නොරකී, ඥාතීන් ඥාතියව නොරකී. (581)

7. බලව, ඥාතීන් බලා සිටියදීම, බොහෝ දෙනා විලාප කියද්දීම මිනිසුන්ගෙන් එක් එක්කෙනා මැරීමට ගෙනයන හරකකු සේ ගෙනයන සැටි (582)

8. මෙලෙස ලෝකයා මරණයෙන්ද මහළුකමින්ද යටපත් කර ඇත. එමනිසා නුවණැත්තෝ ලෝකස්වභාවය දැන ශෝක නොකරත්. (583)

9. යමෙකුගේ ආපු මාර්ගය හෝ ගිය මාර්ගය නොදන්නෙහි නම්[1] අන්ත දෙකම නොදකින්නේ (නුඹගේ) හැඬීමෙන් පලක් නැත. (584)

---

[1] කොහි සිට මෙලොවට ආවාද, පරලොව කොහි ගියාද යන දෙක

10. මුලාවට පත්ව තමන්ටම හිංසා කරගනිමින් හැඬීමෙන්
යම් කිසි ප්‍රයෝජනයක් ලැබේ නම් නුවණැත්තාද එය කරන්නේය.
(585)

11. හැඬීමෙන්, ශෝක කිරීමෙන් සිතට සැනසීමක් ලැබෙන්නේ නැත.
දුක තව තවත් වැඩි වේ, ශරීරය පීඩාවට පත් වේ. (586)

12. (එලෙස) තමුන් තමුන්ට ම හිංසා කර ගැනීමෙන්
කෙට්ටු වෙයි, අවලස්සන වෙයි.
එයින් මිය ගිය අයට රැකවරණයක් නොලැබේ.
හැඬීමෙන් පලක් නැත. (587)

13. ශෝකය අත් නොහළ මිනිසා වැඩිමනත්ම දුකටම පත්වෙයි.
මිය ගිය කෙනා අනුව වැලපෙන්නේ ශෝකයේ පාලනයට නතු වේ.
(588)

14. කර්මානුරූපව (පරලොව) යෑමට නියමිත අන් මිනිසුන් (දෙස) ද බලව
මරුගේ වසඟයට පැමිණ මෙහි සත්ත්වයෝ වෙව්ලති. (589)

15. යම් යම් අයුරකින් සිතයිද, ඊට වෙනස් අයුරකින් එය සිදුවෙයි.
වෙන් වීම එබඳුය, ලෝකස්වභාවය බලව. (590)

16. ඉදින් අවුරුදු සියයක් හෝ ඊට වැඩියෙන් හෝ මිනිසා ජීවත් වුවත්
ඥාති පිරිසගෙන් වෙන් වන්නේය, මෙලොවදී ජීවිතය හරණේය.
(591)

17. එමනිසා රහතුන්ගෙන් (ධර්මය) අසා මියපරලොව ගිය අය දැක
'මට ඔහු යළි නොලැබේ'ය යන වැලපීම හැරපියන්නේය. (592)

18. යම් සේ ගිනිගත් ගෙයක් ජලයෙන් නිවා දමයිද
එලෙසින්ම බුද්ධිමත් ප්‍රඥාවන්ත නුවණැති දක්ෂ මිනිසා
සුළඟක් පුළුන් රොදක් සෙයින් උපන් ශෝකය වහා පිඹ හරී. (593)

19. තමාගේ සුව සොයන්නා, තමාගේ වැලපීමත් ප්‍රාර්ථනාත්
දොම්නසත් යන තමාගේ (ඇනුනු) උල් උදුරා දමන්නේය. (594)

20. උල් ගලවා දැමූයේ, නො ඇලුනේ, සිත සැනසීමට පත් වූයේ
සියළු ශෝකයන් ඉක්මවාලූ නිවුනු (නිවන් දුටු) කෙනාට ශෝකයක්
ඇත්තේ නැත. (595)

3.9 වාසෙට්ඨ සූත්‍රය

(ගද්‍ය පසුබිම් විස්තරය පරිවර්තනය කර නැත)

1. (වාසෙට්ඨ)
   අපි ත්‍රි වේද පරිප්‍රාප්තයැයි අනුදත් හා පිළිගත් අය වෙමු
   මම පොක්ඛරසාතිගේද, මේ තරුණයා තාරුක්ඛගේද සිසුන් වෙමු. (596)

2. ත්‍රිවේදය ගැන යමක් උගත යුතුද, අපි එය සම්පූර්ණ කෙළෙමු.
   පද හා ව්‍යාකරණයෙන්ද මැතිරීමෙන්ද අප ගුරුවරු හා සම වෙමු. (597)

3. ඒ අප අතර, ගෞතමයනි, කුලය පිළිබඳ විවාදයක් ඇත.
   මේ භාරද්වාජ ''උපතින් බ්‍රාහ්මණයෙක් වන්නේ'' යැයි කියයි.
   මම ''ක්‍රියාවෙන්''යැයි කියමි, මෙය මෙලෙස ඇස් ඇත්තානෙනි දැනගන්න. (598)

4. අපි දෙදෙනාට උනුන් ඒත්තු ගැන්වීමට නොහැකි වීමු.
   'සම්බුද්ධ' යැයි ප්‍රසිද්ධ භාග්‍යවතුන්ගෙන් විමසීමට පැමිණියෙමු. (599)

5. යම් සේ ජනයා පූර්ණ චන්ද්‍රයාට ඇඳිලි බැඳ වඳිත්ද
   එලෙසින්ම ලොවෙහි ගෞතමයන්ව, මිනිස්සු නමදිති. (600)

6. ලෝකයේ පහල වූ ඇස වූ ගෞතමයන්ගෙන් අපි විමසමු.
   උපතින් බ්‍රාහ්මණයෙක් වන්නේද නැතිනම් ක්‍රියාවෙන් වන්නේද?
   නොදන්නා වූ අපට කියනු මැන, කෙලෙසින් බ්‍රාහ්මණයෙකු හඳුනා ගනිමුද? (601)

7. (භාග්‍යවතුන් වහන්සේ)
   ප්‍රාණීන් ජාතින් වලට බෙදීම ඒ නුඹලාට මම ඇති සැටියෙන්,
   අනුපිළිවෙලින් පැහැදිලි කරමි. ජාතින් එකිනෙකට වෙනස් ය. (602)

8. තණ රුක් දන ගන්න, ඔවුන් (ජාතිය) ප්‍රකාශ නොකරන නමුදු
   ඔවුන්ගේ වෙනස් සටහන් ජාතිය අනුව වෙයි, ජාතීන් එකිනෙකට වෙනස්ය. (603)

9. තවද කෘමීන් පලඟැටියන් කුහුඹුවන් දක්වා වූ ප්‍රාණීන්
   ඔවුන්ගේ වෙනස් සටහන් ජාතිය අනුව වෙයි, ජාතීන් එකිනෙකට වෙනස්ය. (604)

10. කුඩා වූ හෝ විශාල වූ සිව්පා සතුන් ද දැනගන්න.
ඔවුන්ගේ වෙනස් සටහන් ජාතිය අනුව වෙයි, ජාතීන් එකිනෙකට වෙනස්ය. (605)

11. උදරය පාදය කරගත් දිගු පිටක් ඇති උරගයන් දැනගන්න.
ඔවුන්ගේ වෙනස් සටහන් ජාතිය අනුව වෙයි, ජාතීන් එකිනෙකට වෙනස්ය. (606)

12. එයින් ජලයේ සිටින, ජලයේ හැසිරෙන මත්සයන් දැනගන්න
ඔවුන්ගේ වෙනස් සටහන් ජාතිය අනුව වෙයි, ජාතීන් එකිනෙකට වෙනස්ය. (607)

13. එයින් පියාපත් වලින් යන අහසෙහි හැසිරෙන පක්ෂීන්ද දැනගන්න
ඔවුන්ගේ වෙනස් සටහන් ජාතිය අනුව වෙයි, ජාතීන් එකිනෙකට වෙනස්ය. (608)

14. යම් පරිදි ඒ ජාතීන් අතර
බොහෝ වෙනස් සටහන් ජාතිය අනුවම වෙයි.
නමුත් මිනිසුන් අතර එලෙස
කුලය (ජාතිය) අනුව ගිය බොහෝ වෙනස් සටහන් නැත. (609)

15. කෙස් වලින් හෝ ඔලුවෙන් හෝ කන් වලින් හෝ ඇස් වලින්ද නොවේ.
මුඛයෙන් හෝ නාසයෙන් හෝ දිවෙන් හෝ ඇහි බැම වලින්ද නොවේ. (610)

16. බෙල්ලෙන් උරහිසින් උදරයෙන් පිටෙන්ද නොවේ.
යෝනියෙන් පපුවෙන් ලිංගයෙන් හෝ මෛථුනයෙන්ද නොවේ. (611)

17. අත් වලින්, පා වලින්, ඇඟිලි වලින්, නියපොතු වලින්ද නොවේ.
කෙණ්ඩ වලින්ද, කලව වලින්ද, පැහැයෙන්ද, ස්වරයෙන්ද නොවේ.
අන් ජාතීන් අතර ඇති පරිදි ජාතිය අනුව වූ සටහන් ඇත්තේ නැත. (612)

18. මිනිසුන්ගේ වෙන් වෙන් ශරීර වල එවැනි වෙනස්කම් දක්නට නැත.
මිනිසුන්ගේ ඇතැයි කියන වෙනස්කම් ව්‍යවහාර මාත්‍රයකැයි කියනු ලැබේ. (613)

19. මිනිසුන් අතර යමෙක් ගවයන් බලාගැනීමෙන් ජීවත් වේ ද
මෙලෙස වාසෙට්ඨ දැනගන්න. ඔහු ගොවියෙකි, බ්‍රාහ්මණයෙකු නොවේ. (614)

20. මිනිසුන් අතර යමෙක් නොයෙක් ශිල්පයෙන් ජීවත්වේද
මෙලෙස වාසෙට්ඨ දැනගන්න, ඔහු ශිල්පියෙකි, බ්‍රාහ්මණයෙකු නොවේ. (615)

21. මිනිසුන් අතර යමෙක් ගනුදෙනු කිරීමෙන් ජීවත්වේද
මෙලෙස වාසෙට්ඨ දැනගන්න, ඔහු වෙළෙන්දෙකි, බ්‍රාහ්මණයෙකු නොවේ. (616)

22. මිනිසුන් අතර යමෙක් මෙහෙ කිරීමෙන් ජීවත්වේද
මෙලෙස වාසෙට්ඨ දැනගන්න, ඔහු මෙහෙකරුවෙකි, බ්‍රාහ්මණයෙකු නොවේ. (617)

23. මිනිසුන් අතර යමෙක් සොරකමෙන් ජීවත්වේද
මෙලෙස වාසෙට්ඨ දැනගන්න, ඔහු සොරෙකි, බ්‍රාහ්මණයෙකු නොවේ. (618)

24. මිනිසුන් අතර යමෙක් දුනු ශිල්පියෙන් ජීවත්වේද
මෙලෙස වාසෙට්ඨ දැනගන්න, ඔහු යුධ භටයෙකි, බ්‍රාහ්මණයෙකු නොවේ. (619)

25. මිනිසුන් අතර යමෙක් යාග කිරීමෙන් ජීවත්වේද
මෙලෙස වාසෙට්ඨ දැනගන්න, ඔහු පූජකයෙකි, බ්‍රාහ්මණයෙකු නොවේ. (620)

26. මිනිසුන් අතර යමෙක් ගමත් රටත් පරිභෝග කෙරේනම්
මෙලෙස වාසෙට්ඨ දැනගන්න, ඔහු රජෙකි, බ්‍රාහ්මණයෙකු නොවේ. (621)

27. බැමිණි යෝනියකින් උපන්, මවකගෙන් පහළ වූ නිසාම මම බ්‍රාහ්මණයා යැයි නොකියමි.
අයිති දේවල් ඇති නම් ඔහු 'භවත් වාදියෙකු' වේ.
අයිති දෙයක් නැතිද කිසිවක් අල්ලා නොගත් ඔහුට මම බ්‍රාහ්මණයා යැයි කියමි. (622)

28. සියළු බැඳීම් සිඳ, යමෙක් එකැතින් තැති නොගනීද
උගුල ඉක්මවූ, නොබැඳුන, ඔහුට මම බ්‍රාහ්මණයා යැයි කියමි. (623)

29. හම් පටියද වරපටද දම්වැලද සමඟ අනුපිලිවෙලද සිඳ
දොර පොල්ල උදුරා, බුද්ධ (අවදි) වූයේ, ඔහුට මම බ්‍රාහ්මණයා යැයි කියමි. (624)

30. යමෙක් නොකිපුණු සිතැතිව බැනුම්ද, වන බන්ධනද ඉවසයි නම් ඉවසීම බලය, බල ඇණිය කොට ඇති ඔහුට මම බ්‍රාහ්මණයා යැයි කියමි. (625)

31. ක්‍රෝධ නැති, ව්‍රත ඇත්තේ, සිල්වත්ද, උස්වීම් (මාන්නය) නැත්තේ දමුනේ, අන්තිම ශරීරය දරන ඔහුට මම බ්‍රාහ්මණයා යැයි කියමි. (626)

32. නෙළුම් පතක දිය බිඳක් සේ, ඉදිකටු තුඩ අබ ඇටයක් සේ යමෙක් කාමයන්හි නොඇලෙයි ද, ඔහුට මම බ්‍රාහ්මණයා යැයි කියමි. (627)

33. යමෙක් තමාගේ දුක මෙලොව දීම ක්‍ෂය වූ බව දනීද බර බහා තැබූ, නොබැඳුනු ඔහුට මම බ්‍රාහ්මණයා යැයි කියමි. (628)

34. ගැඹුරු ප්‍රඥාවක් ඇත්තේ, නුවණැති වූයේ,
මාර්ගයේ හා අමාර්ගයේ දක්ෂ වූයේ,
උතුම් යහපතට (නිවනට) පැමිණියේ
ඔහුට මම බ්‍රාහ්මණයා යැයි කියමි. (629)

35. ගිහි පැවිදි දෙපාර්ශවය සමඟම ආශ්‍රයක් නැත්තේ ගෙයක් නොමැති, අල්පේච්ඡ ඔහුට මම බ්‍රාහ්මණයා යැයි කියමි. (630)

36. තැති ගන්නා සේම නොගන්නා සත්ත්වයන් කෙරෙහි මුගුර බහා තබා යමෙක් හිංසා හෝ ඝාතන නොකරයිද, ඔහුට මම බ්‍රාහ්මණයා යැයි කියමි. (631)

37. විරුද්ධවාදී ජනයා අතර අවිරුද්ධ වූයේ, මුගුරු ගත් අය අතර නිවුනේ අල්ලා ගන්නා අය අතර (කිසිවක්) අල්ලා නොගත්තේ, ඔහුට මම බ්‍රාහ්මණයා යැයි කියමි. (632)

38. අබ ඇටයක් ඉදිකටු තුඩකින් වැටෙන්නා සේ යමෙකුගෙන් රාගයත් ද්වේශයත් මාන්නයත් පරගුණ මැකීමත් වැටුනිද, ඔහුට මම බ්‍රාහ්මණයා යැයි කියමි. (633)

39. කර්කශ වචන නොකියා අර්ථය හඟවන සත්‍ය වචන කියයිද ඒවායින් කිසිවෙකු හා නො ඇලේද, ඔහුට මම බ්‍රාහ්මණයා යැයි කියමි. (634)

40. යමෙක් මෙලොව දිග කෙටි කුඩා මහත් හොඳ නරක (කිසිම දෙයක්) සොරකම් නොකරයිද, ඔහුට මම බ්‍රාහ්මණයා යැයි කියමි. (635)

41. මෙලොව හෝ පරලොව කිසිදු දෙයකට යමෙකුට ආශාවක් නැතිද ආශා නැත්තේ, නොබැඳුනු ඔහුට මම බ්‍රාහ්මණයා යැයි කියමි. (636)

42. යමෙක් කෙරෙහි ඇලුම් කිරීම් දක්නට නැතිද, නුවණින් දැන සැක නැත්තේ
අමෘතයේ බැසගැනීමට පැමිණි ඔහුට මම බ්‍රාහ්මණයා යැයි කියමි. (637)

43. යමෙක් මෙලොව පිං හා පව් යන උගුල් දෙකම[1] ඉක්මවා ගියේ ද ශෝක නැති, (කෙලෙස්) කිලුටු නැති, පිරිසිදු ඔහුට මම බ්‍රාහ්මණයා යැයි කියමි. (638)

44. බාධා රහිත චන්ද්‍රයා මෙන් පිරිසිදුද, ඉතා ප්‍රසන්න, නොකැළඹුණ, සතුටු වීම හා භව පැවැත්ම ක්ෂය කල ඔහුට මම බ්‍රාහ්මණයා යැයි කියමි. (639)

45. යමෙක් මේ වගුරු දුර්ග මාර්ගය වූ සංසාරය හා මුළාව ඉක්මවා ගියේද
එගොඩ ගියේ, පරතෙරට ගියේ, බවුන් වඩන, නොසැලෙන සැක නැති අල්ලා ගැනීම් වලින් තොරව නිවුනි ද, ඔහුට මම බ්‍රාහ්මණයා යැයි කියමි (640)

46. යමෙක් මෙහි කාමයන් අතහැර ගෙයක් නොමැතිව හැසිරේද කාමයන් හා භව පැවැත්ම ක්ෂය කළ ඔහුට මම බ්‍රාහ්මණයා යැයි කියමි. (641)

47. යමෙක් මෙහි තණ්හාව අතහැර ගෙයක් නොමැතිව හැසිරේද තණ්හාව හා භව පැවැත්ම ක්ෂය කළ ඔහුට මම බ්‍රාහ්මණයා යැයි කියමි. (642)

48. මානුෂික බන්ධනය අතහැර දිව්‍ය බන්ධනය ඉක්මවා ගියේද සියළු බන්ධන වලින් නොබැඳුනු ඔහුට මම බ්‍රාහ්මණයා යැයි කියමි. (643)

---

[1] ගිහියනට දහම් දෙසන විට පිං වැදගත් කොට දක්වන භාග්‍යවතුන් වහන්සේ, පැවිද්දන් පිං හා පව් යන දෙකම ඉක්මවා යා යුතු බව අවධාරණය කරති.

49. ඇලීමද නොඇලීමද[1] අතහැර සිසිල් වූයේ, වත්කම් නැත්තේ
සියළු ලෝක අභිභවනය කළ වීර වූ ඔහුට මම බ්‍රාහ්මණයා යැයි කියමි.
(644)

50. යමෙක් සත්ත්වයන්ගේ සියළු චුති හා උත්පත්ති මැනවින් දන
නොඇලුනේ, මැනවින් ගියේ (සුගත), අවදි වූයේ (බුද්ධ), ඔහුට මම
බ්‍රාහ්මණයා යැයි කියමි. (645)

51. දේව මනුෂ්‍ය ගන්ධබ්බයෝ යමෙකුගේ (මරණින් මතු) ගිය තැන
නොදනිත්ද
ආශ්‍රව ක්‍ෂය කළ, අරහත් වූ ඔහුට මම බ්‍රාහ්මණයා යැයි කියමි. (646)

52. යමෙකුට පෙර පසු හෝ මැද[2] කිසිවක් නැතිද
කිසිවක් නැති, කිසිවක් අල්ලා නොගත් ඔහුට මම බ්‍රාහ්මණයා යැයි
කියමි. (647)

53. (ශ්‍රේෂ්ඨ) වෘෂභ වූ, උත්තම වූ, වීර, මහාඍෂි, සංග්‍රාමය දිනූ
නොසැලෙන, ස්නානය කළ, බුද්ධ වූ ඔහුට මම බ්‍රාහ්මණයා යැයි
කියමි. (648)

54. පෙර විසූ ආත්මභාව යමෙක් දනීද, ස්වර්ගය හා අපායද දකීද
තවද ඉපදීම ක්‍ෂය කිරීමට පැමිණි ඔහුට මම බ්‍රාහ්මණයා යැයි කියමි.
(649)

55. සිතින් ප්‍රකල්පිත නාම ගෝත්‍ර ලෝකයේ ව්‍යවහාර මාත්‍රයකි.
ඒ ඒ තැන ප්‍රකල්පිත කොට සම්මුතියෙන් හටගත්තකි. (650)

56. නොදනුවත්කම මත දිගුකලක් පැවැතුනු දෘෂ්ඨිගතයකි.
නොදනුවත්කම නිසා ඔවුහු 'උපතින් බ්‍රාහ්මණයෙකු වේ' යැයි පවසති.
(651)

57. උපතින් බ්‍රාහ්මණයකු නොවේ. උපතින් අබ්‍රාහ්මණයකු නොවේ.
ක්‍රියාවෙන් බ්‍රාහ්මණයකු වේ. ක්‍රියාවෙන් අබ්‍රාහ්මණයකු වේ. (652)

58. ක්‍රියාවෙන් ගොවියෙකු වෙයි. ක්‍රියාවෙන් ශිල්පියෙකු වෙයි.
ක්‍රියාවෙන් වෙළෙන්දෙකු වෙයි. ක්‍රියාවෙන් මෙහෙකරුවෙකු වෙයි.
(653)

---

[1] කාමයන්හි ඇලීම හා බඹසර නොඇලීම ලෙසද ගත හැක.
[2] අතීත, අනාගත, වර්තමාන

59. ක්‍රියාවෙන් සොරෙකුද වෙයි. ක්‍රියාවෙන් සොල්දාදුවෙකුද වෙයි.
ක්‍රියාවෙන් පූජකයෙක් වෙයි. ක්‍රියාවෙන් රජෙකුද වෙයි. (654)

60. හේතුවකින් හටගැනීම දකින්නේ, ක්‍රියාව විපාක දෙකෙහි දක්ෂ වූයේ
මේ ආකාරයට නුවණැත්තෝ ඇති සැටියෙන් ක්‍රියාව දකිති.
(655)

61. ක්‍රියාවෙන් ලෝකය පවතී. ක්‍රියාවෙන් මනුෂ්‍ය ප්‍රජාව පවතී.
ගමන් කරන රථයක කඩ ඇණය සේ සත්ත්වයෝ ක්‍රියාව හා බැඳී
ගියාහුය. (656)

62. තපසින්, බ්‍රහ්මචර්යාවෙන්, සංවරයෙන්, හික්මීමෙන්
යන ඒවායින් බ්‍රාහ්මණයෙකු වෙයි. ඒ උතුම්ම බ්‍රාහ්මණයායි. (657)

63. ත්‍රිවිද්‍යා වලින් යුක්ත වේද, ශාන්ත වූයේ, පුනර්භවය ක්‍ෂය කළේද
දන්නා අයට ඔහු ‘බ්‍රහ්මයා’යි, ‘සක්‍රයා’යි, මෙලෙස වාසෙට්ඨ
දැනගන්න. (658)

මෙලෙස කී කල්හි වාසෙට්ඨ, භාරද්වාජ තරුණයෝ භාග්‍යවතුන් වහන්සේට මෙය කීහ. “ඉතා මනහරය භවත් ගෞතමයනි, ඉතා මනහරය. යම් සේ යටිකුරු කරන ලද්දක් උඩුකුරු කරන්නේද, වැසුණු දෙයක් විවර කරන්නේද, මුළා වූවකුට මාර්ගය කියන්නේද, ‘ඇස් අත්තෝ රූප දකින්නෝය’යි අඳුරේ තෙල් පහනක් දරන්නේද, එලෙසින්ම භවත් ගෞතමයන් විසින් නන් අයුරින් ධර්මය දෙසන ලදී. ඒ අපි භවත් ගෞතමයන්ද ධර්මයද භික්ෂු සංඝයාද සරණ කොට යමු. භවත් ගෞතමයන් අප අද පටන් දිවිහිමියෙන් සරණ ගිය උපාසකයන් ලෙස දරණ සේක්වා.”

3.10 කෝකාලිය සූත්‍රය

පරිවර්තනය නොකරන ලදී. (අන්තර්ගතය ඃ කෝකාලියගේ අපා ගත වීම හා අපාය පිළිබඳ විස්තරයකි)

3.11 නාලක සූත්‍රය

(වත්ථු ගාථා (නිදාන කතාව) පරිවර්තනය නොකරන ලදී)

1. (නාලක)
   අසිතගේ [1] ඒ වචනය ඒ අයුරුම බව දැනගත්තෙමි.
   සියළු ධර්මයන්ගේ පරතෙරට පත් ඒ ගෞතමයන්ගෙන් විමසමු. (701)

2. ගෙයක් නොමැති තත්වයට පත්, ආහාර සිඟීමෙන් ජීවිකාව කරන මුනි වතින් උත්තම තත්වයට පත් මුනිවරයා, මා විසින් අසන ලදුයේ පවසනු මැන (702)

3. (භාග්‍යවතුන් වහන්සේ)
   දුෂ්කර වූත්, පිරීම අපහසු වූත්, මුනි වත ඔබට පණවමි.
   අධිෂ්ඨානශීලීව දැඩි වන්න, ඔබට දැන් එය පවසමි. (703)

4. ගමෙහිදී බැන්නත්, වැන්දත් සමාන භාවයක් ඇති කර ගන්න.
   සිත දූෂ්‍ය නොවන සේ රැක ගන්න, ශාන්තව මාන්නයෙන් උස් නොවී හැසිරෙන්න. (704)

5. ලැව් ගින්නක ගිනිසිළු මෙන් උස් පහත් දේ පවසති.
   ළඳුන් මුනිවරු පොළඹවා ගනිති. ඔවුන් ඔබ පොළඹවා නොගනීවා! (705)

6. (මුනි තෙම) මෛථුන ධර්මයෙන් වැළකී නානාවිධ කාමයන් හැරපියා තැති ගත් හෝ නොගත් (සියළු) ප්‍රාණීන් කෙරෙහි විරුද්ධ නොවන්නේය, නොඇලෙන්නේය. (706)

7. මා යම් බඳුද ඔවුන්ද එසේය, ඔවුන් යම් බඳුද මාද එසේය.
   (මෙසේ) තමාවම උපමාවට ගෙන නොමරන්නේය. නොමරවන්නේය (707)

---

[1] අසිත කාලදේවල, නාලක ඔහුගේ නැගනියගේ පුත්‍ය. අසිතගේ වචනයෙන් බුදුරදුන් පිළිබඳ අපේක්ෂාවෙන් නාලක තවුස් දම් පිරීය.

8. යමක් කෙරෙහි සාමාන්‍ය ජනයා ඇලෙත්ද, ඒ කෙරෙහි කැමැත්ත හා ආශාව හැරපියා
මේ නරකයෙන් එතෙර වීමට ඇස් ඇත්තා කටයුතු කරන්නේය. (708)

9. කුඩා උදරයක්[1] ඇත්තේ, මැන ආහාර ගන්නේ, අල්පේච්ඡ වූයේ, ඔහු (ආහාරයෙහි) ලොල් නොවන්නේය.
ඉඳින් කැමති දේ ගැන කුසගින්න[2] නිවුනේනම් ඒ පිරිනිවි කෙනාට කැමැත්තක් නැත. (709)

10. පිඬු පිණිස හැසිර ඔහු වනයට යන්නේය.
ගස් මුලක් වෙතට ගොස් ඒ මුනි තෙම අසුන් ගන්නේය. (710)

11. බවුන් වඩන ඒ නුවණැත්තා කැලයෙහි සිත් අලවන්නේ
සිත ඉතා සතුටු කරමින් ගසක් මුල භාවනා කරන්නේය. (711)

12. එයින් රාත්‍රිය අවසන් වූ කල (පිඬු පිණිස) ගමට යන්නේය.
ගමෙන් ලැබෙන (දාන) ආරාධනා නොපිළිගන්නේය. (712)

13. මුනිවරයා ගමට පැමිණ පවුල් අතර ඉක්මන් කමින් නොහැසිරේ.
අහර සොයන්නේ, කතාබහ නැත්තේ, (ලාභ ලැබීමට) ඉඟිකොට කතා නොකරන්නේය. (713)

14. 'ලද්දේනම් හොඳය නොලද්දේ නම් ඒත් මැනවි'
(ලාභ අලාභ) දෙකෙහිම ඔහු ඒ අයුරුමය, ගසක් මෙන්
(උපේක්ෂාවෙන්) ආපසු හැරේ. (714)

15. නොගොළු වූයේම ගොළුවෙක් යැයි සම්මතව,
පාත්‍ර ඇතැතිව ඔහු හැසිරෙන්නේය.
අල්ප වූ දානයට අවමන් නොකරන්නේය.
(එය) දුන් කෙනාටද නිග්‍රහ නොකරන්නේය. (715)

16. ශ්‍රමණයින් වහන්සේ විසින් උස් පහත් වූ පිලිවෙත දේශනා කර ඇත.
දෙවරක් පරතෙරට[3] නොයත්, එක්වරක් පමණක් විඳින ලද්දේත් නොවේ. (716)

---

[1] ස්වල්පයක් ආහාර ගන්නේ
[2] තණ්හාව, ආශාව
[3] නිවනට

17. යමෙකුට (කාම) පැටලිලි නැද්ද, (තණ්හා) දිය පහර සිඳ දැමූ භික්ෂුවට කටයුතු හා නොකටයුතු ප්‍රහීණ කළේ, දාහයක් ඇත්තේ නැත. (717)

18. මුනි වත ඔබට පණවමි, දැලිපිහි දාරය මෙන් (තියුණු) විය යුතුය. උඩු තල්ලේ දිව සටා උදරයෙහි සංවර වන්නේය. (718)

19. මැලි වූ සිතක් නැත්තේ, බොහෝ කොට සිතන්නේද නැත්තේ පිළිගඳක් නැත්තේ[1], කිසිවක නොලැගුනේ, බඹසර අපේක්ෂා කරන්නේය. (719)

20. එක් වේලක් වැළඳීමටද, ශ්‍රමණ පුරුදු පුරුදු කිරීමටද පුහුණු වන්න. එකලා විසීමෙහි සිත් අලවන්නේ නම්, ඒ සඳහා තනිව සිටීමේ මුනිවත කියන ලදී. (720)

21. කාමයන් අතහැර බවුන් වඩන නුවණැත්තන්ගේ
දස දිසාවෙන් නැගෙන කීර්ති ඝෝෂාව අසා
එයින් මාගේ ශ්‍රාවක තෙම
වැඩිමනත් (පවට) ලැජ්ජාවත්, ශ්‍රද්ධාවත් ඇති කර ගන්නේය. (721)

22. වලවල් හා පොලොවේ පැලුම් වල ගලන නදීන්ගෙන් එය දැනගන්න කුඩා දිය ඇළවල් ඝෝෂා කරමින් ගලති. විශාල ගංගා නිශ්ශබ්දව ගලති. (722)

23. යමක අඩුවක් ඇතිද එය ඝෝෂා කරයි, යමක් පිරුණිද එය ශාන්තය. මෝඩයා අඩක් පිරුණු කලයක් වැනිය. නුවණැත්තා පිරුණු කලය වැනිය. (723)

24. මහණ තෙම, යම් අර්ථ සහිත වූ දෙයක්, ඊට පැමිණ බොහෝ දෙසයිද දැනගෙන ඔහු ධර්මය දෙසයි, දැනගෙන ඔහු බොහෝ දෙසයි. (724)

25. යමෙක් දැන ගැනීමෙන් යුක්තවම, දැන බොහෝ නොදෙසයිද ඒ මුනි තෙම මුනිභාවයට සුදුසුය, ඒ මුනි මුනිභාවයට පැමිණියේය. (725)

---

[1] පිළිගඳ සූත්‍රය (2.2) බලන්න.

3.12 ද්වයතාව අනුව බැලීමේ සූත්‍රය

මා විසින් මෙසේ අසන ලදී. එක් සමයක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර පෙරදිග උයනේ මිගාරමව් (විශාඛාවගේ) ප්‍රාසාදයේ වැඩ වසති. එකල පසළොස්වක පුන්සඳින් යුත් පොහෝ දින භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා පිරිවරා එළිමහනේ වැඩ සිටිනා සේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඉතා නිශ්ශබ්ද වූ භික්ෂු සංඝයා දෙස බලා භික්ෂූන් ඇමතූහ.

"ඉදින් මහණෙනි, යමෙක් නුඹලාගෙන් 'යම් මේ යහපත් වූ, උසස් වූ, (සසරින්) නික්මීම ගෙන දෙන, සම්බෝධියට ගෙන යන ධර්මය කුමක් නිසා අසන්නාහුද'යි මෙසේ විමසුවහොත් ඔවුනට මෙලෙස පිළිතුරු දිය යුතුය. 'හුදෙක් ද්විවිධ ධර්මයන් ඇති සැටියෙන් දැනගැනීම පිණිසයි' කියායි.

කවරක් ද්විවිධ යැයි කියාද? 'මේ දුකය, මේ දුකෙහි හටගැන්මය' මේ එක් අනුපස්සනාවකි. 'මේ දුක් නිරෝධයයි, මේ දුක් නිරුද්ධ කරන ප්‍රතිපදාව'යි මේ දෙවැනි අනුපස්සනාවයි. මෙලෙස මැනවින් ද්වයතාව අනුව බැලීමේ යෙදෙන අප්‍රමාදී උත්සහවත් වීර්යය වැඩීමෙහි යෙදෙමින් වාසය කරන භික්ෂුවට මහණෙනි, ඵල දෙකක් අතරින් එක්තරා ඵලයක් කැමති විය යුතුය. මෙලොව දීම අර්හත්වය හෝ ක්ලේෂයන් ඉතිරි වූ කල්හි අනාගාමී බවයි". භාග්‍යවතුන් වහන්සේ මෙය වදාරා, සුගත ශාස්තෘන් වහන්සේ ඉක්බිතිව තෙල කීහ.

1. යමෙක් දුකද, යලිත් දුකෙහි හටගැනීමත් නොදනිත්ද
   යම් තැනක සියළු දුක ශේෂ නැතිව නිරුද්ධ වේද, එයත් නොදනිත්ද
   ඒ දුක සන්සිඳුවන මාර්ගයත් නොදනිත්ද. (726)

2. ඔවුහු චිත්ත විමුක්තියෙන්ද ප්‍රඥා විමුක්තියෙන්ද පිරිහුනාහු
   ඔවුහු (දුක්) කෙළවර කිරීමට අභව්‍ය වෙති, ඔවුහු නියත ලෙස උපත
   හා මහළු බව වෙත ගියාහුය. (727)

3. යමෙක් දුකද, යලිත් දුකෙහි හටගැනීමත් දනිත් ද
   යම් තැනක සියළු දුක ශේෂ නැතිව නිරුද්ධ වේද,
   එයත් දනී ද, ඒ දුක සන්සිඳුවන මාර්ගයත් මැනවින් දනී ද (728)

4. චිත්ත විමුක්තිය ද ප්‍රඥා විමුක්තිය ද ඇත්තේ
   ඔවුහු (දුක්) කෙළවර කිරීමට භව්‍ය වෙති, ඔවුහු උපත හා මහළු බව
   වෙත නොගියාහුය. (729)

මහණෙනි, ඉදින් මැනවින් ද්වයතාව අනුව බැලීමට අන් ක්‍රමයකුත් ඇතිදැයි අසන ලද්දේ නම් ඔවුනට ඇත්තේ යැයි කිය යුතුය. කෙලෙසද ඇත්තේ. 'යම් කිසි දුකක් හටගනී නම් ඒ සියල්ල වත්කම් නිසාය.' මේ එක් අනුපස්සනාවකි. 'වත්කම් වලම ශේෂ නැතිව නිරුද්ධ කිරීමෙන් දුකෙහි හටගැනීමක් නැත.' මේ දෙවැනි අනුපස්සනාවයි. මෙලෙස මැනවින් ද්වයතාව අනුව බැලීමේ යෙදෙන අප්‍රමාදී උත්සහවත් වීර්යය වැඩීමෙහි යෙදෙමින් වාසය කරන භික්ෂුවට මහණෙනි, ඵල දෙකක් අතරින් එක්තරා ඵලයක් කැමති විය යුතුය. මෙලොව දීම අර්හත්වය හෝ ක්ලේෂයන් ඉතිරි වූ කල්හි අනාගාමී බවයි. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාරා, සුගත ශාස්තෘන් වහන්සේ ඉක්බිතිව තෙල කීහ.

5. ලෝකයෙහි යම් කිසි අනේකාකාර වූ දුක්
වත්කම් හේතුකොටගෙන හටගනී.
යම් නොදන්නා කෙනෙක් වත්කම් ගොඩනගයිද
ඒ මන්දයා නැවත නැවත දුකට පැමිණේ.
එමනිසා දුකෙහි උපත හා හටගැනීම දකින්නා
දැනගෙන වත්කම් නොකරයි. (730)

මහණෙනි, ඉදින් මැනවින් ද්වයතාව අනුව බැලීමට අන් ක්‍රමයකුත් ඇතිදැයි අසන ලද්දේනම් ඔවුනට ඇත්තේ යැයි කිය යුතුය. කෙලෙසද ඇත්තේ. 'යම්කිසි දුකක් හටගනීනම් ඒ සියල්ල අවිද්‍යාව නිසාය' මේ එක් අනුපස්සනාවකි. 'අවිද්‍යාවෙම ශේෂ නැතිව නිරුද්ධ කිරීමෙන් දුකෙහි හට ගැනීමක් නැත.' මේ දෙවැනි අනුපස්සනාවයි. මෙලෙස මැනවින් ද්වයතාව අනුව බැලීමේ යෙදෙන අප්‍රමාදී උත්සහවත් වීර්යය වැඩීමෙහි යෙදෙමින් වාසය කරන භික්ෂුවට මහණෙනි, ඵල දෙකක් අතරින් එක්තරා ඵලයක් කැමති විය යුතුය. මෙලොව දීම අර්හත්වය හෝ ක්ලේෂයන් ඉතිරි වූ කල්හි අනාගාමී බවයි. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාරා, සුගත ශාස්තෘන් වහන්සේ ඉක්බිතිව තෙල කීහ.

6. යමෙක් නැවත නැවතත් උපතට මරණයට සංසාරයට යත්ද
අවිද්‍යාව නිසාම මේ භවයෙන් අන් භවයකට යෑම වන්නේය. (731)

7. මේ අවිද්‍යාව මහා මුලාව වන්නේය, එයින් මේ දිගුකලක් සැරිසැරීම විය.
යම් සත්ත්වයෝ විද්‍යාවට පැමිණියෝද, ඔවුහු පුනර්භවයට නොයති.
(732)

මහණෙනි, ඉදින් මැනවින් ද්වයතාව අනුව බැලීමට අන් ක්‍රමයකුත් ඇතිදැයි අසන ලද්දේනම් ඔවුනට ඇත්තේ යැයි කිය යුතුය.

කෙලෙසද ඇත්තේ. 'යම්කිසි දුකක් හටගනීනම් ඒ සියල්ල සංස්කාර නිසයි' මේ එක් අනුපස්සනාවකි. 'සංස්කාරයන්ගේම ශේෂ නැතිව නිරුද්ධ කිරීමෙන් දුකෙහි හට ගැනීමක් නැත.' මේ දෙවැනි අනුපස්සනාවයි. මෙලෙස මැනවින් ද්වයතාව අනුව බැලීමේ යෙදෙන අප්‍රමාදී උත්සහවත් වීර්යය වැඩීමෙහි යෙදෙමින් වාසය කරන භික්ෂුවට මහණෙනි, ඵල දෙකක් අතරින් එක්තරා ඵලයක් කැමති විය යුතුය. මෙලොව දීම අර්හත්වය හෝ ක්ලේෂයන් ඉතිරි වූ කල්හි අනාගාමී බවයි. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාරා, සුගත ශාස්තෘන් වහන්සේ ඉක්බිතිව තෙල කීහ.

8. යම් කිසි දුකක් හටගනීද, ඒ සියල්ල සංස්කාර නිසයි
   සංස්කාරයන්ගේම නිරුද්ධ කිරීමෙන් දුකෙහි හටගැනීමක් නැත.
(733)

9. දුක සංස්කාර නිසාය යන තෙල ආදීනවය දැන
   සියළු සංස්කාරයන් සංසිඳුවීමෙන් සංඥාවන් වළකා
   එය ඇති සැටියෙන් දැන ගැනීමෙන්, මෙලෙස දුක ක්‍ෂය කිරීම වෙයි.
(734)

10. මැනවින් දැක දැනුමෙන් කෙළවරට ගියේ, මැනවින් දැන නුවණැත්තෝ
   මාර බන්ධනය අභිභවනය කොට පුනර්භවයට නොයතී (735)

මහණෙනි, ඉදින් මැනවින් ද්වයතාව අනුව බැලීමට අන් ක්‍රමයකුත් ඇතිදැයි අසන ලද්දේනම් ඔවුනට ඇත්තේ යැයි කිය යුතුය. කෙලෙසද ඇත්තේ. 'යම්කිසි දුකක් හටගනීනම් ඒ සියල්ල විඥානය නිසයි' මේ එක් අනුපස්සනාවකි. 'විඥානය ම ශේෂ නැතිව නිරුද්ධ කිරීමෙන් දුකෙහි හට ගැනීමක් නැත.' මේ දෙවැනි අනුපස්සනාවයි. මෙලෙස මැනවින් ද්වයතාව අනුව බැලීමේ යෙදෙන අප්‍රමාදී උත්සහවත් වීර්යය වැඩීමෙහි යෙදෙමින් වාසය කරන භික්ෂුවට මහණෙනි, ඵල දෙකක් අතරින් එක්තරා ඵලයක් කැමති විය යුතුය. මෙලොව දීම අර්හත්වය හෝ ක්ලේෂයන් ඉතිරි වූ කල්හි අනාගාමී බවයි. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාරා, සුගත ශාස්තෘන් වහන්සේ ඉක්බිතිව තෙල කීහ.

11. යම් කිසි දුකක් හටගනීද, ඒ සියල්ල විඥානය නිසයි.
   විඥානයම නිරුද්ධ කිරීමෙන් දුකෙහි හටගැනීමක් නැත. (736)

12. දුක විඥානය නිසාය යන තෙල ආදීනවය දැන
   විඥානය සන්සිඳුවා භික්ෂුව කුසගිනි නැතියේ පිරිනිවියේ වෙයි.
(737)

මහණෙනි, ඉදින් මැනවින් ද්වයතාව අනුව බැලීමට අන් ක්‍රමයකුත් ඇතිදැයි අසන ලද්දේනම් ඔවුනට ඇත්තේ යැයි කිය යුතුය. කෙලෙසද ඇත්තේ. 'යම්කිසි දුකක් හටගනීනම් ඒ සියල්ල ස්පර්ශය නිසයි' මේ එක් අනුපස්සනාවකි. 'ස්පර්ශයම ශේෂ නැතිව නිරුද්ධ කිරීමෙන් දුකෙහි හට ගැනීමක් නැත.' මේ දෙවැනි අනුපස්සනාවයි. මෙලෙස මැනවින් ද්වයතාව අනුව බැලීමේ යෙදෙන අප්‍රමාදී උත්සහවත් වීර්යය වැඩීමෙහි යෙදෙමින් වාසය කරන භික්ෂුවට මහණෙනි, ඵල දෙකක් අතරින් එක්තරා ඵලයක් කැමති විය යුතුය. මෙලොව දීම අර්හත්වය හෝ ක්ලේෂයන් ඉතිරි වූ කල්හි අනාගාමී බවයි. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාරා, සුගත ශාස්තෘන් වහන්සේ ඉක්බිතිව තෙල කීහ.

13. ස්පර්ශයෙන් පීඩිත වූ, භව දහරාවට අනුව යන්නා වූ
    වැරදි මඟට පිළිපත් ඔවුන් 'බන්ධන ක්‍ෂය කිරීමෙන් 'බොහෝ දුරය.
    (738)

14. යමෙක් ස්පර්ශය පිරිසිඳ දැන, අවබෝධයෙන් සන්සිඳවීමේ ඇලුනේ ද
    ඔවුහු සැබැවින්ම ස්පර්ශය අවබෝධ කොට කුසගිනි නැතියේ
    පිරිනිව්යෝ වෙති. (739)

මහණෙනි, ඉදින් මැනවින් ද්වයතාව අනුව බැලීමට අන් ක්‍රමයකුත් ඇතිදැයි අසන ලද්දේනම් ඔවුනට ඇත්තේ යැයි කිය යුතුය. කෙලෙසද ඇත්තේ. 'යම්කිසි දුකක් හටගනීනම් ඒ සියල්ල විඳීම් (වේදනා) නිසයි' මේ එක් අනුපස්සනාවකි. 'විඳීම් වලම ශේෂ නැතිව නිරුද්ධ කිරීමෙන් දුකෙහි හට ගැනීමක් නැත.' මේ දෙවැනි අනුපස්සනාවයි. මෙලෙස මැනවින් ද්වයතාව අනුව බැලීමේ යෙදෙන අප්‍රමාදී උත්සහවත් වීර්යය වැඩීමෙහි යෙදෙමින් වාසය කරන භික්ෂුවට මහණෙනි, ඵල දෙකක් අතරින් එක්තරා ඵලයක් කැමති විය යුතුය. මෙලොව දීම අර්හත්වය හෝ ක්ලේෂයන් ඉතිරි වූ කල්හි අනාගාමී බවයි. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාරා, සුගත ශාස්තෘන් වහන්සේ ඉක්බිතිව තෙල කීහ.

15. සැප හෝ දුක හෝ සැප-දුක් නොවූ හා
    අභ්‍යන්තර ද බාහිර ද වූ යම් කිසි විඳින ලද්දක් ඇති ද (740)

16. එය 'දුක' යැයි දන, මුළා කරන, බිඳෙන සුළු වූ දෙයක් බවද දැන
    ස්පර්ශ වෙවී නැති වී යාම දකිමින් මෙලෙස එහි නොඇලේ
    විඳීම් ක්‍ෂය කිරීමෙන් භික්ෂුව කුසගිනි නැතියේ පිරිනිව්යේ වෙයි.
    (741)

මහණෙනි, ඉදින් මැනවින් ද්වයතාව අනුව බැලීමට අන් ක්‍රමයකුත් ඇතිදැයි අසන ලද්දේනම් ඔවුනට ඇත්තේ යැයි කිය යුතුය. කෙලෙසද ඇත්තේ. 'යම්කිසි දුකක් හටගනීනම් ඒ සියල්ල තණ්හාව

(ආශාව) නිසයි' මේ එක් අනුපස්සනාවකි. 'තණ්හාව ශේෂ නැතිව නිරුද්ධ කිරීමෙන් දුකෙහි හට ගැනීමක් නැත.' මේ දෙවැනි අනුපස්සනාවයි. මෙලෙස මැනවින් ද්වයතාව අනුව බැලීමේ යෙදෙන අප්‍රමාදී උත්සහවත් වීර්යය වැඩීමෙහි යෙදෙමින් වාසය කරන භික්ෂුවට මහණෙනි, ඵල දෙකක් අතරින් එක්තරා ඵලයක් කැමති විය යුතුය. මෙලොව දීම අර්හත්වය හෝ ක්ලේෂයන් ඉතිරි වූ කල්හි අනාගාමී බවයි. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාරා, සුගත ශාස්තෘන් වහන්සේ ඉක්බිතිව තෙල කීහ.

17. සංසාරය නැමැති දීර්ඝ මාර්ගයෙහි
    තණ්හාව (තනියට සිටින) දෙවැනි පරුෂයාය.
    (ඔහු සමඟ) මේ භවයෙන් වෙන භවයකට යන්නේ
    සසර නොඉක්මවන්නේය (742)

18. දුක තණ්හාව නිසාය යන තෙල ආදීනවය දැන
    තණ්හාව දුරු කළේ, අල්ලා ගැනීමක් නැත්තේ, සතිමත්ව භික්ෂුව
    හැසිරේ. (743)

මහණෙනි, ඉදින් මැනවින් ද්වයතාව අනුව බැලීමට අන් ක්‍රමයකුත් ඇතිදැයි අසන ලද්දේනම් ඔවුනට ඇත්තේ යැයි කිය යුතුය. කෙලෙසද ඇත්තේ. 'යම්කිසි දුකක් හටගනීනම් ඒ සියල්ල අල්ලාගැනීම (උපාදානය) නිසයි' මේ එක් අනුපස්සනාවකි. 'අල්ලාගැනීම ශේෂ නැතිව නිරුද්ධ කිරීමෙන් දුකෙහි හට ගැනීමක් නැත.' මේ දෙවැනි අනුපස්සනාවයි. මෙලෙස මැනවින් ද්වයතාව අනුව බැලීමේ යෙදෙන අප්‍රමාදී උත්සහවත් වීර්යය වැඩීමෙහි යෙදෙමින් වාසය කරන භික්ෂුවට මහණෙනි, ඵල දෙකක් අතරින් එක්තරා ඵලයක් කැමති විය යුතුය. මෙලොව දීම අර්හත්වය හෝ ක්ලේෂයන් ඉතරි වූ කල්හි අනාගාමී බවයි. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාරා, සුගත ශාස්තෘන් වහන්සේ ඉක්බිතිව තෙල කීහ.

19. අල්ලාගැනීම නිසා පැවැත්ම වෙයි, උපන්නේ දුකට පැමිණේ.
    උපන්නාට මරණය වෙයි, එය දුකෙහි හටගැනීමයි. (744)

20. එමනිසා නුවණැත්තෝ මැනවින් දැන අල්ලා ගැනීම් ක්ෂය කර
    උපත ක්ෂය කිරීම හොඳින් දැන පුනර්භවයට නොයත්. (745)

මහණෙනි, ඉදින් මැනවින් ද්වයතාව අනුව බැලීමට අන් ක්‍රමයකුත් ඇතිදැයි අසන ලද්දේනම් ඔවුනට ඇත්තේ යැයි කිය යුතුය. කෙලෙසද ඇත්තේ. 'යම්කිසි දුකක් හටගනීනම් ඒ සියල්ල 'පටන් ගැන්ම' නිසයි' මේ එක් අනුපස්සනාවකි. 'පටන් ගැන්ම ශේෂ නැතිව නිරුද්ධ

කිරීමෙන් දුකෙහි හට ගැනීමක් නැත.' මේ දෙවැනි අනුපස්සනාවයි. මෙලෙස මැනවින් ද්වයතාව අනුව බැලීමේ යෙදෙන අප්‍රමාදී උත්සහවත් වීර්යය වැඩීමෙහි යෙදෙමින් වාසය කරන භික්ෂුවට මහණෙනි, ඵල දෙකක් අතරින් එක්තරා ඵලයක් කැමති විය යුතුය. මෙලොව දීම අර්හත්වය හෝ ක්ලේෂයන් ඉතිරි වූ කල්හි අනාගාමී බවයි. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාරා, සුගත ශාස්තෘන් වහන්සේ ඉක්බිතිව තෙල කීහ.

21. යම් කිසි දුකක් හටගනීද, ඒ සියල්ල ආරම්භය නිසයි
ආරම්භ කිරීම ම නිරුද්ධ කිරීමෙන් දුකෙහි හටගැනීමක් නැත. (746)

22. දුක ආරම්භය නිසායැයි තෙල ආදීනවය දැන
සියළු ආරම්භ කිරීම් අතහැර අනාරම්භයේ ස්ථිරව පිහිටියේ. (747)

23. භව තණ්හාව සිඳ දැමුව ශාන්ත සිත් ඇති භික්ෂුව
උපතින් හා සසරින් එතෙර වූයේ, ඔහුට පුනර්භවයක් නැත. (748)

මහණෙනි, ඉදින් මැනවින් ද්වයතාව අනුව බැලීමට අන් ක්‍රමයකුත් ඇතිදැයි අසන ලද්දේනම් ඔවුනට ඇත්තේ යැයි කිය යුතුය. කෙලෙසද ඇත්තේ. 'යම්කිසි දුකක් හටගනීනම් ඒ සියල්ල ආහාර[1] නිසයි' මේ එක් අනුපස්සනාවකි. 'ආහාරය ම ශේෂ නැතිව නිරුද්ධ කිරීමෙන් දුකෙහි හට ගැනීමක් නැත.' මේ දෙවැනි අනුපස්සනාවයි. මෙලෙස මැනවින් ද්වයතාව අනුව බැලීමේ යෙදෙන අප්‍රමාදී උත්සහවත් වීර්යය වැඩීමෙහි යෙදෙමින් වාසය කරන භික්ෂුවට මහණෙනි, ඵල දෙකක් අතරින් එක්තරා ඵලයක් කැමති විය යුතුය. මෙලොව දීම අර්හත්වය හෝ ක්ලේෂයන් ඉතිරි වූ කල්හි අනාගාමී බවයි. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාරා, සුගත ශාස්තෘන් වහන්සේ ඉක්බිතිව තෙල කීහ.

24. යම් කිසි දුකක් හටගනීද, ඒ සියල්ල ආහාර නිසයි
ආහාරම නිරුද්ධ කිරීමෙන් දුකෙහි හට ගැනීමක් නැත. (749)

25. දුක ආහාර නිසා යැයි තෙල ආදීනවය දැන
සියළු ආහාර පිරිසිඳ දැන, සියළු ආහාර මත යැපීමක් නැත්තේ.
(750)

26. ආරෝග්‍යය (නිවන) මැනවින් දැන
ආශ්‍රව මුළුමනින් ක්ෂය කොට
ධර්මයෙහි ස්ථිරව පිහිටියේ, නුවණින් දැන (ආහාර) සේවනය කරයි,
දැනුමෙන් පරතෙරට ගියේ ගිණීමකට නොඑයි. (751)

---

[1] ආහාර 4කි - ගොරෝසු හෝ සියුම් සන ආහාර, ස්පර්ශය, මනෝසංචේතනා, විඥානය

මහණෙනි, ඉදින් මැනවින් ද්වයතාව අනුව බැලීමට අන් ක්‍රමයකුත් ඇතිදැයි අසන ලද්දේනම් ඔවුනට ඇත්තේ යැයි කිය යුතුය. කෙලෙසද ඇත්තේ. 'යම්කිසි දුකක් හටගනී නම් ඒ සියල්ල (සිතේ) සෙලවීම් නිසයි' මේ එක් අනුපස්සනාවකි. '(සිතේ) සෙලවීම් ශේෂ නැතිව නිරුද්ධ කිරීමෙන් දුකෙහි හට ගැනීමක් නැත.' මේ දෙවැනි අනුපස්සනාවයි. මෙලෙස මැනවින් ද්වයතාව අනුව බැලීමේ යෙදෙන අප්‍රමාදී උත්සහවත් වීර්යය වැඩීමෙහි යෙදෙමින් වාසය කරන භික්ෂුවට මහණෙනි, ඵල දෙකක් අතරින් එක්තරා ඵලයක් කැමති විය යුතුය. මෙලොව දීම අර්හත්වය හෝ ක්ලේෂයන් ඉතිරි වූ කල්හි අනාගාමී බවයි. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාරා, සුගත ශාස්තෘන් වහන්සේ ඉක්බිතිව තෙල කීහ.

27. යම් කිසි දුකක් හටගනීද, ඒ සියල්ල (සිතේ) සෙලවීම නිසයි
    සෙලවීම ම නිරුද්ධ කිරීමෙන් දුකෙහි හටගැනීමක් නැත. (752)

28. දුක සෙලවීම් නිසා යැයි තෙල ආදීනවය දැන
    එම නිසා සැලීම හැරපියා, සංස්කාර වළක්වා
    නොසැලෙන්නේ, අල්ලා නොගත්තේ, සතිමත්ව භික්ෂුව හැසිරේ.
    (753)

මහණෙනි, ඉදින් මැනවින් ද්වයතාව අනුව බැලීමට අන් ක්‍රමයකුත් ඇතිදැයි අසන ලද්දේනම් ඔවුනට ඇත්තේ යැයි කිය යුතුය. කෙලෙසද ඇත්තේ. '(යමක්) ඇසුරු කරන්නාට (සිතේ) චලනයක් වෙයි.' මෙය එක් අනුපස්සනාවකි. 'ඇසුරු නොකරන්නාට චලනයක් නැත.' මේ දෙවැනි අනුපස්සනාවයි. මෙලෙස මැනවින් ද්වයතාව අනුව බැලීමේ යෙදෙන අප්‍රමාදී උත්සහවත් වීර්යය වැඩීමෙහි යෙදෙමින් වාසය කරන භික්ෂුවට මහණෙනි, ඵල දෙකක් අතරින් එක්තරා ඵලයක් කැමති විය යුතුය. මෙලොව දීම අර්හත්වය හෝ ක්ලේෂයන් ඉතිරි වූ කල්හි අනාගාමී බවයි. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාරා, සුගත ශාස්තෘන් වහන්සේ ඉක්බිතිව තෙල කීහ.

29. ඇසුරු නොකරන්නා නොසැලේ, ඇසුරු කරන්නා අල්ලාගැනීමෙන්
    මේ භවයෙන් වෙන භවයකට යන්නේ, සසර නොඉක්මවයි. (754)

30. එම ආදීනවයත්, ඇසුරු කිරීම්වල මහාබියත් දැන
    (කිසිවක්) ඇසුරු නොකළේ, අල්ලා නොගත්තේ සතිමත්ව භික්ෂුව
    හැසිරේ. (755)

මහණෙනි, ඉදින් මැනවින් ද්වයතාව අනුව බැලීමට අන් ක්‍රමයකුත් ඇතිදැයි අසන ලද්දේනම් ඔවුනට ඇත්තේ යැයි කිය යුතුය.

කෙලෙසද ඇත්තේ. 'රූපයට වඩා අරූපය ශාන්තය.' මෙය එක් අනුපස්සනාවකි. 'අරූපයට වඩා නිරෝධය ශාන්තය.' මේ දෙවැනි අනුපස්සනාවයි. මෙලෙස මැනවින් ද්වයතාව අනුව බැලීමේ යෙදෙන අප්‍රමාදී උත්සහවත් වීර්යය වැඩීමෙහි යෙදෙමින් වාසය කරන භික්ෂුවට මහණෙනි, ඵල දෙකක් අතරින් එක්තරා ඵලයක් කැමති විය යුතුය. මෙලොව දීම අර්හත්වය හෝ ක්ලේෂයන් ඉතිරි වූ කල්හි අනාගාමී බවයි. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාරා, සුගත ශාස්තෘන් වහන්සේ ඉක්බිතිව තෙල කීහ.

31. යම් රූපයට (රූප ලෝකයට) පැමිණි සත්ත්වයෝ වෙත්ද
යම් අරූපයෙහි වසන්නෝ වෙත්ද
නිරෝධය නොදන්නා නිසා
පුනර්භවයට (නැවත) එන්නාහ. (756)

32. යමෙක් රූපය පිරිසිඳ දැන, අරූපයෙහි නොසිටියෝද
නිරෝධයෙහි ස්ථිර ලෙස පිහිටත්ද, ඒ ජනයා මරණය වනසා දමූහ.
(757)

මහණෙනි, ඉදින් මැනවින් ද්වයතාව අනුව බැලීමට අන් ක්‍රමයකුත් ඇතිදැයි අසන ලද්දේනම් ඔවුනට ඇත්තේ යැයි කිය යුතුය. කෙලෙසද ඇත්තේ? මහණෙනි, 'දෙවියන් සහිත, මරුන් සහිත බඹුන් සහිත, මහණ බමුණන් සහිත දෙව් මිනිසුන් සහිත ප්‍රජාව 'මෙය සත්‍යයැ'යි'[1] යමක් සිතන ලද්දේ ද ආර්යයන් විසින් 'එය බොරුවකැ'යි යථා පරිදි මනා ප්‍රඥාවෙන් මැනවින් දක්නා ලදී.' මෙය එක් අනුපස්සනාවකි. මහණෙනි, 'දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත මහණ බමුණන් සහිත දෙව් මිනිසුන් සහිත ප්‍රජාව 'මෙය බොරුවකැ'යි යමක් සිතන ලද්දේ ද, ආර්යයන් විසින් 'එය සත්‍යයකැ'යි යථා පරිදි මනා ප්‍රඥාවෙන් මැනවින් දක්නා ලදී.' මේ දෙවැනි අනුපස්සනාවයි. මෙලෙස මැනවින් ද්වයතාව අනුව බැලීමේ යෙදෙන අප්‍රමාදී උත්සහවත් වීර්යය වැඩීමෙහි යෙදෙමින් වාසය කරන භික්ෂුවට මහණෙනි, ඵල දෙකක් අතරින් එක්තරා ඵලයක් කැමති විය යුතුය. මෙලොව දීම අර්හත්වය හෝ ක්ලේෂයන් ඉතිරි වූ කල්හි අනාගාමී බවයි. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාරා, සුගත ශාස්තෘන් වහන්සේ ඉක්බිතිව තෙල කීහ.

33. ආත්මයක් නැති දෙයෙහි 'ආත්මයක් ඇතැ'යි යන මැනීම ඇති
දෙවියන් සහිත ලෝකය බලන්න.
(ඔවුහු) නාම-රූපයෙහි ඇතුලට බැසගෙන
'මෙය සත්‍යයකැ'යි සිතත්. (758)

---

[1] ආත්ම සඤ්ඤාව පිළිබඳව කියන ලදී.

34. යම් යම් අයුරකින් සිතත්ද ඉන් එය අන් අයුරකින් වෙයි
එයම ඔහුට බොරුවක් වෙයි, නොවැදගත් රැවටිලි මාත්‍රයකි. (759)

35. 'නිවීම (නිවන) නොරැවටිල්ලකැ'යි
ආර්යයන් මෙය සත්‍යයක් ලෙස දන
ඔවුහු එකැතින් සත්‍යය අවබෝධ කොට
කුසගිනි නැත්තෝ පිරිනිවියෝ වෙති. (760)

මහණෙනි, ඉදින් මැනවින් ද්වයතාව අනුව බැලීමට අන් ක්‍රමයකුත් ඇතිදැයි අසන ලද්දේනම් ඔවුනට ඇත්තේ යැයි කිය යුතුය. කෙලෙසද ඇත්තේ? මහණෙනි, 'දෙවියන් සහිත, මරුන් සහිත, බඹුන් සහිත, මහණ බමුණන් සහිත දෙව් මිනිසුන් සහිත ප්‍රජාව 'මෙය සැපයැ'යි[1] යමක් සිතන ලද්දේ ද ආර්යයන් විසින් 'එය දුකකැ'යි යථා පරිදි මනා ප්‍රඥාවෙන් මැනවින් දක්නා ලදී.' මෙය එක් අනුපස්සනාවකි. මහණෙනි, 'දෙවියන් සහිත මරුන් සහිත බඹුන් සහිත මහණ බමුණන් සහිත දෙව් මිනිසුන් සහිත ප්‍රජාව 'මෙය දුකකැ'යි[2] යමක් සිතන ලද්දේ ද, ආර්යයන් විසින් 'එය සැපයැ'යි යථා පරිදි මනා ප්‍රඥාවෙන් මැනවින් දක්නා ලදී.' මේ දෙවැනි අනුපස්සනාවයි. මෙලෙස මැනවින් ද්වයතාව අනුව බැලීමේ යෙදෙන අප්‍රමාදී උත්සහවත් වීර්යය වැඩීමෙහි යෙදෙමින් වාසය කරන භික්ෂුවට මහණෙනි, ඵල දෙකක් අතරින් එක්තරා ඵලයක් කැමති විය යුතුය. මෙලොව දීම අර්හත්වය හෝ ක්ලේෂයන් ඉතිරි වූ කල්හි අනාගාමී බවයි. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාරා, සුගත ශාස්තෘන් වහන්සේ ඉක්බිතිව තෙල කීහ.

36. ප්‍රිය වූ සිත්කළු මන වඩනා යම් රූප, ශබ්ද, රස, ගන්ධ, ස්පර්ශයෝ
මනසේ අරමුණුද යන සියල්ල ඇතැයි කියනු ලැබේ. (761)

37. දෙවියන් සහිත ලෝකයාට ඒවායෙහි 'සැප' යන සම්මුතිය ඇත.
ඉදින් යම් තැනක ඒවා නිරුද්ධ වෙත් නම් එය ඔවුනට දුක යැයි සම්මතය. (762)

38. ආර්යයන් විසින් සැප යැයි දක්නා ලද දෙයෙහි ඔවුන්ගේ වැලපීම සිදුවිය හැක.
දකින්නවුන්ගේ මේ දැක්ම සමඟ සියළු ලෝකයා අත්‍යන්තයෙන් විරුද්ධ වෙති. (763)

---

[1] පංච කාමයන්

[2] නෙක්ඛම්මය : පංච කාමයන්ගෙන් වෙන්වීම

39. යමක් අන්‍යයෝ සැප යැයි කීවෝද එය ආර්යයෝ දුක යැයි කීහ
යමක් අන්‍යයෝ දුක යැයි කීවෝද එය ආර්යයෝ සැප යැයි දැනගත්හ
දැන ගැනීමට දුෂ්කර මේ ධර්මය දෙස බලව, මෝඩයෝ එහි මුළාවට පත්වෙති. (764)

40. අන්ධයාට අඳුර මෙන්
(අවිද්‍යාවෙන්) වැසුණු කෙනාට අන්ධකාරය පවතී.
පෙනෙන්නාට ආලෝකය මෙන්
සත්පුරුෂයාට (ධර්මය) විවෘතව පෙනේ.
ළඟ ඇත්තේ නමුදු ධර්මයෙහි අදක්ෂ වූ මෝඩයාට
එය දත නොහැකිය. (765)

41. භව (පැවැත්මට) ඇල්ම නිසා පීඩිත වූ, භව දහරාව අනුව යන්නා වූ මාරවිෂයට (කාමයන්ට) පැමිණියෝ විසින් මේ ධර්මය පහසුවෙන් අවබෝධ කරගත නොහැක. (766)

42. යම් තත්වයක් මැනවින් දැන ආශ්‍රව රහිතව පිරිනිවෙත්ද
ඒ සම්බුද්ධ තත්වය ආර්යයන්ට හැර වෙන කවරෙකුට නම් සුදුසු ද? (767)

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාල කල්හි සතුටු සිත් ඇති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ භාෂිතය සතුටින් පිළිගත්හ. මෙම දේශනාව දෙසන කල්හි හැටක් පමණ භික්ෂූන්ගේ සිත් අල්ලා ගැනීම් වලින් තොරව ආශ්‍රව වලින් මිදුනාහ.

04 . අටේ පරිච්ඡේදය

4.1 කාම සූත්‍රය

1. (මාරයා)
කාමයන් කැමතිවන්නාට, ඔහුගේ ඒ අභිප්‍රාය සමෘද්ධ වේනම්
ඒ කැමැති දේ ලත් මිනිසා, ඒකාන්තයෙන් සතුටු සිත් ඇත්තෙකි.
(768)

2. (භාග්‍යවතුන් වහන්සේ)
කාමයන් කැමතිවන්නාට, ආශාව උපන් (ඒ) මිනිසාගේ
තෙල කාමයෝ පිරිහී යත්නම් (විනාශ වේනම්) (හෙතෙම) උලකින්
විදිනු ලැබූවෙකු සේ පෙලේ. (769)

3. යමෙක් කාමයන්ගෙන් වැළකේනම්
සර්පයකුගේ හිස ලඟින් පය ඉවත් කරගන්නා සේ
ඔහු ලෝකයේ ඇති මෙම පැටලෙන දෙය (පංච කාමයන්)
සතිමත්ව ඉක්මවයි. (770)

4. කෙත්වතු, රත්රන්, ගවයන්, අසුන්, දාස කම්කරුවන්,
ස්ත්‍රීන්, නෑයන් බඳු බොහෝ කාමයන් කෙරෙහි යම් මිනිසෙක් ගිජු
වෙයිද (771)

5. උපද්‍රවයන් ඒවා (කාම වස්තූන්) මඬනා (විනාශ කරන) කල්හි
ඒ අබල වූ දේ (බිඳෙන සුළු කාමයෝ) ඔහුව මැඬලති
එයින් දුක ඔහු තුළට පිවිසේ
බිඳුනු නැවකට දිය ඇතුල් වන්නා සේ. (772)

6. එමනිසා මිනිසා හැම විටම සතිමත්ව කාමයන් මඟහරින්නේය.
ඒවා දුරලා දිය ඉස එතෙර යන නැවක් සේ සැඩපහර තරණය
කරන්නේය. (773)

4.2 ගුහාවේ අට සූත්‍රය

1. මිනිසා ගුහාවක බැඳුනේ, (කාම රාගයෙන්) බෙහෙවින් වැසීගියේ
මුළාවෙහි ගිලී සිටින්නේ ද
එවැනි වූ ඔහු (කාය-චිත්ත) විවේකයෙන් දුරමැ වේ
ලෝකයේ කාමයන් දුරු කිරීම ඉතාම දුෂ්කරය. (774)

2. කැමැත්ත මුල් කොට ඇත්තෝ, පැවැත්මේ සැපයේ බැඳුනෝ
අතීතයේ ලද දේ හෝ අනාගතයෙහි ලැබීමට හෝ පතන්නෝ
දැන් විඳින කම් සුවත් අතීතයේ පතන ලද්දේ,
ඔවුහු (කාමයන්ගෙන්) ඉතා දුකසේ මිදිය යුත්තාහ, අනෙකකු විසිනුදු
මුදවාලිය නොහැක. (775)

3. කාමයන්හි ගිජු වූ, ඒ සොයන, එහි මුළාවූ
වැරදි ක්‍රියාවල නියැලුනු අයට වෙන කෙනෙකු විසින් කරුණු දැක්විය
නොහැක්කේය.
(ඔවුහු) "මෙයින් (මේ අත්බැවින්) චුත වූ පසු අපට කුමක් වන්නේද?"යි
දුකට පමුණුවනු ලැබ විලාප දෙත්. (776)

4. එමනිසා පුද්ගලයා මෙහිම (මේ කරුණෙහිම) හික්මේවා!
ලොව යම් කිසිවක් විෂම යැයි දන්නේද (එනම් කාමයන්)
එය හේතු කරගෙන විෂම (වැරදි) ක්‍රියාවල නොයෙදෙන්නේය.
(ඇයිද යත්) නුවණැත්තෝ මේ ජීවිතය අල්ප වූ දෙයකැයි කියන ලදී.
(777)

5. පැවැත්මෙහි තණ්හාව ඇති කර ගෙන බියෙන් ගැහෙන
ලෝකයේ මෙම මිනිස් කැල දකිමි.
විවිධ දේ කෙරෙහි ආශාව නැති කර නොගත්
හීන මිනිස්සු මරු මුඛයෙහි විලාප දෙත්. (778)

6. සිඳී යන අල්ප දිය ඇති දිය කඩක මසුන් මෙන්
'මගේ' යැයි අයිති කරගත් දේ ඇත්තා ගැහෙනා සැටි බලව
එයද දැක 'මගේ' යැයි ගත් කිසිවක් නැතිව
පැවැත්මෙහි ඇලුම් කිරීමක් නැතිව හැසිරෙන්න (779)

7. අන්ත දෙකෙහි[1] කැමැත්ත දුරලන්න.
ස්පර්ශය අවබෝධ කරගෙන ගිජු නොවූයේ
තමනට ගැරහීම උපදවන දෙය නොකරන්නේ
නුවණැත්තා ඇසූ දුටු දෙයෙහි නොඇලෙයි. (780)

8. සංඥාව (දැන ගැනීම්) අවබෝධ කරගෙන සැඩපහර තරණය කරන්නේය.
මුනිවරයා තමා අයත් දෙයෙහි නො ඇළුනේ
(සිතේ ඇනුන) උල උදුරා දැමූයේ, අප්‍රමාදීව හැසිරෙන්නේ
මෙලොව හෝ පරලොව හෝ නොපතන්නේය. (781)

[1] අන්ත දෙක නම් අභ්‍යන්තර හා බාහිර ආයතනය (එනම් ඇස-රූප, කන-ශබ්ද, නාසය-ගන්ධය, දිව-රස, කය-කායික ස්පර්ශය, මනස-ධර්ම (සිතුවිලි). ස්පර්ශය යනු එම අභ්‍යන්තර හා බාහිර ආයතන වල එකතු වීමයි.

4.3 දුෂ්ඨ අට සූත්‍රය

1. කෙනෙක් දූෂ්ඨ සිතකින් කතා කෙරේ.
නැතිනම් සත්‍යය යැයි සිතා කතා කෙරේ.
(මෙලෙස) උපන් වාදයට මුනිවරයා සහභාගී නොවේ.
එම නිසා මුනිවරයාට කිසිදු (ද්වේශ ආදී) හුලක් ඇත්තේ නැත.
(782)

2. කැමැත්ත විසින් ගෙන යනු ලබන්නේ, රුචි දෙයෙහි බැසගත්තේ
කෙසේනම් තමන්ගේ දෘෂ්ඨිය ඉක්මවන්නද (අතහරින්නද)?
තමා විසින් නිවැරදි යැයි නිෂ්ඨාවට ගිය දේ කරමින්
යම් පරිදි දන්නේද, ඒ පරිදි කියන්නේය. (783)

3. යම් පුද්ගලයෙක් තමාගේ (ප්‍රාතිමෝක්‍ෂ ආදී) සීල ව්‍රතය
නොඅසාම අන් අයට කියා පාන්නේද
තමා ගැන තමාම කියාපාන
එය අනාර්ය ධර්මයකැයි දක්ෂයෝ පවසත්. (784)

4. ශාන්ත වූ භික්ෂුව මැනවින් නිවීගිය බැවින්
'මම මෙසේ' යැයි සීලය ප්‍රකාශ නොකරන්නේද
එය ආර්ය ධර්මයකැයි දක්ෂයෝ පවසත්.
ඔහුට ලෝකයේ කිසිදු උස්වීමක් (මාන්නයක්) ඇත්තේ නැත.
(785)

5. ශුද්ධ නොවූ ශාන්තියක් පෙරටු කරගෙන
පරිකල්පිත වූ සකසන ලද අදහස් (දෘෂ්ඨී) යමෙකුට ඇද්ද
(ඒවායින්) තමා කෙරෙහි (යම්) ආනිසංසයක් දකින්නේ
එය ඇසුරු කොට ලබන එම ශාන්තිය වහා වෙනස්වන සුළුය.
(786)

6. අදහස් අතරින් තක්සේරු කර අල්ලාගත්
දෘෂ්ඨී නිවෙස් ඉක්මවායාම බොහෝ දුෂ්කරය.
එමනිසා මිනිසා එම නිවාස අතරින්
ඇතැම් දෘෂ්ඨියක් ගන්නෙත්, තවෙකක් හරනෙත් වෙයි. (787)

7. පිරිසිදු වූවහුට (රහත් හට) ලෝකයෙහි
විවිධ දේ ගැන පරිකල්පිත කිසිදු දෘෂ්ඨියක් නැත.
පිරිසිදු වූයේ, රැවටිල්ලත් මාන්නයත් හැර දැමූයේ
ඔහු කුමකින් (කුමන දෘෂ්ඨියකින්) යන්නද?
ඔහු කිසිවකට (කිසිම දෘෂ්ඨියකට) නොඑළඹියේ වෙයි. (788)

8. දෘෂ්ඨී වලට එළඹෙන්නා වාදයට එළඹෙයි.
(දෘෂ්ඨී වලට) නොඑළඹෙන්නා කා සමඟ කුමක් කියන්නද?
අල්ලාගත් දෙයක් හෝ අත්හැරිය දෙයක් ඔහුට නැත.
ඔහු මෙහිදීම සියළු දෘෂ්ඨීන් අතහැර දමන ලදී. (789)

4.4 ශුද්ධ අට සූත්‍රය

1. "පාරිශුද්ධ වූ, උත්තරීතර වූ, ආරෝග්‍ය දේ දකිමි,
දෘෂ්ඨියෙන් මිනිසාගේ පාරිශුද්ධිය සිදුවෙයි"
මෙය මෙසේ දන්නේ, එය පරම යැයි සිතා
"පාරිශුද්ධිය දකිමි"යි ඥාණයකට පැමිණේ. (790)

2. ඉදින් දෘෂ්ඨියෙන් පුද්ගලයාගේ පාරිශුද්ධිය සිදුවේ නම්
නැතහොත් ඥානයෙන් දුක ප්‍රහීණ කරන්නේ නම්
හෙතෙම කෙලෙස් ඇත්තේම අන් ක්‍රමයකින් පිරිසුදු වන්නේය.
(ඔහුගේ) දෘෂ්ඨියම එසේ කියන ඔහුව (ඔහුගේ තත්වය) හෙළි කරයි.
(791)

3. ඇසූ දුටු දැන ගත් දෙයෙහි[1] හෝ සීල ව්‍රතයෙහි හෝ
අන්‍ය ක්‍රමයකින් හෝ (සැබෑ) බ්‍රාහ්මණයා ශුද්ධිය ප්‍රකාශ නොකරයි.
පවෙහි හෝ පිනෙහි නොඇලෙන්නේ
අල්ලා ගත් දෙය අතහැර (දෘෂ්ඨි) කිසිවක් සකස් නොකරයි.
(792)

4. මුල් දෙය (දෘෂ්ඨිය) අතහැර වෙන දෙයක බැඳෙන්නේ
(සිතේ) සෙලවීම් අනුව යන ඔවුහු ඇලීම් වලින් එතෙර නොවෙත්.
වඳුරෙකු අත්තක් අතහැර වෙන අත්තක් අල්ලා ගන්නාසේ
ඔවුහු (දෘෂ්ඨි) අල්ලාගන්නේත් අතහරින්නේත් වෙයි. (793)

5. පුද්ගලයෙක් තෙමේම සීලව්‍රතයක් සමාදන්ව
සංඥාවෙහි ඇලුනේ, උස්පහත් (භව) වලට යේ.
පුළුල් ප්‍රඥාවක් ඇති දන්නා පුද්ගලයා
නුවණින් ධර්මය අවබෝධ කරගෙන උස්පහත් (භව) වලට නොයේ.
(794)

6. ඇසූ දුටු දැනගත් යම් කිසිවක් ඇද්ද
ඔහු ඒ සියළු ධර්මයන් කෙරෙහි අවිරුද්ධ වූයේ
එයම (එම තත්වයම) දකිමින් විවෘතව හැසිරෙන්නේ
මෙලොව කුමකින් ඔහුව වර්ගීකරණය කරන්නද? (795)

---

[1] දැනගත් : නාසයෙන් දිවෙන් කයෙන් දැනගත්

7. (දෘෂ්ඨි) සකස් කිරීමක් නොකරන (කිසිවක්) පෙරදැරි කර නොගත්
ඔවුහු 'මේ උත්තම පාරිශුද්ධිය' යැයි නොපවසත්
ග්‍රහනය කිරීමේ ගැටය ලිහා දමා
ලෝකයේ කිසිම දෙයකට ආශාවක් නොකරත්. (796)

8. සීමාවන් ඉක්මවා ගිය බ්‍රාහ්මණයාට
දැන හෝ දැක අල්වාගත් කිසිවක් නැත.
ඇලීමෙහිත් නොඇලුනේ, නොඇලීමෙහිත් නොඇලුනේ
ඔහුට මෙහි පරම යැයි ග්‍රහනය කළ කිසිවක් නැත. (797)

4.5 පරම අට සූත්‍රය

1. ලෝකයේ දෘෂ්ටී අතරින් යම් දෘෂ්ටියක් 'පරම' යැයි
උත්තරීතර කරගෙන එහි ගැලී වසන්නේ
එයින් අනෙක් සියල්ල 'පහත්' යැයි කියාද
එහෙයින් (හෙතෙම) විවාද නොඉක්මවන ලදී. (798)

2. ඇසූ දුටු දැනගත් දෙයින් හෝ සීලවෘතයෙන් හෝ
තමා කෙරෙහි යම් ආනිසංසයක් දකියිද
එහි එම දේම හෙතෙම දැඩිව ගෙන
අනෙක් සියල්ල නිහීන යැයි දකියි. (799)

3. යමක් ඇසුරු කරමින් අනෙකක් හීන යැයි දකියිද
එය ගැටයක් යැයි දක්ෂයෝ පවසත්.
එමනිසා භික්ෂුව ඇසූ දුටු දැනගත් දෙයක් හෝ
සීල වෘතය හෝ ඇසුරු නොකරන්නේය. (800)

4. ඥාණයෙන් හෝ සීලවෘතයෙන් හෝ
ලෝකයෙහි (කිසිදු) දෘෂ්ටියක් විකල්පනය නොකරන්නේ
තමන් 'සමානයෙකැයි' නොදක්වන්නේ
(තමා) හීන කියා හෝ උසස් කියා හෝ නොසිතන්නේය. (801)

5. තමාගේ යැයි තිබූ දෙය අතහැර කිසිවක් (අළුතින්) අල්වා
නොගන්නේ
ඥානය මතද ඔහු නොයැපෙන්නේ
භේද වූ ජනයා අතර පැත්තක් නොගන්නේ
ඔහු කිසිදු දෘෂ්ටියකට ද නොඑයි. (802)

6. යමෙකුට අන්ත දෙක ගැන අපේක්ෂාවක් නැතිද
මෙලොව හෝ පරලොව හෝ කිසිම දෙයක් ගැනත්
අදහස් අතරින් තක්සේරුකර අල්වාගත්
කිසිදු (දෘෂ්ටී) නිවසක් ඔහුට ඇත්තේ නැත. (803)

7. ඔහුට මෙහි ඇසූ දුටු දැනගත් දෙයෙහි
ගොඩනැගූ අංශුමාත්‍ර වූත් දෘෂ්ඨියක් නැතිද
දෘෂ්ඨියක් නොගන්නා ඒ බ්‍රාහ්මණයාව
මෙලොව කුමකින් වර්ගීකරණය කරන්නද? (804)

8. (සිතින්) සකස් කිරීමක් නොකරති. (කිසිවක්) පෙරදැරි කර නොගනිති.
ඔවුන් (ඉන්ද්‍රිය සයෙන්) දැනගත් දේද (ඒ සැටියෙන්)
පිළිනොගන්නා ලදි.
බ්‍රාහ්මණයා සීලව්‍රතයෙන් දත නොහැක.
එහෙව් වූ ඔහු පරතෙරට ගියේ (මෙගොඩට) නැවත නොඑයි.
(805)

4.6 වියපත් බව සූත්‍රය

1. මේ ජීවිතය ස්වල්ප වූ දෙයකි, වසර සියයටත් අඩුවෙන් මියයයි. ඉදින් යමෙක් ඊට වඩා ජීවත් වන්නේ නම්, ඉක්බිති ඔහු වියපත්වම මියයයි. (806)

2. 'මගේ' යැයි අල්ලාගත් දෙයින් ජනයා දුකට පත්වෙති.
නිත්‍ය වූ (මගේ යැයි) අයිතිකරගත් දෙයක් නම් ඇත්තේ නැත.
''මේ වෙන්වීමේ ස්වභාවය ඇත්තේම''යැයි
දැක ගිහිගෙයි නොවසයි. (807)

3. පුරුෂයෙක් යමක් 'මෙය මගේ' යැයි සිතයිද
(අවසන) මරණයෙන් වුවද එය නැතිවන්නේය.
මගේ ශ්‍රාවක නැණවතා මෙය දැක
මගේ කර ගැනීමට නැඹුරු නොවන්නේය. (808)

4. යම් සේ සිහිනයකදී හමු වූ කෙනෙකු
පිබිදුනු පුරුෂයා නොදකියිද
එලෙසින්ම ප්‍රියකරන ලද ජනයා
මිය පරලොව ගිය පසු නොදකියි. (809)

5. යමෙකුගේ මේ නමයැයි (දැන්) කියන්නේද
ඇසූ දුටු ඒ ජනයා පෙර වූහ.
මියගිය පුද්ගලයා ගැන කීමට
නම පමණක් ඉතුරුවන්නේය. (810)

6. ශෝක, වැලපීම් හා මසුරු කම
'මගේ' යැයි ගත් දෙයෙහි ගිජුවූවෝ අත් නොහරිත්.
එමනිසා මුනිවරු අයිති දෑ බැහැර කොට
බිය නැති ස්ථානය (නිවන) දකිමින් හැසිරුනහ. (811)

7. අප්‍රකටව හැසිරෙන භික්ෂුව
විවේක සෙනසුන් ඇසුරු කරන්නේද
එය ඔහුට අනුරූප යැයි කියති.
ඒ ඔහු තමන්ව ප්‍රතිසන්ධි තලයක[1] නොදක්වන්නේය. (812)

---

[1] නැවත ඉපදීමක

8. මුනිවරයා කිසිම දෙයක් කෙරෙහි නොබැඳෙන්නේ
ප්‍රිය කිරීමක් හෝ අප්‍රිය කිරීමක් නොකරයි.
ඔහු කෙරෙහි වැලපීමත් මසුරුකමත්
නෙළුම් පතේ දිය බිඳුවක් සෙයින් නොතැවරෙයි. (813)

9. නෙළුම් පතක දියබිඳු හෝ
නෙළුමේ ජලය හෝ නොතැවරෙයි.
එලෙසින්ම මුනිවරයාද ඇසූ දුටු
දැනගත් දෙයෙහි නොතැවරෙයි. (814)

10. යම් බඳු ඇසූ දුටු දැනගත් දේවල් අතුරෙන්
කිසිවක් කරණ කොටගෙන පිරිසිදු වූවහු මඤ්ඤනා නොකරයි.[1]
වෙනත් ක්‍රමයකිනුදු ශුද්ධිය නොපතයි.
ඔහු ඇලෙන්නේද නැත. නොඇලෙන්නේද නැත.[2] (815)

---

[1] 'මම, මගේ' ලෙස වැරදි අයුරින් නොසිතයි.
[2] නොඇලෙන්න මුලින් යමක ඇලී සිටිය යුතුය. මුලින්ම ඇලුණු දෙයක් නැති කල්හි නොඇලීමක් ද නැත.

4.7 තිස්ස මෙත්තෙය්‍ය සූත්‍රය

1. (තිස්ස මෙත්තෙය්‍ය)
නිදුකානනි, මෛථුනයේ යෙදුනහුට සිදුවන විනාශය කියනු මැන.
ඔබගේ ඔවදන අසා (කාය-චිත්ත) විවේකයේ හික්මෙන්නෙමු.
(816)

2. (භාග්‍යවතුන් වහන්සේ)
මෛථුනයේ යෙදුනහුට
(ශාස්තෘන් වහන්සේගේ) අවවාද අනුශාසනා අමතකව යන්නේය.
වැරදියටත් පිළිපදියි.
එය ඔහු කෙරෙහි අනාර්ය ධර්මයකි. (817)

3. කලින් තනිව හැසිරී (පසුව) යමෙක් මෛථුනයේ යෙදේද
කබල් රථයක් සේ ඔහුට ලෝකයේ 'හීන සාමාන්‍ය කෙනෙකි'යි
පවසත්. (818)

4. පෙර යම් යසසක් කීර්තියක් වීද, එයද ඔහුට පිරිහී යයි.
මෙයත් දැක මෛථුනය දුරලීම සඳහා කටයුතු කරන්න. (819)

5. සිතුවිලි වලින් මැඬුන ඔහු දිළින්දෙක් මෙන් කල්පනා කරයි.
අන්‍යයන්ගේ කතා අසා එවැන්නෙකු ලැජ්ජාවෙන් නිශ්ශබ්ද වේ.
(820)

6. අන් අයගේ දොස්කීම් අසා අනතුරුව ඔහු (වාචික හා කායික)
ආයුධ තනයි.
බොරුකීමටද බැසගනී, එය ඔහුට මහා විලංගුවකි. (821)

7. නුවණැත්තෙක් යැයි පිළිගැණුනු, එකලා වාසය අදිටන් කර ගෙන
සිටි ඔහු
පසුව මෛථුනයේ යෙදුනේද, මෝඩයෙකු සේ පීඩාවට පත් වේ.
(822)

8. මුනිවරයා පෙර තත්වය හා පසුව ඇතිවන මේ ආදීනවය දැක
එකලා වාසය දැඩි කරන්නේය, මෛථුනයේ නොයෙදෙන්නේය.
(823)

9. විවේකයෙහිම[1] හික්මෙන්නේය,
එය ආර්යයන්ගේ උත්තරීතර දහමකි.
නමුත් එයින් (තමන්) ශ්‍රේෂ්ඨ යැයි නොසිතන්නේය.
ඒකාන්තයෙන් ඔහු නිවන සමීපයෙහිය. (824)

10. කාමයන් කෙරෙහි අපේක්ෂා නැතිව
(කාමයන්ගෙන්) හිස්ව හැසිරෙන
සැඩපහර තරණය කළ මුනිවරයාව
කාමයන්හි තදින් බැඳුණු ප්‍රජාව ප්‍රිය කරති. (825)

[1] කාය චිත්ත විවේකය - කාමයන්ගෙන් වෙන් වීම.

4.8 පසූර සූත්‍රය

(වාද කිරීමට ආ පසූරට භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය වදාරණ ලදි)

1. ශුද්ධිය ඇත්තේ මෙහි පමණකැයි වාදකරත්.
 අන් කිසි දහමක ශුද්ධියක් නැතැයි පවසති.
 යමක් තදින් ඇසුරු කරමින් එහි යහපත් බව කියනා
 ඔවුහු බොහෝ දෙනා, වෙන් වෙන් වූ සත්‍යවල පිහිටා සිටිති.
 (826)

2. ඔවුහු වාද කරනු රිසිව පිරිස් මැදට වැද
 ඔවුනොවුන් එකිනෙකා මෝඩ යැයි සිතත්.
 ප්‍රශංසා ලබනු කැමැත්තෙන්, තමන් දක්ෂ යැයි කියා ගනිමින්
 නොයෙක් න්‍යායන් දැඩිව ගෙන වාද කරත්. (827)

3. පිරිස් මැද වාදයෙහි නියැලුනේ
 ප්‍රශංසා කැමැත්තෙන් පීඩාවට පත්වේ.
 පැරදුනු කල ලැජ්ජාවෙන් නිශ්ශබ්ද වේ.
 සිදුරු (වැරදි) සොයන ඔහු, නින්දා කරණු ලැබ කුපිත වේ. (828)

4. ප්‍රශ්ණයෙහි විනිසුරුවෝ
 යමෙකුගේ වාදය නිහීන යැයි පැවැසුවෝද
 ඒ හීනවාද ඇත්තා ශෝක කරයි, වැලපෙයි.
 ''මාව පැරදවී''යැයි ශෝකයෙන් දොඩවයි. (829)

5. එම විවාද ශ්‍රමණයන් අතර හටගත් කල්හි
 එවායෙන් උද්දාමයත්, චිත්ත පීඩාවත් වේ.
 ප්‍රශංසා ලැබීම හැර එහි වෙනත් ප්‍රයෝජනයක් නැත.
 (එම නිසා) එයත් දැක විවාද වලින් වැළැකිය යුතුය. (830)

6. පිරිස් මැද වාද කථා පවසා
 ඉදින් එහි ප්‍රශංසා ලැබුවේ නම්
 තම සිතෙහි වූ පරිදි එම ප්‍රයෝජනය ලබා
 ඉන් ඔහු සිනාසෙයි, උඩඟුද වෙයි. (831)

7. යම් උඬඟු බවක් වේද, එය ඔහුට චිත්ත පීඩා ගෙන දෙන බිමකි.
ඔහු තම මාන්නය හා උඬඟුකම ප්‍රකාශ කරයි.
එයද දැක විවාද නොකරන්න.
එයින් ශුද්ධිය නොලැබෙතැයි දක්ෂයෝ පවසති. (832)

8. යම් සේ රාජභෝජන අනුභව කළ යුධ සෙබලෙක්
(සටනට) ප්‍රතිවාදී සෙබලෙක් සොයමින් ගර්ජනා කරන්නේද
සූර, යම් තැනක ඔහු සිටීද, එහි යන්න.
යුද්ධය සඳහා වූ දෙයක් මුලින්ම මෙහි නැත. (833)

9. යමෙක් දෘෂ්ටි දැඩිව ගෙන විවාද කරත්ද
''සත්‍යය මෙය පමණකි''යි වාදකරත්ද
නුඹ ඔවුනට කියව, වාද උපන් කළ
විරුද්ධ වාද කරන්නෝ මෙහි නැත. (834)

10. දෘෂ්ටියකින් දෘෂ්ටියකට විරුද්ධ නොවෙමින්
විරුද්ධකම් නොමැතිව යමෙක් හැසිරෙත්ද
පසූර, නුඹ ඔවුන් අතුරෙන් කවරෙක් (විරුද්ධ වාදියෙකු ලෙස)
ලබන්නද?
ඔවුනට ''උත්තම'' යැයි ග්‍රහනය කළ දෙයක් නැත. (835)

11. යලිදු නුඹ සිතින් දෘෂ්ටි න්‍යායන් සිතමින්
විතර්ක කරමින් පැමිණියෙහි.
පිරිසිදු වූවහු (බුදුරදුන්) සමඟ මුහුණට මුහුණ හමුවිය.
නමුත් නුඹට (වාදයෙන්) එළඹෙන්නට නොහැක. (836)

4.9 මාගන්දිය සූත්‍රය

(මාගන්දියගේ දුව මාගන්දියා අරබයා භාග්‍යවතුන් වහන්සේ)

1. තණ්හා, අරති, රගා ද දැක (මාර දූවරු දැක)
   මෛථුනයෙහි කැමැත්තක් නොවීය.
   මල මුත්‍ර පිරුණු මෙවැන්නකින් කවර ඵලක්ද?
   පාදයෙන් හෝ එය (එම සිරුර) ස්පර්ශ කිරීමට නොකැමැත්තෙමි.
   (837)

2. (මාගන්දිය)
   බොහෝ රජවරුන් විසින් පතන ලද මෙවැනි ස්ත්‍රී
   රත්නයකට නොකැමැත්තෙහි නම්
   ඔබගේ දෘෂ්ටිගතයද සීලව්‍රතයද ජීවිතයද
   (මරණින් මතු) භව උත්පත්තියද කෙබඳු දැයි කියන්න. (838)

3. (භාග්‍යවතුන් වහන්සේ)
   'මෙය කියන්නෙමි'යි ඔහුට
   අදහස් අතරින් තක්සේරු කර අල්ලාගත් දෙයක් නැත.
   (ආදීනව) දකින්නෙමි, දෘෂ්ටි අතරින් කිසිවක් නොගෙන
   විමර්ශනය කරන මම, අභ්‍යන්තර ශාන්තිය දුටුවෙමි. (839)

4 . (මාගන්දිය)
   (ධර්ම) විනිශ්චයන්ද, (ඒ ඇසුරින්) ගොඩනැගූ කල්පිත ද
   මුනිවරයානෙනි, (මට) අනුග්‍රහ පිණිස කියනු මැන
   'අභ්‍යන්තර ශාන්තිය' යැයි යම් අර්ථයක් කියන ලදද
   නුවණැත්තන් විසින් එය කෙසේ විස්තර කරන ලද්දේද? (840)

5. (භාග්‍යවතුන් වහන්සේ)
   දෘෂ්ටියෙනුත් නොවෙයි, දැනුමෙනුත් නොවෙයි, ඥානයෙන්ද නොවෙයි.
   සීල ව්‍රතයෙන්ද ශුද්ධිය නොකියයි.
   දෘෂ්ටිය නැතිවත්, දැනුම නැතිවත්, ඥානය නැතිවත්
   සීලය නැතිවත්, ව්‍රතය නැතිවත් නොවෙයි.
   ඒවා හැරදමා ග්‍රහණය නොකොට
   ශාන්ත වූයේ, (කිසිවක් මත) යැපීමක් නැති බැවින් (භව) පැවැත්ම නොපතයි. (841)

6. (මාගන්දිය)
ඉදින් දෘෂ්ඨියෙන් දැනුමෙන් ඥානයෙන් හෝ
සීලව්‍රතයෙන් විශුද්ධිය නොකියයිද
දෘෂ්ඨිය නැතිවත්, දැනුම නැතිවත්, ඥානය නැතිවත්
සීලය නැතිවත් ව්‍රතය නැතිවත් නොවෙයි (කියා) ද
එය අතිශයින් මුළාවූ ධර්මයකැයි සිතමි.
කෙනෙක් දෘෂ්ඨියෙන් ශුද්ධිය වෙතියි සිතත්. (842)

7. (භාග්‍යවතුන් වහන්සේ)
දෘෂ්ඨියක් මත රැඳෙමින් ප්‍රශ්න කරන්නේ
අල්ලාගත් දෑ (අදහස්) අතරෙහි මුළාවට පැමිණියෙහිය.
මෙහි (මේ දහමෙහි) අංශු මාත්‍ර වූද (දෘෂ්ඨි) සංඥාවක්
නොදුටුවෙහිය.
එමනිසා නුඹ 'අතිශයින් මුළා වූවකැ'යි සිතන්නෙහිය. (843)

8. යමෙක් (තමා) සමානය, උසස්ය, පහත් යැයි කියා හෝ සිතයිද,
හෙතෙම ඒ කරන කොටගෙන විවාද කෙරෙයි.
(මේ) ත්‍රිවිධ ආකාරවල නොසැලෙන්නේද
ඔහුට 'සම'යි කියා හෝ උසස් යැයි කියා හෝ (මානයක්) නැත.
(844)

9. 'සත්‍යය' යැයි ඒ බ්‍රාහ්මණයා කුමක් කියන්නද?
'බොරු' යැයි කියා කවරෙක් සමඟ වාද කරන්නද?
යමෙක් කෙරෙහි 'සම' හෝ 'සම නැතැ' යි හෝ නැද්ද
ඔහු කවරෙකු සමඟ වාදයේ යෙදෙන්නද? (845)

10. ගෙය හැර දමා ගෙයක් නැතිව හැසිරෙන්නේ
මුනිවරයා, ගම සමඟ (මිත්‍ර) සබඳකම් නොපවත්වයි.
කාමයන්ගෙන් හිස්ව, (කිසිදු දෘෂ්ඨියක්) පෙරටු කර නොගත්තේ
කලහයට හේතුවන කතා ජනයා සමඟ නොකියන්නේය. (846)

11. යම් දේ වලින් වෙන්ව ලෝකයේ හැසිරෙන්නේද
හස්තියා (ශ්‍රේෂ්ඨ මිනිසා) ඒවා අල්ලාගෙන කතා නොකියන්නේය.
යම් සේ ජලයේ උපන් කටු සහිත නටුවක් ඇති පියුම
ජලයෙන් හා මඩෙන් නොතැවරී සිටීද
ශාන්ත ස්වභාවය පිළිබඳ කතා ඇති, ගිජු කමක් නැති මුනිවරයා
එලෙසින් කාමයන්ගෙන් හා ලෝකයෙන් නොතැවරී සිටී.
(847)

12. පූර්ණ ප්‍රඥා ඇත්තා දෘෂ්ඨියකින් හෝ ඥානයෙන්
මිනීමකට නොඑයි. ඔහු ඒවායින් සැදුනෙක් නොවේ.
හෙතෙම ක්‍රියාවෙන් හෝ දැනුමෙන් දත නොහැක.
ඔහු කිසිදු වාසස්ථානයක් වෙත[1] පමුණුවන ලද්දෙක් නොවේ.
(848)

13. සංඥාවෙහි නොඇලුනු කෙනාට ගැට ඇත්තේ නැත.
ප්‍රඥා විමුක්තියෙන් මිදුනු කෙනාට මුළාවක් ඇත්තේ නැත.
යමෙක් සංඥාවත් දෘෂ්ඨියත් අල්ලගත්තෝද
ඔවුහු ගැටෙමින් ලෝකයෙහි හැසිරෙත්.
(849)

[1] මේ වාසස්ථාන දෘෂ්ඨී ලෙසද, උපදින ස්ථාන (ලෝක) ලෙසද ගත හැක.

4.10 'කය බිඳීමට පෙර' සූත්‍රය

1. (ප්‍රශ්නය)
කෙසේ දකින, කෙබඳු සිල් ඇතියේ 'උපශාන්ත'යැයි කියන්නේද?
ගෞතමයනි, මා විසින් විමසන ලදුව ඒ උත්තම පුරුෂයා පවසන්න.
(850)

2. (භාග්‍යවතුන් වහන්සේ)
කය බිඳීමට පෙර තණ්හාව ප්‍රහීණ කළේද, පෙර හා පසු ඇසුරු නොකළේද
මැද[1] ගිණීමකට නොඒද ඔහුට පෙරදැරි කරගත් කිසිවක් නැත.
(851)

3. නොකිපෙන සුළු, නොසැලෙන
පුරසාරම් දෙඩීමක් නැති, නුසුදුසු ඉරියව් නැති,
පමණ දැන කතා කරන්නේ, උඩඟු කමකුත් නැතිද
වචනයෙන් ඔහු මුනිවරයෙක්මය. (852)

4. අනාගතයෙහි එල්බ නොගත්තේ, අතීතය ගැන ශෝක නොකරයිද
ස්පර්ශයෙහි[2]නොබැඳුනේ, දෘෂ්ඨීන් අනුව ගෙන යා නොහැක්කේ
(853)

5. සමාජයෙන් වෙන්වූයේ, වඤ්චනික නොවූයේ
ගිජු නොවූයේ, මසුරු නොවූයේ
නුසුදුසු හැසිරීම් නැති, පිළිකුල් නොමැති (ඔහු)
කේලම් කීමෙහිද නොයෙදේ. (854)

6. මිහිරි දෙයෙහි ආශා නැත්තේ
උධික මාන්නයෙන් යුක්ත නොවූයේ
මෘදු වූයේ, දහම් තෝරා දෙන්නේ, ශ්‍රද්ධාව මත නොරැඳුනේ
(ඇලුනු දෙයක් නැති බැවින්) නොඇලෙන්නේද නැත. (855)

7. ලාභ ලබා ගැනීමට උත්සුක නොවූයේ,
නොලැබුනේ යැයි සිත ව්‍යාකූලද නොවූයේ
තණ්හාවෙන් විරුද්ධවාදී නොවූයේ
රසෙහිද ගිජු නොවෙයි. (856)

---

[1] පෙර පසු මැද - අතීත, අනාගත, වර්තමාන ලෙස ගත හැක
[2] අභ්‍යන්තර ආයතන 6 හා බාහිර ආයතන 6 අතර ස්පර්ශය

8. උපේක්ෂා සහගත වූයේ, සැම විටම සතිමත් වූයේ
ලෝකයේ කිසිවෙක් (තමාට) සමානයි කියා හෝ
උසස් කියා හෝ පහත් කියා හෝ නොසිතන්නේද,
ඔහුට උස්වීමක් (මාන්නයක්) ඇත්තේ නැත. (857)

9. යමෙකුට (කිසිවක් මත) යැපීමක් නැතිද, ධර්මය දැන අනිශ්‍රිත වූයේ
වීමට හෝ නොවීමට[1] යමෙකු කෙරෙහි තණ්හාවක් දක්නට නැතිද
(858)

10. කාමයන්හි අපේක්ෂාවක් නැති ඔහුට 'උපශාන්ත' යැයි කියමි.
ඔහු කෙරෙහි ගැට දක්නට නැත, ඔහු (කාම)පැටලීම ඉක්මවන ලදී.
(859)

11. ඔහු කෙරෙහි දරුවන්, ගවයන්, කෙත් වතු දක්නට නැත.
අයත් කරගත් දෙයක් හෝ අතහැරිය දෙයක් ඔහුට නැත. (860)

12. යමකින් සාමාන්‍ය ජනයා හෝ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ඔහුට කියත් නම්
එය ඔහු විසින් පෙරදැරි නොකරගත් බැවින් වාදයෙහි නොසැලේ.
(861)

13. ගිජුබව ප්‍රහීණ කළ, මසුරු නැති මුනිවරයා, (තමා) උස්තැනිහි ලා
හෝ සම හෝ පහත් තැන්හිලා නොපවසයි, වර්ග කළ නොහැකි
ඔහු වර්ග කිරීමකට නොඑයි. (862)

14. යමෙකුට තමාගේ යැයි ගත් දෙයක් ලෝකයේ නැතිද,
එසේ නැතැයි කියා ශෝක නොකෙරේද,
සිතුවිලි අනුවත් නොයයිද, ඔහුට 'ශාන්ත' යැයි කියනු ලැබේ.
(863)

[1] පැවැත්මට හෝ පැවැත්ම නැති කිරීමට - භව-විභව.

4.11 කලහ - විවාද සූත්‍රය

1. (ප්‍රශ්නය)
කලහා - විවාද කොයින් හට ගැනුණිද
වැලපීම් ශෝක කිරීම් හා මසුරුකමත්
මාන්නය අධිකමාන්නය සහ කේලමත්
යන ඒවා කොතැනින් හට ගැනුණිදැයි කියනු මැන. (864)

2. (පිලිතුර)
කලහ - විවාදත්, වැලපීම් ශෝක කිරීමත්
මසුරුකමත්, මාන්නය, අධිමාන්නයත්
කේලමත්, ප්‍රියදෙයින් හටගැණුනි.
මසුරුකම ඇති කල්හි කලහ-විවාද වේ.
විවාද හට ගත් කල්හි කේලාම් කිම වේ. (865)

3. (ප්‍රශ්නය)
ලෝකයෙහි ප්‍රිය දේවල් කොතැනින් හට ගැනුනිද,
ලොව යම් ආශාවෝ හැසිරෙත්ද, ඒවාද,
පුද්ගලයාගේ මරණයෙන් මතු තත්වය තීරණය කරන
ආශාවද එහි නිෂ්ඨාවද කොයින් හටගැණුනිද. (866)

4. (පිලිතුර)
ප්‍රිය දේවල් ඡන්දය මුල් කොට ඇත්තාහ.
ලොව යම් ආශාවෝ හැසිරෙත්ද, ඒවාද
පුද්ගලයාගේ මරණයෙන් මතු තත්වය තීරණය කරන
ආශාවද එහි නිෂ්ඨාවද එයින්ම හටගැණුනි. (867)

5. (ප්‍රශ්නය)
ඡන්දය ලෝකයෙහි කොතැනින් හට ගැණුනිද?
විනිශ්චයයෝත් කොතැනින් උපන්නෝද?
ක්‍රෝධය ද බොරු කීමද සැකයද
ශ්‍රමණයන් කියූ යම් ධර්මයෝ ඇත්ද ඒවාත් (කොයින් උපන්නෝද?)
(868)

6. (පිලිතුර)
ලෝකයේ යමක් මිහිරි-අමිහිරි යැයි කියත්ද
එය ඇසුරු කොට ගෙන ඡන්දය උපදී
රූපවල වීමත් නොවීමත් දැක
මිනිසා ලෝකයේ විනිශ්චය කෙරේ. (869)

7. ක්‍රෝධය බොරුකීම සැකය
යන එම ධර්ම, මේ දෙක ඇති කල්හිම වේ.
සැකය ඇත්තා ඥාණ මාර්ගය මඟින් හික්මිය යුතුය.
ශ්‍රමණයන් වහන්සේ විසින් ධර්මයන් දැන පවසන ලදී. (870)

8. (ප්‍රශ්නය)
මිහිරි අමිහිරි දෑ කොයින් හටගැණුනිද?
කුමක් නැති කල්හි ඒවා නොවෙත්ද?
වීම-නොවීම යැයි යම් ඒ අර්ථයක් ඇතිද
එය කොතැනින් හටගැණුනිදැයි මට කියන්න (871)

9. (පිලිතුර)
මිහිරි අමිහිරි බව ස්පර්ශයෙන් හට ගැණුනි
ස්පර්ශය නැති කල්හි ඒවා නොවෙත්.
වීම-නොවීම යැයි යම් ඒ අර්ථයක් ඇතිද
එය ද ඔබට මෙයින් හටගත්තේයැයි කියමි. (872)

10. (ප්‍රශ්නය)
ස්පර්ශය ලෝකයෙහි කොතැනින් හටගැනුණිද?
අයිති කරගත් දෑ කොතැනින් ඉපදුනිද?
කුමක් නැති කල්හි මගේ යැයි ගැනීමක් නැතිද?
කුමක් නැති වූ කල්හි ස්පර්ශයෝ ස්පර්ශ නොකරත්ද? (873)

11. (පිලිතුර)
නාමයයි රූපයයි නිසා ස්පර්ශයෝ හටගනිත්.
අයිතිකරගත් දෑ කැමැත්ත නිසා හටගනී.
කැමැත්ත නැති කල්හි මගේ කර ගැනීමක් නැත.
රූපය නැති වූ කල්හි ස්පර්ශයෝ ස්පර්ශ නොකරත්. (874)

12. (ප්‍රශ්නය)
කෙසේ පිළිපන්නහුට රූපය නැති වී යයිද
සැප හා දුක කෙසේ නැති වී යයිද
යම් ආකාරයකින් (ඒවා) නැතිවී යයිද, එය මට කියන්න.
''එය දැනගන්නෙමු''යි මට සිත් විය. (875)

13. (පිළිතුර)
සාමාන්‍ය සංඥාවක් ඇතිවද නොවෙයි,
විකෘති සංඥාවක් ඇතිවද නොවෙයි,
සංඥාව නැතිවද නොවේ (සිහි නැතිවද නොවේ),
සංඥාව නැති කර දමාද නොවේ,
මෙසේ පිළිපන්නහුට රූපය නැති වී යයි.
ප්‍රපඤ්චයෙන්[1] කරන ගිණීම්, සංඥාවෙන් හටගනී. (876)

14. (ප්‍රශ්නය)
ඔබගෙන් යමක් ඇසුවෙමුද එය අපට කීවෙහිය.
වෙන දෙයක් අසන්නෙමු. එයද කියනු මැන.
මෙහි ඇතැම් නුවණැත්තෝ එපමණකින්ම
සත්ත්වයාගේ අග්‍ර ශුද්ධියක් පණවත්ද?
නැත්නම් එහි වෙනින් ශුද්ධියක් පණවත්ද? (877)

15. (පිළිතුර)
එපමණකින්ම මෙහි ඇතැම් නුවණැත්තෝ
සත්ත්වයාගේ අග්‍රශුද්ධිය පණවත්.
අනුපාදිශේෂයෙහි[2] දක්ෂයෝ යැයි පවසන
ඔවුන්ගෙන් ඇතැමෙක් ලබ්දි මාත්‍රයක්ම (ඇදහිල්ලක්ම) පවසත්.
(878)

16. ඔවුන් වනාහි යමක් ඇසුරු කළ (යමක් මත යැපුන) අය යැයි දැන
ඒ දැනගත් මුනිවරයා ඇසුරු කිරීම් (යැපීම්) පිරික්සන්නේ
දැන විමුක්ත වූයේ විවාදයකට නොඑයි.
නොයෙක් නොයෙක් දේ වලට නුවණැත්තා නොඑළඹේ. (879)

---

[1] ප්‍රපඤ්ච යනු පාලනයකින් තොරව ලියලන සිතුවිලි වැල්ය. (කටුකුරුන්දේ ඤාණානන්ද හිමිපානන්ගේ 'මුල් බුදු සමයේ සංකල්පය සහ යථාර්ථය' බලන්න)
[2] කෙලෙස් කිසිවක් නැති නිවන.

4.12 'සේනා පෙලගැස්ම' කුඩා සූත්‍රය

1. (ප්‍රශ්නය)
තම තමාගේ දෘෂ්ඨිය දැඩිව ගෙන[1]
කලහ කරමින් නානා විධ දක්ෂ කතා කියත්.
"යමෙක් මෙලෙස දනීයි ද, ඔහු ධර්මය දනී.
මෙය ප්‍රතික්ෂේප කරන්නේ ද, ඔහු අසම්පූර්ණය". (880)

2. මෙලෙස කලහ කෙරෙමින් විවාද කරත්.
අනෙක් කෙනා 'මෝඩයෙකැ'යි 'අදක්ෂයෙකැ'යි කියති.
මේ වාද අතරින් සත්‍යය වාදය කුමක්ද?
(මක් නිසාද?) මේ සියළු දෙනාම දක්ෂයෝ යැයි කියා ගනිති.
(881)

3. (පිලිතුර)
ඉදින් වෙන කෙනෙකුගේ ධර්මය නොපිළිගැනීමෙන්
මෝඩයෙක්, මෘගයෙක්, නිහීන ප්‍රඥාවක් ඇත්තෙක් වෙයි නම්
සියළු දෙනාම ඉතා නිහීන ප්‍රඥාව ඇති මෝඩයෝ වන්නාහ.
(මක් නිසාද) මේ සියළු දෙනා දෘෂ්ඨි දැඩිව ගෙන සිටින බැවිනි.
(882)

4. ස්වකීය වූ දෘෂ්ඨියක් දැරීමෙන්ම පිරිසිදු වූවෝ වෙත් නම්
ඉතා පිරිසිදු ප්‍රඥාවක් ඇත්තෝ, දක්ෂයෝ, බුද්ධිමත්හු වෙත් නම්
ඔවුන්ගෙන් කිසිවෙක් පිරිහිනු ප්‍රඥාවක් ඇත්තෝ නොවෙත්.
(මක් නිසාද) ඔවුන්ගේ දෘෂ්ඨි ඒ ආකාරයටම ඔවුන් විසින් ගන්නා
ලද හෙයිනි. (883)

5. යම් මේ එකිනෙකාට 'මෝඩයන්' යැයි කියා ගැනීමක් වේ ද
මම එය ඒ ආකාරයැයි (නිවැරදි යැයි) නොකියමි.
තම තමාගේ දෘෂ්ඨියම 'සත්‍යය' කර ගනිති.
එම නිසා අනෙකා 'මෝඩයෙකැ'යි සළකති. (884)

6. (ප්‍රශ්නය)
කෙනෙක් යමක් 'සත්‍යයැ'යි 'ඒ ආකාරයමැ'යි කියයිද
එයම අන් අය 'හිස් බොරුවකැ'යි පවසත්.
මෙලෙස කලහ කරමින් විවාද කර ගනිති.
ඇයි ශ්‍රමණයෝ එක දෙයක් නොපවසන්නේ? (885)

---

[1] පරිබ්බසානා - තුල වෙසෙමින්. ඒ දැඩිව ගත් නිසාය

7. (පිළිතුර)
යමක් දැනගැනීමෙන් ජනයා, ජනයා හා විවාද නොකෙරේද
ඒ එකම සත්‍යයකි ඇත්තේ, දෙවැන්නක් නැත.
ඔවුහු විවිධ සත්‍යයන් තම තමන්ම අගය කරගනිති.
එම නිසා ශ්‍රමණයෝ එක දෙයක් නොපවසති. (886)

8. (ප්‍රශ්නය)
මහත් වාද කරමින් දක්ෂ යැයි පවසමින් නානා විධ
සත්‍යයන් කුමක් නිසා පවසත්ද?
බොහෝ සත්‍යයන් (ඔවුන් විසින්) අසන ලද්දේද?
නැතිනම් ඔවුහු තර්කයම සිහි කරත්ද? (887)

9. (පිළිතුර)
(සත්‍යය යන) සංඥාව හැරෙන්නට ලෝකයේ ස්ථිරව පිහිටන
නානාවිධ බොහෝ සත්‍යයන් ඇත්තේ නැත.
දෘෂ්ඨීන් කෙරෙහි තර්ක ගොඩනගා
'සත්‍යය-බොරුව' යන ධර්ම දෙක කියති. (888)

10. ඇසූ දුටු දැනගත් දෙය හා සීලව්‍රතය
යන ඒවා මත යැපෙමින් (අනුන්) පහත් කර දකියි.
(තමා) තීන්දු කරගත් දේ මත පිහිටා (අන් අයට) සිනාසෙන්නේ
අනෙකා 'මෝඩ අදක්ෂයෙකැ'යි පවසයි. (889)

11. යමකින් අනෙකා 'මෝඩයෙකැ'යි සිතයිද
එයින්ම තමන් 'දක්ෂයෙකැ'යි පවසයි.
තමා තමුන්ම 'දක්ෂයෙකැ'යි කියාගන්නේ
අනෙකා පහත් කොට සලකමින් ඒ අයුරින්ම කතා කරයි. (890)

12. හෙතෙම දෘෂ්ඨියක නිෂ්ඨාවට යමින් සීමාව ඉක්මවූයේ
මාන්නයෙන් මත් වූයේ, තමා පරිපූර්ණ යැයි සිතා
තමා තමුන්ම සිතින් අභිෂේක කර ගත්තේ වෙයි.
ඔහුගේ ඒ දෘෂ්ඨිය ඒ ආකාරයටම (ඔහු විසින්) ගන්නා ලදී. (891)

13. ඉදින් වෙන කෙනෙකුගේ වචනයෙන් නිහීන අයෙක් වන්නේ නම්
තෙමේත් ඔහු සමගම නිහීන ප්‍රඥා ඇත්තෙක් වන්නේය.
නැතහොත් තමුන්ටම තමන් පූර්ණ දැනුමැති නුවණැත්තෙක් කර ගත හැකිනම් නම්
ශ්‍රමණයින් අතර කිසිම මෝඩයෙක් ඇත්තේ නැත. (892)

14. "මෙයින් අන්‍ය වූ යම් ධර්මයක් අගය කරත් නම්,
ඔවුහු ශුද්ධිය වරදවා ගත්තෝ ය, පිරිපුන් නැත්තෝය"
මෙලෙස තීර්ථකයෝ (අන්‍යාගමික පූජකයෝ) බොහෝ සේ පවසත්
ඔවුහු තමන්ගේ දෘෂ්ඨී පිළිබඳ ඇල්මෙන්, තදින් ඇලුනාහු වෙති.
(893)

15. ශුද්ධිය ඇත්තේ මෙහි පමණකැයි වාදකරත්.
අන් කිසි දහමක ශුද්ධියක් නැතැයි පවසත්.
මෙලෙස තීර්ථකයෝ බොහෝ ආකාරයට නිෂ්ඨාවට ගියාහු
තමන්ගේ ලබ්ධිය දැඩිව පවසත්. (894)

16. ඉදින් තමන්ගේම ලබ්ධිය දැඩිව පවසයි නම්
එහිලා කෙසේ නම් වෙන කෙනෙක් 'මෝඩයෙකැ'යි සළකන්නද?
වෙන කෙනෙකුට "මෝඩ අශුද්ධ ධර්මයක් ඇත්තෙකැ"යි කියා නම්
හෙතෙම තමා කෙරෙහිම කලහය කැඳවා ගනී. (895)

17. තීන්දුවෙහි පිහිටා තෙමේම මැන
මත්තෙහි ඔහු ලෝකයෙහි විවාදයට පැමිණේ.
සියළුම විනිශ්වය කිරීම් නතරකොට
මිනිසා ලෝකයෙහි ගැටුම් ඇතිකර නොගනී. (896)

4.13 'සේනා පෙලගැස්ම' විශාල සූත්‍රය

1. (ප්‍රශ්නය)
යම් කිසිවෙක් මේ දෘෂ්ඨීන් දැඩිව ගත්තෝද
''මෙයම සත්‍යයැ''යි විවාද කරත්ද
ඔවුහු සියළු දෙනා නින්දාව කැඳවා ගනිත්ද?
නැත්නම් එහි ප්‍රශංසාවක් ලබත්ද? (897)

2. (පිළිතුර)
එය (නින්දා-ප්‍රශංසා) ස්වල්ප වූ දෙයකි, සන්සිඳීමක් ඇති කළ නොහැක.
විවාදයකට ඇත්තේ ඵල දෙකකි.[1]
ඒ බව දැක, අවිවාද භූමිය වූ
ක්ෂේමය (නිවන) දකිමින් විවාද නොකරන්න. (898)

3. සාමාන්‍ය ජනයා අතර ඇති යම් තාක් සම්මුති ඇත්ද
විද්වතා ඒ සියළු දේට නොපැමිණෙයි.
ඇසූ දුටු දෙයෙහි කිසිවකට රුචි නොකරන්නේ (එම නිසා)
කිසිවකට නොඑළඹෙන ඔහු කෙසේ නම් යමකට එළඹෙන්නද?
(899)

4. සීලය උතුම් යැයි ගත්තෝ (සීල) සංයමයෙන් ශුද්ධිය ප්‍රකාශ කරති.
ව්‍රතයක් සමාදන්ව, එහි එළඹ සිටින්නේ
''මෙහිම හික්මෙමු ඉක්බිතිව ශුද්ධිය වන්නේ යැ''යි (පවසත්)
තමුන් දක්ෂයෝ යැයි තුමූම පවසන නමුත් (ඔව්හු) භවයට පමුණුවන ලද්දෝය. (900)

5. ඉදින් ඔහු සීල ව්‍රතයෙන් පිරිහුනේ නම්
එම ක්‍රියාවෙහි අසමර්ථ වූ ඔහු කම්පාවෙයි.
යම්සේ ගෙයින් පිටව විදේශ ගත වූවෙකුට තවලම මඟහැරුනා සේ,
හෙතෙම මෙහි ශුද්ධිය පතයි, දැඩිව පතයි. (901)

6. ශීල ව්‍රතය හා වැරදි-නිවැරදි ක්‍රියාවද
යන සියල්ල හැරපියා
ශුද්ධිය හෝ අශුද්ධිය ද නොපතමින්
වැලකුනේ, ශාන්තියට අනුග්‍රහ කරමින් හැසිරෙන්නේය. (902)

---

[1] ජය-පැරදුම

7. (අණුවණයා) ඒ පිළිකුල් කටයුතු (ව්‍රත) හෝ
ඇසූ දුටු දැනගත් දෙයක් හෝ මත යැපෙමින්
විවිධ දේ කෙරෙහි ආශාව ප්‍රහීණ කර නොගෙන
මරණින් මතු ශුද්ධිය පිළිබඳ අපේක්ෂාවෙන් දොඩවති. (903)

8. අභිලාෂයක් ඇත්තාටම 'දැඩි පැතීම්' වෙයි,
ප්‍රකල්පිත දේ කෙරෙහි සැලීමද වෙයි.
යමෙකුට මෙහි චුති උත්පත්තියක් නැතිද
ඔහු කෙසේ සැලෙන්නද? කොතැනක් පතන්නද? (904)

9. (ප්‍රශ්නය)
කෙනෙක් යම් ධර්මයක් පරම යැයි කීවෝද
එයම වෙන කෙනෙක් හීන යැයි කීහ.
මේ වාද අතරින් සත්‍යය වාදය කුමක්ද?
(මක්නිසාද) මේ සියළු දෙනා 'දක්ෂයෝ' යැයි කියා ගනිති. (905)

10. (පිළිතුර)
තමුන්ගේම ධර්මය පරිපූර්ණ යැයි කීහ.
අනෙක් අයගේ ධර්මය හීන යැයි කීහ.
මෙලෙස කලහ කරමින් විවාද කෙරෙත්.
තම තමුන්ගේ සම්මුතිය (පිළිගත් දේ) සත්‍යය යැයි පවසති. (906)

11. ඉදින් අවමන් කිරීමෙන් වෙන කෙනෙකුගේ ධර්මය හීන වේ නම්
ධර්මයන් අතර කිසිවක් උසස් නොවේ.
බොහෝ දෙනා ස්වකීය ලබ්ධිය දැඩිව පවසමින්
අන් අයගේ ධර්මය නිහීන යැයි පවසත්. (907)

12. තමන්ගේ ධර්මයට යම් සේ ප්‍රශංසා කරත්ද
ගෞරව කෙරේද, එය (ඒ ධර්මය) ඒ කී ආකාරම නම් (සත්‍ය නම්)
සියළුම වාද ඒ ලෙසම (සත්‍යම) වන්නෝය.
එවිට ඒවායේ ශුද්ධිය වෙන් වෙන්ව වෙන්නේය.[1] (908)

13. බ්‍රාහ්මණයාට වෙන කෙනෙකු විසින් පැමිණවිය යුතු දෙයක් නැත.
අදහස් අතරින් තක්සේරු කර අල්ලා ගත් දෙයක්ද නැත.
එමනිසා විවාද ඉක්මවා ගියේ
අන් කිසිදු දහමක් ශ්‍රේෂ්ඨ යැයි නොදකියි. (909)

---

[1] ශුද්ධි/සත්‍යය බොහෝ වන්නේය.

14. "මම දනිමි, මම දකිමි, එය එලෙසමයි" යැයි
ඇතැමෙක් දෘෂ්ටියෙන් ශුද්ධියට පත්වේ යැයි සිතත්.
ඉතින් ඔහු (එලෙස) දුටුවේ නම් ඉන් ඔහුට කවර ප්‍රයෝජනයක්ද?
(සත්‍යය) ඉක්මවා ගොස් අන් අයුරකින් ශුද්ධිය ප්‍රකාශ කරත්.
(910)

15. දකින පුද්ගලයා නාමරූපයම දකී.
දැක හෝ දැනගත්තේ එවාම පමණි.
(හෙතෙම) බොහෝ කොට හෝ මද කොට හෝ දකීවා
එයින් ශුද්ධියක් නොවේ යැයි දක්ෂයෝ පවසත්. (911)

16. ප්‍රකල්පිත දෘෂ්ටිය පෙරදැරි කරගෙන
එය තුලට වැද කියන්නාට මගපෙන්වීම අපහසුය.
යමක් මත යැපෙමින් එහි හොඳ කියන්නේ
එහි ශුද්ධිය පවසන්නේ, ඔහු එය ඒ ආකාරයටම දුටු බැවිනි. (912)

17. බ්‍රාහ්මණයා නුවණින් සිතා ගිණීමකට නොඑයි.
දෘෂ්ටි අනුව යන්නේද, ඥානය ඥාති කොට ඇත්තේද නොවෙයි
සාමාන්‍ය ජනයාගේ සම්මුති (පිලිගත් දෘෂ්ටි) හෙතෙම දැන
උපේක්ෂා කරන්නේය. (නමුත්) අන් අය ඒවා අල්ලා ගනිති. (913)

18. මුනිවරයා ලොවෙහි ගැට මුදා හැර
විවාද කරන්නවුන් අතර පැත්තක් නොගෙන
නොසන්සුන් වූවන් අතර සන්සුන්ව, ඔහු උපේක්ෂා කරන්නේ
කිසිවක් අල්ලා නොගනී, (නමුත්) අන් අය අල්ලා ගනිති. (914)

19. අතීත ආශ්‍රව හැරපියා, අළුතින් ආශ්‍රවයන් නොකරන්නේ
කැමැත්තට අනුව නොයන්නේ, දෘෂ්ටියන් තුලට වැද (ග්‍රහනය කොට) කතා නොකරන්නේ
සියළු දෘෂ්ටි සම්බන්ධ දෙයින් නුවණැත්තා මැනවින් මිඳුනේ
තමා කෙරෙහි වරදක් නැති ඔහු ලෝකයේ නොඇලෙයි. (915)

20. ඇසූ දුටු දැනගත් යම් කිසිවක් ඇද්ද
ඔහු ඒ සියළු ධර්මයන් කෙරෙහි අවිරුද්ධ වූයේ
බර බහා තැබූ, (සියළු දෙයින්) මැනවින් මිඳුනු මුනිවරයා
කල්පිත නොකරන්නේ, කිසිවක නොඇලුනේ, ප්‍රාර්ථනා නොකරන්නේය. (916)

4.14 කඨිනම් සූත්‍රය

1. (ප්‍රශ්නය)
හිරු නෑ මහා ඍෂි වරයානෙනි
විවේකයත් ශාන්ත තත්වයත් පිළිබඳව මම විමසමි.
කෙසේ දැක භික්ෂුවක් ලෝකයෙහි
කිසිවක් අල්ලා නොගෙන නිවී යයිද? (917)

2. (භාග්‍යවතුන් වහන්සේ)
ප්‍රපඤ්චයන්ගේ මූලය දැන
ප්‍රඥාවෙන් 'වෙමි' යන මානය සම්පූර්ණයෙන් සිඳලයි.
අභ්‍යන්තරයේ යම් කිසි ආශාවක් ඇතිද
එය දුරලා හැමවිටම සතිමත්ව හික්මෙයි. (918)

3. අභ්‍යන්තරයේ හෝ බැහැර හෝ
යම්කිසි ධර්මයක් දන්නේද
එයින් මාන්නයක් නොකරන්නේය.
එය (එම මාන්නය) නිවීමක්[1] යැයි සත්පුරුෂයන් නොකියන ලදී. (919)

4. එයින් තමා උසස් යැයි නොසිතන්නේය.
පහත් කියා හෝ සමානයි කියා හෝ ද නොසිතන්නේය.
නොයෙක් අයුරින් ප්‍රශ්ණ ඇසූ කල්හි[2]
තමන්ව (උසස් යැයි කියා) විකල්පනය කරමින් නොසිටින්නේය. (920)

5. අභ්‍යන්තරයම (සිතම) තැන්පත් කර ගන්නේ
භික්ෂුව අන් ක්‍රමයකින් ශාන්තිය නොසොයන්නේය.
අභ්‍යන්තරය තැන්පත් වූවහුට අල්ලා ගත් දෑ නැත,
අතහැරිය දෙයක් කොයින්ද? (921)

6. යම්සේ මුහුද මැද
රැලි හට නොගනීද, නිශ්චල වෙයිද
එලෙසින්ම (සිත) නිශ්චල වූ නොසැලෙන භික්ෂුව
කවර ආකාරයක හෝ උස්වීමක් (මාන්නයක්) නොකරයි. (922)

---

[1] නිවීම - නිවන

[2] හේවාවිතාරණ මුද්‍රණයේ පරිදි 'පුට්ඨො' ලෙස ගන්නා ලදී.

7. (ප්‍රශ්නය)
විවෘත ඇස් ඇතියානන් ප්‍රත්‍යක්ෂ වූ ධර්මය
පවසන ලදී, උවදුරු දුරු කරන
ප්‍රතිපදාවත් ස්වාමීනි, වදාළ මැනව,
ප්‍රාතිමෝක්ෂයත්, ඉක්බිති සමාධියත් (923)

8. (පිළිතුර)
ඇසෙහි (රූප බැලීමේ) ලොල් නොවන්නේය.
ග්‍රාම්‍ය කතාවලට කන් නොදෙන්නේය.
රසයෙහිද ගිජු නොවන්නේය.
ලෝකයේ කිසිම දෙයක් 'මගේ' කර නොගන්නේය. (924)

9. (නරක) ස්පර්ශයන් යම් කලෙක ස්පර්ශ කළ කල්හි
භික්ෂුව කිසිදු වැලපීමක් නොකරන්නේය.
(භව) පැවැත්මද නොපතන්නේය.
බියකරු දෙයෙහිද නොසැලෙන්නේය. (925)

10. කෑමක් වේවා බීමක් වේවා
කැවිලි වේවා සිවුරු වේවා
ලැබුණු කල්හි ගබඩා කර නොතබන්නේය.
ඒවා නොලැබුනු කල්හි නොතැවෙන්නේය. (926)

11. භාවනා කරන්නේ, තැන තැන ඇවිදිමින් කාලය ගත නොකරන්නේ
පසුතැවිලි දුරලා අප්‍රමාදී වන්නේ
යලිදු භික්ෂුව නිහඬ
සෙනසුන් වල වාසය කරන්නේය. (927)

12. වැඩිපුර නිදා නොගන්නේය.
වීර්යයෙන් යුක්තව නිදි වැරීමේ යෙදෙන්නේය.
කම්මැලිකම, වංචාව, සිනහව, ක්‍රීඩාව
මෛථුනය හා හැඩවැඩ වීම වෙසෙසින් දුරලන්නේය. (928)

13. යන්ත්‍ර මන්ත්‍ර, සිහින හා ලක්ෂණ විද්‍යාවේ හා
නක්ශස්ත්‍රයේ නොයෙදෙන්නේය.
මාගේ ශ්‍රාවකයා ශබ්ද විද්‍යාවේ,
ගැබ් ගන්වන ශාස්ත්‍රයේ හෝ වෙදකමේ ද නොයෙදෙන්නේය.
(929)

14. නින්දාවලින් නොසැලෙන්නේය.
ප්‍රශංසා කරනු ලැබ භික්ෂුව උඩඟු නොවන්නේය.
ආශාව හා මසුරු කමත්
ක්‍රෝධයත් කේලම් කීමත් දුරු කරන්නේය. (930)

15. ගණුදෙනු කිරීමෙහි නොයෙදෙන්නේය.
භික්ෂුව කවර ආකාරයෙන් හෝ ගැරහීමක් නොකරන්නේය.
ගමෙහිද නොඇලෙන්නේය.
ලාභ (යම් යම් දේ) ලබාගැනීමට ජනයාට චාටුබස් නොකියන්නේය.
(931)

16. භික්ෂුව තමාගේ උසස් බව කියාපාමින් කතා නොකරන්නේය.
(ලාභ ලැබීමට) ඉඟි කරමින්ද කතා නොකරන්නේය.
නොගැලපෙන (අවිචාරවත්) ක්‍රියාවලද නොයෙදෙන්නේය.
කලහ උපදවන කතා නොකියන්නේය. (932)

17. බොරුකීමෙහි නොයෙදෙන්නේය.
දැන දැන කපටි වැඩ නොකරන්නේය
තවද දිවි පැවැත්මෙන් හෝ ප්‍රඥාවෙන් හෝ සීල ව්‍රතයෙන් හෝ
අන්‍යයන් පහත් කර නොසිතන්නේය. (933)

18. ශ්‍රමණයන්ගේ හෝ ගිහි ජනයාගේ
ප්‍රකෝප කරවන බොහෝ බස් ඇසුවද
රළු බසින් ඔවුනට ආමන්ත්‍රනය නොකරන්නේය.
ශාන්ත වූවහු විරුද්ධ කම් නොකරයි. (934)

19. එම ධර්මය දැනගෙන
විචක්ෂණශීලී භික්ෂුව සැමවිටම සතිමත්ව හික්මේ.
නිවීම (නිවන) ශාන්ත භාවයයැයි දැන
ගෞතමයන්ගේ ඉගැන්වීමෙහි අප්‍රමාදී වන්නේය. (935)

20. හෙතෙම (රූප ආදිය) මැඩ පවත්වන්නේ, (අන් දෙයක්) විසින් මැඩලිය නොහැක්කේ.
තෙමේ ම ධර්මය ප්‍රත්‍යක්ෂ කළේ, වෙන කෙනෙකුගේ කීමක් මත නොරැඳේ.
එම නිසා ඒ භාග්‍යවතුන් වහන්සේගේ ඉගැන්වීමෙහි
අප්‍රමාදීව සැමවිටම ගෞරවයෙන් යුක්තව හික්මෙන්න. (936)

4.15 'මුගුරු ගැනීම' සූත්‍රය

1. මුගුරුගත් අයගෙන් බිය උපන, කලහ කරන ජනයා බලවු
(සම්බෝධියට පෙර) මට දනුන සංවේගය ඒ අයුරින් ප්‍රකාශ කරමි.
(937)

2. උනුන් හා විරුද්ධව, (වියලෙන) කුඩා දියවලක මසුන් මෙන්
ගැහෙන (මිනිස්) ප්‍රජාව දැක මට බිය උපන (938)

3. ලෝකය හාත්පසින් අසාරය, සියළු දිශා කම්පිත වී ඇත
මා (බිය නැති) නිවහනක් පතනුයේ, (බියෙන්) නොමැඬුන තැනක්
නොදුටිමි. (939)

4. අවසානය තෙක්ම විරුද්ධ වූවන් දැක මට කළකිරීම උපන
ඉක්බිතිව හදවතේ ඇනුන දැකීමට අපහසු හුල දුටිමි. (940)

5. යම් උලකින් විදුනා ලදුව හැම දිශාවකටම දිව යයිද
ඒ උලම උදුරා දමා නොදුවන්නේය. නොගිලෙන්නේය. (941)

දැන් ශික්ෂාව ගයනු ලැබේ.

6. ලෝකයේ යම්තාක් බන්ධන ඇතිද,
ඒවායෙහි නොයෙදෙන්නේය.
කාමයන් සම්පූර්ණයෙන් බිඳ දමා,
තමාගේ නිවීම පිණිස කටයුතු කරන්නේය. (942)

7. මුනි තෙම සත්‍යවාදී වන්නේ
අවිචාරවත් නොවන්නේ, වඤ්චනික නොවන්නේ,
කේලාම් කීමෙහි නොයෙදෙන්නේ, ක්‍රෝධ නොකරන්නේ,
පාපී ආශාව හා සැකය ඉක්මවන්නේය. (943)

8. නිවීම කෙරෙහි නැමුනු සිත් ඇති මිනිසා
කම්මැලිකම, නින්ද, මැලිකම මැඩලයි.
ප්‍රමාදය සමග එකට නොවසන්නේ
අධිමාන්නයේද නොසිටින්නේය. (944)

9. බොරු කීමෙහි නොයෙදෙන්නේ, (තමාගේ) රූපයේ ආලයක් නොකරන්නේ,
මාන්නයද පිරිසිඳ දැන, සැහැසිකමින් තොරව හැසිරෙන්නේය.
(945)

10. අතීත දෙයෙහි සතුටු නොවන්නේ
අළුත් දෙයෙහි කැමැත්තක් ඇතිකර නොගන්නේ
(ඒ දේවල්) නැසෙන කල්හි ශෝක නොකරන්නේ
අහස මෙන් නොඇලී සිටින්නේය. (946)

11. ගිජුකම සැඩපහරකැයි කියමි
දැඩිව පැතීම එහි ඉදිරියට යාම යැයි කියමි
කල්පනා ගොඩනැගීම එහි ආධාරයයි
කාම මඩවගුර ඉක්මවීමට ඉතා අපහසුය. (947)

12. සත්‍යයෙන් ඉවත් නොවන මුනි වූ බ්‍රාහ්මණයා උස් බිමෙහි (නිවනේ) සිටියි.
සියල්ල අතහැර දැමූ ඔහු සැබවින්ම ශාන්ත යැයි කියනු ලැබේ.
(948)

13. ඔහු සැබැවින්ම දැනුමැති වූයේ, ප්‍රඥාවෙන් කෙළවරට ගියේ
තමා විසින්ම ධර්මය දැන
හෙතෙම මැනවින් ලෝකයේ හැසිරෙන්නේ
ලොව කිසිවෙකුටවත් ආලය නොකරන්නේය. (949)

14. ලෝකයේ තරණය කිරීමට දුෂ්කර බන්ධනය වූ කාමය
යමෙක් මෙහිදී (මෙලොවදී) තරණය කළේද
(තණ්හා) දිය දහර සිඳ දැමූ, බන්ධන නොමැති වූ
ඔහු ශෝක නොකෙරේ, (කාමයන්) නොපතයි. (950)

15. යමක් පෙර (අතීතයේ) වීද එය වියලවා දමන්න
පසුව (අනාගතයේ) ඔබට කිසිවක් නොවේවා!
ඉදින් මැදද (වර්තමානය) අල්ලා නොගත්තේනම්
උපශාන්තව හැසිරෙන්නෙහිය. (951)

16. යමෙකුට නාමරූප වල 'මගේ' යැයි ගත් කිසිවක් නැතිද
නැතැයි කියා ශෝක නොකෙරේද, ඔහුට සැබවින්ම ලොව
කිසිවක් අහිමි නොවේ.[1] (952)

17. යමෙකුට 'මෙය මගේ' යැයි කියා හෝ
වෙන අයෙකුගේ කියා හෝ කිසිවක් නැතිද
හෙතෙම 'මගේ' යැයි කිසිවක් නොදකින්නේ
'මට නැතැ'යි කියා ශෝක නොකරන්නේය. (953)

18. 'කම්පිත නොවන පුද්ගලයා' අසනා ලදුව
(ඔහුගේ) මේ ආනිශංස ප්‍රකාශ කරමි
ඊර්ෂ්‍යා නැතියෙක, ගිජු නොවූයෙක
නොසැලෙන්නේය, සැමතැන්හි සම (සිත් ඇත්තෙක්) වන්නේය.
(954)

19. නොසැලෙන දන්නා කෙනාට
කවර වූ හෝ (සිතින් කරන) සකස් කිරීමක් නැත.
හෙතෙම සැහැසි කමින් වැලකුනේ
සැමතැන්හි ක්ෂේමය (බිය නැති බව) දකී. (955)

20. මුනි තෙම තමා සම භාවයෙහි හෝ හීන භාවයෙහි හෝ
උසස් භාවයෙහි ලා කතා නොකරයි.
ශාන්ත වූයේ, මසුරු කම පහ කළේ
කිසිවක් නොගනී, බැහැරද නොකරයි.[2] (956)

---

[1] නාමරූප ආසන්න ලෙස ලෝකය යයි ගත හැක. සියල්ල අතහැරිය කෙනාට නැති වන දෙයක් නැත.

[2] බැහැර කිරීමට කිසිවක් තිබිය යුතුය.

4.16 සැරියුත් සූත්‍රය

1. (සැරියුත් හිමියන්)
තුසිත දෙව්ලොවින් (මෙහි) පිරිස් ඇත්තෙකු බවට පැමිණි
මෙවැනි වූ මිහිරි තෙපුල් ඇති ශාස්තෘ කෙනෙකු
මා විසින් මින් පෙර නොදකින ලදී.
වෙන කිසිවෙකුගෙන් හෝ නොඅසන ලදී. (957)

2. දෙවියන් සහිත ලෝකයාට ඇස් ඇත්තා යම් ආකාරයකට පැණේද
(ඔහු) සියළු අඳුර දුරු කොට තනිවම සැපයට පැමිණියහ. (958)

3. බන්ධනයට හසු වී සිටින මෙහි බොහෝ දෙනා වෙනුවෙන්
ඒ අවදි වූ (බුද්ධ), නොඇලුනු, නොසැලෙන
වඤ්චනික නොවූ, පිරිස් ඇත්තා වෙත
ප්‍රශ්නයක් ඇසීමට පැමිණියෙමි. (959)

4. (සසර) පිළිකුල් කරන භික්ෂුවක් හිස් සෙනසුන් (ශූන්‍යාගාර)
රුක්මුල්, සොහොන් හෝ ගිරිගුහා ඇසුරු කරන්නේ. (960)

5. ඒ නිහඬ විවිධ වූ සෙන්සුන් වල යම් බියගැන් වීම් ඇද්ද
භික්ෂුව විසින් බිය නොවිය යුතු ඒ බියගැන්වීම් කීයද? (961)

6. පෙර නොගිය දිසාවකට යන ඒ භික්ෂුව දුර ඈත සෙනසුන් වලදී
ජය ගත යුතු ලොව ඇති එබඳු උවදුරු කොපමනද? (962)

7. ඒ වීර්‍ය්‍යයවන්ත භික්ෂුව කතා කරන අකාරය කෙබඳුද?
මෙහි ඔහුගේ ආහාරය කෙබඳුද? ඔහුගේ සීලවෘතය කෙබඳුද?
(963)

8. එක්තැන් වූ සිත් ඇතිව, බුද්ධිමත්ව සතිමත්ව
ඔහු කවර පුහුණුවක යෙදීමෙන්
කඹුරෙකු රිදීවල කිලුට පිඹහරින්නා සේ
තමාගේ (කෙලෙස්) කිලුටු පිඹහරීද? (964)

9. (භාග්‍යවතුන් වහන්සේ)
ඉදින් හිස් සෙනසුන් ඇසුරු කරන
(සසර) පිළිකුල් කරන සම්බෝධිය කැමැත්තාට
පහසුව පිණිස වූ ධර්මානුකූල පිළිවෙත
මා දැනගත් පරිදි ඔබට පවසමි. (965)

10. සතිමත්ව (කාම) ලොව කෙළවර හැසිරෙන
නුවණැති භික්ෂුව තැති ගැනීම් පහකට බිය නොවේ.
ඇටමැස්සන් හා වෙනත් විදින කෘමීන්ද, සර්පයන්ද
මනුෂ්‍ය හිරිහැර, සිව්පා සතුන්ද (966)

11. අන්‍යාගමිකයන්ටද බිය නොවන්නේය.
මේවායෙන් ඇතිවන බොහෝ තැතිගැන්වීම් දැක
ඉක්බිතිව යහපත සොයන්නා
තවත් උවදුරු ජයගත යුතුය. (967)

12. රෝගාබාධ, කුසගින්න ස්පර්ශ කරන ලද්දේ
සීතල හා උෂ්ණයද ඉවසන්නේය.
හෙතෙම ඒවායින් නොයක් ආකාරයෙන් ස්පර්ශ කරන ලදුව,
නිවසක් නැත්තේ, වීර්යය පරාක්‍රමය දැඩි කරන්නේය. (968)

13. සොරකම් නොකරන්නේය. බොරු නොකියන්නේය.
බියවන හා බිය නැති සියල්ලන් කෙරෙහි මෛත්‍රිය පතුරවන්නේය.
යම් කලෙක සිතේ කැලැඹුනු බවක් දැනගත්තේ නම්
''(තෙල) මාරයාගේ පක්ෂය'' යැයි (සිතා) එය දුරුකරන්නේය.
(969)

14. ක්‍රෝධයේ හා අධිමාන්නයේ පාලනයට නතු නොවන්නේය.
ඒවායේ මුල් ද උදුරා දමන ලද්දේය.
යලිත් ප්‍රිය හෝ අප්‍රිය දෑ, අභිවෘද්ධිය ඇත්තා
ඒකාන්තයෙන් අභිභවනය කරන්නේය. (970)

15. ප්‍රඥාව පෙරටුකොට, යහපත් වූ ප්‍රීතියෙන් යුක්තව
ඒ උවදුරු යටපත් කරන්නේය.
දුර ඈත සේනාසන කෙරෙහි කලකිරීම (නොඇල්ම) දුරලන්නේය.
වැලපීම් ඇතිකරන සිතුවිලි සතර මැඬලන්නේය. (971)

16. 'කුමක් වළඳන්නෙම්ද?' 'කොහෙන් වළඳන්නෙම්ද?'
'(ඊයේ) දුකසේ සැතපුනෙමි?' 'අද කොහේ සැතපෙන්නෙම්ද?'
මේ වැලපීම් ඇතිකරන විතර්ක
ගෙයක් නොමැති හික්මෙන්නා (සේඛ) දුරුකරන්නේය. (972)

17. සුදුසු කල්හි ආහාර හා වස්ත්‍ර ලද විට
තෘප්තිමත් වීමට මෙහි (පිළිගැනීමේ) පමණ ඔහු දන්නේය.
ඔහු ඒවායින් රැකුනේ සංවරව ගමේ හැසිරෙන්නේ
(ඔහුව) ප්‍රකෝප කිරීමට තැත් කළද රළු බසක් නොකියන්නේය.
(973)

18. යට හෙළු ඇස් ඇත්තේ, ඇවිදිමින් කාලය ගත නොකරන්නේ
භාවනාවෙහි යෙදුනේ, බෙහෙවින් නිදි මැරීමෙහි යෙදුනේ
උපේක්ෂාව අරමුණු කොට ගත් තැන්පත් සිතක් ඇත්තේ
පසුතැවිලි ගෙනදෙන සිතුවිලි තෙමේ සිඳලන්නේය. (974)

19. (අනෙක් අය) චෝදනා කරන ලද විට සතිමත්ව පිළිගන්නේය.
සබ්‍රහ්මචාරීන් වහන්සේලා[1] කෙරෙහි (ක්‍රෝධ) උල බිඳලන්නේය.
යහපත් වචන වුවත් වැඩිපුර කතා නොකරන්නේ
ජනයා අතර කතා කෙරෙහි සිත නොයොදන්නේය. (975)

20. ඉක්බිතිව සතිමත්ව දුරලීමට හික්මිය යුතු
කිලුටු පහක් ලෝකයේ ඇත.
රූප ශබ්ද කෙරෙහිද තවද රසය කෙරෙහිද
ගඳ සුවඳ හා (කායික) ස්පර්ශය කෙරෙහිද ඇලීම මැඩලිය යුතුය.
(976)

21. එම ධර්ම කෙරෙහි කැමැත්ත දුරලන්නේ
සතිමත් වූ මැනවින් මිදුනු සිතක් ඇති ඒ භික්ෂුව
සුදුසු කාලයේ නිවැරදිව ධර්මය විමසන්නේ
එකඟ වූ සිත් ඇතියේ, හෙතෙම අඳුර නසා දමන්නේය. (977)

---

[1] සෙසු භික්ෂූන්

05 . 'පරතෙරට යෑම' පරිච්ඡේදය

නිදාන කථාව (වත්ථුගාථා) පරිවර්තනය නොකරන ලදී

5.1 අජිත ප්‍රශ්නය

1. (අජිත)
   ලෝකයා කුමකින් වැසුනේද? කුමකින් ප්‍රකාශ නොවේද?
   අලවන ලහටුව කුමක්ද? ඔහුට ඇති මහත් බිය කුමක්ද? (1034)

2. (භාග්‍යවතුන් වහන්සේ)
   ලෝකයා අවිද්‍යාවෙන් වැසී ඇත, සැකය හා ප්‍රමාදය නිසා ප්‍රකාශ නොවේ.
   පැතීම අලවන ලහටුවයි, දුක ඔහුට ඇති මහත් බියයි. (1035)

3. (අජිත)
   (තණ්හා) දිය දහරා හැමතැනම ගලත්
   දිය දහරාවල වැළැක්වීම කුමක්ද?
   දිය දහරාවල සංවරය කියනු මැන
   දිය දහරා කුමකින් වසා දමේද? (1036)

4. (භාග්‍යවතුන් වහන්සේ)
   ලෝකයේ යම්තාක් දිය දහරා ඇතිද
   සතිමත් බව ඒවායේ වැළැක්වීමයි
   දිය දහරා වල සංවරය පවසමි.
   ප්‍රඥාවෙන් ඒවා වසා දමේ. (1037)

5. (අජිත)
නිදුකානෙනි, ප්‍රඥාව මෙන්ම සතියද, නාම රූපයද
මෙය මා විසින් අසන ලදුව පවසනු මැන, ඒවා කොහි නිරුද්ධ වේද? (1038)

6. (භාග්‍යවතුන් වහන්සේ)
'කොතැනක නාමයද රූපයද ඉතිරි නැතිව නිරුද්ධ වේද?'
යම් ඒ ප්‍රශ්නයක් විමසීද, අජිත එය ඔබට පවසමි.
විඥානය නිරුද්ධ වීමෙන්, එතැන[1] ඒවා නිරුද්ධ වේ. (1039)

7. (අජිත)
යම් ඒ ධර්මය දැනගත් කෙනෙක් වෙත්ද
යම් ඒ (තවම) හික්මෙන බොහෝ දෙනෙකුත් මෙහි වෙත්ද
නුවණැති නිදුකානනි, ඔවුන්ගේ ප්‍රතිපත්තිය
මා විසින් විමසන ලද්දේ පවසනු මැන. (1040)

8. (භාග්‍යවතුන් වහන්සේ)
කාමයන් හි ගිජු නොවන්නේය. නොකැළඹුනු මනසක් ඇත්තෙක් වන්නේය.
සියළු දහම්හි දක්ෂ වන්නේය, භික්ෂුව සතිමත්ව හැසිරෙන්නේය. (1041)

---

[1] විඥානය නිරුද්ධ වන තැන එනම් නිවන

5.2 තිස්සමෙත්තෙය්‍ය ප්‍රශ්නය

1. (තිස්සමෙත්තෙය්‍ය)
   ලෝකයේ කවරෙක් නම් තෘප්තිමත්ද?
   කවරෙකුට කම්පනයෝ නැතිද?
   කවරෙක් දෙකෙළවර මැනවින් දැන
   ප්‍රඥායෙන් මැද නොඇලේද?
   කවරෙකුට මහා පුරුෂයා යැයි කියන සේක්ද?
   මෙහි කවරෙක් (තණ්හා) මැහුම්කාරිය ඉක්මැ ගියේද? (1042)

2. (භාග්‍යවතුන් වහන්සේ)
   කාමයන් අතර බ්‍රහ්මචර්යාවෙහි හැසිරෙමින්
   ආශාව ප්‍රහීණ කළේ, හැම විට සතිමත් වූයේ
   නුවණින් දැන භික්ෂුව නිවුනිද
   ඔහුට කම්පනයක් ඇත්තේ නැත. (1043)

3. හෙතෙම දෙකෙළවර මැනවින් දැන
   ප්‍රඥාවෙන් මැද නොඇලේ
   ඔහුට මහා පුරුෂයා යැයි කියමි.
   ඔහු මෙහිදීම මැහුම්කාරිය ඉක්මැ ගියේය. (1044)

5.3 පුණ්ණක ප්‍රශ්නය

1. (පුණ්ණක)
නොසැලෙන, මූලය දකින්නා වෙත
ප්‍රශ්නයක් ඇසීමට පැමිණියෙමි.
කුමක් හේතුවෙන් ඍෂිවරු, මිනිසුන්
රජදරුවන්, බමුණන්, දෙවිවරුන්ට
මෙලොවදී බොහෝ යාග කෙරෙත්ද
භාග්‍යවතුන්ගෙන් එය විමසමි. මට එය වදාළ මැනව. (1045)

2. (භාග්‍යවතුන් වහන්සේ)
යම් කිසි මේ ඍෂිවරු, මිනිස්සු
රජදරුවො, බමුණො දෙවිවරුන්ට
මෙලොවදී බොහෝ යාග කෙරෙත් ද
පුණ්ණක, (නැවත) මේ (කාම) භවය පතමින්
මහළු වියේ පැමිණීමද නිසා යාග කෙරෙත්. (1046)

3. (පුණ්ණක)
යම් කිසි මේ ඍෂිවරු, මිනිස්සු,
රජදරුවො, බමුණො දෙවිවරුන්ට
මෙලොවදී බොහෝ යාග කෙරෙත් ද
භාග්‍යවතුනි, නිදුකාණනි, ඔවුහු යාගයෙහි අප්‍රමාදී වූවහු
උපතද, මහළු වීමද ඉක්මැවීද?
භාග්‍යවතුන්ගෙන් එය විමසමි, මට එය වදාළ මැනව. (1047)

4. (භාග්‍යවතුන් වහන්සේ)
(ඔවුහු) බලාපොරොත්තු වෙත්, ස්තුති යාඥා කෙරෙත්
දඬිව පතත්, පූජා පවත්වත්
විවිධ දේ ලබා ගැනීමට, කාමයම පතත්
ඔවුහු යාගයෙහි බැඳුනාහු, භව ඇල්මෙන් ඇලුනාහු
උපත හා මහළු වීම තරණය නොකළහයි කියමි. (1048)

5. (පුණ්ණක)
නිදුකාණනි, ඉදින් ඔවුහු යාගකිරීමෙන්, යාඥා කිරීමෙන්
උපත හා මහළුවීම තරණය නොකළාහු නම්
නිදුකාණනි, දෙව් මිනිස් ලොව කවරෙක් නම්
උපත හා මහළුවීම ඉක්මවීද
භාග්‍යවතුන්ගෙන් එය විමසමි, මට එය වදාළ මැනව. (1049)

6. (භාග්‍යවතුන් වහන්සේ)
ලෝකයෙහි උස් පහත් දේ නුවණින් දැන
ලෝකයේ කිසිදු වූ කැළැඹිල්ලක් යමෙකුට නැතිද
ශාන්ත වූ, (කෙලෙස්) දුම රහිත, සිත් කරදර නැති, ආශා නැති
ඔහු, උපත හා මහළු බව තරණය කළේ යැයි කියමි. (1050)

5.4 මෙත්තගූ ප්‍රශ්නය

1. (මෙත්තගූ)
භාග්‍යවතුන්ගෙන් මෙය විමසමි, මට එය වදාළ මැනව
ඔබ වහන්සේ ඥානයෙන් පරතෙරට ගියේ, වැඩූ සිත් ඇත්තෙකැයි සිතමි.
ලෝකයෙහි අනේකවිධ වූ යම් කිසි දුකක් ඇද්ද
මේ දුක් කොයින් හටගත්තෝ ද? (1051)

2. (භාග්‍යවතුන් වහන්සේ)
එකැතින් (නුඹ) මගෙන් දුකෙහි හටගැන්ම විමසන්නෙහිය.
මා දන්නා පරිදි එය ඔබට පවසමි.
ලෝකයෙහි අනේකවිධ වූ යම් කිසි දුක් ඇද්ද
(ඒවා) 'මගේ' යැයි අල්ලාගත් දෑ (වත්කම්) නිසා හටගනිති.
(1052)

3. ඉදින් යමෙක් නොදන වත්කම් (භෞතික/අභෞතික) තනයිද
ඒ මන්දයා නැවත නැවතත් දුකට පැමිණේ
එම නිසා දුකෙහි උපත, හට ගැනීම දකින්නා
මැනවින් දන්නේ, වත්කම් නොතනයි. (1053)

4. (මෙත්තගූ)
අපි ඔබගෙන් යමක් විමසුවෙමුද, එය අපට විසඳන ලදී
වෙන දෙයක් ඔබගෙන් විමසමි. එයද වදාළ මැනව.
නුවණැත්තෝ කෙසේ නම් සැඩපහර තරණය කරත්ද
උපත, මහළු බව, ශෝකය හා වැලපීමත්?
මුනිවරයාණනි, එය මට විසඳා දෙන්නේ නම් මැනවි.
නුඹ වහන්සේ විසින් ඇති සැටියෙන්ම එම ධර්මය දැන ගන්නා ලදී.
(1054)

5. (භාග්‍යවතුන් වහන්සේ)
මෙලොවදීම තමාටම දත හැකි, වෙන අයෙකුගේ කීමෙන් ඇදහිය යුතු නැති
යමක් දැනගෙන සතිමත්ව හැසිරීමෙන්
ලෝකයේ ඇති පැටලීමෙන්[1] එතෙර විය හැකිද
ඒ ධර්මය නුඹට දෙසමි. (1055)

---

[1] ලෝකයේ ඇති පැටලෙන දෙය කාමයයි.

6. (මෙත්තගූ)
යමක් දැනගෙන සතිමත්ව හැසිරීමෙන්
ලෝකයේ ඇති පැටලීමෙන් එතෙර විය හැකිද
මහා ඍෂිවරයාණෙනි, ඒ උත්තම ධර්මය
මම සතුටින් පිළිගනිමි. (1056)

7. (භාග්‍යවතුන් වහන්සේ)
උඩ යට හෝ මැද සරස යම්කිසි
දෙයක් නුඹ දන්නෙහිද
ඒවායෙහි සතුටුවීමත්, ලැග සිටීමත් දුරලන්න.
(එවිට) විඥාණය භවයේ (පැවැත්මේ) නොපිහිටයි. (1057)

8. මෙලෙස සතිමත්ව, අප්‍රමාදීව වෙසෙයිද
'මගේ' යැයි ගත් දෑ අතහැර භික්ෂුව හැසිරෙයිද
ඒ විද්වතා මෙලොවදීම දුක දුරලන්නේය
උපත, මහළුබව, ශෝකය හා වැලපීමත්. (1058)

9. (මෙත්තගූ)
මහා ඍෂිවරයාගේ ඒ වචනය සතුටින් පිළිගනිමි.
ගෞතමයන් විසින් වත්කම් දුරලීම මැනවින් දෙසන ලදී.
භාග්‍යවතුන් සැබවින්ම දුක් ප්‍රහීණ කළ සේක.
නුඹ වහන්සේ විසින් ඇති සැටියෙන්ම එම ධර්මය දැනගන්නා ලදී.
(1059)

10. මුනිවරයානෙනි, නුඹ යමෙකුට නිතර උපදෙස් දෙයිද
ඔවුහුද ඒකාන්තයෙන් දුක දුරලන්නාහ.
හස්තියානෙනි, නුඹ වහන්සේ කරා එළඹ නුඹ නමදිමි.
භාග්‍යවතුන් මට නිතර උපදෙස් දෙන්නේ නම් මැනවි. (1060)

11. (භාග්‍යවතුන් වහන්සේ)
නුවණින් පරතෙරට ගිය, කිසිවක් (අයිති) නැති
කාමයන්හිත්, භවයෙහිත් නොඇලුණු යම් බ්‍රාහ්මණයෙකු දන්නේ ද,
ඔහු සැබැවින්ම මෙම සැඩපහර තරණය කළේය.
එගොඩට ගියේ, හුල උදුරා දැමූයේ, සැක නැත්තේය. (1061)

12. නුවණින් පරතෙරට ගිය ඒ විද්වත් පුද්ගලයා
මෙහි විවිධ දේ කෙරෙහි බැඳීම් දුරලා
ඒ තණ්හාව (ආශාව) දුරලූ, පීඩාවක් නැති, ආශාවක් නැති
ඔහු උපත හා මහළු බව ඉක්මවී යැයි කියමි. (1062)

5.5 ධෝතක ප්‍රශ්නය

1. (ධෝතක)
භාග්‍යවතුන්ගෙන් මෙය විමසමි, මට එය වදාළ මැනව.
මහා ඍෂිවරයානෙනි, ඔබේ වචනය ඇසීමට කැමැත්තෙමි.
ඔබ කියන දේ අසා
මාගේ නිවීම (නිවන) පිණිස කටයුතු කරමි. (1063)

2. (භාග්‍යවතුන් වහන්සේ)
එසේනම් මෙහිදීම (මෙලොවදීම) නුවණැතිව
සතිමත්ව වීර්යය වඩන්න
මේ කියන දේ අසා
තමාගේ නිවීම පිණිස කටයුතු කරන්න. (1064)

3. (ධෝතක)
මම දෙව්මිනිස් ලොවෙහි හැසිරෙන
කිසිවක් අයිති නැති බ්‍රාහ්මණයාව දිකිමි.
සියල්ල දකින්නා (මම) නමදිමි.
ශාක්‍යයාණෙනි, මාව සැකයෙන් මුදවාලුව මැනව. (1065)

4. (භාග්‍යවතුන් වහන්සේ)
ධෝතක, ලෝකයේ කිසිදු සැක සහිතයෙක්
ඉන් මුදන්නට මට නොහැක.
ශ්‍රේෂ්ඨ වූ ධර්මය දැනගෙන
නුඹම මෙසේ මේ සැඩපහර තරණය කරන්න. (1066)

5. (ධෝතක)
බ්‍රහ්මයාණෙනි, යම් සේ මම අහස මෙන් බාධා රහිතව
මෙහිදීම ශාන්ත භාවයට විත්, කිසිවක නොඇලී හැසිරෙන්නෙම්ද
(ඒ සඳහා වූ) යම් විවේක ධර්මයක් මම දැන ගන්නෙම් ද
කරුණාවෙන් (එය මට) දෙසුව මැනවි. (1067)

6. (භාග්‍යවතුන් වහන්සේ)
මෙලොවදීම තමාටම දත හැකි, වෙන අයෙකුගේ කීමකින් ඇදහිය යුතු නැති
යමක් දැනගෙන සතිමත්ම හැසිරීමෙන්
ලෝකයේ ඇති (කාම/තණ්හා) පැටලීමෙන් එතෙර විය හැකිද
ඒ ශාන්ත තත්වය නුඹට දෙසමි. (1068)

7 (ධෝතක)
යමක් දැනගෙන සතිමත්ව හැසිරීමෙන්
ලෝකයේ ඇති පැටලීමෙන් එතෙර විය හැකිද
මහා ඍෂිවරයාණෙනි, ඒ උත්තම ශාන්ත තත්වය
මම සතුටින් පිළිගනිමි. (1069)

8. (භාග්‍යවතුන් වහන්සේ)
උඩ යට හෝ මැද සරස
යම්කිසි දෙයක් නුඹ දන්නෙහිද
එය ලෝකයේ ඇති බන්ධනයක් බව දැන
(ඒ) විවිධ දේ කෙරෙහි ආසාවක් නොකරව. (1070)

5.6 උපසීව ප්‍රශ්නය

1. (උපසීව)
ශාක්‍යයාණෙනි, මම තනිවම කිසිවක් මත නොයැපී
මහා සැඩපහරින් එතෙර වීමට නොහැකි වීමි.
සියල්ල දකින්නානෙනි, යමක් මත යැපෙමින් මෙම සැඩපහර
තරණය කළ හැකිනම් ඒ අරමුණ (ආධාරය) වදාළ මැනව. (1071)

2. (භාග්‍යවතුන් වහන්සේ)
සතිමත්ව 'කිසිවක් නැති තත්වය'[1] දකිමින්
'(කිසිවක්) නැතැ'යි මත යැපෙමින් සැඩපහර තරණය කරන්න.
කාමය දුරු කොට, සැකය හැරපියා
'තණ්හාව ක්ෂය වූ තත්වය' (නිවන) දිවා රෑ සොයන්න. (1072)

3. (උපසීව)
යමෙක් සියළු කාමයන්හි ඇල්ම දුරු කළේද
'කිසිවක් නැති තත්වය' මත යැපෙමින්, අන් සියල්ල හැරදා
උසස්ම සඤ්ඤා විමෝක්ෂයෙන් විමුක්ත වුයේද,[2]
එතැනම ඔහු සිටීද? (සසර) අනූව නොයයිද? (1073)

4. (භාග්‍යවතුන් වහන්සේ)
යමෙක් සියළු කාමයන්හි ඇල්ම දුරු කළේද
'කිසිවක් නැති තත්වය' මත යැපෙමින්, අන් සියල්ල හැරදා
උසස්ම සඤ්ඤා විමෝක්ෂයෙන් විමුක්ත වූයේ ද,
එතැනම ඔහු සිටී, (සසර) අනූව නොයයි. (1074)

5. (උපසීව)
සියල්ල දකින්නානෙනි, ඉදින් ඔහු විශාල වර්ෂ ගණනාවක්
එතැන සිටින්නේ නම්, (සසර) අනූව නොයයි නම්
එතැනම ඔහු සිසිල් වී විමුක්තිය ලබයි නම්
එවැනි අයෙකුගේ විඥානය චුත වෙයිද (එතැනින් ගිලිහී යාද)?
(1075)

---

[1] ආකිඤ්චඤ්ඤායතනය - තෙවැනි අරූප ධ්‍යානය, ඉහළම සඤ්ඤා සමාපත්තියයි.
[2] නිවන ලැබූ පුද්ගලයා

6. (භාග්‍යවතුන් වහන්සේ)
යම් සේ ගිනිසිලක් සුළඟින් නිවී ගිය කල
අස්තයට යයි (නොදැක්මට යයි), ගිණීමකට නොපැමිණේ[1]
එලෙසින්ම මුනිවරයා නාම කයින්[2] විමුක්ත වූයේ
අස්තයට යයි, ගිණීමකට නොපැමිණේ. (1076)

7 (උපසීව)
ඔහු අස්තයට ගියේද? එසේත් නැතිනම් නැති වී ගියේද?[3]
නැතිනම් නියතව සදාකාලික ආරෝග්‍ය භාවයකට පැමිණියේද?[4]
මුනිවරයාණෙනි, මෙය මට පහදා දෙනු මැනවි.
නුඹවහන්සේ විසින් ඇති සැටියෙන්ම එම ධර්මය දැන ගන්නා ලදී.

(1077)

8. (භාග්‍යවතුන් වහන්සේ)
අස්තයට ගිය ඔහුව මැනීමට ක්‍රමයක් නැත.
යම් විදියකින් ඔහු ගැන පැවසිය හැකිද, එවැනි විදියක් ඔහුට නැත.
සියළු ධර්මයන් නැසූ කෙනා කෙරෙහි
සියළු කතා විධිද නසන ලද්දේ වෙයි. (1078)

---

[1] නිවී කොයි අතකට ගියේදැයි, මොන තත්වයකට පත් වුනේදැයි ගිණීමකට නොපැමිණේ.
[2] නම් කිරීමට උපකාර වන ධර්ම : විඳීම්, සඤ්ඤා, චේතනා, ස්පර්ශය, මනසිකාර
[3] උච්ඡේද දෘෂ්ඨිය ප්‍රකාශ වේ.
[4] ශාස්වත දෘෂ්ඨිය ප්‍රකාශ වේ.

5.7 නන්ද ප්‍රශ්නය

1. (නන්ද)
''ලෝකයේ මුනිවරු ඇතැ''යි ජනයා පවසත්, එය කෙසේද?
ඥානයට පැමිණි නිසාද, නැතිනම් දිවි පෙවෙත නිසාද මුනිවරයා
යැයි කියනුයේ? (1079)

2. (භාග්‍යවතුන් වහන්සේ)
නන්ද, දෘෂ්ටියෙන් හෝ දනුමෙන් හෝ ඥාණයෙන් හෝ නොවේ.
දක්ෂයෝ මෙහි මුනිවරයා යැයි පවසන්නේ
යමෙක් අවිරුද්ධව, පීඩා රහිතව, ආශාවලින් තොරව හැසිරෙත්ද,
ඔවුන් 'මුනිවරයෝ' යැයි පවසමි. (1080)

3. (නන්ද)
භාග්‍යවතුනි, යම් කිසි මේ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ
දෘෂ්ටියෙනුත්, දනුමෙනුත් ශුද්ධිය පවසත්
ශීල ව්‍රතයෙන්ද ශුද්ධිය පවසත්
නොයෙක් විධිවලින්ද ශුද්ධිය පවසත්
කිම, ඔවුහු එහි ඒ ආකරයට හැසිරෙන්නෝ
නිදුකානනි, උපතද මහළු බවද ඉක්මවා ගියෝද?
භාග්‍යවතුන්ගෙන් එය විමසමි, මට එය වදාළ මැනව. (1081)

4. (භාග්‍යවතුන් වහන්සේ)
යම්කිසි මේ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ
දෘෂ්ටියෙනුත්, දනුමෙනුත් ශුද්ධිය පවසත්
ශීල ව්‍රතයෙන්ද ශුද්ධිය පවසත්
නොයෙක් විධිවලින් ද ශුද්ධිය පවසත්
ඔවුහු ඒ ආකාරයට එහි හැසිරෙන්නේ නමුදු
උපත හා මහළු බව ඉක්මවා නොගියෝ යැයි කියමි. (1082)

5. (නන්ද)
යම්කිසි මේ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ
දෘෂ්ටියෙනුත් දනුමෙනුත් ශුද්ධිය පවසත්
ශීලව්‍රතයෙන්ද ශුද්ධිය පවසත්
නොයෙක් විධිවලින් ද ශුද්ධිය පවසත්
ඉදින් මුනිතෙම ඔවුන් සැඩපහර තරණය නොකළේ යැයි කියා නම්
එසේ නම් නිදුකානනි, කවරෙක් නම් දෙව් මිනිස් ලොව
උපත හා මහළු බව ඉක්මවා ගියෝද?
භාග්‍යවතුන්ගෙන් එය විමසමි, මට එය වදාළ මැනව. (1083)

6. (භාග්‍යවතුන් වහන්සේ)
මම සියළුම මහණ බමුණන්
උපතින් හා මහළු බවින් අවුරණ ලදැයි නොකියමි.
යමෙක් මෙහි ඇසූ දුටු දැනගත් දෑ හෝ
සීලව්‍රතය හෝ සියල්ල දුරලා
නොයෙක් ආකාර ඇති සියල්ල ද දුරලා
ආශාව (තණ්හාව) පිරිසිඳ දැන ආශ්‍රව[1] රහිත වීද
එම පුද්ගලයන් නියත ලෙසම සැඩපහර තරණය කළේ යැයි කියමි.
(1084)

7. (නන්ද)
මහා ඍෂිවරයාගේ ඒ වචනය සතුටින් පිළිගනිමි
ගෞතමයන් විසින් වත්කම් දුරලීම මැනවින් දෙසන ලදී.
යමෙක් මෙහි ඇසූ දුටු දැනගත් දෑ හෝ
සීලව්‍රතය හෝ සියල්ල දුරලා
නොයෙක් ආකාර ඇති සියල්ල ද දුරලා
ආශාව පිරිසිඳ දැන ආශ්‍රව රහිත වීද
මම ද ඔවුන් සැඩපහර තරණය කළේ යැයි පවසමි.
(1085)

---

[1] ආශ්‍රව 3කි : කාම, පැවැත්ම, අවිද්‍යාව (කාමාසව, භවාසව, අවිජ්ජාසව)

5.8 හේමක ප්‍රශ්නය

1. (හේමක)
ගෞතමයන්ගේ උපදෙස් වලට පෙර, යමෙක් මට පෙර පැවසුවාහුද
''මෙසේ වීලු, මෙසේ වන්නේලූ'' ඒ සියල්ල 'මෙසේය මෙසේය'
කතාය
ඒ සියල්ල විතර්ක වඩන්නාහ, මම එහි සතුටු නොවෙමි.
(1086)

2. යමක් දැනගෙන සතිමත්ව හැසිරීමෙන්
ලෝකයේ ඇති පැටලීමෙන් එතෙර විය හැකිද?
තණ්හාව නසන ඒ ධර්මය මුනිවරයානෙනි නුඹ මට පවසනු මැන.
(1087)

3. (භාග්‍යවතුන් වහන්සේ)
හේමක, මෙහි ඇසූ, දුටු, දැනගත්, සිතූ ප්‍රිය සහගත දැයෙහි
කැමැත්ත හා ඇල්ම දුරලීමයි, චුතියක් නැති නිවීම. (1088)

4. යම් සත්පුරුෂයෝ එය දැනගෙන මේ ජීවිතයේදීම නිවුනාහුද
ඔවුහු හැමවිටම උපශාන්ත වූවෝ,
ලෝකයේ පැටලීමෙන් එතෙර වූවෝ ද වෙති. (1089)

5.9 තෝදෙය්‍ය ප්‍රශ්නය

1. (තෝදෙය්‍ය)
   යමෙක් කෙරෙහි කාමයෝ නොවසත්ද,
   යමෙක් කෙරෙහි තණ්හාව දක්නට නැතිද
   යමෙක් සැකය ඉක්මවීද
   ඔහුගේ විමෝක්ෂය කෙබඳුද? (1090)

2. (භාග්‍යවතුන් වහන්සේ)
   යමෙක් කෙරෙහි කාමයෝ නොවසත්ද
   යමෙක් කෙරෙහි තණ්හාව දක්නට නැතිද
   යමෙක් සැකය ඉක්මවීද
   ඔහුට ඉන් එහා විමෝක්ෂයක් නැත. (1091)

3. (තෝදෙය්‍ය)
   හෙතෙම පැතුම් රහිතද නැතිනම් පැතුම් ඇත්තෙක්ද?
   හෙතෙම ප්‍රඥාවෙන් යුක්තද, නැතිනම් නුවණින් කල්පිත ගොඩනඟන්නෙක්ද?
   ශාක්‍යයානනි, යම් සේ මම මුනිවරයා දැන ගන්නෙම්ද
   සියල්ල දකින්නාණෙනි, මට ඔහු ගැන කියා දෙන්න. (1092)

4. (භාග්‍යවතුන් වහන්සේ)
   හෙතෙම පැතුම් රහිතය, ඔහු පැතුම් පතන්නෙක් නොවේ.
   හෙතෙම ප්‍රඥාවෙන් යුක්තය, නුවණින් කල්පිත ගොඩනඟන්නෙක් නොවේ.
   මෙලෙස තෝදෙය්‍ය, කිසිවක් අයිති නැති
   කාමයන්හි හා පැවැත්මෙහි නොඇලුණු මුනිවරයා දැනගන්න.
   (1093)

5.10 කප්ප සූත්‍රය

1. (කප්ප)
   විල මැද සිටියදී
   මහත් බිය ජනක සැඩපහර උපන් කල්හි
   නිදුකානනි, මහළු බවෙන් හා මරණයෙන් පීඩිත වූවනට
   දූපත වදාළ මැනව
   මත්තෙහි නොව මෙලොවදීම දත හැකි
   ඒ දූපත නුඹ වහන්සේ මට කියනු මැන (1094)

2. (භාග්‍යවතුන් වහන්සේ)
   විල මැද සිටියදී, මහත් බිය ජනක සැඩපහර උපන් කල්හි
   කප්ප, මහළු බවෙන් හා මරණයෙන් පීඩිත වූවනට දූපත ඔබට කියමි.
   (1095)

3. කිසිවක් (අයිති) නැති බව හා කිසිවක් අල්ලා නොගත් බව
   දූපත එයයි, අනෙකක් නොවේ
   මහළු බව හා මරණය ක්ෂය වී ගියාවූ
   එයට නිවීම (නිවන) යැයි කියමි. (1096)

4. යම් සත්පුරුෂයෝ එය දැනගෙන මේ ජීවිතයේදීම නිවුනෝ ද
   ඔවුහු මාරයාට යටත් වූවෝ නොවෙති, ඔවුහු මාරයාගේ වහලුන්
   නොවෙති. (1097)

5.11 ජතුකණ්ණි ප්‍රශ්නය

1. (ජතුකණ්ණි)
කාමයන්ට කැමැත්තක් නැති, සැඩපහර ඉක්මවූ වීරයා ගැන අසා
ප්‍රශ්නයක් අසනු කැමැත්තෙන් මම පැමැණියෙමි.
සහජාත ඇස් ඇතියානෙනි, ශාන්ත තත්වය වදාළ මැනවි
ඒ සැබෑ සත්‍යය භාග්‍යවතුනි, යථා පරිදි මට පවසනු මැන.
(1098)

2. යම් සේ දිලිසෙන හිරු තම තේජසින් පොළොව මැඩලයිද
එලෙසින්ම භාග්‍යවතුන් කාමයන් මැඩලමින් හැසිරේ
මහා ප්‍රාඥායානෙනි, සුළු ප්‍රඥාවක් ඇති මට
මෙලොවදීම උපත හා මහළු බව ප්‍රහීණ කිරීම සඳහා
යම් ධර්මයක් ඇතිද, මට දැනගැනීමට එය වදාළ මැනව
(1099)

3. (භාග්‍යවතුන් වහන්සේ)
කාමයන් කෙරෙහි ගිජු බව දුරලන්න
නෛෂ්කර්මය (කාමයන්ගෙන් වෙන් වීම) බිය නැති තැන ලෙස
දකින්න
අල්ලාගත් හෝ අත්හල කිසිම දෙයක්
ඔබ කෙරෙහි දක්නට නොලැබේවා! (1100)

4. යමක් පෙර (අතීතයේ) වීද එය වියලවා දමන්න
පසුව (අනාගතයේ) ඔබට කිසිවක් නොවේවා!
ඉතින් මැද (වර්තමානය) අල්ලා නොගත්තේ නම්
උපශාන්තව හැසිරෙන්නෙහිය. (1101)

5. බ්‍රාහ්මණය, සියළුම නාමරූපන්හි ගිජුබව දුරලූවෝ කෙරෙහි
මාරයාගේ පාලනයට යටත් කරන ආශ්‍රවයෝ දක්නට නොලැබෙත්.
(1102)

5.12 හද්‍රවුධ ප්‍රශ්නය

1. (හද්‍රවුධ)
නිවෙස අතහැරිය, තණ්හාව සිඳලූ, නොසැලෙන
සතුටු වීම අතහැරිය, සැඩපහර තරණය කළ, විමුක්ත වූ
විතර්ක ගොඩනැඟීම අතහැරිය ප්‍රඥාවන්තයා අයදිමි.
හස්තියාට සවන් දීමෙන්ම පසු ජනයා මෙතැනින් බැහැර වෙත්.
(1103)

2. වීරයානෙනි, ඔබේ වචන අසනු කැමතිව
නොයෙක් රට වලින් ජනයා මෙහි රැස් වී ඇත.
ඔවුනට ඔබ වහන්සේ (ධර්මය) දේශනා කරනු මැනවි.
නුඹ වහන්සේ විසින් ඇති සැටියෙන්ම ඒ ධර්මය දැනගන්නා ලදී.
(1104)

3. (භාග්‍යවතුන් වහන්සේ)
උඩ යට හා මැද සරස (කිසිවක)
අල්ලා ගැනීමේ ආශාව සම්පූර්ණයෙන් දුරලන්න
ලෝකයෙහි යම් යම් දෙයක් අල්ලා ගනියිද
එයින්ම මාරයා ඒ පුද්ගලයා අනුව එන්නේය. (1105)

4. එම නිසා භික්ෂුව සතිමත්ව, මැනවින් දැන,
මාරයාගේ විෂය පථයෙහි පැටළුනු මේ ප්‍රජාව
'අල්ලා ගැනීමෙහි ඇළුනෝ' යැයි දකිමින්
මුළු ලෝකයෙම කිසිවක් අල්ලා නොගන්නේය. (1106)

5.13 උදය ප්‍රශ්නය

1. (උදය)
(කෙලෙස්) දූවිලි නැති, හිඳ බවුන් වඩන
කළ යුත්ත කර නිම කළ, ආශ්‍රව රහිත
සියළු ධර්මයන්ගේ පරතෙරට ගිය ඔබෙන්
ප්‍රශ්නයක් විමසීමට පැමිණියෙමි.
අවිද්‍යාව බිඳ දමන
අඤ්ඤා විමෝක්ෂය (ඥානයෙන් ලබන විමෝක්ෂය)[1] දෙසුව මැනවි.
(1107)

2. (භාග්‍යවතුන් වහන්සේ)
කාමයන්ට කැමැත්තත් දොම්නසත් දෙකම දුරලා
මැලි බවත් දුරු කොට, පසුතැවිල්ල වළකා (1108)

3. ධර්ම තර්කය පළමුව දුවන, සුපිරිසිදු උපේක්ෂාව හා සතිය ඇති
අවිද්‍යාව බිඳ දමන, ඥානයෙන් ලබන විමෝක්ෂය (එය යැයි) පවසමි.
(1109)

4. (උදය)
ලෝකයාගේ බන්ධනය කුමක්ද? ඔහුගේ සංචරණය කුමක්ද?
ඔහු කුමක් ප්‍රහීණ කිරීමෙන් 'නිවුනේ' යැයි කියනු ලැබේද?
(1110)

5. (භාග්‍යවතුන් වහන්සේ)
(යම් යම් දේ කෙරෙහි) සතුටු වීම ලෝකයාගේ බන්ධනයයි,
විතර්කය ඔහුගේ සංචරණයයි.
තණ්හාව ප්‍රහීණ කිරීමෙන් 'නිවුනේ' යැයි කියනු ලැබේ. (1111)

6. (උදය)
කෙලෙස සතිමත්ව හැසිරෙන්නාගේ විඥාණය නිරුද්ධ වේද?
භාග්‍යවතුන් විමසීමට පැමිණියෙමු, ඔබගේ ඒ වචනයට සවන් දෙමු.
(1112)

7. (භාග්‍යවතුන් වහන්සේ)
අභ්‍යන්තර හා බාහිරද වූ වේදනාව (මගේ යැයි) පිළිනොගන්නේය.
මෙලෙස සතිමත්ව හැසිරෙන්නාගේ විඥානය නිරුද්ධ වේ.
(1113)

---

[1] එනම් නිවන

5.14 පෝසාල ප්‍රශ්නය

1. (පෝසාල)
යමෙක් අතීතය ප්‍රකාශ කරයිද, නොසැලෙන, සැකය සිඳලූ
සියළු ධර්මයන්ගේ පරතෙරට ගිය ඔබෙන් ප්‍රශ්නයක් ඇසීමට
පැමිණියෙමි. (1114)

2. රූප සංඥාව නැති වී ගිය, සියළුම කයවල් ප්‍රහීණ කළ
ඇතුලතද පිටතද කිසිවක් නැතැයි දකින්නා
ශාක්‍යයානෙනි විමසමි, එවැන්නෙක් කෙසේ ඥානයට පැමිණ විය
යුතුද? (1115)

3. (භාග්‍යවතුන් වහන්සේ)
විඥානය පිහිටන තැන් (භව) සියල්ල
තථාගතයන් මැනවින් දන්නේ,
එහි (ආකිඤ්චඤ්ඤායතනයේ) සිටින කෙනාද දනියි.
එය පරම කොට ඇත්තාද, විමුක්ත වූ කෙනාද (දනියි). (1116)

4. 'කිසිවක් නැති තත්වයේ'[1] හටගැනීම දැක
(එහි) සතුටු වීම බන්ධනය යැයිද
මෙලෙස එය මැනවින් දැන
ඉක්බිති එහි විපස්සනා කරයි.
පුහුණුව සම්පූර්ණ කළ ඒ බ්‍රාහ්මණයාගේ
එම ඥනය ඔහුට තත් වූ පරිදිම වන්නේය. (1117)

---

[1] ආකිඤ්චඤ්ඤායතනය

5.15 මොඝරාජ ප්‍රශ්නය

1. (මොඝරාජ)
දෙවරක් ශාක්‍යයාගෙන් විමසුවෙමි
ඇස් ඇත්තා මට පිලිතුරු නොදුනි.
තෙවැනි වර දක්වා ඇසූකල
දෙව ඍෂි තෙම පිලිතුරු දෙතියි මා විසින් අසන ලදී. (1118)

2 . දෙවියන් සහිත මෙලොවත් පරලොවත් බඹලොවත් (කිසිවෙක්)
කීර්තිමත් ගෞතමයන් වූ ඔබගේ දෘෂ්ඨිය නොදනී. (1119)

3. මෙවැනි මනහර වු දක්මක් ඇත්තා කරා
ප්‍රශ්නයක් විමසීමට පැමිණියෙමි.
කෙලෙස ලෝකය දෙස බලන්නා
මාර රජු තෙමේ නොදකීද? (1120)

4. (භාග්‍යවතුන් වහන්සේ)
මෝඝරාජ, හැමවිටම සතිමත්ව ලෝකය ශුන්‍ය යැයි බලන්න.
ආත්මදෘෂ්ඨිය උදුරා දමා, එලෙස මාරයා ඉක්මවූවෙක් වන්න.
එලෙස ලෝකය දෙස බලන්නා, මාර රජු තෙමේ නොදකියි.
(1121)

5.16 පිංගිය ප්‍රශ්නය

1. (පිංගිය)
මහළු වෙමි, දුර්වල වෙමි, අවලස්සන වෙමි.
නෙත් (දැක්ම) පිරිසිදු නැත, ඇසීම අපහසුය.
මුලාවූවෙක්ව අතරමැද මම නොවැනසෙම්වා!
මෙලොවදීම උපත හා මහළු බව ප්‍රහීණ කිරීමට
යම් ධර්මයක් ඇතිද, එය මට දැනගැනීමට දෙසන සේක්වා! (1122)

2. (භාග්‍යවතුන් වහන්සේ)
කය නිසා පීඩාවට පත්වූවන් දැක
ප්‍රමාද වූ ජනයා කයෙහි පෙළීමට පැමිණේ.
එම නිසා පිංගිය, ඔබ අප්‍රමාදීව
නැවත නොඉපදීම සඳහා කය දුරුකරන්න. (1123)

3. (පිංගිය)
දිශා සතරද අනුදිශා සතරද
උඩ යට යන මේ දස දිශා වලම
නුඹ වහන්සේ නොඇසූ, නොදුටු, නොදැනගත්
තවද නොසිතූ කිසිම දෙයක් ලෝකයේ ඇත්තේ නැත.
මෙලොවදීම උපත හා මහළු බව ප්‍රහීණ කිරීමට
යම් ධර්මයක් ඇතිද, එය මට දැනගැනීමට දෙසන සේක්වා. (1124)

4. (භාග්‍යවතුන් වහන්සේ)
සිත් තැවුලින් තැවුණු, මහළු බවෙන් පීඩිත වූ
ආශාවෙහි ගිලුනු මිනිසුන් දකින්නේද
එමනිසා පිංගිය, ඔබ අප්‍රමාදීව
නැවත නොඉපදීම සඳහා ආශාව (තණ්හාව) දුරු කරන්න. (1125)

(ඉන්පසු එන ගද්‍ය හා පද්‍ය විස්තරය පරිවර්තනය නොකරන ලදී. අන්තර්ගතය : පරායනය සඳහා වූ සාරාංශ ගත අවසානය හා පිංගිය තෙරුන් වහන්සේ විසින් භාග්‍යවතුන් වහන්සේ ගැන කරන වර්ණාව)